211 වන කාණ්ඩය - 5 වන කලාපය
தொகுதி 211 - இல. 5
Volume 211 - No. 5

2012 ඔක්තෝබර් 23 වන අඟහරුවාදා
2012 ஒக்ரோபர் 23, செவ்வாய்க்கிழமை
Tuesday, 23rd October, 2012

# පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES

(HANSARD)

## නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන :**
දිවි නැගුම පනත් කෙටුම්පත : ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත : ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
විසර්ජන පනත් කෙටුම්පත, 2013 : ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත : නියෝග**

**කල් තැබීමේ යෝජනාව :**
තරග පාවා දීම

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புகள்:**
திவிநெகும சட்டமூலம்: உயர்நீதிமன்றுக்கு மனுக்கள்
குற்றவியல் நடவடிக்கைமுறை சட்டக்கோவை (விசேட ஏற்பாடுகள்) சட்டமூலம்: உயர்நீதிமன்றுக்கு மனுக்கள்
ஒதுக்கீட்டுச் சட்டமூலம், 2013 : உயர்நீதிமன்றுக்கு மனு

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தாவர, விலங்கின பாதுகாப்புக் கட்டளைச் சட்டம்:**
ஒழுங்குவிதிகள்

**ஒத்திவைப்புப் பிரேரணை:**
ஆட்ட நிர்ணய சூதாட்டம்

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Divineguma Bill: Petitions to the Supreme Court
Code of Criminal Procedure (Special Provisions) Bill: Petitions to the Supreme Court
Appropriation Bill, 2013: Petition to the Supreme Court

ORAL ANSWERS TO QUESTIONS

FAUNA AND FLORA PROTECTION ORDINANCE:
Regulations

ADJOURNMENT MOTION:
Match Fixing

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2012 ඔක්තෝබර් 23 වන අඟහරුවාදා***
*2012 ஒக்ரோபர் 23, செவ்வாய்க்கிழமை*
*Tuesday, 23rd October, 2012*

***අ. භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය. නියෝජ්‍ය කථානායකතුමා [ගරු චන්දිම වීරක්කොඩි මහතා] මූලාසනාරූඪ විය.***
*பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது. பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு சந்திம வீரக்கொடி] தலைமை வகித்தார்கள்.*
*The Parliament met at 1.00 p.m.,* MR. DEPUTY SPEAKER [THE HON. CHANDIMA WEERAKKODY] *in the Chair.*

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### I

### දිවි නැගුම පනත් කෙටුම්පත : ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
"திவிநெகும" சட்டமூலம் : உயர் நீதிமன்றுக்கு மனுக்கள்
DIVINEGUMA BILL : PETITIONS TO THE SUPREME COURT

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව දිවි නැගුම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තවත් පෙත්සම් අටක පිටපත්, 2012.10.12 දින ගරු කථානායකතුමාගේ නිවේදනයේ සඳහන් පෙත්සම් තුනට අමතරව ලැබී ඇති බව ස්ථාවර නියෝග අංක 50(2)(අ) යටතේ පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

### II

### අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත : ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
குற்றவியல் நடவடிக்கைமுறை சட்டக்கோவை (விசேட ஏற்பாடுகள்) சட்டமூலம் : உயர் நீதிமன்றுக்கு மனுக்கள்
CODE OF CRIMINAL PROCEDURE (SPECIAL PROVISIONS) BILL : PETITIONS TO THE SUPREME COURT

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම් දෙකක පිටපත් ගරු කථානායකතුමා වෙත ලැබී ඇති බව ස්ථාවර නියෝග අංක 50(2)(අ) යටතේ පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

### III

### විසර්ජන පනත් කෙටුම්පත, 2013 : ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්
ஒதுக்கீட்டுச் சட்டமூலம், 2013 : உயர் நீதிமன்றுக்கு மனு
APPROPRIATION BILL, 2013: PETITION TO THE SUPREME COURT

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව විසර්ජන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සමක පිටපතක් ගරු කථානායකතුමා වෙත ලැබී ඇති බව ස්ථාවර නියෝග අංක 50(2)(අ) යටතේ පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

### IV

### පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழு கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2012 ඔක්තෝබර් මස 23 වන අඟහරුවාදා, එනම් අද දින පස්වරු 3.15ට ගරු කථානායකතුමාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීවරුන් සියලු දෙනාටම මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය සමග කියවිය යුතු, 2000 අංක 43 දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතේ 13 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (ඇ) ඡේදය, 16 වැනි වගන්තිය සහ 112 වැනි වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2012 පෙබරවාරි 21 දිනැති අංක 1746/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියෝග.- [අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන්, 2010 වර්ෂය සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන මම ඉදිරිපත් කරමි.

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

මෙම වාර්තාව ආරක්ෂක හා නාගරික සංවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2011 වර්ෂය සඳහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ නීති කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.- [අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍ය ගරු දි.මු. ජයරත්න මහතා වෙනුවට ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උසස් අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

(1) 2007, 2008, 2009 සහ 2010 වර්ෂ සඳහා රුහුණ විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තා; සහ

(2) 2009 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නැඟෙනහිර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා උසස් අධ්‍යාපන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පරිසර අමාත්‍යතුමා වෙනුවෙන්, 2009 සහ 2010 වර්ෂ සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරියේ වාර්ෂික වාර්තා මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තා පරිසර කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවට යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## උපදේශක කාරක සභා වාර්තා
## ஆலோசனைக் குழு அறிக்கைகள்
## CONSULTATIVE COMMITTEE REPORTS

**ගරු සාලින්ද දිසානායක මහතා (දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சாலிந்த திசாநாயக்க - சுதேச மருத்துவத் துறை அமைச்சர்)
(The Hon. Salinda Dissanayake - Minister of Indigenous Medicine)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2010 වර්ෂය සඳහා ආයුර්වේද වෛද්‍ය සභාවේ වාර්ෂික වාර්තාව සම්බන්ධයෙන් දේශීය වෛද්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා (මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன - நிதி, திட்டமிடல் பிரதி அமைச்சர் )
(The Hon. Gitanjana Gunawardena - Deputy Minister of Finance and Planning)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

(i) 2009 වර්ෂය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව;

(ii) 2009 වර්ෂය සඳහා ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව;

(iii) 2008 සහ 2009 වර්ෂ සඳහා තුරුසවිය අරමුදලේ වාර්ෂික වාර්තා;

(iv) 2009 වර්ෂය සඳහා ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ වාර්ෂික වාර්තාව;

(v) 2009/2010 වර්ෂය සඳහා සී./ස. කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ වාර්ෂික වාර්තාව; සහ

(vi) 2009 වර්ෂය සඳහා රබර් පර්යේෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු විදුර වික්‍රමනායක මහතා**
(மாண்புமிகு விதுர விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සුළු අපනයන භෝග ප්‍රවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් සුළු අපනයන භෝග ප්‍රවර්ධන කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

(i) 2007 සහ 2008 වර්ෂ සඳහා උක් පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තා; සහ

(ii) 2008 සහ 2009 වර්ෂ සඳහා ශ්‍රී ලංකා කජු සංස්ථාවේ වාර්ෂික වාර්තා සහ ගිණුම්.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු නෙරන්ජන් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு நெரன்ஜன் விக்கிரமசிங்க)
(The Hon. Neranjan Wickramasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ සභාපතිතුමා

වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා සම්බන්ධයෙන් විදුලිබල හා බලශක්ති කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

(1) 2010 වර්ෂය සඳහා පරමාණු ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව; සහ

(2) 2010 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා - පැමිණ නැත.

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - தேசிய மொழிகள், சமூக ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - Minister of National Languages and Social Integration)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දහය ඉදිරිපත් කරමි.

(1) බලන්ගොඩ, රත්මලවින්න, අංක 100 - බී 1 දරන ස්ථානයෙහි පදිංචි ඒ.එම්.එස්.එම්.එස්.එස්.බී. අත්තනායක මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) පොල්ගහවෙල, යටිගල්ඔලුව, පොරමඩල, "රන්ෂාමිණි" නිවසෙහි පදිංචි පී.එච්. පතිරණ මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) මතුරට, අම්පිටිගොඩ පදිංචි ඒ.බී.ජී. වික්‍රමසේන මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) වතුරුගම, ඌරුවලවත්ත, අංක 46/2 දරන ස්ථානයෙහි පදිංචි ඩී.ඒ. කාන්ති සමරවීර මැණිකේ මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(5) ගොඩකවෙල, රෝහල හංදිය, අංක 23 දරන ස්ථානයෙහි පදිංචි අයි. මානෙල් රංජනී මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(6) බලන්ගොඩ, රාස්සගල, හැරමිටිගල, අංක 72 දරන ස්ථානයෙහි පදිංචි එම්. යමුනාසිංහම් මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(7) ඔට්ටමාවඩි, මීරාවෝඩෙයි, සමුපකාර පාරෙහි පදිංචි මුහම්මදු සාලි සුබෙයිර් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(8) පැල්මඩුල්ල, උඩතුල, "සමන්" නිවසෙහි පදිංචි වයි.එම්. විජේසේන මහතාගෙන් ලැබුණු පෙත්සම;

(9) කුරුවිට, දෙව්පහල පෙලෙන්ගහයට පදිංචි ජී.එච්.එම්. විජේරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(10) සම්මන්තුරේ 04, ආට්ටුක්කරුත්තාර් වීදිය, අංක 208 දරන ස්ථානයෙහි පදිංචි ආදම්බාවා පාත්තුම්මා මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Susantha Punchinilame - Deputy Minister of Fisheries and Aquatic Resources Development)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) ඕපනායක, ගල්හිර පදිංචි එම්.එස්. කුලසේන මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) බලන්ගොඩ, කිරිදිගල, ආදමෙන්ගම, අංක 50 දරන ස්ථානයෙහි පදිංචි ජී.එම්. විමලා මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) ත්‍රිකුණාමලය, බක්මීගම, මැදවච්චිය, "වාසනා ටෙක්ස්"හි පදිංචි එස්.කේ. විජේනායක මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු ලලිත් දිසානායක මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லலித் திசாநாயக்க - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. Lalith Dissanayake - Deputy Minister of Health)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) මොරොන්තොට, මල්ගම්මන, ජයලත් සෙවණ, අංක 10 දරන ස්ථානයෙහි පදිංචි ජේ.පී. ප්‍රේම ජයන්ත මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) පල්ලෙකැලේ, ට්‍රිනිටි රගර් ස්ටේඩියම් පාර, අංක 110 දරන ස්ථානයෙහි පදිංචි කේ.සී.ආර්. පැලපොල්වත්ත මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) ගාල්ල, පනන්ගල, "නන්දන" නිවසෙහි පදිංචි ඩබ්ලිව්. ලලිත් ආනන්දවංශ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) මාතලේ, නාඋල, හාඩුවෙල පදිංචි ආර්.එම්. ලීලාවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු දිලිප් වෙදආරච්චි මහතා - පැමිණ නැත.

ගරු අජිත් කුමාර මහතා - පැමිණ නැත.

**ගරු වසන්ත අලුවිහාරේ මහතා**
(மாண்புமிகு வசந்த அலுவிஹாரே)
(The Hon.Wasantha Aluwihare)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මාතලේ, එම්සී පාර, අංක 142/9 ඒ දරන ස්ථානයෙහි පදිංචි අයිරාංගනි ඉන්ද්‍රා රණතුංග මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු හේමාල් ගුණසේකර මහතා - පැමිණ නැත.

**ගරු වයි.ජී. පද්මසිරි මහතා**
(மாண்புமிகு வை.ஜீ. பத்மசிரி)
(The Hon. Y.G. Padmasiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) අම්තිරිගල, නාමල්ගමුව පදිංචි ජේ.පී. ජීවන්ති ජයසිංහ මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) රුවන්වැල්ල, මොරාවත්ත පදිංචි පී.කේ.ඩී. වීරසේන මෙනවියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු විදුර වික්‍රමනායක මහතා**
(மாண்புமிகு விதுற விக்கிரமநாயக்க)
(The Hon. Vidura Wickramanayaka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) පොකුණුවිට, වැලිකල, තලාවත්ත පදිංචි සී.එම්. විතාන මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) බණ්ඩාරගම, වීදාගම, වරකාගහවත්ත පදිංචි එම්.කේ. ඩී.අයි. පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සම.

**ගරු නෙරන්ජන් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு நெரன்ஜன் விக்கிரமசிங்க)
(The Hon. Neranjan Wickramasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) මාවතගම, තලහේන්ගොඩ, "සම්පත්" නිවසෙහි පදිංචි ජී.ඒ. විජයකෝන් මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කුරුණෑගල, තෝරයාය, ග්‍රීන් විලේජ්, අංක 2 දරන ස්ථානයෙහි පදිංචි එස්.ඊ. ප්‍රනාන්දු මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
# வினாக்களுக்கு வாய்மூல விடைகள்
# ORAL ANSWERS TO QUESTIONS

## මහව ජල සම්පාදන යෝජනාක්‍රමය : ධාරිතාව
## மாஹோ நீர் வழங்கல் திட்டம் : கொள்ளளவு
## MAHO WATER SUPPLY SCHEME : CAPACITY

2147/'11

**2. ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මහව ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ, මහව නගරයේ ජල අවශ්‍යතා සපුරාලීම සඳහා 2005 වර්ෂයේ අග භාගයේදී ඉදි කරන ලද මහව ජල සම්පාදන යොජනා ක්‍රමය ජනතා අයිතියට පත් කරන ලද දිනය කවරේද;

(ii) එහි ධාරිතාව කොපමණද;

(iii) ඒ යටතේ ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම ජල සම්පාදන ක්‍රමය සඳහා ඇස්තමේන්තුගත මුදල හා වියදම් වූ මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ඉදි කිරීම් සිදු කරන ලද අය කවුරුන්ද;

(iii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කළ අය කවුරුන්ද;

(iv) එහි වර්තමාන තත්ත්වය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

நீர் வழங்கல், வடிகாலமைப்புச் சபை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாஹோ பிரதேச செயலாளர் ஆளுகைப் பிரதேசத்தில் மாஹோ நகரத்தின் நீர்த் தேவையைப் பூர்த்தி செய்வதற்காக 2005ஆம் ஆண்டின் இறுதிப் பகுதியில் நிர்மாணிக்கப்பட்ட மாஹோ நீர் வழங்கல் திட்டம் மக்களுக்கு உரிமை கையளிக்கப்பட்ட திகதி யாதென்பதையும்;

(ii) அதன் கொள்ளளவு யாதென்பதையும்;

(iii) அதன் கீழ் பயனடையும் குடும்பங்களின் எண்ணிக்கை யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) மேற்படி நீர் வழங்கல் திட்டத்திற்காக மதிப்பீடு செய்யப்பட்ட பணத் தொகை மற்றும் செலவிடப்பட்ட பணத் தொகை வெவ்வேறாக யாதென்பதையும்;

(ii) குறித்த நிர்மாணத்தை மேற்கொண்டவர்கள் யாவர் என்பதையும்;

(iii) அதற்காக நிதி ஒதுக்கீடு செய்தவர்கள் யாவர் என்பதையும்;

(iv) அதன் தற்போதைய நிலை யாதென்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Water Supply and Drainage:

(a) Will he state -

(i) the date on which Maho Water Supply Scheme, which was constructed in the latter part of the year 2005 to cater to the water requirements of Maho town in Maho Divisional Secretary's Division was commissioned;

(ii) the capacity of the aforesaid scheme; and

(iii) the number of families benefitted by the aforesaid scheme?

(b) Will he inform this House -

(i) separately, the estimated cost and the actual expenditure of the aforesaid water supply scheme;

(ii) the persons who carried out the construction work of the aforesaid scheme;

(iii) the persons who allocated funds for the aforesaid scheme; and

(iv) the current position of the aforesaid scheme?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 2012 මාර්තු 24 දින.

(ii) දිනකට 1,500$M^3$ යි.

(iii) පවුල් 3,000 යි.

(ආ) (i) මහව, නිකවැරටිය ඒකාබද්ධ ජල යෝජනා ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 723.0කි. එහි වියදම් වූ මුදල රුපියල් මිලියන 786.0කි. (වැඩිපුර වියදම් අවිනිශ්චිත වියදම් යටතේ පියවා ඇත.)

(ii) ප්‍රාදේශීය කොන්ත්‍රාත්කරුවන් මඟිනි. ප්‍රධාන කොන්ත්‍රාත්කරුවන්ගේ නම් පහත සඳහන් කරමි.

1. ඇක්සෙස් ඉංජිනියරින්
2. සිංහ ඩිවලොප්මන්ට්
3. ෆයිනයිට් ලංකා ප්‍රයිවෙට් ලිමිටඩ්
4. ඉසුරු බිල්ඩර්ස්
5. කේ.පී.ප්‍රොජෙක්ට්ස් ඉන්ටනැෂනල් ප්‍රයිවෙට් ලිමිටඩ්
6. රිකෝමා කන්ස්ට්‍රක්ෂන් ඉංජිනියර්ස්
7. ජෙනරල් සේල්ස් කම්පැනි (ප්‍රයිවෙට් ලිමිටඩ්)
8. ඇනලිටිකල් ඉන්ස්ට්‍රමන්ට් ප්‍රයිවෙට් ලිමිටඩ්

(iii) ශ්‍රී ලංකා රජයේ ප්‍රාග්ධන අරමුදලිනි.

(iv) මහව නිකවැරටිය ඒකාබද්ධ ජල යෝජනා ක්‍රමය සඳහා ජලය ලබා ගනු ලබන්නේ මාගල්ල වැවෙනි. ඊට නුදුරින් ඉදි කර ඇති ජල පවිත්‍රාගාරය මඟින් ජලය පිරිසිදු කොට ඉන් කොටසක් බෝගොල්ලාගම ඉදි කර ඇති භූගත ජල ටැංකියක් හරහා මහව ජල කුලුන වෙත පොම්ප කරනු ලබයි. දැඩි නියං තත්ත්වයන් පවතින අවස්ථාවලදී මාගල්ල වැව සිඳී යන බැවින් විකල්පයක් ලෙස දැදුරු ඔයෙන් ලබා ගන්නා සීමිත ජල ප්‍රමාණයකින් පවිත්‍රාගාරය ක්‍රියාත්මක කරනු ලබයි. එම අවස්ථාවලදී පමණක් මහව තෙක් ජල සැපයුම අඩාළ වීම සිදු වන අතර, වැසි කාලගුණික තත්ත්වයන්හිදී මේ සම්බන්ධයෙන් කිසිදු ගැටලුමය තත්ත්වයක් පැන නොනඟින බව දන්වනු කැමැත්තෙමි. වර්තමානයේ තත්ත්වය සලකා බැලීමේදී පසු ගිය කාලය තුළ පැවැති දැඩි නියං තත්ත්වය හේතු කොට ගෙන මාගල්ල වැව සිඳී ගොස් තිබූ අතර, මේ වන විට වර්ෂාපතනය ලැබෙමින් පවතින බැවින් මාගල්ල වැවේ ජල ධාරිතාව වර්ධනය වෙමින් පවතී.

(ඇ) පැන නොනඟී.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, මහව දිගන ප්‍රදේශයේ සාදා තිබෙන මේ කුලුනෙන් ඔබතුමන්ලා බලාපොරොත්තු වුණා, පවුල් 3,500කට වතුර දෙන්න. නමුත් අද උදේත් කථා කර බැලුවාම මට දැන ගන්න ලැබුණා පවුල් 100කට තමයි දැනට වතුර ලැබෙන්නේ කියලා.

මේ පවුල් 3,500න් ඉතුරු අයට රුපියල් මිලියන 786ක් වියදම් කරලා මහව හදා තිබෙන ජල කුලුනෙන් ජලය ලබා දීමට අවශ්‍ය කටයුතු කරන්නේ කවදාද කියා මම අහන්න කැමැතියි. පවුල් සියයකටයි දැනට ජලය සපයන්නේ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
අනික් අයට ජලය ලබා දීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන සලසා තිබෙනවා. මා කලින් සඳහන් කළ පරිදි මහවට ජලය අතිරේකව සැපයීම සඳහා දැනට ඉදි වෙමින් පවතින අනිකුත් ව්‍යාපෘති දෙක - නිකවැරටිය සහ වාරියපොල- මඟින් කටයුතු කරනවා. මහව සහ දළදාගම අවට ගම්මාන ආශ්‍රිතවයි පවුල් තුන්දාස් පන්සියය ඇස්තමේන්තු කරලා තිබෙන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
තව අතුරු ප්‍රශ්න තිබෙනවාද?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ජලය ලබා දෙන්නේ මේ ව්‍යාපෘතියෙන් විතරක් නොවෙයිද? පවුල් 3,500ටම ජලය ලබා දෙන්න ඔබතුමා බලාපොරොත්තු වන්නේ වෙනත් ක්‍රමවේදයකටද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
සම්පූර්ණ ධාරිතාවට මේ යෝජනා ක්‍රම දෙකම -නිකවැරටිය සහ වාරියපොල දෙකම- හමාර කරන්න ඕනෑ. දැනට තිබෙන යෝජනා ක්‍රමය අනුව අපි බලාපොරොත්තු වනවා, දැදුරු ඔයෙනුත් ඉදිරියේදී අපට වතුර ලබා ගන්න පුළුවන් වෙයි කියලා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ කියන්නේ one hundred plus; Thirteen Plus නොවෙයි. මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මා දන්නේ නැහැ, ඔබතුමා කියන ඉලක්කම් මොනවාද කියලා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Thirteen Plus ඔබතුමාලාට දිරවන්නේම නැහැ නේ. ඒකයි මම කිව්වේ. [බාධා කිරීම්] Thirteen Plus දිරවන්නේ නැති

[ගරු දයාසිරි ජයසේකර මහතා]

කට්ටිය ඉන්නවා. පෙනෙනවා නේ, දහතුන කිව්ව ගමන් නැඟිටිනවා. කථා දෙකක් නැහැ. [බාධා කිරීම්] ඕක one thousand plus. Thirteen Plus නොවෙයි. කිව්ව ගමන් නැඟිට්ටා. තව කවුරුවත් ඉන්නවාද, නැඟිටින කට්ටිය? නැහැ නේ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඉන්නවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
වාසුදේව මහත්තයා නැඟිටිනවා Thirteen Plus වලට. අනෙක් අය minusවලටයි නැඟිටින්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තුන්වෙනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමනි, දැන් ඔබතුමාත් දන්නවා වට රවුම් ප්‍රමාණය අඩි 12ක් විතර වන ළිඳකට රුපියල් 7,500 ගණනේත්, ඊට වැඩි වට රවුම් ප්‍රමාණයක් තිබෙන ළිඳකට රුපියල් 7,500 ඉඳලා රුපියල් 15,000, රුපියල් 20,000 දක්වා වැඩි වන විධියටත් ළිංවලට බද්දක් ගහන්න හදන බව. ඔබතුමා නොවෙයි. මම දන්නේ නැහැ, වාරිමාර්ග අමාත්‍යාංශයෙන් අපේ ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා ඒක කරනවාද කියලා. ජල සම්පාදන හා ජලාපවහන ඇමතිවරයා විධියට ඔබතුමාගෙන් මම අහන්න කැමැතියි, කපා ගන්නා සාමාන්‍ය ළිඳකටත් රුපියල් 7,500 ගණනේ ළිං බද්දක් ගහලා අඩුම තරමේ මේ රටේ මිනිස්සුන්ට ළිඳක් කපා ගන්න තිබෙන අයිතිවාසිකමත් අහෝසි කරන්නද ඔබතුමන්ලා මේ හදන්නේ කියලා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජය එවැනි තීරණයක් ගෙන නැහැ. ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යවරයා හැටියට මාත්, ඒ වාගේම වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍ය ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාත් කිසිම අවස්ථාවක එවැනි තීරණයක් ගෙන නැහැ. අමාත්‍ය මණ්ඩලයත් එවැනි තීරණයක් අනුමත කරලා නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මල බද්ද ගහනවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නිලධාරියෙක් තමුන්ට හිතෙන හිතෙන යෝජනා ප්‍රකාශයට පත් කළාට අපේ රජය ජනතාවාදී රජයක් හැටියට එවැනි දෙයක් කරන්නේ නැහැ. ඒ නිසා තමුන්නාන්සේලා කලබල වන්න එපා. අපි එහෙම දෙයක් කරන්නේ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක මල බද්ද කියලා ගහන්නේත් නැද්ද?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 3-2195/'11-(1), ගරු රවි කරුණානායක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## විශ්වවිද්‍යාල ප්‍රජාවට නිවාස : ප්‍රතිපාදන
பல்கலைக்கழக சமூகத்தினருக்கு வீடுகள்: நிதி ஒதுக்கீடு
HOUSING FOR UNIVERSITY COMMUNITY: FUNDS ALLOCATED

2225/'12

4. **ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ "සැමට නිවසක් - හිතට සෙවණක්" වැඩ පිළිවෙළ යටතේ, විශ්වවිද්‍යාල ප්‍රජාවේ නිවාස අවශ්‍යතාව සම්පූර්ණ කිරීම සඳහා නිවාස 5000ක් ඒ ඒ විශ්වවිද්‍යාල අවට ඉදි කර දීමට හෝ ඒ සඳහා සුදුසු ඉඩම් කැබැල්ලක් ලබා දීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කරන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත වැඩසටහන සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(ii) එසේ නම්, වෙන් කළ මුළු මුදල කොපමණද;

(iii) එම ප්‍රතිපාදන වෙන් කර ඇත්තේ නිවාස ඉදි කිරීමටද; නොඑසේ නම්, ඉඩම් කැබලි ලබා දීමටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) மஹிந்த சிந்தனை தொலை நோக்குக் கொள்கைகளில் "සැමට නිවසක් - හිතට සෙවණක්" வேலைத்திட்டத்தின் கீழ், பல்கலைக்கழக சமூகத்தினரின் குடியிருப்புத் தேவையை பூர்த்தி செய்வதற்காக 5000 வீடுகளை அந்தந்த பல்கலைக்கழகங்களுக்கு அருகில் நிர்மாணிப்பதற்கு அல்லது அதற்குப் பொருத்தமான

காணித்துண்டை வழங்குவதற்குத் தேவையான நிதி ஏற்பாட்டினை ஒதுக்குவதாக வாக்குறுதி அளிக்கப் பட்டுள்ளதென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி நிகழ்ச்சித்திட்டத்துக்கு நிதி ஒதுக்கப் பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், ஒதுக்கப்பட்ட மொத்தப் பணத் தொகை எவ்வளவென்பதையும்;

(iii) மேற்படி நிதி ஏற்பாடானது வீடுகளை நிர்மாணிப்பதற்காகவா அல்லது காணித்துண்டு களை வழங்குவதற்காகவா ஒதுக்கப்பட்டுள்ளது என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Construction, Engineering Services, Housing and Common Amenities:

(a) Is he aware that a pledge was made under the "සැමට නිවසක් - හිතට සෙවණක්" programme of the "Mahinda Chintana - A Vision for the Future" manifesto that funds would be allocated to build 5,000 houses around the relevant universities or to provide a suitable plot of land for that purpose in order to fulfil the housing need of the university community?

(b) Will he inform this House -

(i) whether funds have been allocated for the above purpose;

(ii) if so, the total amount of money so allocated; and

(iii) whether those funds have been allocated to build houses or to provide plots of land?

(c) If not, why?

**ගරු විමල් වීරවංශ මහතා (ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு விமல் வீரவங்ச - நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சர்)
(The Hon. Wimal Weerawansa - Minister of Construction, Engineering Services, Housing and Common Amenities)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) ඔව්.

(ආ) (i) ඔව්.

(ii) 2011 වසරේ රුපියල් බිලියන 01යි.

2012 වසරේ රුපියල් මිලියන 682යි.

(iii) මෙම ප්‍රතිපාදන උපයෝගී කර ගනිමින් ඒ ඒ විශ්වවිද්‍යාල සතු ඉඩම්වල නිවාස ඉදි කිරීම් කටයුතු සිදු වෙමින් පවතී.

(ඇ) පැන නොනඟී.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඇමතිතුමා සඳහන් කළා 2011 දී රුපියල් බිලියන එකකුත්, 2012 දී රුපියල් මිලියන 682කුත් වෙන් කළ බව. ඒ කියන්නේ විශ්වවිද්‍යාල ප්‍රජාවගේ නිවාස අවශ්‍යතා සඳහා නිවාස 5,000ක් සඳහා 2011 දී රුපියල් බිලියනයක් වෙන් කළා කියලාද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

නැහැ. ඔබතුමා අහලා තිබෙන්නේ නිවාස 5,000 සඳහාම වෙන් කළ මුදල නොවෙයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ඒ ගැන තමයි මම අහන්නේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ඔබතුමා අහනවා, "ඉහත වැඩසටහන සඳහා ප්‍රතිපාදන වෙන් කර තිබේද, එසේ නම්, වෙන් කළ මුදල කොපමණද?" කියලා. දැන් අවුරුදු දෙකයි ගෙවිලා තිබෙන්නේ. ඒ අවුරුදු දෙක තුළ ඒ නිවාස 5,000ටම මුදල් වෙන් කෙරෙන්නේ නැහැ. ඒකෙන් ඒ අවුරුද්දට ඔරොත්තු දෙන ප්‍රමාණයට තමයි, මුදල් වෙන් කර තිබෙන්නේ. ඒ අනුව මේ වැඩ පිළිවෙළ ආරම්භ වෙලා තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමා වග කීමෙන් ප්‍රකාශ කරන්නේ නිවාස 5000ක් ඉදි කිරීම සඳහා 2011 වර්ෂයේ රුපියල් බිලියන එකක් -ඒ කියන්නේ රුපියල් මිලියන 1000ක්-

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ඒ නිවාස 5000ටම නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මම අහන්නේ නිවාස 5000 ගැනයි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

හරි, හරි. නිවාස 5000ක් හදන්නේ අවුරුදු කීයක් ඇතුළතද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

මම අහන්නේ අවුරුදු ගණන නොවෙයි. මම අහන්නේ ප්‍රතිපාදන ගැනයි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු මන්ත්‍රීතුමනි, ප්‍රතිපාදන කියන ඒවා වෙන් වන්නේ මෙහෙමයි. අවුරුදු 5ක් ඇතුළත නිවාස 5000ක් හදන්න බලාපොරොත්තු වෙනවා නම්, පළමුවැනි අවුරුද්දේ නිවාස 5000ටම ප්‍රතිපාදන වෙන් වන්නේ නැහැ. පළමුවැනි අවුරුද්දට අදාළ කොටසට මුල් අවුරුද්දේ ප්‍රතිපාදන වෙන් වෙනවා. ඒ අනුව තමයි මම කියන්නේ පළමුවැනි අවුරුද්දේ -2011 වසරේදී- රුපියල් බිලියන එකක් වෙන් වුණා; 2012 වසරේදී රුපියල් මිලියන 682ක් වෙන් වුණා කියලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
රුපියල් බිලියන 682ක්?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
රුපියල් බිලියන එකක් සහ රුපියල් මිලියන 682ක්. එතකොට දෙකේම එකතුව රුපියල් බිලියන එකකුත් මිලියන 682ක්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
එතකොට ඒ මුදල්වලින් දැන් ඒ වැඩ පිළිවෙළ ආරම්භ වෙලා තිබෙනවා. එය යන්නේ නිවාස 5000 ඉලක්කයට තමයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය තමයි-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දැන් පළමුවැනි අතුරු ප්‍රශ්නය තුන් පාරක් විතර ඇහුවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, නැහැ. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මම හරියට ඇහුවේ නැහැ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඕක නේ කියන්නේ. පොඩි වංචාවක් නේ. පොඩි පොඩි වංචාවල්ම කරන්න හදනවා නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය ඇහුවේ නැහැ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
අර නායකතුමාට එරෙහිවත් වංචාවල් කරන්න හදනවා. ඒක නේ, වෙලා තිබෙන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මම ඇහුවේ නැහැ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
නායකතුමාගේ පර්ස් එකටත් පොකට් ගහනවා. ඒ වාගේ මේ ප්‍රශ්නවලට දෙන උත්තරත් පොකට් ගහන්න එපා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න තුනක් ඇහුවා. උත්තර හතරක් දුන්නා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, නැහැ. එතුමා හරියට ලබා දුන්න දත්තයන් ගැනයි මම ඇහුවේ. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය ඔබතුමා වෙන් කරන ලද ඒ මුදල් ප්‍රමාණයෙන් මේ වන විට නිවාස-

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මම නොවෙයි. මම වෙන් කරන්නේ නැහැ, ජනාධිපතිතුමා තමයි මුදල් වෙන් කරන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමාගේ මෙහෙයවීමෙන්-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමනි, ප්‍රශ්නය අහලා ඉවර වන තෙක් ඉන්න. නැත්නම් තවත් ප්‍රශ්න වැලක් අහයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඇමතිතුමනි, ඔබතුමාගේ මෙහෙය වීමෙන් ක්‍රියාත්මක වන මේ වැඩසටහනේ වෙන් කර තිබෙන රුපියල් මිලියන 1682න් මේ වන විට විශ්වවිද්‍යාල ප්‍රජාවගේ නිවාස අවශ්‍යතාවයෙන් කොපමණ ප්‍රමාණයක් සම්පූර්ණ කර තිබෙනවාද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
එයට පිළිතුර මෙයයි. අග්නිදිග විශ්වවිද්‍යාලය දැනට ආරම්භ වී තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. තනි පුද්ගල නිවාස

ඒකක 10ක් ආරම්භ වී තිබෙනවා. පවුල් නිවාස ඒකක දෙකක් ආරම්භ වී තිබෙනවා. ශිෂ්‍යයන් 100ක් සඳහා නේවාසික ඒකක ආරම්භ වී තිබෙනවා. ඒ අනුව වෙන් කළ මුදල -රුපියල් මිලියන 149ක්- දැන් ආයෝජනය කර තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, මම ඒකක ගැන නොවෙයි ඇහුවේ. නිවාස 5000න් නිවාස කීයක් සම්පූර්ණ කර තිබෙනවාද කියායි ඇහුවේ. අහන ප්‍රශ්නයට උත්තර දෙන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඉතින්, දෙවියනේ! මම ඒකට තමයි උත්තර දීගෙන එන්නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ඒ ඇසූ ප්‍රශ්නයට ඇමතිතුමා උත්තර දුන්නාද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ. උත්තරය දුන්නේ නැහැ. කොහේද යන්නේ මල්ලේ පොල් වාගේ එකකුයි කිව්වේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
උත්තර දුන්නාද නැද්ද කියා තීන්දු කරන එක ඇමතිතුමාගේ අයිතිය. ගරු ඇමතිතුමනි, ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගෙන් ප්‍රශ්නයක් ඇහුවා. ඒ ප්‍රශ්නයට ඔබතුමා පිළිතුර දුන්නාද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මට පිළිතුර දෙන්න ඉඩ දෙන්නේ නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පිළිතුර දෙන්න ඉඩ දෙන්නේ නැතිලු. මන්ත්‍රීතුමා, ඔබතුමා ප්‍රශ්නය අහලායි තිබෙන්නේ. කරුණාකර, පිළිතුර දෙන්න ඉඩ දෙන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මම අහලා තිබෙන විධියට තාත්තා නම් ඔහොම නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පිළිතුර දීලා අවසන් කරන්න ඉඩ දෙන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මම දැන් පිළිතුර දෙනවා, ගරු මන්ත්‍රීතුමා. පිළිතුර කියා අවසාන වන තුරු පොඩ්ඩක් අහ ගෙන ඉන්න.

අග්නිදිග විශ්වවිද්‍යාලය ගැන මම කලින් කිව්වා. ඔබතුමා ඇහුවේ දැනට මොනවාද පටන් අරගෙන තිබෙන්නේ කියායි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නිවාස ගණන.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
වෙන වෙනම කියලා ඔක්කොම එකතු කරලා කියන්න හදන්නේ. එහෙම කිව්වාම හොඳයි නේද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
බොහොම හොඳයි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
වයඹ විශ්වවිද්‍යාලයේ මාකඳුර අධ්‍යයන කාර්ය මණ්ඩල නිල නිවාස සංකීර්ණය එතැන හැදෙනවා. ඊළඟට ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩල නිල නිවාස 45ක් හැදෙනවා. ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩල පවුල් නිවාස 6ක් හැදෙනවා. යාපනය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය නිල නිවාස 14ක් හැදෙනවා. සබරගමුව විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන සේවක නිල නිවාස (තනි පුද්ගල) ඒකක 32ක් හැදෙනවා. මේ විධියට ගත්තොත් රුපියල් මිලියන 447කට වැඩි මුදලක් දැනට වැය කර ඊට අදාළ නිවාස ප්‍රමාණයක් ඇති වී තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
උත්තරය හරි නේ. දැන් දෙවන අතුරු ප්‍රශ්නය.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමාගේ පිළිතුරේදී සඳහන් කළා, දැනට රුපියල් මිලියන 447ක් වැය කර නිවාස තනා තිබෙනවා කියලා. 2011 වර්ෂයට නිවාස තැනීමට ඔබතුමන්ලා රුපියල් මිලියන 1000ක් - රුපියල් බිලියනයක්- වෙන් කළා. එතකොට ඒ රුපියල් බිලියනයෙන් රුපියල් මිලියන 447ක නිවාස ප්‍රමාණයක් තමයි දැනට හැදිලා තිබෙන්නේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු මන්ත්‍රීතුමනි, ඒ ප්‍රමාණයක වැඩ අවසන් වෙලා තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, ඔබතුමා සඳහන් කළා 2011 අවුරුද්දට නිවාස වෙනුවෙන් රුපියල් මිලියන1000ක් වෙන් කළා කියලා. ඒ

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

කියන්නේ රුපියල් බිලියනයක් කියන එකයි. ඒ වාගේම ඔබතුමාගේ පිළිතුරෙහි සඳහන් කළා, දැනට හදා තිබෙන නිවාස සඳහා වැය කර තිබෙන්නේ රුපියල් මිලියන 447ක් කියලා.

මම අහන්නේ මේ කාරණයයි. 2011 දී වෙන් වුණු රුපියල් මිලියන 1000න් ඉතිරි රුපියල් මිලියන පන්සිය ගණනක් ආපසු මහා භාණ්ඩාගාරයට ගියාද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට දැන් තේරෙනවා නායකුමාට තිබෙන ප්‍රශ්නය ලෙහෙසි පහසු ප්‍රශ්නයක් නොවෙයි කියලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු ඇමතිතුමනි, ඔබතුමා මගේ ප්‍රශ්නයට උත්තර දෙන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
කියන දේ තේරෙන්නේ නැති වුණාම, රනිල් වික්‍රමසිංහ මහත්මයාට තිබෙන අමාරුව කොපමණද කියන එක මට දැන් තේරෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා ප්‍රශ්නයට උත්තර දෙන්නේ නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමනි, කරුණාකරලා ප්‍රශ්නයට පිළිතුර දෙන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අහන ප්‍රශ්නයට උත්තර දෙන්න කියන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මේක බරපතළ ප්‍රශ්නයක්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සල්ලි ටික ආපසු මහා භාණ්ඩාගාරයට යවලා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මම උත්තර දෙන්නම් ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මෙතුමා හිතා ගෙන ඉන්නේ,- [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please! ප්‍රශ්නයට උත්තර දෙන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
රුපියල් මිලියන 447ක ගෙවල් හැදිලා ඉවරයි කියන එකයි අපි මේ කියන්නේ. ඉතිරි ඒවායේ ආරම්භ වෙලා වැඩ කෙරෙමින් පවතිනවා. තව ඒවායේ වැඩ ආරම්භ වෙන්න නියමිතව තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, මේ මුදල් අපේ අමාත්‍යාංශය හරහා නොවෙයි විශ්වවිද්‍යාලවලට යොමු වෙන්නේ. මේ මුදල් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හරහා විශ්වවිද්‍යාලවලට ස්වාධීනව වෙන් කෙරෙනවා. විශ්වවිද්‍යාලවලින් තමයි ඔවුන්ගේ අවශ්‍යතාවන්ට අනුකූල විධියට ඒ ඉදි කිරීම් කටයුතු කර ගෙන යන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එය මම ඇසූ ප්‍රශ්නයට පිළිතුර නොවෙයි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමා ඇසූ ප්‍රශ්නයට තමයි මම උත්තර දෙන්නේ. හැබැයි ඔබතුමාට ඕනෑ උත්තරය නොවෙයි. මම දෙන්නේ, ඔබතුමා අහපු ප්‍රශ්නයට අදාළ උත්තරය. ඔබතුමා ඉල්ලන උත්තර දෙන්න මට බැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පොඩ්ඩක් සාධාරණ වෙන්න ඕනෑ. මම ප්‍රශ්නය ඇහුවාම එතුමා කිව්වා, රුපියල් මිලියන 447යි වියදම් කරලා තිබෙන්නේ කියලා. මම අහන්නේ, 2011 වර්ෂයට වෙන් කරපු මුදලින් ඉතිරි රුපියල් මිලියන පන්සිය ගණනට මොකක්ද වුණේ කියලායි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමා තේරුම් ගත්ත විධිය වැරැදියි. මම කිව්වාය කියලා ඔබතුමා කියන්නේ මොකක්ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමාගේ පිළිතුරේදී ඔබතුමා සඳහන් කළා, දැනට විශ්වවිද්‍යාල ප්‍රජාවගේ අවශ්‍යතාව වෙනුවෙන් රුපියල් මිලියන 447ක නිවාස සම්පූර්ණ කරලා තිබෙනවා කියලා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
වැඩ අවසන් කරලා තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒ වාගේම ඔබතුමාගේ පිළිතුරෙහි ඔබතුමා සඳහන් කළා, 2011 වසරේ රුපියල් බිලියනයක් මේ සඳහා වෙන් කළා කියලා.

රුපියල් බිලියනයක් කියන්නේ රුපියල් මිලියන දාහක්. රුපියල් මිලියන දාහෙන් අඩු කරන්න රුපියල් මිලියන හාරසිය හතළිස්හතක්. ඉතිරි සල්ලිවලට මොකක්ද වුණේ?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඉතිරි සල්ලිවලට තවම වැඩ කෙරෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
2011 වර්ෂයේ?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔව්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඉතිරි මුදල් ආපහු මහා භාණ්ඩාගාරයට යැව්වා. එහෙමද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඒක විශ්වවිද්‍යාල උපකුලපතිතුමන්ලාගෙන් අහන්න. තමුන්නාන්සේ දන්නවා, මීට කලිනුත් සංවර්ධන කටයුතු සඳහා විශ්වවිද්‍යාලවලට යවා තිබෙන මුදල් ඒ අවුරුද්ද තුළ නියමිත අරමුණු වෙනුවෙන් යොදවන්නේ නැතුව ආපසු භාණ්ඩාගාරයට ගිය අවස්ථා තිබෙන බව.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එහෙනම් ඔබතුමා ඒක පිළිගන්නවා? ඒකයි මට දැන ගන්න ඕනෑ. බොහොම ස්තුතියි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු මන්ත්‍රීතුමනි, මේ කටයුතු සම්පූර්ණයෙන් තිබෙන්නේ විශ්වවිද්‍යාල උපකුලපතිතුමන්ලා යටතේයි. මෙතුමාට වලිගෙ පැගිලා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ස්තුතිවන්ත වෙනවා ගරු ඇමතිතුමාට. එතුමා පිළිගන්නවා, විශ්වවිද්‍යාල ප්‍රජාවගේ නිවාස වෙනුවෙන් වෙන් කරපු සල්ලි ටික ආපසු මහා භාණ්ඩාගාරයට යවලා තිබෙනවා කියලා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
නැහැ, මම පිළිගත්තේ නැහැ. [බාධා කිරීම්] මොළේ අමාරුවක්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
හිටපු ජනාධිපතිතුමාගේ පුතාට මෙහෙම අසනීපයක් තිබෙනවා කියලා මම හිතුවේ නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අපේ ගරු ඇමතිතුමාගෙන් මම අහන්න කැමැතියි, මහින්ද චින්තන ඉදිරි දැක්මේ සඳහන්ව තිබෙන ආකාරයට විශ්වවිද්‍යාල ප්‍රජාවගේ නිවාස අවශ්‍යතාව සම්පූර්ණ කරන්නට -පන්දහසක නිවාස අවශ්‍යතාව සම්පූර්ණ කරන්නට- ආශ්චර්යවත් ශ්‍රී ලංකාව තුළ තව කොපමණ කලක් ගන්නවාද කියලා. [බාධා කිරීමක්] හරි නේ. ආශ්චර්යවත් ශ්‍රී ලංකාවක් නේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමා සතුටු වන්නේ අප තව කොපමණ කාලයක් ගත්තොත්ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අහන ප්‍රශ්නයට උත්තර දෙන්න, ගරු ඇමතිතුමා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
උත්තරය දෙන්න පහසු කර ගන්නයි මම එහෙම ඇහුවේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම බොහොම පිරිසිදුව ප්‍රශ්න අහන්නේ. [බාධා කිරීම්] ඔබතුමාට තේරෙනවා නේ. උත්තර දෙන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
පුදුම පිරිසුදුයි. [බාධා කිරීම්] මට පිරිසිදු බව තේරෙනවා. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
කාලය පැය භාගයක් ගිහින් තිබෙනවා. තවම ප්‍රශ්න හතරයි අහලා තිබෙන්නේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහින්ද චින්තන ඉදිරි දැක්මේ කියලා තිබෙනවා, ඉදිරි පස් වසර සඳහා තමයි මේ සැලසුම් කර තිබෙන්නේ කියා. ඉතින් එතුමාට ගණන හදා ගන්න කියන්න. දැන් අවුරුදු දෙකක් ගියානේ. ඉතිරි කීයද කියලා ගණන හදා ගන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා මේ උත්තරීතර සභාවට කියන්න. කවදාද ඒ වැඩ ඉවර කරන්නේ?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඒක තමයි කිව්වේ. මහින්ද චින්තන ඉදිරි දැක්මේ කියනවා, අවුරුදු පහක් ඇතුළතයි මේවා කරන්නේ කියලා. දැන් අවුරුදු දෙකක් ගත වී තිබෙනවා. ඉතිරි කීයද? අවුරුදු තුනයි. ගණන හැදුවාම ඔබතුමාට තේරෙනවා තව අවුරුදු තුනත් තිබෙනවා කියා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එතකොට මේ අවුරුදු තුන ඇතුළත වෙන් කරන සල්ලි ආපසු යවන්නේ නැහැ? [බාධා කිරීම්]

## උතුරු - නැඟෙනහිර අධ්‍යාපන සංවර්ධනය : ආධාර
வடக்கு, கிழக்கு கல்வி அபிவிருத்தி : உதவிகள்
DEVELOPMENT OF EDUCATION IN NORTH AND EAST : AID

2293/'12

**5. ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) යුද ජයග්‍රහණයෙන් පසු උතුරු - නැඟෙනහිර ප්‍රදේශවල අධ්‍යාපන ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා රජය විසින් ගෙන ඇති ක්‍රියා මාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) යුද්ධයෙන් පසු උතුරු - නැගෙනහිර ප්‍රදේශවල අධ්‍යාපන සංවර්ධනය සඳහා,

(i) ආධාර ලබාදුන් විදේශීය ආයතන හා රාජ්‍ය නොවන සංවිධාන කවරේද;

(ii) එම එක් එක් ආයතනය මගින් ලබාදී ඇති මූල්‍යමය ආධාරවල වටිනාකම වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2009 - 2012 දක්වා රජය විසින් වාර්ෂිකව කරන ලද මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම අදාළ ව්‍යාපෘති අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) யுத்த வெற்றியின் பின்னர் வடக்கு, கிழக்கு பிரதேசங்களின் கல்வி அபிவிருத்திக்காக அரசாங்கத்தினால் மேற்கொள்ளப்பட்டுள்ள நடவடிக் கைகள் யாவை என்பதை குறிப்பிடுவாரா?

(ஆ) யுத்தத்திற்குப் பின்னர் வடக்கு, கிழக்கு பிரதேசங்களின் கல்வி அபிவிருத்திக்காக,

(i) உதவி வழங்கிய வெளிநாட்டு நிறுவனங்கள் மற்றும் அரச சார்பற்ற அமைப்புக்கள் யாவை என்பதையும்;

(ii) ஒவ்வொரு நிறுவனம் மூலமாக வழங்கப் பட்டுள்ள நிதி ரீதியான உதவிகளின் பெறுமதி ஆண்டுவாரியாக தனித்தனியாக யாவை என்பதையும்;

(iii) 2009-2012 வரை அரசாங்கத்தினால் ஆண்டு வாரியாக மேற்கொள்ளப்பட்ட நிதியேற்பாட்டு ஒதுக்கீடுகள் சம்பந்தப்பட்ட கருத்திட்டங்களுக் கிணங்க தனித்தனியாக யாவை என்பதையும்

அவர் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he state the measures that have been taken by the Government for the development of the education sector in the Northern and the Eastern Provinces after winning the war?

(b) Will he inform this House -

(i) the names of the foreign institutions and non -governmental organizations that granted aid;

(ii) separately, the value of the financial aid given by each of those institutions annually; and

(iii) separately, in relation to the relevant projects, the financial provisions allocated by the Government annually during the period from the year 2009-2012;

for the development of education in the Northern and the Eastern Provinces after the war ?

(c) If not, why?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා ( අධ්‍යාපන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா - கல்வி பிரதி அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa - Deputy Minister of Education)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නට පිළිතුරු දෙනවා.

(අ) යුද ජයග්‍රහණයෙන් පසු උතුරු -නැඟෙනහිර ප්‍රදේශවල අධ්‍යාපන සංවර්ධනය අදියර 03කින් සමන්විත වේ.

01. අවතැන් වූ පාසල් දරුවන්ගේ අධ්‍යාපන සුදුසුකම් නොකඩවා පවත්වා ගෙන යෑම තහවුරු කිරීම.

02. නැවත පදිංචි කරවීමේ ප්‍රදේශවල ආරම්භ කර ඇති පාසල්වල අධ්‍යාපන කටයුතු ස්ථාපිත කිරීම.

03. පාසල් ගුණාත්මක සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

යුද්ධයෙන් පසු උතුරු නැඟෙනහිර පළාත්වල අවතැන්වූවන්, රජය විසින් සහන ගම්මානවල රඳවා තබා ගෙන පහසුකම් සැපයීමට ක්ෂණිකව කටයුතු කරන ලදී. ජනාධිපති විශේෂ කාර්යසාධන ඒකකය ඒකාබද්ධව නැඟෙනහිර නවෝදය, උතුරු වසන්තය, වැඩසටහන්වලට සමගාමීව උතුරු නැඟෙනහිර පළාත්වල සියලු අධ්‍යාපන සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා නියාමනය කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ විශේෂ ඒකකයක් පිහිටුවන ලදී. සහන ගම්මානවල සිටින පාසල් යන වයසේ ළමුන් සඳහා පාසල් අධ්‍යාපනය නොකඩවා ලබා දීමට පියවර ගන්නා ලදී.

මෙහි මුල් අදියරේදී අවතැන් වූ පාසල් දරුවන්ගේ මූලික අධ්‍යාපන අයිතිවාසිකම් තහවුරු කිරීමට තාවකාලිකව ඉගෙනුම් මධ්‍යස්ථාන පිහිටුවා අධ්‍යාපනික අවශ්‍යතා සොයා බලා උචිත අධ්‍යාපන සංවර්ධන වැඩසටහන් ඔවුන් වෙනුවෙන් ආරම්භ කිරීමට පළාත් හා රේඛීය අමාත්‍යාංශය යටතේ යෝජිත වැඩසටහන් සම්බන්ධීකරණය හා නියාමනය කරන ලදී.

මෙමඟින් සමස්ත උතුරු හා නැඟෙනහිර පළාත්වල අධ්‍යාපනික අවශ්‍යතා (භෞතික, මූල්‍ය හා මානව) ගණනය කොට ඒවා සපුරාලීම සඳහා පියවර ගන්නා ලදී.

පළමුවැනි අදියරේ වැඩසටහන් පහත අයුරින් වේ.

* සහන ගම්මානවල සිටින ළමුන් සඳහා අමතර පෙළ පොත් කට්ටල ලබා දීම, මසා නිම කළ පාට නිල ඇඳුම් කට්ටල එක ළමයකුට 02 බැගින් ලබා දීම.
* පාසල් ළමුන් සඳහා ලී බඩු උපකරණ ලබා දීම.
* සරණාගත කඳවුරුවල සිටින සිසුන් සඳහා පෝෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
* පාසල් ළමුන් සඳහා සනීපාරක්ෂක පහසුකම් සැපයීම.
* සහන ගම්මානවල සිටින 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව, අපොස (සා/පෙළ), අපොස (උ/පෙළ) සිසුන් සඳහා විශේෂ උපකාරක පන්ති පැවැත්වීම.
* විශේෂ උපකාරක පන්ති සඳහා කොළඹ ප්‍රධාන පාසල්වල විශේෂඥ ගුරුවරුන් කොළඹ සිට සහන ගම්මාන වෙත සති අන්තයේ යැවීම.

දෙවන අදියර ලෙස, නැවත පදිංචි කිරීමේ ක්‍රියාවලිය ඇරඹූ පසු,

* නැවත ආරම්භ කරන ලද පාසල් සඳහා පෙළ පොත්, නිල ඇඳුම්, පුස්තකාල පොත්, ලී බඩු උපකරණ හා ජංගම විද්‍යාගාර පහසුකම් සැපයීම.

| භාණ්ඩ වර්ගය | සංඛ්‍යාව | |
|---|---|---|
| | උතුරු පළාත | නැඟෙනහිර පළාත |
| පාසල් පුස්තකාල සඳහා (පුටු,මේස,පොත් රාක්ක, වීදුරු අල්මාරි) ලී බඩු කට්ටල | 163 | 166 |
| ඩ්‍රෝවින් බෝඩ්, ඊසල්, පැනල් බෝඩ් යනාදී චිත්‍ර කලා උපකරණ කට්ටල | 150 | 400 |
| ක්‍රීඩා උපකරණ කට්ටල | 202 | 370 |

ඒකක වටිනාකම රුපියල් 400,000.00 බැගින් රුපියල් මිලියන 98ක වියදමින් උතුරු පළාතට පියානෝ 246ක් සහ රුපියල් මිලියන 56ක වියදමින් නැඟෙනහිර පළාතට පියානෝ 141ක් ලබා දීම.

ඒකක වටිනාකම රුපියල් 30,000.00 බැගින් රුපියල් මිලියන 3.6ක වියදමින් උතුරු පළාතට ග්‍රීන් බෝඩ් 122ක් සහ රුපියල් මිලියන 15ක වියදමින් නැඟෙනහිර පළාතට ග්‍රීන් බෝඩ් 500ක් ලබා දීම.

උතුරු පළාතේ පාසල් 46ක් සඳහා රුපියල් 2,623,113.00ක් වටිනා විද්‍යා උපකරණ හා රසායනික ද්‍රව්‍ය ලබා දීම.

නැඟෙනහිර පළාතේ පාසල් 45ක් සඳහා රුපියල් 2,566,089.00ක් වටිනා විද්‍යා උපකරණ හා රසායනික ද්‍රව්‍ය ලබා දීම.

උතුරු නැඟෙනහිර පළාත්වල පාසල් 27ක් සඳහා DVD යන්ත්‍ර 41ක් ලබා දීම. (වියදම රුපියල් 231,650.00යි.)

උතුරු නැඟෙනහිර පළාත්වල පාසල් 176ක් සඳහා රුපියල් මිලියන 80.5ක ලී බඩු හා උපකරණ ලබා දීම.

❖ අලාභ හානි වූ පාසල්වල නැවත ඉදි කිරීම් හා අලුත්වැඩියාවන් සිදු කොට පාසල ප්‍රතිසංවිධානය සඳහා කටයුතු කිරීම. (පාසල් සංඛ්‍යාව 349යි, වියදම රුපියල් මිලියන 545යි - ලේඛන ඇමුණුම 03හි දක්වා ඇත. ඇමුණුම 03 **සභාගත***කරමි.)
❖ කඩිනම් ඉගෙනුම් වැඩසටහන (ALP)
❖ බිම් බෝම්බ අවදානම් අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
❖ ගුරුවරුන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් හා පරිගණක පුහුණු වැඩසටහන (Data Entry Operating) ක්‍රියාත්මක කිරීම.
❖ විදුහල්පතිවරුන් හා නියෝජ්‍ය විදුහල්පතිවරුන් සඳහා කළමනාකරණ පුහුණු වැඩසටහන් හා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
❖ "උතුරු මිතුරු" වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

තුන්වන අදියර ලෙස,

❖ උතුරු පළාතේ සියලුම ද්විතීයික පාසල්වලට පරිගණක ලබා දීම. (එක පාසලකට පරිගණක 05 බැගින් පාසල් 362කට පරිගණක 1,810ක් ලබා දී ඇත.)
❖ ජීවන අවියක් ලෙස ඉංග්‍රීසි භාෂාව, "ත්‍රි භාෂා ශ්‍රී ලංකා" වැඩසටහන පාදක කොට ගෙන පවත්වා ගෙන යාම.
❖ පාසල් බාහිර ඇගයීම් ශක්තිමත් කිරීම.
❖ ප්‍රතිඵල නැංවීමට සුවිශේෂී වැඩසටහන් දියත් කිරීම.
❖ හර විෂයයන් සඳහා විශේෂයෙන් ගුරුවරුන් පුහුණු කිරීම.
❖ ද්විතීයික පාසල් සංවර්ධන වැඩසටහන හා පෝෂිත ප්‍රාථමික පාසල් සංවර්ධනය කිරීම.
❖ ALP වැඩසටහන අඛණ්ඩව කර ගෙන යාම.
❖ දෙමළ මාධ්‍ය ප්‍රශ්නෝත්තර, විෂය නිර්දේශ, ඇගයීම් වාර්තා, ගුරු අත් පොත් නිකුත් කිරීම.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
පිළිතුර සභාගත කළොත් ප්‍රමාණවත් නැද්ද, ගරු මන්ත්‍රීතුමා?

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මෙම ප්‍රශ්නයේ (ආ) කොටසට පිළිතුර දෙන්න පුළුවන්ද, ගරු නියෝජ්‍ය ඇමතිතුමා?

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ආයතනද? මෙය දීර්ඝ පිළිතුරක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මම මේ පිළිතුර සභාගත කරන්නම්.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
(மாண்புமிகு அகில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
විස්තර අවශ්‍ය නැහැ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. (ආ) කොටසට පිළිතුර කියන්න.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
මම ආයතන ටිකත් මොනවාද කියලා කියන්නම්.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා**
**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

අතුරු ප්‍රශ්න තිබෙනවාද, ගරු මන්ත්‍රීතුමා?

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පළමුවන අතුරු ප්‍රශ්නය මෙසේයි. ගරු ඇමතිතුමනි, අපි පසු ගිය යුගයේ පුවත් පත්වල දැක්කා මිනෝලි කියන, දූෂණය කරලා මිය ගිය තැනැත්තිය වෙනුවෙන් ගෙයක් දුන්නා කියලා ආණ්ඩුව ලොකු ප්‍රචාරයක් ගෙන ගියා. මම ඊයේත් ඔවුන් සමඟ දුරකථනයෙන් සංවාදයක නිරත වුණා. ඔවුන් කිව්වා එසේ ගෙයක් ලැබිලා නැහැ කියලා. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒ ගැන දැනුවත්ද?

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විධියට සිය දිවි නසාගැනීම් සහ විවිධ ආකාරයෙන් කටයුතු කරන අයට-

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
සිය දිවි නසාගැනීමක්.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
සමහර වෙලාවට සිය දිවි නසා ගැනීම් වුණ අවස්ථා තිබෙනවා. ඒ වාගේම පිට රට ගිහින් ආබාධිත වෙලා ආපු අවස්ථා තිබෙනවා. ඒ අය නීත්‍යානුකූල මාර්ගයෙන් විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියා පදිංචි වෙලා ගිහින් තිබෙනවා නම් අපි ඒ අයට නිවෙස් සාදා දුන්නු අවස්ථා තිබුණා. නමුත් මේ කාන්තාව ගිහිල්ලා තිබුණේ නීත්‍යානුකූල ආකාරයට ලියා පදිංචි වෙලා නොවෙයි. නීත්‍යානුකූල නොවන ආකාරයටයි ගිහින් තිබුණේ. පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ජනතා නියෝජිතයන් මේ සම්බන්ධයෙන් මා සමඟ කථා කළා. ගරු ගීතාංජන ගුණවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා මේ සම්බන්ධයෙන් විශාල මහන්සියක් වුණා. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා මට වරක් දුරකථනයෙන් කථා කළා, මේ පිළිබඳව. ඒ කාරණා සැලකිල්ලට අරගෙන අපි ඒ කාන්තාව වෙනුවෙන් රුපියල් මිලියනයක වන්දියක් ලබා දීම සඳහා කටයුතු කරලා තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නය.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු ඇමතිතුමනි, මම අහන්නේ, ඇයට නිවසක් ලබා දුන්නාද, නැද්ද කියලායි.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
නිවසක් ලබා දෙන්න විධියක් නැහැ. මොකද, ඇය පිට රට ගියේ නීත්‍යානුකූල නොවන මාර්ගයෙන්.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
පුරවැසියකු නීත්‍යානුකූල නොවන මාර්ගයෙන් පිට රට ගියොත් ඔහුට ඒ rights ලැබෙන්නේ නැද්ද?

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නීත්‍යානුකූල නොවන මාර්ගයකින් පිට රට ගිය අනෙක් අයට නොකරන විධියේ විශේෂයක් කරලා අපි ඇය වෙනුවෙන් රුපියල් මිලියනයක වන්දි මුදලක් ලබා දෙන්න කටයුතු කර තිබෙනවා.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
අපේ විමල් වීරවංශ ඇමතිතුමා ප්‍රචාරයක් ගත්තා ගෙයක් දුන්නා කියලා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔව්, ඔව්. ඒ ගැන තමයි මා මේ කියන්න හදන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මිනෝලි මහත්මිය මිය ගියාට පස්සේ එතුමියගේ ස්වාමිපුරුෂයායි, දරුවායි, එතුමියගේ පියායි අපව මුණ ගැසුණා. ඒ අයට නීත්‍යානුකූලව ඉඩමක් නැහැ. තිබෙන්නේ තාත්තාගේ පාර්ශ්වයේ ඉඩමක්. තාත්තාගේ වාචික එකඟතාව මත තමයි එතැන ගේ හදන්න වෙන්නේ. නිවාස සංවර්ධන අධිකාරියේ නිලධාරීන් යවලා, ඒ අයත් එක්ක සාකච්ඡා කරලා අවසානයේදී අපි ඒ අයට ණය ආධාර මුදලක් දුන්නා නිවස හදා ගැනීම සඳහා.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
කීයක්ද ගරු ඇමතිතුමා?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මගේ මතකය අනුව රුපියල් ලක්ෂ 5ක වාගේ මුදලක්. ඒක වරදින්න පුළුවන්. රුපියල් ලක්ෂ 5ක්, 3ක්, 2ක් වාගේ මුදලක් වෙන්න පුළුවන්.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ඇයගේ මරණයේ වටිනාකම රුපියල් ලක්ෂ 5ද? අනේ පව්!

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
නැහැ, නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු රංජන් රාමනායක මන්ත්‍රීතුමා, ඒ ප්‍රශ්නය වෙනම අහන්න, ගරු විමල් වීරවංශ ඇමතිතුමාගෙන්.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මා කිව්ව රුපියල් මිලියනයයි, එතැන රුපියල් ලක්ෂ පහයි එකතු කළාම රුපියල් ලක්ෂ 15යි. එතුමාට ගණන් බැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ඒ සම්බන්ධයෙන් වෙනම ප්‍රශ්නයක් අහන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු මන්ත්‍රීතුමනි, රුපියල් මිලියනයක් දූන්නාය කිව්වාම, ඒකද මැරුණු කෙනාගේ වටිනාකම කියලා ඔබතුමා ඇහුවොත් ඒක මොන තරම්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

ප්‍රශ්නයක්ද?

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
එතුමාට ගණන් බැහැ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මැරුණු මිනිසෙකු වෙනුවෙන් දෙන ආධාර මුදලෙන් ඔහුගේ වටිනාකම මනින්න බැහැ. ආධාර මුදල දෙන්නේ ඒ මනුස්සයාව මිල කරන්න නොවෙයි, ඒ පවුලේ අයට නැඟිටින්න. ඒක තේරෙන්නේ නැති නළුවෙක් නේ.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු ඇමතිතුමා, මිනෝලි කියන්නේ ලංකාවේ පුරවැසියෙක්. ඇය නීත්‍යානුකූල නොවන මාර්ගයෙන් පිට රට ගියොත් ඒකට වග කියන්නේ කවුද? [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 7, ගරු ගයන්ත කරුණාතිලක මහතා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා තුන්වැනි අතුරු ප්‍රශ්නය අහනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
අතුරු ප්‍රශ්න අවසන්.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ. දෙකයි ඇහුවේ.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரன்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මා අතුරු ප්‍රශ්න දෙකයි ඇහුවේ. [බාධා කිරීම්]

## ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය : වැලි ගොඩදැමීම

எல்பிட்டிய பிரதேச செயலகப் பிரதேசம் : மணல் அகழ்வு

ELPITIYA DIVISIONAL SECRETARY'S DIVISION : SAND MINING

2492/'12

7. **ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

පරිසර අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මඟින් ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ වැලි ගොඩදැමීම සඳහා බලපත්‍ර ලබා දී තිබේද;

(ii) එසේ නම්, ලබා දී ඇති බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(iii) එම බලපත්‍රලාභීන්ගේ නම් සහ ලිපිනයන් කවරේද;

(iv) ඔවුන්ට වැලි ගොඩ දැමීමට අවසර දී ඇති ස්ථාන කවරේද;

(v) අදාළ බලපත්‍රලාභීන් විසින් වැලි ගොඩ දැමීමේදී අනුගමනය කළ යුතු කොන්දේසි තිබේද;

(vi) එසේ නම්, ඒවා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) புவிச்சரிதவியல் அளவை, சுரங்க பணியகத்தினால் எல்பிட்டிய பிரதேச செயலக ஆளுகைப் பிரதேசத்தினுள் மணல் அகழ்வதற்கு உரிமப் பத்திரம் வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், வழங்கப்பட்டுள்ள உரிமப் பத்திரங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) மேற்படி உரிமப் பத்திர உரிமையாளர்களின் பெயர்கள் மற்றும் முகவரிகள் யாவை யென்பதையும்;

(iv) இவர்களுக்கு மணல் அகழ்வதற்கு அனுமதி வழங்கப்பட்டுள்ள இடங்கள் யாவை யென்பதையும்;

(v) மேற்படி உரிமப் பத்திர உரிமையாளர்கள் மணல் அகழ்வின்போது பின்பற்ற வேண்டிய நிபந்தனைகள் உள்ளனவா என்பதையும்;

(vi) ஆமெனில் அவை யாவையென்பதையும்

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Environment:

(a) Will he inform this House -

(i) whether the Geological Survey and Mines Bureau has issued permits for sand mining within Elpitiya Divisional Secretary's Division;

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(ii) if so, the number of permits that have been issued;

(iii) the names and addresses of those permit holders;

(iv) the names of the places where they have been permitted to engage in sand mining;

(v) whether there are any conditions which the permit holders should adhere to when they engage in sand mining; and

(vi) if so, what those conditions are ?

(b) If not, why?

**ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர் - சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. A.R.M. Abdul Cader - Deputy Minister of Environment)
கௌரவ கயந்த கருணாதிலக்க சுற்றாடல் அமைச்சரிடம் கேட்ட வினாவுக்கான விடை:

ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා, උත්තරය පිටු හතක් තිබෙනවා. තමුන්නාන්සේට ඔක්කෝම කියවන්න ඕනෑ ද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, උත්තරය සිංහලෙන් කියෙව්වා නම් හොඳයි.

**ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා**
(மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர்)
(The Hon. A.R.M. Abdul Cader)
පිටු හතක් තිබෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
එපමණ දිග විස්තරයක් ඕනෑ නැහැ. උත්තරය කෙටියෙන් කිව්වා නම් ඇති. වැලි ගොඩ දැමීම සඳහා බලපත්‍ර කොපමණ දීලා තිබෙනවාද කියලායි අහන්නේ.

**ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා**
(மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர்)
(The Hon. A.R.M. Abdul Cader)
බලපත්‍ර 14යි. මම දෙමළෙන් උත්තරය කියවන්නේ. ඔක්කෝම headphones දා ගන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, පිටු හතම කියවන්න අවශ්‍ය වෙන්නේ නැහැ නේද?

**ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා**
(மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர்)
(The Hon. A.R.M. Abdul Cader)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පිටු හයක්, හතක් තිබෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඔබතුමාට කියන්න පුළුවන්ද, බලපත්‍රලාභීන්ට වැලි ගොඩ දැමීමට අවසර දී ඇති ස්ථාන?

**ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා**
(மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர்)
(The Hon. A.R.M. Abdul Cader)
තමුන්නාන්සේ headphone එක දා ගන්න.

| | ***பெயர்*** | ***ஆற்றின் பெயர்*** | ***நீர்த் துறையின் பெயர்*** |
|---|---|---|---|
| 1. | பீ.எல்.என். ஜயலத் | பெந்தரை | வத்தஅத்தர நீர்த்துறை |
| 2. | எச்.டீ.விஜேசிறி | எல்பிட்டி கால்வாய் | எலமோதர படகுத்துறை |
| 3. | ரீ. ஞானசிறி | எல்பிட்டி கால்வாய் | மைத்திரீகம நீர்த்துறை |
| 4. | டபிள்யு. மல்லவஆரச்சி | பெந்தரை | பீல்ல கட்டிய |

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නම් සහ ලිපිනයන් නැතුවාට කමක් නැහැ. වැලි ගොඩ දැමීමට අවසර දී ඇති ස්ථාන දෙමළෙන් හෝ කිව්වාම ඇති.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ගම්වල නම් ටික දෙමළෙන් කිව්වා නම් හරි.

**ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා**
(மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர்)
(The Hon. A.R.M. Abdul Cader)
நரவெல்கெட்டிய தோட்டம், மிரிஸ்வத்தை-12 ஆம் துண்டு, நரவெல்கெட்டிய தோட்டம், கொட்டகந்த ஓவிட்ட.

එතැන ගම් පහක් තිබෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඔබතුමාට සිංහල බැරිද?

**ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා**
(மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர்)
(The Hon. A.R.M. Abdul Cader)
බැහැ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
විපක්ෂයේ ඉන්න කොට පුළුවන්කම තිබුණා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මාර අපහාසයක් නේ.

**ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා**
(மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர்)
(The Hon. A.R.M. Abdul Cader)
නැහැ, ගරු මන්ත්‍රීතුමා. ඒක අපහාසයක් නොවෙයි.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමා කැමැති විධියට පිළිතුරු දෙන්න.

**ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා**
(மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர்)
(The Hon. A.R.M. Abdul Cader)
දැන් නම් ටික කිව්වා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ආණ්ඩුවට ගියාට පස්සේ සිංහලත් බැරි වෙලා.

**ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා**
(மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர்)
(The Hon. A.R.M. Abdul Cader)
குறித்த பெயர்கள் சொல்லப்பட்டுவிட்டன. வினாவுக்கான முழு விடையையும் நான் சபாபீடத்தில் சமர்ப்பிக்கின்றேன்.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, පිළිතුර සභාගත කරන්න.

**ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා**
(மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர்)
(The Hon. A.R.M. Abdul Cader)
හොඳයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන ප්‍රශ්නයට උත්තරය මොකක්ද කිව්වේ නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අවසාන ප්‍රශ්නයට පිළිතුර අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
අනුගමනය කළ යුතු කොන්දේසි මොනවාද කියා කියන්න. මේ පැත්තේ ඉන්නකොට සිංහල පුළුවන්. සිංහලෙන් කියන්න.

**ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා**
(மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர்)
(The Hon. A.R.M. Abdul Cader)
සිංහලෙන් කියවන්න බැහැ.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
එහෙම නම් දෙමළෙන් කියන්න.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
What is the point of Order?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
Every Member in this House has the right to speak in all three languages, Sinhala, Tamil and English. When the Hon. Deputy Minister is replying in Tamil, the Hon. Member is forcing him to reply in Sinhala.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
That is not a point of Order. කියන්න, ගරු ඇමතිතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
කොන්දේසි මොනවාද කියා කියන්න.

**ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා**
(மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர்)
(The Hon. A.R.M. Abdul Cader)
ඒකේ හුඟක් තිබෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ටිකක් කියන්න. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
Order, please!

**ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා**
(மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர்)
(The Hon. A.R.M. Abdul Cader)

* மணல் அகழ்வின்பொருட்டு "பிரன்ட் அன்ட் லோடர்ஸ்" மற்றும் "எக்ஸ்கவேட்டர்ஸ்" பயன்படுத்தப்படுதல் வேண்டும்.
* அகழ்வுகளை ஆரம்பிப்பதற்கு முன்னர் மத்திய சுற்றாடல் அதிகார சபையின் மூலம் வழங்கப்படுகின்ற சுற்றாடல் இசைவுச் சான்றிதழைப் பெறுதல் வேண்டும்.
* மாதாந்த உற்பத்தியின் அளவு 160 கியூப்களைத் தாண்டலாகாது.
* அகழ்வுப் பணிகள் மு.ப. 6.00 மணிக்கும் பி.ப. 6.00 மணிக்கும் இடைப்பட்ட காலத்தில் நடைபெறுதல் வேண்டும்.
* இந்த உரிமப் பத்திரத்தின் ஒரு பிரதியை வேலைத்தளத்தில் வைத்திருத்தல் வேண்டும்.
* அகழ்வு செய்யப்படுகின்ற குழியின் ஆழம் 15 அடிகளைவிட அதிகரித்தலாகாது.
* அகழ்வுப் பணிகளின்போது அயலில் வசிப்பவர்களுக்கு, பயிர்ச் செய்கைகளுக்கு மற்றும் சொத்துக்களுக்குச் சேதம் ஏற்படாதவாறு செயலாற்றுதல் வேண்டும்.
* தூசி ஏற்படுவதைத் தடுப்பதற்கு நீர் தெளித்தல் வேண்டும்.
* மண் அரிப்பைத் தடுப்பதற்கு நடவடிக்கை எடுத்தல் வேண்டும்.
* பிரவேசப் பாதைகளை ஒழுங்காக அமைத்தல் வேண்டும்.
* பொது வீதிகளுக்குச் சேதம் ஏற்படுத்தலாகாது.
* காணியின் எல்லையிலிருந்து 5 மீற்றர் நிலப் பகுதியை அகழ்வு செய்யாது கைவிடுதல் வேண்டும்.
* அகழ்வின்போது, ஏற்றுகின்றபோது, ஏற்றிச் செல்லலின்போது சேதங்கள் குறைவாக ஏற்படக்கூடிய வகையில் செயலாற்றுதல் வேண்டும்.
* அகழ்வுப் பணிகளின்போது புதர்கள் மற்றும் மரங்களுக்குச் சேதம் விளைவித்தலாகாது.
* முதலுதவிப் பெட்டியொன்றை வேலைத்தளத்தில் வைத்திருத்தல் வேண்டும்.

තව ඊනෑද, ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා? இன்னும் சொல்ல வேண்டுமா?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
හොඳයි. බොහොම ස්තුතියි.

***සභාමේසය මත තබන ලද පිළිතුර:**
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(அ) (1) வழங்கப்பட்டுள்ளது.

(11) வழங்கப்பட்டுள்ள உரிமப் பத்திரங்களின் எண்ணிக்கை 14.

(111) மேற்படி உரிமப் பத்திர உரிமையாளர்களின் பெயர்கள் மற்றும் முகவரிகள் வருமாறு:

| | *பெயர்* | *முகவரி* |
|---|---|---|
| 01 | பீ.எல்.என். ஜயலத் | குருந்துவத்தை, மெய்ஹேன |
| 02 | எச்.டீ. விஜேசிறி | இல. 18, மைத்ரீகம, கனேகொட |
| 03 | ரீ. ஞானசிறி | ஹிபன்கந்த, நவந்தகல |
| 04 | டபிள்யு.மல்லவஆரச்சி | கெரண்டிவெல்தூவ, வலல்லாவிட்ட |
| 05 | கே.ஈ.ஏ. குமார | கல்வக்க, வலல்லாவிட்ட |
| 06 | ஐ.பீ. மனு பிரசன்ன | அமுன மாவத்தை, இஹல எல்பிட்டிய |
| 07 | ஈ.கே. சிறிசேன | ஶ்ரீயானந்த, மெட்டிவிலிய, பிட்டிகல |
| 08 | டீ.பீ. இஹலகே | ஏக்கர் 100, ஓலபெத்த |
| 09 | எல்.ஆர். ரணவீர | 4வது மைல் கல், பிடுவல, எல்பிட்டிய |
| 10 | எல்.ஆர்.பீ. ஜயசிங்க | ஏக்கர் 100, ஓலபெத்த |
| 11 | டீ.ஏ. குமார | 75, மஹஜன மாவத்தை, எல்பிட்டிய |
| 12 | எஸ்.என்.சீ.ஜே. குமார | 675/ பி, மஹஜன மாவத்தை, மகருகடுவ, எல்பிட்டிய |
| 13 | எச்.எல். சுமனசிறி | இஹல கும்புல, பிடுவல, எல்பிட்டிய |
| 14 | டீ.ஜீ. புஷ்பகுமார | ஆனந்த வித்தியாலய மாவத்தை, எல்பிட்டிய |

(1v) இவர்களுக்கு மணல் அகழ்வதற்கு அனுமதி வழங்கப்பட்டுள்ள இடங்கள் பின்வருமாறு:

ஆற்று மணல் அகழ்வுக்கு அனுமதியளிக்கப் பட்டுள்ள இடங்கள்

| | *பெயர்* | *ஆற்றின் பெயர்* | *நீர்த் துறையின் பெயர்* |
|---|---|---|---|
| 01 | பீ.எல்.என். ஜயலத் | பெந்தரை | வத்தஅத்தர நீர்த்துறை |
| 02 | எச்.டீ. விஜேசிறி | எல்பிட்டி கால்வாய் | எலமோதர படகுத்துறை |
| 03 | ரீ. ஞானசிறி | எல்பிட்டி கால்வாய் | மைத்திரீகம நீர்த்துறை |
| 04 | டபிள்யு. மல்லவஆரச்சி | பெந்தரை | பீல்ல கட்டிய |
| 05 | கே.ஈ.ஏ. குமார | பெந்தரை | பீல்ல கட்டிய |
| 06 | ஐ.பீ. மனு பிரசன்ன | பெந்தரை | பன்வில வயல் |
| 07 | ஈ.கே. சிறிசேன | பெந்தரை | கல்வக்க நீர்த்துறை |

மேட்டு நில மணல் அகழ்வுக்கு அனுமதி வழங்கப்பட்டுள்ள இடங்கள்

| | *பெயர்* | *காணியின் பெயர்* | *கிராமம்* |
|---|---|---|---|
| 01 | டீ.பீ. இஹலகே | நரவெல்கெட்டிய தோட்டம் | கஹதூவ தெற்கு |
| 02 | எல்.ஆர். ரணவீர | மிரிஸ்வத்தை, 12 ஆம் துண்டு | எரமுல்ல |
| 03 | எல்.ஆர்.பீ. ஜயசிங்க | நரவெல்கெட்டிய தோட்டம் | இஹல கும்புர |
| 04 | டீ.ஏ. குமார | கொட்டகந்த ஓவிட்ட | பெலந்தகொட |
| 05 | எஸ்.என்.சீ. ஜே. குமார | கொட்டகந்த ஓவிட்ட, 65வது துண்டு | 25ஈ, பெலென்த கொட |
| 06 | எச்.எல். சுமனசிறி | ஹெகொடயாகுல, துண்டு 26ஏ | 26சீ, குடாகல |
| 07 | டீ.ஜீ. புஷ்பகுமார | கஹம்பிலியகொட கெலே, ஏலியஸ் ஓவிட்ட | 25ஈ, பெலென்த கொட |

(v) ஏற்புடைய உரிமப் பத்திர உரிமையாளர்கள் கடைப்பிடிக்க வேண்டிய நிபந்தனைகள் உள்ளன.

(vi) அத்தகைய நிபந்தனைகள் கீழே தரப்பட்டுள்ளன.

*ஆற்று மணலின் பொருட்டு*

- Ø உரிமப்பத்திர உரிமையாளர் காணியின் உரிமையாளர் அல்லாத பட்சத்தில் 1992ஆம் ஆண்டின் 33ஆம் இலக்க சுரங்கங்கள், கனிப்பொருட்கள் சட்டத்தின் 51வது வாசகத்திற்கமைய அகழ்வுக்கான உரிமையைக் காணியின் உரிமையாளரது விருப்பின் பிரகாரமன்றி உரிமப் பத்திர உரிமையாளரால் செயற்படுத்த முடியாது.
- Ø எதிர்வரும் காலத்தில் மணல் அகழ்வு தொடர்பாகப் புவிச் சரிதவியல் அளவை, சுரங்கப் பணியகத்தின் பணிப்பாளர் நாயகத்தினால் விதிக்கப்படுகின்ற நிபந்தனைகளுக்கு உரிமப் பத்திர உரிமையாளர் இணங்குதல் வேண்டும்.
- Ø உரிமப் பத்திரத்தைப் புதுப்பிக்கும் பொருட்டு வேண்டுகோள் விடுக்கின்றபோது, உரிமப் பத்திர காலகட்டத்தினுள் பிரதேச செயலாளரால் பணம் அறவிடப்பட்டு அகழ்வுக்கு அனுமதி வழங்கிய மணல் கியூப்களின் அளவைக் குறிப்பிட்டு, உரிமப் பத்திரத்தை ஒரு வருடத்தினால் நீடிப்பதை விதந்துரைக்கின்ற கடிதமொன்றைச் சமர்ப்பித்தல் வேண்டும்.
- Ø ஆற்றங்கரை அரிப்புக்குள்ளாவதைத் தடுப்பதற்கு நடவடிக்கை எடுத்தல் வேண்டுமென்பதோடு அவ்வாறின்றி மணல் அகழ்ந்தெடுக்கப்படுவதன் காரணமாக ஆற்றங்கரைகளுக்கும் சுற்றாடலுக்கும் சேதம் ஏற்படுவதாக அறியக்கிடைக்குமெனில், உரிமப் பத்திரத்தை இடைநிறுத்துவதற்கு நடவடிக்கை எடுக்கப்படும்.
- Ø மணல் அகழ்வானது திங்கட்கிழமை, புதன்கிழமை மற்றும் வெள்ளிக்கிழமை நாட்களில் மாத்திரம் நடைபெறுதல் வேண்டும்.
- Ø மாதாந்த உற்பத்தியின் அளவு 35 கியூப்களைத் தாண்டலாகாது.
- Ø மணல் அகழ்வுக்காக இயந்திரப் பொறிகள் எதுவும் பயன்படுத்தப்படுதலாகாது.
- Ø வீதிகளை வெட்டி வாகனங்களை ஆற்றில் பிரவேசிக்கச் செய்தலாகாது.
- Ø மணல் அகழ்வின் மூலம் சுற்றுச் சூழலில் உள்ள மரம் செடிகளுக்குச் சேதம் விளைவிக்கக்கூடாது.
- Ø ஆற்றின் கரைகள் அரிப்புக்குள்ளாவதைத் தடுக்கும் பொருட்டு இரு கரைகளிலும் மருத மரம் மற்றும் மூங்கில் பயிரிடப்படுதல் வேண்டும்.
- Ø ஆற்றங்கரைகளுக்குச் சேதம் விளைவித்தலாகாது.
- Ø ஆற்றின் அடிப்பகுதியை அகழ்தலாகாது.
- Ø மணல் அகழ்வுப் பணிகள் மு.ப. 6.00 மணிக்கும் பி.ப. 6.00 மணிக்கும் இடைப்பட்ட காலத்தில் மாத்திரம் நடைபெறுதல் வேண்டும்.
- Ø நீர்த் துறைக்குப் பிரவேசிக்கும் பாதை 1 மீற்றராயிருத்தல் வேண்டுமென்பதோடு ஒரு பிரவேசப் பாதையை மாத்திரம் பேணி வருதல் வேண்டும்.
- Ø மணல் அகழ்வுக்காக ஈடுபடுத்தப்படும் ஊழியர்களின் எண்ணிக்கை 04 பேருக்கு அதிகமாயிருத்தலாகாது.
- Ø இந்த உரிமப் பத்திரத்தின் ஒரு பிரதியை வேலைத் தளத்தில் வைத்திருத்தல் வேண்டும்.
- Ø அகழ்வுப் பகுதியில் முதலுதவிப் பெட்டியொன்றை வைத்திருத்தல் வேண்டும்.
- Ø மணல் ஏற்றிச் செல்லல் காரணமாகப் பொது வீதிகளுக்குச் சேதம் ஏற்படுத்துதலாகாது.
- Ø பிரவேசப் பாதைகளை ஒழுங்காகப் பேணி வருதல் வேண்டும்.
- Ø ஆற்றங்கரைகளின் இரு மருங்குகளிலிருந்தும் காணியை நோக்கியதான 5 மீற்றர் எல்லையினுள் மணல் அகழ்தல் கூடாது.
- Ø அகழ்வுப் பணிகளைச் சுற்றிலுமுள்ள வீடுகள் மற்றும் சொத்துக்களுக்குச் சேதம் ஏற்படாதவாறு பேணி வருதல் வேண்டும்.
- Ø அகழ்வு நடவடிக்கைகள் நீர்த் துறையிலிருந்து ஆற்றின் மேல் பகுதியை நோக்கியதாக 100 மீற்றர்களும் ஆற்றின் கீழ்ப் பகுதியை நோக்கியதாக 100 மீற்றர்களுமான வீச்சிடையினுள் மேற்கொள்ளப்படுதல் வேண்டும்.
- Ø அகழ்வுப் பிரதேசத்தில் நுளம்பு பரவுதலைத் தடுத்தல் வேண்டும்.

*மேட்டுநில மணலின் பொருட்டு*

- Ø மணல் அகழ்வின்பொருட்டு "பிரன்ட் அன்ட் லோடர்ஸ்" மற்றும் "எக்ஸ்கவேட்டர்ஸ்" பயன்படுத்தப்படுதல் வேண்டும்.
- Ø அகழ்வுகளை ஆரம்பிப்பதற்கு முன்னர் மத்திய சுற்றாடல் அதிகார சபையின் மூலம் வழங்கப்படுகின்ற சுற்றாடல் இசைவுச் சான்றிதழைப் பெறுதல் வேண்டும்.
- Ø மாதாந்த உற்பத்தியின் அளவு 160 கியூப்களைத் தாண்டலாகாது.
- Ø அகழ்வுப் பணிகள் மு.ப. 6.00 மணிக்கும் பி.ப. 6.00 மணிக்கும் இடைப்பட்ட காலத்தில் நடைபெறுதல் வேண்டும்.

[ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා]

- Ø இந்த உரிமப்பத்திரத்தின் ஒரு பிரதியை வேலைத்தளத்தில் வைத்திருத்தல் வேண்டும்.
- Ø அகழ்வு செய்யப்படுகின்ற குழியின் ஆழம் 15 அடிகளைவிட அதிகரித்தலாகாது.
- Ø அகழ்வுப் பணிகளின்போது அயலில் வசிப்பவர்களுக்கு, பயிர்ச் செய்கைகளுக்கு மற்றும் சொத்துக்களுக்குச் சேதம் ஏற்படாதவாறு செயலாற்றுதல் வேண்டும்.
- Ø தூசி ஏற்படுவதைத் தடுப்பதற்கு நீர் தெளித்தல் வேண்டும்.
- Ø மண் அரிப்பைத் தடுப்பதற்கு நடவடிக்கை எடுத்தல் வேண்டும்.
- Ø பிரவேசப் பாதைகளை ஒழுங்காக அமைத்தல் வேண்டும்.
- Ø பொது வீதிகளுக்குச் சேதம் ஏற்படுத்தலாகாது.
- Ø காணியின் எல்லையிலிருந்து 5 மீற்றர் நிலப் பகுதியை அகழ்வு செய்யாது கைவிடுதல் வேண்டும்.
- Ø அகழ்வின்போது, ஏற்றுகின்றபோது, ஏற்றிச் செல்லலின்போது சேதங்கள் குறைவாக ஏற்படக்கூடிய வகையில் செயலாற்றுதல் வேண்டும்.
- Ø அகழ்வுப் பணிகளின்போது புதர்கள் மற்றும் மரங்களுக்குச் சேதம் விளைவித்தலாகாது.
- Ø முதலுதவிப் பெட்டியொன்றை வேலைத்தளத்தில் வைத்திருத்தல் வேண்டும்.
- Ø அகழ்வின் காரணமாகச் சுற்றிலுமுள்ள காணிகள், சொத்துகளுக்கு சேதம் விளைவித்தலாகாது.
- Ø அகழ்வின்போது அகற்றப்படுகின்ற கழிவுப் பொருட்கள் பக்கத்திலுள்ள காணிகள் அல்லது கால்வாய்களில் விடுவதற்கு இடமளித்தலாகாது.
- Ø அகழ்வுப் பணிகளைச் சனிக்கிழமை, ஞாயிற்றுக்கிழமை மற்றும் அரச விடுமுறை தினங்களில் மேற்கொள்ளலாகாது.
- Ø அகழ்வின் காரணமாகப் பக்கத்திலுள்ள வீடுகள் மற்றும் சொத்துக்களுக்கு ஏதேனும் சேதம் ஏற்படுமிடத்து அதன் பொருட்டு செலுத்த வேண்டிய நட்டஈட்டுத் தொகையைச் செலுத்துவதற்கு உரிமப் பத்திர உரிமையாளர் கடப்பாடுடையவராவார்.
- Ø அகழ்வு மேற்கொள்ளப்பட்ட நிலத்தை மண்ணை நிரப்பிப் புனரமைத்தல் வேண்டும்.
- Ø அகழ்வு நடைபெறும் இடத்தில் ஏதேனும் திடீர் விபத்துக்கள் நேரிடுமெனில் அதைப் பற்றி 24 மணித்தியாலங்கள் செல்வதற்கு முன்னர் பணியகத்திற்கு அறிவித்தல் வேண்டும்.

(ஆ) எழாது.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Ranil Wickremasinghe - Leader of the Opposition)

I must commend the Government for using Tamil, after the Indian Prime Minister, the Hon. Manmohan Singh pulled them up.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, I rise to a point of Order.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

What is your point of Order?

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Sir, he should feel ashamed. The Hon. Leader of the Opposition is misleading the House. Tamil has been used from the time Parliament started. There are Tamil interpreters here. Then, there are Tamil Hansard Reporters who take down proceedings for Hansard and so on. He is misleading the international community. The Hon. Manmohan Singh will give a slap on your face.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Okay. That has been taken note of. අතුරු ප්‍රශ්න තිබෙනවාද?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

නැහැ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ප්‍රශ්න අංක 8-2524/'12-(1), ගරු අනුර දිසානායක මහතා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාස තුනක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

ප්‍රශ්න අංක 9-2546/'12-(1), ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාස තුනක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## වී නිෂ්පාදනය : සහතික මිල
அரிசி உற்பத்தி: உத்தரவாத விலை
PADDY PRODUCTION : CERTIFIED PRICE

2850/'12

10. **ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) සම්බා සහ නාඩු වී කිලෝවක් සඳහා මේ වන විට ගෙවනු ලබන රජයේ සහතික මිල වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්තමානයේ වී කිලෝවක නිෂ්පාදන පිරිවැය කොපමණද;

(ii) එම පිරිවැය ගණනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) නිෂ්පාදන වියදමට සාපේක්ෂව වී කිලෝවක් සඳහා ප්‍රමාණවත් සහතික මිලක් ගොවියාට ලබා දෙන්නේද;

(ii) නොඑසේ නම්, වී මිලදී ගන්නා සහතික මිල වැඩි කිරීමට ගන්නා ඉදිරි පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) சம்பா மற்றும் நாட்டரிசி ஒரு கிலோவுக்கு தற்போது செலுத்தப்படும் அரசாங்கத்தின் உத்தரவாத விலைகள் தனித்தனியாக எவ்வளவென்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) தற்போது ஒரு கிலோ நெல் உற்பத்தி செய்வதற் காக ஏற்படும் செலவினம் எவ்வளவென் பதையும்;

(ii) இச்செலவினம் கணிப்பிடப்படும் முறைமை யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) உற்பத்திச் செலவுக்கு ஒப்பீட்டளவில் ஒரு கிலோ நெல்லுக்காக போதியளவு உத்தரவாத விலையை விவசாயிகளுக்கு வழங்குவாரா என்பதையும்;

(ii) இன்றேல், நெல் கொள்வனவு செய்யப்படும் உத்தரவாத விலையை அதிகரிப்பதற்காக எடுக்கப்படும் எதிர்கால நடவடிக்கை யாதென்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Will he state separately, the certified price of the government paid for a Kilogram of Samba and Nadu varieties of paddy at present ?

(b) Will he inform this House -

(i) the cost of production of a kilogram of paddy at present; and

(ii) the method employed to calculate that cost ?

(c) Will he state -

(i) whether farmers are paid a sufficient certified price for a kilogram of paddy, in comparison to the cost of production; and

(ii) if not, the steps intended to be taken to raise the certified purchasing price of paddy ?

(d) If not, why ?

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன - கமத்தொழில் அமைச்சர்)
(The Hon. Mahinda Yapa Abeywardena - Minister of Agriculture)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) ඔව්.
සම්බා කිලෝග්‍රෑම් 01ක සහතික මිල රුපියල් 30.00යි.
නාඩු කිලෝග්‍රෑම් 01ක සහතික මිල රුපියල් 28.00යි.

(ආ) (i) වර්තමානයේ වී කිලෝ 01ක නිෂ්පාදන පිරිවැය
(ගොවි පවුලේ ශ්‍රමයේ වටිනාකමද වියදමට එකතු කළ විට)
ප්‍රධාන වාරිමාර්ග ප්‍රදේශවල - රුපියල් 20.00 - 25.00

වර්ෂා පෝෂිත ප්‍රදේශවල - රුපියල් 30.00 - 31.00
(ගොවි පවුලේ ශ්‍රමයේ වටිනාකම වියදමට එකතු නොකළ විට)

ප්‍රධාන වාරිමාර්ග ප්‍රදේශවල - රුපියල් 16.00 - 21.00

වර්ෂා පෝෂිත ප්‍රදේශවල - රුපියල් 26.00 - 27.00

(ii) කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකාවේ ප්‍රධාන වී නිෂ්පාදන ප්‍රදේශ නියෝජනය වන පරිදි වී වගාව බහුලව සිදු වන ගොවිජන සේවා මධ්‍යස්ථානවලින් වැඩිපුර ගොවීන් සංඛ්‍යාවක් තෝරා ගන්නා අතර, අඩු වී වගා වපසරියක් ඇති

[ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා]

මධ්‍යස්ථානවලින් අඩු ගොවීන් පිරිසක් තෝරා ගෙන, එම ගොවීන්ගෙන් රැස් කළ තොරතුරු අනුව ගොවි පවුලේ ශ්‍රමයේ වටිනාකම වියදමට එකතු කර එක් නිෂ්පාදන පිරිවැයකුත්, ගොවි පවුලේ ශ්‍රමයේ වටිනාකම වියදමට එකතු නොකර එක් නිෂ්පාදන පිරිවැයකුත් ගණනය කරනු ලබයි.

(ඇ) (i) ඔව්.
(ii) අදාළ නොවේ.

(ඈ) අදාළ නොවේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමා සඳහන් කළා සම්බා වී කිලෝවකට රුපියල් 30ක සහතික මිලකුත්, නාඩු වී කිලෝවකට රුපියල් 28ක සහතික මිලකුත් ලබා දෙනවා කියලා. ඒ වාගේම ඔබතුමාගේ පිළිතුර අනුව මේ වී කිලෝවක් සඳහා යන වියදම රුපියල් 20 ඉඳලා 31 දක්වා ප්‍රමාණයක් වෙනවා. මේ කරුණු දිහා සාපේක්ෂව බැලුවාම අපට පෙනෙනවා වී ගොවියාට ලැබෙන ඉතිරි කිරීම්, නැත්නම් ලාභය ඉතාම සුළු මුදලක් බව. එවැනි තත්ත්වයක් තුළ නිෂ්පාදන වියදමට සාපේක්ෂව වී කිලෝවක් සඳහා ප්‍රමාණවත් සහතික මිලක් ගොවියාට ලබා දෙන්නේද කියා මා ඇසූ ප්‍රශ්නයට ඔබතුමා "ඔව්" කියලා පිළිතුරු දුන්නා. මේ තරම් නාමික ඉතිරි කිරීමක් -නාමික ලාභයක්- පමණක් තිබියදී මේ සහතික මිල ගොවියාට ප්‍රමාණවත්, ගොවියා සතුටු වන මිලක් කියලා ඔබතුමා හිතනවාද?

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ඔබතුමා ගත්තේ වර්ෂා පෝෂිත ප්‍රදේශවල මිල.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
වර්ෂා පෝෂිත ප්‍රදේශ නොවුණත් අනික් ඒවාට සාපේක්ෂව ගත්තත් ඒත් තිබෙන්නේ සියයට 25කටත් වඩා අඩු ලාභයක්.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
එය වරින් වර සංශෝධනය කිරීමට යටත් වෙනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මුල් අවස්ථාවේම පිළිතුරු දුන්නු එකට. ඔබතුමා සංඛ්‍යා ලේඛන කියෙව්වා. දැන් මේ වියදමයි, ආණ්ඩුව දෙන මිලයි අතර තිබෙන පරතරය සාපේක්ෂව අඩු බවත්, වී ගොවියාට ප්‍රමාණවත් නොවන බවත් ඔබතුමා පිළිගන්නවාද?

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
එක් එක් අවස්ථාවල මේ මිල වෙන වෙනම සංශෝධනය කිරීමට යටත් වෙනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔබතුමා කියන්නේ දැනට තිබෙන සහතික මිල -

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
මේ මොහොතේ එහෙම වෙනසක් අවශ්‍ය නැහැ කියන එකයි කියන්නේ.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඇමතිතුමා කියන්නේ මේ රටේ වී ගොවියාට දැනට දෙන සහතික මිල ඔවුන් සතුටු වන, ප්‍රමාණවත් මිලක් කියලාද?

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සතුටු වනවාය කියන එක එක් එක්කෙනාගේ පෞද්ගලික මට්ටමේ දෙයක්.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
හොඳයි, හොඳයි. ඔහොම හිතා ගෙන ඉන්න.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 11-2883/'12 - (1), ගරු මනූෂ නානායක්කාර මහතා.

**ගරු මනූෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මහතා**
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி த சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාස දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මටත් පිළිතුරේ පිටපතක් දෙන්න.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 13-2148/'11- (1), ගරු දයාසිරි ජයසේකර මහතා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගීතාංජන ගුණවර්ධන මහතා**
(மாண்புமிகு கீதாஞ்ஜன குணவர்தன)
(The Hon. Gitanjana Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා. පළමුවැනි වතාවටයි මේ ප්‍රශ්නය අහන්නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order. පළමුවැනි වර අහන ප්‍රශ්නවලට පිළිතුරු දීමට මේ ඇමතිවරුන්ට තිබෙන නැකත මොකක්ද?

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## රජය කොළඹ දිස්ත්‍රික්කය තුළ ඉදි කරන නිවාස : ප්‍රතිපාදන

### கொழும்பு மாவட்டத்தில் நிர்மாணிக்கப்படும் வீடுகள் : ஒதுக்கீடு

### CONSTRUCTION OF HOUSES IN COLOMBO DISTIRICT BY GOVERNMENT : ALLOCATION

2196/'11

14. **ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ෂ 2011 දී රජය විසින් කොළඹ දිස්ත්‍රික්කය තුළ ඉදි කරන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) 2012, 2013 සහ 2014 යන වර්ෂයන්හි දී ඉදි කිරීමට අපේක්ෂිත නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත සඳහන් නිවාස ඉදි කිරීම සඳහා වෙන් කොට ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) අලුතින් ඉදි කරන ලද නිවාස නොමිලේ ලබා දෙන්නේද;

(ii) නොඑසේ නම්, එම අලෙවි කරනු ලබන හෝ කුලියට දෙනු ලබන මිල ගණන් කවරේද;

(iii) එම නිවාස ලබා දෙන පදනම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அரசாங்கத்தால் 2011ஆம் ஆண்டு கொழும்பு மாவட்டத்தில் நிர்மாணிக்கப்பட்ட வீடுகளின் எண்ணிக்கையையும்;

(ii) 2012ஆம், 2013ஆம் 2014 ஆம் ஆண்டுகளில் நிர்மாணிக்க உத்தேசிக்கப்பட்டுள்ள வீடுகளின் எண்ணிக்கையையும்;

(iii) மேற்குறிப்பிட்ட வீடுகளின் நிர்மாணத்திற்கு ஒதுக்கப்பட்ட பணத்தின் அளவையும்

அவர் கூறுவாரா?

(ஆ) (i) புதிதாக கட்டப்பட்ட வீடுகள் இலவசமாக வழங்கப்படுகின்றனவா என்பதையும்;

(ii) இன்றேல் அவ்வீடுகள் கிரயத்திற்கு விற்கப் படுகின்ற அல்லது குத்தகைக்கு விடப்படுகின்ற விலையையும்;

(iii) அவ்வீடுகள் எவ்வடிப்படையில் ஒதுக்கப்படு கின்றன என்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Construction, Engineering Services, Housing and Common Amenities:

(a) Will he state -

(i)_the number of houses built in Colombo District by the Government in the year 2011;

(ii) the number of houses expected to be constructed in the years 2012, 2013 and 2014; and

(iii) the amount of money allocated for the aforesaid construction of houses?

(b) Will he inform this House -

(i) whether the newly built houses are given free;

(ii) if not, the price at which those houses are sold or rented; and

(iii) the basis on which those houses are allocated?

(c) If not, why?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2011 දී කොළඹ දිස්ත්‍රික්කය තුළ ඉදි කරන ලද නිවාස ගණන 1,865යි.

(ii) නිවාස සංඛ්‍යාව 46,029යි.

(iii) රුපියල් මිලියන 28,032.5යි.

[ගරු විමල් වීරවංශ මහතා]

* නිවාස සංවර්ධන අධිකාරිය 2013/2014 ඉදි කිරීමට නියමිත නිවාස 10,654 සඳහා ප්‍රතිපාදන ඇස්තමේන්තු කර ඇත.

*නාගරික සංවර්ධන අධිකාරිය 2012/2013 වර්ෂයන්හි ඉදි කිරීමට නියමිත නිවාස 20,000 සඳහා වියදම ඇස්තමේන්තුගත කරමින් පවතී.

(ආ) (i) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

* සසුනෙන් සෙවන වැඩසටහන යටතේ නිවාස ඉදි කිරීම සඳහා නැවත අය නොකරන ආධාර මත නිවාස ඉදි කරනු ලැබේ.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

* නිවාස ව්‍යාපෘතියේ ස්වභාවය අනුව අවස්ථානුකූලව එය තීරණය කරනු ලැබේ.

නාගරික සංවර්ධන අධිකාරිය

* නාගරික අඩු ආදායම් හා අඩු පහසුකම් නිවාසවල ජීවත් වන ජනතාව සඳහා නිවාස ලබා දෙනු ලැබේ.

(ii) ඒ ඒ ව්‍යාපෘති පිරිවැය අනුව මිල ගණන් තීරණය කරනු ලැබේ.

(iii) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

විසිරි, විරු ගම්මාන, උපහාර ණය නිවාස ණය ආධාර වැඩසටහන් යටතේ ණය/ආධාර මුදල් ලබා දෙන අතර, ණය මුදල වාරික වශයෙන් අය කර ගැනීම සිදු කෙරේ.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

නිවාස ව්‍යාපෘතියේ ස්වභාවය අනුව අවස්ථානුකූලව තීරණය කරනු ලැබේ. එනම් ණය පදනම මත, සහනදායි පදනම මත, ප්‍රශස්ථාපන පදනම මත, වාරික පදනම මත හා විකුණුම් පදනම මත වේ.

(ඇ) පැන නොනඟී.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි.

2011 වර්ෂයේ ගෙවල් 1,865ක් ඉදි කරලා තිබෙනවා කියලා ඔබතුමා කිව්වා. ඒ අවුරුද්දේම ගෙවල් 4,800ක් කොළඹ නගර සභාවෙන්ම කැඩුවා කියලාත් ඔබතුමා පිළිගන්නවා?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු මන්ත්‍රීතුමනි,-

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා ප්‍රශ්නය ඇහුවාම උත්තරය දෙන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මගේ ප්‍රශ්නය අහන්නම්. 2012, 2013 සහ 2014 වර්ෂවලට ගෙවල් 46,029ක් ඉදි කරනවා කියලා ඇස්තමේන්තු කරලා තිබෙනවා කියලා ඇමතිතුමා පෙන්වනවා. ඒකට රුපියල් මිලියන 28,032.5ක් වෙන් කරලා තිබෙනවා කියලා කියනවා. මෙතැන ඔබතුමන්ලාගේ ජනාධිපති ඇවිල්ලා අය වැය ඉදිරිපත් කරන අවස්ථාවේදී 2012, 2013 සහ 2014ට වෙන් කරලා තිබෙන මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 6,188යි කියලා කිව්වා. එහෙම නම් 2012, 2013, 2014 වර්ෂවලට රුපියල් මිලියන 28,032ක මුදලක් වෙන් කරලා තිබෙනවාය කියා ඔබතුමා කොයි ආකාරයෙන්ද කියන්නේ?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අසා තිබෙන්නේ කොළඹ දිස්ත්‍රික්කයට මිසක් කොළඹ-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම ඔබතුමාට තව ලෙහෙසි කළා. මම අහලා තිබෙන්නේ කොළඹ දිස්ත්‍රික්කය ගැනයි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමා ඇහුවේ කොළඹ දිස්ත්‍රික්කය ගැන?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
කොළඹ දිස්ත්‍රික්කය තුළ මේ නිවාස වැඩ පිළිවෙළ ප්‍රධාන වශයෙන් ආයතන කිහිපයක් මඟින් කරනවා. එකක් නිවාස සංවර්ධන අධිකාරිය. අනෙක නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය. ඊ ළඟට, නාගරික සංවර්ධන අධිකාරිය සහ සමෘද්ධි අධිකාරිය. මේ වාගේ ආයතන කිහිපයක් මේ වැඩ පිළිවෙළ තුළ තම තමන්ගේ කාර්ය භාරය ඉටු කරනවා. ඔබතුමා ඔය උපුටා දක්වන්නේ අපේ අමාත්‍යාංශයට අයත් ආයතනවලට වෙන් කළ ප්‍රතිපාදන ගැනයි. ගරු මන්ත්‍රීතුමනි, උදාහරණයක් හැටියට කිව්වොත්-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, මට ඒ ගැන පොඩි පැහැදිලි කර ගැනීමක් අවශ්‍යයි. ඒ කියන්නේ ඔබතුමාගේ අමාත්‍යාංශය කෑලිවලට කඩලා තිබෙනවාද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
නැහැ, නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා මට අංග සම්පූර්ණ උත්තරයක් දෙන්න හදන විට, මේකෙන් මට තිබෙන්නේ 1,000යි, අනෙත් කෙනාට 5,000යි කියලා ඒ වාගේ කියනවා. ඇයි ඔබතුමාට ඔක්කොම දීලා නැත්තේ? [බාධා කිරීමක්]

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මන්ත්‍රීතුමා, දැන් කඩුවෙල නැහැ. මොකද දන්නේ නැහැ නේද? [බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ගරු ඇමතිතුමා, පිළිතුර දෙන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
අපි පරණ ගෙවල් හදන විට, තාත්තා හදපු ගෙවල් ගණනේ දැන් යනවා. බලන්න අපි කොපමණ උදවුවක්ද කළේ කියලා. දැන් පුතණ්ඩියාව මම ඒ පරණ ගෙවල් ගණනේ යවනවා.

මන්ත්‍රීතුමා අහපු ප්‍රශ්නයට පිළිතුර මම කියන්නම්. ගරු මන්ත්‍රීතුමනි, උදාහරණයක් හැටියට නාගරික සංවර්ධන අධිකාරිය 2012, 2013 වර්ෂවල ඉදි කිරීමට නියමිත නිවාස 20,000 සඳහා දැනට ඇස්තමේන්තු කරමින් පවතිනවා. ඒ අයගේ ව්‍යාපෘතිය වෙන්නේ භාණ්ඩාගාර ප්‍රතිපාදන මත පදනම්ව නොවෙයි. ඒක වෙන්නේ සම්පූර්ණයෙන්ම වෙනත් මුදල් ප්‍රවාහයන් මත පදනම්වයි. ඒ වාගේ මේ වැඩ පිළිවෙළ යන්නේ සම්පූර්ණයෙන්ම භාණ්ඩාගාර ප්‍රතිපාදන මත පමණක් පදනම්ව නොවෙයි. නිදසුනක් හැටියට නිවාස සංවර්ධන අධිකාරිය ඇප වෙලා, රාජ්‍ය බැංකුවලින් සහනදායී පදනමකින් ණය අරගෙන මහ ජනයාට දීලා ඒ අය හැදූ නිවාසත් මම මේ කියපු නිවාස 1,865 තුළ තිබෙනවා. ඒ නිසා මේ වැඩ පිළිවෙළ යන්නේ භාණ්ඩාගාර ප්‍රතිපාදන මත පමණක් පදනම් වෙලා නොවෙයි. ඔය පොත බැලුවා කියලා තමුන්නාන්සේට මේ ගණන හදා ගන්න කොහොමවත් පුළුවන් වන්නේ නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, ඔබතුමාත් මාත් මේ පාර්ලිමේන්තුවේ නියෝජනය කරන්නේ කොළඹ දිස්ත්‍රික්කයයි. කොම්පඤ්ඤවීදියේ ගෙවල් 7,800ක් කඩන්න කියලා දැන් තීන්දු කර තිබෙනවා. නමුත් ඒ අයට විකල්ප ගෙවල් දීලා නැහැ. ඔබතුමා නිවාස හා පොදු පහසුකම් ඇමතිවරයා හැටියට ඒ අයට විකල්ප ගෙවල් හදා නොදී පිට රට කොම්පැනිවලට මේ ඉඩම් විකුණන්න හදන්නේ ඇයි? දැන් ඔබතුමාම කියනවා දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අහෝසි කරන්න ඕනෑ කියලා. ඔබතුමාම සුද්දන්ට විරුද්ධව කියනවා, බටහිර කුමන්ත්‍රණයක් තිබෙනවා කියලා. එහෙම නම් ඔබතුමාගේ අමාත්‍ය මණ්ඩලය ඇතුළේම ඔබතුමාට විරුද්ධව කුමන්ත්‍රණයක් තිබෙනවා නේ. ඔබතුමා දක්ෂයි. යමක් කිව්වොත් කරනවා. මට මතකයි, අනුරාධපුරයේ වැඩක් කිව්වාම ඒ වැඩේ කළා කියා. කොළඹ දිස්ත්‍රික්කයේ මේ වාගේ දෙයක් වෙන්න ඉඩ දෙන්නේ ඇයි?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා කියපු ආකාරයට කොළඹ නගර සහා බල ප්‍රදේශයේ ජීවත් වන ජනතාව ඒ ප්‍රදේශවල අනවසර පදිංචිකරුවන් වුණත්, නීත්‍යානුකූල පදිංචිකරුවන් වුණත් ඒ අයට නිවසක් නැති වන්නේ නැහැ. රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ දියත් කර තිබෙන කොළඹ නගරය යළි ප්‍රතිෂ්ඨාපනය කිරීමේ වැඩ පිළිවෙළින් සැබෑ ලෙසම කොළඹ ජීවත් වන කිසිම පුද්ගලයකුට කිසි ලෙසකින්වත් නිවසක් නැති වන්නේ නැහැ. දැනට සිටින නිවසට වඩා සුදුසු නිවසක් ඔවුන්ට ලැබෙන විධියට තමයි ඒ වැඩ පිළිවෙළ හදලා තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඉතින් ඔබතුමා ඔය කොම්පඤ්ඤවීදියේ අය ගැන කියද්දී වුණත් මට කියන්න තිබෙන්නේ, එතැනදී අපි ඒ අයට නියමිත නිවාස -සුදුසු ගේ-දෙන තෙක් කුලී පදනමින් ඉන්න එකඟ වෙලා තිබෙනවාය කියන එකයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මොකක්ද ඒ වීථිය?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ජයසේකර වීථියද? [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමනි, ඒ අය එකඟ වෙලා තිබෙනවා ඒ ස්ථානවලින් ඉවත් වෙලා වෙන තැනක කුලියට නිවසක් අර ගෙන පදිංචි වෙලා ඉඳලා නාගරික සංවර්ධන අධිකාරිය ගේ හදලා දෙන කාලයට-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ අය එකඟවෙලා නැහැ, ඇමතිතුමනි. ඔබතුමායි ඒක කියන්නේ. [බාධා කිරීම්]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
එකඟවෙලා නැහැ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමා කඩුවෙල නේද, මොකද, මේ කොම්පඤ්ඤවීදියට බහින්නේ? දැන් කඩුවෙල නැහැ නේ. [බාධා කිරීමක්] ඔබතුමා කියන ඒ කාරණයට මම එකඟ වෙනවා. එකඟත්වයක් ඇති කර ගැනීම සඳහා දැන් සාකච්ඡා පැවැත්වෙමින් තිබෙනවා. කොහොම වුණත් අපි යමක් කරන්නේ ඒ ප්‍රජාවත් එක්ක එකඟත්වයක් හදා ගෙනයි. හැබැයි, ඉතින් තමුන්නාන්සේලා ගිහිල්ලා එහෙම දේවල්වලට එකඟ වෙන්න එපා කියලා පොඩි පොඩි විෂබීජ දමලා අවුල් කිරීමේ යම් කිසි ව්‍යාපාරයකුත් යනවා. පෞද්ගලිකව ඔබතුමාට කියනවා නොවෙයි. නමුත් විපක්ෂයේ උදවිය ගිහිල්ලා එහෙම කරනවා. ඒ නිසා සමහරු ඒකට එකඟ වන්නේ නැති තත්ත්වයකුත් තිබෙනවා. කොහොම වුණත් ඒ අයගේ කැමැත්ත ඇතිව තමයි රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය ඒ වැඩ පිළිවෙළ ඉස්සරහට ගෙන යන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ තුන්වැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, මම වගකීමකින් මේ ප්‍රශ්නය

[ගරු රවි කරුණානායක මහතා]

අහන්නේ. මම හිතන විධියට ඔබතුමාගේ අමාත්‍යාංශයට මුදල් වෙන් කරන්නේ නැතිව UDA එකට වෙන් කරනවා ඇති. නමුත් ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් බ්ලූමැන්ඩල් පාරේ නිවාස ව්‍යාපෘතියකට දැන් තුන්වැනි වතාවට මුල් ගල් තියලා තිබෙනවා. ඔබතුමා නොවෙයි තිබ්බේ. එතැන තවම කිසිම ගෙයක් හදලා නැහැ. ඒ වාගේම කොළඹ මහ නගර සභාවේ ඡන්දය තිබෙන අවස්ථාවේ වැලිගොඩවත්තේත් ගෙවල් 500ක් හදනවා කියලා මුල් ගල් තියලා තිබෙනවා. නමුත් අද වන තෙක් එක ගෙයක්වත් හදලා නැහැ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
කවුද මුල් ගල් තිබ්බේ?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නාමල් රාජපක්ෂ, බැසිල් රාජපක්ෂ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
නැහැ. නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මමයි කියන්නේ. වැලිගොඩවත්තේ ගෙවල් 500ක් හදනවා කියා මුල් ගල් තිබ්බා. ඔබතුමාට වග කීමකින් මම මේ කාරණය කියන්නේ. ඒ වාගේම නිවාස අධිකාරියෙන් ඇවිත් මට්ටක්කුලියේ කෝවිල ඉදිරිපිට මීට අවුරුදු තුනකට ඉස්සෙල්ලා දෙවන වතාවට මුල් ගල් තියලා තිබෙනවා. එතැනත් මුල්ගල් තබා තිබෙන්නේ ඔබතුමා නොවෙයි. එතැන ගෙවල් 1900ක් ඉදි කරනවා කිව්වාට තවම එකක්වත් ඉදි වෙලා නැහැ. එම උදවියමයි ඔය ඔක්කෝම කරන්නේ. කෝට්ටේ, අනුරෝධ මාවතේ ගෙවල් 350ක් ඉදි කරන්න තිබෙනවා. එකක්වත් ඉදි කර නැහැ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
කෝට්ටේ කවුද? ඔබතුමා කියන්නේ කෝට්ටේත් මුල් ගල් තියලා කියලාද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නිවාස අධිකාරියෙන් මුල් ගල් තියලා තිබෙනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
නැහැ. නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නිවාස අධිකාරියෙන් මුල් ගල් තියලා තිබෙන්නේ. ඕනෑ නම් දැන් අපි දෙදෙනා යමු. ඒ වාගේම කඩුවෙල ආසනයේ පයිප්ප පාරේ -[බාධා කිරීමක්]

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මෙතුමාව කඩුවෙලින් එළවා දමා දැන් අසරණයා වෙලා ඉන්නේ; අවතැන් වෙලා ඉන්නේ. දැන් කොම්පඤ්ඤ වීදියට බැහැලා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔබතුමා ඔය ඇමතිකමට එන්න පෙර මුල් ගල් තියලා තිබෙනවා. තවම එක ගෙයක්වත් හදලා නැහැ. ඇමතිතුමනි, 2013 වර්ෂයේවත් මුදල් ටිකක් ලබා ගෙන මේ ගෙවල් ටික ඉදි කරන්න කටයුතු කරන්න ඔබතුමාට පුළුවන්ද බැරිද? නැත්නම් අකිල විරාජ් මන්ත්‍රීතුමා කිව්වා වාගේ අර කේපී ළඟ තිබෙන රුපියල් මිලියන 18,800න් ඔබතුමාට ගන්න පුළුවන්. මේ මුදල වෙනත් අයට දෙන්නේ නැතුව කරුණාකර රටේ සංවර්ධනයට පාවිච්චි කරන්න කියා මා ඉල්ලනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා බොහොම වැදගත් යෝජනාවකුයි ඉදිරිපත් කළේ. දැනට අවුරුදු තුන හතරකට කලින් මුල් ගල් තබා තිබෙන සමහර නිවාස ව්‍යාපෘතිවලට කේපීගෙන් මුදල් අරගෙන ඒ මුදල්වලින් ඒ නිවාස හදන්න කියලා ඔබතුමා කියන්නේ. එහෙම නේද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම කියන්නේ එයා ඒ වාගේ පට්ටපල් හොරෙක්; අධිකරණයට ගෙනෙන්නේ නැතුව -

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
පට්ටපල් හොරෙක් නම් -[බාධා කිරීමක්]

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දැන් ඔබතුමා අතුරු ප්‍රශ්නය අහලා ඉවරයි. ඒ ප්‍රශ්නයට පිළිතුර දෙන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ පට්ටපල් හොරාගෙන්, ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ 75,800ක් මරපු ඔය හාදයාගෙන් -[බාධා කිරීමක්]

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඒ හොරාගෙන් අපට සල්ලි ගන්න කියන්නේ ඇයි?

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
මෙතැන කරන්නේ විවාදයක් නොවෙයි. ඔබතුමා යෝජනාවකින් ඒක ගන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මන්ත්‍රීතුමාගේ පුරුද්ද මේ. ඔබතුමා කියනවා කේපී කියන්නේ පට්ටපල් හොරෙක් කියා. ඊට කලින් කිව්වා, එයාගෙන් සල්ලි අරගෙන අර ගෙවල් ටික හදන්න කියා. [බාධා කිරීමක්] ඔබතුමා කියන විධියට ත්‍රස්තවාදී පට්ටපල් හොරෙක් නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම එහෙම කියනවා. ඔබතුමා එය පිළිගන්නවාද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මාත් කියනවා කියමු කෝ. එහෙම කියන ගමන් අපට කියනවා එයාගෙන් සල්ලි අරගෙන ගෙවල් හදන්න කියා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ සල්ලි දැන් තිබෙන්නේ කා ළඟද? ඔබතුමාගේ ආණ්ඩුවත් එක්ක නේ එයා සිටින්නේ. ඒ නිසා නේ එයාලා නිදහස් කරන්නේ. සල්ලි ගත්තා; එයා රට ඇරියා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමා කේපී එක්ක මොකුත් business කළේ නැහැ නේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
ප්‍රශ්න අංක 15. සජිත් ප්‍රේමදාස මහතා අහන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
සමා වෙන්න ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ ගරු මන්ත්‍රීතුමා අහපු අවසන් ප්‍රශ්නයට පිළිතුර මෙයයි. ගරු මන්ත්‍රීතුමනි, දැනට අවුරුදු තුන-හතරකට කලින් නිවාස ව්‍යාපෘති පටන් ගන්න ගිය සමහර ප්‍රදේශ සම්බන්ධයෙන් නාගරික සංවර්ධන අධිකාරිය හදා තිබෙන උපාය මාර්ගික සැලැස්මට අනුව තමයි ඒවා එතැන ඉදිවෙනවාද නැද්ද කියන එක අලුතින් තීන්දු වෙන්නේ. මොකද, නාගරික සංවර්ධන අධිකාරිය කොළඹ නගරයට හදා තිබෙන සැලැස්ම ඇතුළේ තිබුණු සමහර ඒවා දැන් එතැන ඒ ව්‍යාපෘතියට සුදුසු නැහැ කියන තීන්දුවකට ඇවිල්ලා තිබෙනවා. හැබැයි ඒ වෙනුවට වෙනත් තැනක ඒ නිවාස ව්‍යාපෘතිය හා සමාන හෝ ඊට වැඩිය හොඳ එකක් හැදෙනවා. ඒ විධියේ ප්‍රශ්නයක් තමයි කොළඹ නගර සභා බල ප්‍රදේශය ඇතුළේ තිබෙන්නේ. මන්ත්‍රීතුමා කෝට්ටේ නගරය සම්බන්ධයෙන් කියපු එක ගැන මම සොයා බලා කටයුතු කරන්නම්.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
බොහොම ස්තුතියි. ගරු සජිත් ප්‍රේමදාස මහතා 15වන ප්‍රශ්නය අහන්න. දැන් වෙලාව පහු වෙලායි තිබෙන්නේ.

## රාජ්‍ය සේවා නිවාස යෝජනා ක්‍රම : විස්තර
### அரச சேவை வீட்டுத் திட்டங்கள்: விபரம்
### PUBLIC SERVICE HOUSING SCHEMES : DETAILS

2226/'12

15. **ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති මාලාවේ "සැමට නිවසක් - හිතට සෙවණක්" වැඩපිළිවෙළ යටතේ, ජල්තර, එඩ්මන්ටන් සහ ටොරින්ටන් නිවාස යෝජනා ක්‍රම වැනි රාජ්‍ය සේවා නිවාස යෝජනා ක්‍රම 25ක් සෑම දිස්ත්‍රික්කයකම ප්‍රධාන නගරය පදනම් කරගෙන, එම දිස්ත්‍රික්කයේ සේවය කරන නිවාස නොමැති රජයේ සහ රාජ්‍ය සංස්ථා සේවකයින් වෙනුවෙන් ආරම්භ කරන බවට පොරොන්දුවක් දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත පොරොන්දුව ප්‍රකාරව නිවාස ව්‍යාපෘති ආරම්භ කළ වර්ෂය කවරේද;

(ii) මේ වනවිට නිවාස ව්‍යාපෘති ඉදිකර අවසන්කර ඇති නගර සංඛ්‍යාව කොපමණද;

(iii) එම නගර කවරේද;

(iv) ඉදිකිරීම් අවසන් නිවාසවල පදිංචිකර ඇති රජයේ සහ සංස්ථා සේවක පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நிர்மாண, பொறியியல் சேவைகள், வீடமைப்பு, பொது வசதிகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) மஹிந்த சிந்தனை தொலை நோக்குக் கொள்கைகளில் "සැමට නිවසක් - හිතට සෙවණක්" வேலைத் திட்டத்தின் கீழ், ஜல்தர, எட்மன்டன் மற்றும் ரொரிங்டன் வீடமைப்புத் திட்டங்கள் போன்று அரச ஊழியர்களுக்கான 25 வீடமைப்புத் திட்டங்கள் அனைத்து மாவட்டங்களிலும் பிரதான நகரத்தை அடிப்படையாகக் கொண்டு அம்மாவட்டத்தில் சேவையாற்றும் வீடுகளற்ற அரச மற்றும் அரச கூட்டுத்தாபன ஊழியர்களுக்காக ஆரம்பிக்கப் படுவதாக வாக்குறுதி அளிக்கப்பட்டுள்ளது என்பதை அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி வாக்குறுதிக்கமைய வீடமைப்புக் கருத்திட்டங்கள் ஆரம்பிக்கப்பட்ட ஆண்டு யாதென்பதையும்;

(ii) இன்றளவில் வீடமைப்புக் கருத்திட்டங்கள் நிர்மாணிக்கப்பட்டு பூர்த்தி செய்யப்பட்டுள்ள நகரங்களின் எண்ணிக்கை எத்தனை யென்பதையும்;

(iii) அந்நகரங்கள் யாவையென்பதையும்;

(iv) நிர்மாணப் பணிகள் பூர்த்திசெய்யப்பட்ட வீடுகளில் குடியமர்த்தப்பட்டுள்ள அரச மற்றும் அரச கூட்டுத்தாபன ஊழியர் குடும்பங்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

asked the Minister of Construction, Engineering Services, Housing and Common Amenities:

(a) Is he aware that a pledge was made under the "සැමට නිවසක් - හිතට සෙවණක්" programme of the "Mahinda Chintana" manifesto that 25 public service housing schemes similar to the Jaltara, Edmonton and Torrington housing schemes, which will be centred around the main town of each of the districts in which they serve, would be commenced for public sector and corporation employees who do not have houses ?

(b) Will he inform this House of -

(i) the year in which the housing projects were commenced as per the above pledge;

(ii) the number of towns in which the housing projects have been completed by now;

(iii) the names of the aforesaid towns; and

(iv) the number of families of public sector and corporation employees who have been settled in the houses of which the construction work has been completed ?

(c) If not, why?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

(අ) ඔව්.

(ආ) (i) රාජ්‍ය සේවකයින් වෙනුවෙන් ආරම්භ කළ නිවාස ව්‍යාපෘති විස්තර පහත දැක්වේ.

(ii) මෙම නිවාස යෝජනා ක්‍රම ඉදිවෙමින් පවතින අතර, ඉදිකිරීම් කටයුතු කඩිනමින් සිදු කර ජනතා අයිතියට පැවරීමට කටයුතු කරනු ලැබේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම අහලා තිබෙන්නේ, නගර සංඛ්‍යාව කොපමණද කියායි.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
නගර සංඛ්‍යාව තමයි මම මේ කිව්වේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නගර ගණනයි අහලා තිබෙන්නේ. නගර කීයක හදා තිබෙනවාද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මම කිව්වා. කොළඹ, ඇල්විටිගල එකයි. සයිමන්ඩෙල් එකයි. සොයිසා පුර එකයි. මිහිඳුපුර, එඩ්මන්ටන් එකයි. කුරුණෑගල වෙලන්ගොල්ල වත්ත. වවුනියාව ගැන මම කිව්වා. වෙහෙරගම රජයේ නිවාස ව්‍යාපෘතිය,-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම අහලා තිබෙන්නේ, නගර සංඛ්‍යාව ගැන. නගර කීයක නිවාස ව්‍යාපෘති හදලා තිබෙනවාද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඉතින් මම කිව්වා නේ නගර ටිකයි, ව්‍යාපෘති ටිකයි, හදපු අවුරුද්දයි. ඔබතුමා මගෙන් අහන ඒවාටත් වඩා කොපමණ ඒවාට මම උත්තර දෙනවාද? ඇයි ඒක අගය කරන්නේ නැත්තේ?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අගය කරනවා. පිළිවෙළකට උත්තර දෙන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මම උත්තර දෙන්නද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හරි. ඔබතුමා (ආ) (iii) කොටසට උත්තර දුන්නා නේද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

(iii) පැන නොනඟී.

(iv) පැන නොනඟී.

(ඇ) පැන නොනඟී.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඇයි අංක (iv)ට පිළිතුර හැටියට "පැන නොනඟී" කියන්නේ?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඒක මගෙන් අහලා වැඩක් නැහැ. ඒක මට බේරන්න පුළුවන් ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, (ආ) (iv) ප්‍රශ්නයෙන් මම අහලා තිබෙන්නේ, ඉදිකිරීම් අවසන් නිවාසවල පදිංචි කර ඇති

රජයේ සහ සංස්ථා සේවක පවුල් සංඛ්‍යාව කොපමණද කියායි. කොහොමද, ඒකට "පැන නොනඟී" කියන්නේ? මෙපමණ ගෙවල් හදලා තිබෙනවා නම් පදිංචි කරපු පවුල් සංඛ්‍යාව කියන්න ඕනෑ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
පොඩ්ඩක් ඉන්න, මම ඔබතුමාට කියන්නම්. මේ වන විට පවුල් 721යි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
රජයේ සේවක පවුල් 721යි?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔව්.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, සෑම දිස්ත්‍රික්කයකම ආවරණය වන විධියට නිවාස යෝජනා ක්‍රම 25ක් ස්ථාපනය කරනවාය කියලා "මහින්ද චින්තන ඉදිරි දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයෙන්පොරොන්දු වෙලා තිබෙනවා. ඒ සඳහා ඔබතුමන්ලා දිස්ත්‍රික් මට්ටමෙන් නිවාස අහිමි රාජ්‍ය සේවකයන් ගැන සංගණනයක් කර තිබෙනවාද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
නිවාස අහිමි රාජ්‍ය සේවකයන් පිළිබඳව සම්පූර්ණ කරුණු ඇතුළත් වාර්තාවක් අප සතුව නැහැ. ගරු මන්ත්‍රීතුමනි, අපේ වැඩසටහන් ගැන දැනුවත් කර, ජනතාවගේ ඉල්ලීම් අරගෙන බැලුවාම සාමාන්‍යයෙන් නාගරික කලාපවල තමයි නිවාස ඉල්ලුම වැඩි. නමුත් ඒ ප්‍රමාණය මෙන්න මේ නිශ්චිත සංඛ්‍යාවයි කියා අපට මේ වෙන තුරු හරියටම කියන්න බැහැ. ජන හා නිවාස සංගණනයේදීත් රාජ්‍ය සේවකයන්ගේ සංඛ්‍යා ලේඛන අපට වෙනම ලබා ගන්න බැරි වෙලා තිබෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ඇත්ත වශයෙන්ම රජයේ සේවක නිලධාරින්ගේ නිවාස ප්‍රශ්නය විසඳන්නට වැඩසටහනක් ක්‍රියාත්මක කරනකොට, ගෙවල් හදන්නට ඉස්සෙල්ලා සංගණනයක් කර අවශ්‍යතාව හඳුනා ගන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම කවදා ද මේ අවශ්‍යතාව හඳුනා ගන්නේ? කොපමණ රජයේ සේවක නිවාස සංඛ්‍යාවක් මේ රටේ බිහි විය යුතුද කියන සංගණනය කරන්න ඕනෑ, ගෙවල් හදන්න ඉස්සෙල්ලා. කවදාද ඒ සංගණනය කරන්නේ?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
සංගණනයක් කර තිබෙනවා, ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙන්. 1981ට පස්සේ සංගණනයක් කර තිබෙනවා. ඒකෙන් සොයා ගෙන තිබෙනවා, මුළු රටේම-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
1981 වර්ෂයේ නොවෙයි. 2001 වර්ෂයේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
නැහැ. නැහැ. 1981 වර්ෂයේ සංගණනය කළාට පස්සේ මුළු රටම ආවරණය වන විධියට -

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
2001 වර්ෂයේත් තිබුණානේ සංගණනයක්.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
උතුරු නැඟෙනහිර පළාත් ඇතුළුව මුළු රටම ආවරණය වන විධියට සංගණනයක් කර තිබෙනවා. ඒ සංගණනයෙන් හඳුනාගෙන තිබෙනවා, නුසුදුසු නිවාස සහ නිවාස අහිමි සංඛ්‍යාව ලක්ෂ හතකට ආසන්න ප්‍රමාණයක් බව. ඒ ලක්ෂ හත ඇතුළත තමයි ගරු මන්ත්‍රීතුමනි, නිවාස අහිමි රජයේ සේවකයන්ගේ සංඛ්‍යාව තිබෙන්නේ. මට මතකයි ඔබතුමාත් කිව්වා ලක්ෂ 12ක්, 15ක් කියලා. මාත් කිව්වා ලක්ෂ 12ක් කියලා. ප්‍රාදේශීය ලේකම්වරුන් හරහා එන-

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඔබතුමා ලක්ෂ 15ක් කියලා කිව්වා, මේ සභාවේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔව්. ලක්ෂ 15, ලක්ෂ 12 වාගේ ගණන් ඔබතුමාත් කිව්වා, මාත් කිව්වා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම කිව්වේ, [illegible] [illegible] නිසායි. ඔබතුමා වගකීමෙන් මේ ගරු සභාවට ඉදිරිපත් කරපු සංඛ්‍යා ලේඛන තමයි මම ඉදිරිපත් කළේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මම එහෙම වග කීමෙන් කියන ඒවා ඊට පස්සේ ඔබතුමාත් කියනවා නේ?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
අනිවාර්යයෙන්ම. මෙය උත්තරීතර සභාවක්. මේ සභාවේ අසත්‍ය ප්‍රකාශ කරන්න බැහැ නේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මම ඉදිරියේදීත් ඒ විධියට වග කීමෙන් කියන්න බලාපොරොත්තු වෙනවා, ඔබතුමා එය නැවත කියයි කියන බලාපොරොත්තුවෙන්.

දැන් මම කියන්න ගියේ මේකයි. ඒ ලක්ෂ හත ඇතුළත තමයි, රජයේ සේවක නිවාස අවශ්‍යතාව තිබෙන්නේ. අප දැනට ජන ලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවෙන් ලිඛිතව ඉල්ලීමක් කර තිබෙනවා, ඒ රජයේ සේවකයන්ගේ සංඛ්‍යාව අපට වෙන් කර දෙන්න කියලා. අප අමුතුවෙන් ඒ ගැන සංගණනයක් කරන්න ඕනෑ නැහැ. ඒගොල්ලන්ගේ වාර්තාවලින් අපට ඒක වෙන් කර දෙන්න කියලා තිබෙනවා. ඒක අපට ඉදිරියේදී ලැබේවි. ඒ නිසා ඒ ප්‍රශ්නය පැන නඟින්නේ නැහැ.

අනෙක් එක තමයි මේ කාරණය. අප රාජ්‍ය බැංකුවලින් සියයට 10ක තරම් අඩු පොලියක් සහිතව ලක්ෂ 5ක මුදලක් ණය ගැනීමේ සුදුසුකම් නැති රජයේ සේවකයන්ට පවා ලබා දීලා තිබෙනවා. ඒ කියන්නේ, වැටුපෙන් කැපෙන උපරිම සීමාවත් කැපුණු සේවකයන්ට පවා නිවාස අධිකාරියෙන් ඇපය දී ඒ අයට ණය ලබා දී තිබෙනවා. අපි ඒ වාගේ ණය දහස් ගණනක් ලබා දී තිබෙනවා. මේ අවුරුද්දේ රුපියල් බිලියන හතරකට ආසන්න මුදලක්, ගිය අවුරුද්දේ රුපියල් බිලියන තුනකට වැඩි මුදලක් උතුරු නැඟෙනහිරත් ඇතුළුව රටේ හැම දිස්ත්‍රික්කයකම රාජ්‍ය සේවකයන්ට ලබා දුන්නා. ඒ මඟින් තමන්ගේ ඉඩමේ තමන්ගේ ගෙය හදා ගැනීමේ වැඩ පිළිවෙළත් මේ එක්කම කෙරෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මගේ තුන්වන අතුරු ප්‍රශ්නය මෙයයි.

මා ස්තුතිවන්ත වෙනවා ඔබතුමා ඒ පිළිතුර ලබා දුන්නාට. ඒ වාගේම මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයෙහි තිබෙන, "සියලුම රාජ්‍ය සේවකයන්ගේ නිවාස අවශ්‍යතාව සම්පූර්ණ කරන්න කටයුතු කරනවාය" කියන ඒ පොරොන්දුව ඊළඟ ජනාධිපතිවරණයට පෙර ඉටු කරන බව ඔබතුමාට නිශ්චිතව වගකීමෙන් කියන්න පුළුවන් ද? ඔබතුමා ඒ ගැන වගකීමෙන් ප්‍රකාශයක් කරනවා ද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඊළඟ ජනාධිපතිවරණයට පෙර නොව, අපි උත්සාහ කරන්නේ ඊට කලින් මේ ඔක්කෝම ඉවර කරන්නයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
කවදා ද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඊළඟ ජනාධිපතිවරණයට පෙර.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඊළඟ ජනාධිපතිවරණයට පෙර කියන්නේ කවදා ද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමාට ඕනෑ මාසයයි, දිනයයි, අවුරුද්දයි ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ. දළ වශයෙන් වසර කියන්න. 2014ද, 2015ද, 2016ද?

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඊළඟ ජනාධිපතිවරණය තියෙන්නේ කොයි අවුරුද්දේද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මම වග කීමෙන් අහන්නේ. ඔබතුමා කිව්වා ඊට පෙර අවසන් කරනවා කියලා. එහෙම නම් ඒ දිනය හෝ වසර කියන්න.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
අපේ බලාපොරොත්තුව, අපේ උත්සාහය, අපේ කැපවීම, අපේ මැදිහත්වීම -මේ සියල්ලම- තිබෙන්නේ ඊළඟ ජනාධිපතිවරණයට කලින් මහින්ද චින්තන ඉදිරි දැක්මේ කියලා තිබෙන සියලු පොරොන්දු කෙසේ හෝ ඉටු කරලා ඊළඟ ජනාධිපතිවරණයේදී මහජනතාව අතරට යන්නයි.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මේ පොරොන්දුව ගැන මා අහන්නේ.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
සියලු පොරොන්දු ගැනයි මම කිව්වේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)
දෙවන වටය.

## ගජමන්ගම ජල ව්‍යාපෘතියේ ඉදිරි කිරීම් : කඩිනම් කිරීම

கஜமன்கம நீர் வழங்கல் திட்ட நிர்மாணம் : துரிதப்படுத்தல்

CONSTRUCTION OF GAJAMANGAMA WATER SUPPLY PROJECT : EXPEDITION

1883/'11

1. **ගරු ජෝන් අමරතුංග මහතා (ගරු බුද්ධික පතිරණ මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு புத்திக பதிரண சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Buddhika Pathirana)

රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) හම්බන්තොට දිස්ත්‍රික්කයේ පිහිටි හුංගම, ගජමන්ගම උස්සාන ජල ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු අතරමඟ නවතා දමා ඇති බවත්;

(ii) එම නිසා එකී ප්‍රදේශයේ ජනතාව දැඩි පීඩාවට පත්ව ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘතියේ ඉදි කිරීම් කටයුතු කඩිනමින් සිදු කිරීමට කටයුතු කරන්නේද;

(ii) ඒ සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

(iii) එසේ නම්, එම ඉදි කිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிர்வாக, உள்நாட்டலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) அம்பாந்தோட்டை மாவட்டத்திலுள்ள ஹுங்கம கஜமன்கம உயர்த்திய நீர் வழங்கல் திட்டத்தின் நிர்மாணிப்புப் பணிகள் இடைநடுவே நிறுத்தப் பட்டுள்ளதென்பதையும்;

(ii) இதனால் மேற்படி பிரதேசத்தின் மக்கள் கடும் பாதிப்புக்கு உள்ளாகியுள்ளனர் என்பதையும்

அவர் ஏற்றுக் கொள்வாரா?

(ஆ) (i) மேற்படி கருத்திட்டத்தின் நிர்மாணிப்புப் பணிகளை துரிதமாக மேற்கொள்வதற்கு நடவடிக்கையெடுப்பாரா என்பதையும்;

(ii) அதற்கான நிதி ஏற்பாடுகள் ஒதுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், நிர்மாணிப்புப் பணிகள் ஆரம்பிக்கப்படும் திகதி யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration and Home Affairs:

(a) Will he admit -

(i) that the construction work of the elevated water supply project at Gajamangama in Hungama of Hambantota District has been stopped half way ; and

(ii) as a result the people of the aforesaid area are undergoing severe hardships?

(b) Will he inform this House -

(i) whether action will be taken to carry out the construction work of the aforesaid project speedily ;

(ii) whether funds have been allocated for that purpose; and

(iii) if so, the date on which the aforesaid construction work will be commenced?

(c) If not, why?

**ගරු විජය දහනායක මහතා (රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு விஜய தஹநாயக்க- பொது நிருவாக, உள்நாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Wijaya Dahanayake - Deputy Minister of Public Administration and Home Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

***සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
**Answer tabled:*

(අ) (i) අතරමඟ නවතා නැත.

(ii) නැත.

(ආ) (i) ව්‍යාපෘතියට අදාළ සියලුම වැඩ සිදු කර අවසන්ය.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(ඇ) අදාළ නොවේ.

## මුලටියන ආයුර්වේද බෙහෙත් ශාලාව : ඖෂධ හිඟය

முலட்டியன ஆயுர்வேத மருந்தகம்: மருந்துப் பற்றாக்குறை

MULATIYANA AYURVEDIC DISPENSARY : DRUG SHORTAGE

1884/'11

12. **ගරු ජෝන් අමරතුංග මහතා (ගරු බුද්ධික පතිරණ මහතා වෙනුවට)**
(மாண்புமிகு ஜோன் அமரதுங்க - மாண்புமிகு புத்திக பதிரண சார்பாக)
(The Hon. John Amaratunga on behalf of the Hon. Buddhika Pathirana)

දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) මාතර දිස්ත්‍රික්කයේ, මුලටියන ප්‍රාදේශීය සභා කාර්යාල භූමියෙහි පිහිටි ආයුර්වේද බෙහෙත් ශාලාවේ පවතින ඖෂධ හිඟය නිසා ප්‍රදේශයේ ජනතාව දැඩි අපහසුතාවට පත්ව සිටින බව එතුමා දන්නෙහිද?

[ගරු බුද්ධික පතිරණ මහතා]

(ආ) (i) එම බෙහෙත් ශාලාවේ පවත්නා ඖෂධ හිඟය කඩිනමින් මඟහැරවීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඊට ගත වන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுதேச மருத்துவத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) மாத்தறை மாவட்டத்தின் முலட்டியன பிரதேச சபை அலுவலக வளவில் அமைந்துள்ள ஆயுர்வேத மருந்தகத்தில் நிலவுகின்ற மருந்துப் பொருட்கள் பற்றாக்குறையினால் பிரதேசத்திலுள்ள மக்கள் கடும் சிரமங்களுக்கு உள்ளாகியுள்ளனரென்பதை அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி மருந்தகத்தில் நிலவுகின்ற மருந்துப் பொருட்கள் பற்றாக்குறையை துரிதமாக நீக்குவதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) ஆமெனில், அதற்காக எடுக்கும் காலம் யாதென்பதையும்

அவர் இச்சபைக்கு அறிவிப்பார?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Indigenous Medicine:

(a) Is he aware that the people of the area are highly inconvenienced due to the shortage of drugs prevailing in the Ayurvedic Dispensary situated in the Mulatiyana Divisional Secretariat premises of Matara District?

(b) Will he inform this House -

(i) whether speedy action will be taken to overcome the shortage of drugs prevailing in the aforesaid dispensary;

(ii) if so, of the time required for it?

(c) If not, why?

**ගරු සාලින්ද දිසානායක මහතා**
(மாண்புமிகு சாலிந்த திசாநாயக்க)
(The Hon. Salinda Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
**Answer tabled:*

(අ) මුලටියන ප්‍රාදේශීය සභා ආයුර්වේදයේ දැඩි ඖෂධ හිඟයක් නොමැති අතර, ඒ හේතුවෙන් බල ප්‍රදේශයේ ජනතාවට දැඩි අපහසුතාවක් ඇති වී නොමැත.

(ආ) (i) ඖෂධ තොග අවසන් වන සෑම අවස්ථාවකදීම සභා අරමුදල් මඟින් ඖෂධ ලබා ගෙන ඇති අතර, ඇතැම් ඖෂධ දෛනිකව නිෂ්පාදනය කිරීමක් ද සිදු කරයි. **ඇමුණුම*** බලන්න.

(ii) විශේෂ කාලයක් අවශ්‍ය නොවන අතර, මේ වන විට ඖෂධ හිඟයක් ඇති නොවන ලෙස කටයුතු කර ඇත.

(ඇ) අදාළ නැත.

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

### I

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා :

"ස්ථාවර නියෝග 7 හි විධිවිධානවල සහ 2010.07.09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ.භා. 1.00 සිට අ.භා. 7.00 දක්වා විය යුතුය. අ.භා. 4.00ට ස්ථාවර නියෝග 7(5) ක්‍රියාත්මක විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

### II

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සභානායකතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා :

"න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 2 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

## වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත : නියෝග
## தாவர, விலங்கினப் பாதுகாப்புக் கட்டளைச் சட்டம் : ஒழுங்குவிதிகள்
## FAUNA AND FLORA PROTECTION ORDINANCE : REGULATIONS

[අ.භා. 2.20]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ජලසම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - நீர்வழங்கல், வடிகாலமைப்பு அமைச்சரும் அரசாங்கத் தரப்பின் முதற்கோலாசானும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Water Supply and Drainage and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවට මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"(469 වැනි අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 71 වැනි වගන්තිය සමඟ කියවිය යුතු, එකී පනතේ 30 වැනි වගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2012 සැප්තැම්බර් 6 දිනැති අංක 1774/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2012.10.11 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ නියෝග පිළිබඳව නියෝජ්‍ය අමාත්‍ය ගරු එස්.එම්. චන්ද්‍රසේන මැතිතුමා විසින් පැහැදිලි කරනවා ඇති.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**නියෝජ්‍ය කථානායකතුමා**
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Deputy Speaker)

Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

***අනතුරුව නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු මුරුගේසු චන්ද්‍රකුමාර් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு முருகேசு சந்திரகுமார்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY SPEAKER *left the Chair, and* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. MURUGESU CHANDRAKUMAR] *took the Chair.*

[අ.භා. 2.21]

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (ගොවිජන සේවා හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - கமநல சேவைகள், வனசீவராசிகள் பிரதி அமைச்சர்)
(The Hon. S.M. Chandrasena - Deputy Minister of Agrarian Services and Wildlife)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මුහුදු ක්ෂීරපායී සතුන් නැරඹීම සඳහා සකස් කරන ලද නියෝග අද දින ඉදිරිපත් කර තිබෙනවා. ඒ පිළිබඳව මා පැහැදිලි කරන්න කැමැතියි. සමුද්‍ර ක්ෂීරපායී සතුන් නිරීක්ෂණය, නියාමනය සහ පාලනය කිරීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් රෙගුලාසි සකස් කර ඇත. තල්මසුන්, ඩොල්ෆින්, ඩියුගොන් යන සත්ව විශේෂ මුහුදු ක්ෂීරපායීන් ලෙස සැලකේ. එයින් තල්මස් විශේෂ 19ක්, ඩොල්ෆින් විශේෂ 09ක් සහ මුහුදු ඌරන් විශේෂ 01ක් ඇතුළු සත්ව විශේෂ 30ක් ශ්‍රී ලංකා වෙරළ තීරයේ ජීවත් වෙති.

මෙම මුහුදු ක්ෂීරපායීන්ගේ පැවැත්මට හා අභිජනනයට ශ්‍රී ලංකා මුහුදු තීරය ඉතාමත් යෝග්‍ය බැවින්, එම සතුන් ශ්‍රී ලංකා මුහුදු තීරයේ බහුලව වාසය කරති. එම නිසා බ්ලූ වේල්, ෆින් වේල්, හම්බැක් වේල්, ස්පර්ම් වේල්, පිග්මි වේල්, ඩ්වොෆ් ස්පර්ම් වේල් යන ක්ෂීරපායී විශේෂ නැරඹීම සඳහා ශ්‍රී ලංකා වෙරළ තීරය ලෝක ප්‍රකටව ඇත.

වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ දැඩි ලෙස ආරක්ෂිත ක්ෂීරපායී සත්ව ලේඛනයේ ඉහත සත්ව විශේෂ සියල්ලම අඩංගු කර ඇත. ඒ අනුව, මෙම සතුන්ගේ සංරක්ෂණයට අදාළව කටයුතු කරන ශ්‍රී ලංකාවේ ප්‍රධානතම ආයතනය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වේ.

පසු ගිය කාලය තුළ මේ රටේ පැවැති යුද්මය වාතාවරණය අවසන් වීමෙන් පසු තල්මසුන් හා ඩොල්ෆින් නැරඹීමේ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය වීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ. සංචාරක ව්‍යාපාරය වර්ධනය වීමත් සමඟින් එකී කර්මාන්තයේ නියැලෙන සමහර පුද්ගලයන් විසින් මෙම ක්ෂීරපායී සතුන්ගේ පැවැත්මට බාධා වන අයුරින් ක්‍රියාත්මක වන බවක් දක්නට ලැබේ. මෙම බාධා දිගටම පැවතුනහොත් එම සතුන් ශ්‍රී ලංකා මුහුදු තීරයෙන් බැහැරව වාසය කිරීම සඳහා වෙනත් ප්‍රදේශ තෝරා ගැනීමට ඉඩ ඇත.

එබැවින්, එම තත්ත්වය පාලනය කිරීම සඳහාත්, මුහුදු ක්ෂීරපායී සතුන් නැරඹීම තුළින් මෙරටට විශාල විදේශ විනිමයක් උපයාගත හැකි බැවිනුත් එම තත්ත්වය ඉදිරියටත් පවත්වාගෙන යාමේ අවශ්‍යතාවක් දැඩිව පවතී. එම නිසා මෙම සතුන්ගේ පැවැත්ම තහවුරු කිරීම සඳහාත්, සංචාරක කර්මාන්තය තිරසාර කර ගැනීම සඳහාත් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් සකස් කර ඇති ඉහත රෙගුලාසි වඩා වැදගත් වේ.

මුහුදු ක්ෂීරපායී සතුන් නැරඹීමේ ගැසට් නිවේදනයට අනුව, එම සතුන්ගේ ආරක්ෂාව හා පැවැත්ම තහවුරු කිරීමටත්, නරඹන්නන්ගේ ආරක්ෂාව තහවුරු කිරීමටත් පහත ක්‍රියාමාර්ග ගෙන ඇත.

**සතුන්ගේ ආරක්ෂාව සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග**

- සතුන්ගේ ස්වාභාවික සංචරණ ක්‍රියාවන්ට අවහිර නොවන අන්දමින් සංචාරක කර්මාන්තයේ නියැලීම.
- එම සතුන් නැරඹීමේදී තල්මසුන් දර්ශනය වූ විටෙක එම ස්ථානයේ සිට මීටර් 400ක් දුරදී යාත්‍රාවේ වේගය අඩු කළ යුතුය. මීටර් 100 දක්වා ලංවූ විට යාත්‍රාව නවතා එන්ජිම ක්‍රියා විරහිත කර ගත යුතුය. අනෙක් සත්ව විශේෂ සඳහා මීටර් 50ක් දුරින් බෝට්ටුව නවතා ගත යුතුය.
- සතුන්ට කෘත්‍රිම ආහාර ලබා දීම හෝ ආලෝක හෝ ශබ්ද තරංග සහ සතුන් ආකර්ෂණය කරන කිසිදු ක්‍රියාවක් නොකළ යුතුය.
- සතුන්ගේ ගමන් මාර්ගය අවහිර වන ලෙස බෝට්ටු නොපැදවිය යුතු අතර, නවතා නොතිබිය යුතුය. සතුන් ආසන්නයේ මුහුදට බැසීම, කිමිදීම නොකළ යුතුය.

[ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා මහතා]

**නරඹන්නන්ගේ ආරක්ෂාව සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග**

- සතුන් නැරඹීම සඳහා භාවිතා කරන බෝට්ටු හොඳ තත්ත්වයේ පවත්වා ගත යුතුය.
- ධාවනය වන බෝට්ටු සඳහා ක්‍රියාකරුවකු, සහකාර ක්‍රියාකරුවකු හා ලියාපදිංචි මාර්ගෝපදේශකයකු අනිවාර්යයෙන්ම සිටිය යුතුය.
- බෝට්ටු තුළ සියලුම නරඹන්නන් සහ සේවකයන් සඳහා ජීවිතාරක්ෂක කට්ටල තිබිය යුතුය.
- බෝට්ටුවේ ගමන් කරන්නන් සඳහා රක්ෂණාවරණයක් තිබිය යුතුය.
- ගොඩබිම සමඟ නිරන්තර සම්බන්ධතාවක් සහ ගමන් මාර්ග හඳුනා ගැනීම සඳහා GPS උපකරණ, මාලිමා යන්ත්‍ර සහ සන්නිවේදන උපකරණ තිබිය යුතුය.
- අයහපත් කාලගුණ තත්ත්වයන් යටතේ සතුන් නැරඹීම සඳහා යාත්‍රා ධාවනය නොකළ යුතුය.
- මුහුදු ක්ෂීරපායී සතුන් ස්වාභාවික වාස භූමිවලදී නිරීක්ෂණය කිරීමේ කාර්යය සඳහා මඟීන් මුහුදට රැගෙන යාමට පෙර එම සතුන් ආරක්ෂා කිරීමට ගත යුතු සංරක්ෂණ වැඩ පිළිවෙළ පිළිබඳව මඟීන් දැනුවත් කළ යුතුය.
- සතුන් නිරීක්ෂණය කරන අවස්ථාවන්හිදී යාත්‍රාව තුළ සිටින මාර්ගෝපදේශකයා විසින් සතුන්ගේ හැසිරීම් රටාවන් පිළිබඳව මඟීන් දැනුවත් කළ යුතුය.
- බෝට්ටුව තුළ මත් පැන් භාවිතා කිරීම හෝ මත් පැන් භාවිතා කොට යාත්‍රාව තුළ ගමන් කිරීම නොකළ යුතු වේ.

මෙසේ අවශ්‍යතාවන් පැන නඟින අවස්ථාවන්හිදී සංරක්ෂණ කටයුතු සිදු කරමින් හා ඉදිරියේදී සංචාරක කර්මාන්තය හොඳින් පවත්වාගෙන යාමට යටිතල පහසුකම් හා ඊ සම්බන්ධ නීති රෙගුලාසි ඉදිරියටත් සකස් කිරීමේ කාර්යය වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සතුව ඇත.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම අපි මේ නියෝග ඉදිරිපත් කළේ මේ කාරණා නිසායි. මුහුදු ක්ෂීරපායී සතුන් අපේ මුහුදු තීරයේ බහුලව ජීවත් වෙනවා. ඒ වාගේම තල්මසුන්, ඩොල්ෆින් වැනි මත්ස්‍යයන් බලන්නට අපේ සංචාරකයන් නිරන්තරයෙන්ම මේ මුහුදු සීමාවේ ගැවසෙනවා. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හැටියට අපේ නිලධාරින් දැක්කා, මේ තල්මසුන්, ඩොල්ෆින් වැනි සතුන් බලන්නට එන සංචාරකයන් බෝට්ටු පාවිච්චි කිරීමේ දී අවිධිමත් ලෙස කටයුතු කරන ආකාරය. සතුන්ට අවහිරයක්, බාධාවක් වන ආකාරයට නුසුදුසු බෝට්ටු පාවිච්චි කරමින් සතුන්ගේ පැවැත්මට හානියක් වන ආකාරයෙන් තමයි ඔවුන් ක්‍රියා කර තිබෙන්නේ. ඒ වාගේම තල්මසෙකු නරඹන්නට අඩු ගණනේ මුහුදු සීමාවේ ඉඳලා මීටර් 100කට එහා යාම නරකයි. ඈත ඉඳලා බලන්නට ඕනෑ. ඒ වාගේම ඩොල්ෆින් මාළුවා නරඹන්නත් ගොඩ බිමේ ඉඳලා මීටර් 50ක් විතර දුරට තමයි යන්නට ඕනෑ. නමුත් පසු ගිය කාලවලදී මේ කාරණා සැලකිල්ලට නොගෙන ඩොල්ෆින් අසලම, තල්මසුන් අසලම බෝට්ටු ගැවසෙමින් අපේ රටට සුවිශේෂ සම්පතක් වන මුහුදු ක්ෂීරපායී සතුන්ට හානි වන ආකාරයට සංචාරකයන් කටයුතු කරනවා අපි දැක්කා. ඒ නිසා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හැටියට සතුන්ගේ පැවැත්ම සඳහා මේ නියෝග නිකුත් කරන්නට අප තීරණය කළා. මෙම නියෝග නිකුත් කිරීමෙන් අප බලාපොරොත්තු වන්නේ අපේ රටට සම්පතක් වන දුර්ලභ ගණයේ තල්මසුන්, ඩොල්ෆින් - මුහුදු ඌරන් - වැනි ක්ෂීරපායී සතුන් ආරක්ෂා කරන්නයි. මෙම නියෝග සම්මත කර ගැනීමෙන් පසුව මේ කටයුතු හරියාකාරව ක්‍රියාත්මක කරන්නට අපි බලාපොරොත්තු වනවා.

මේ අපේ රටේ සංචාරක ව්‍යාපාරය අපි දියුණු කරමින් පවතින අවස්ථාවක්. ඒ නිසා සංචාරක කර්මාන්තය දියුණු කරන්නටත් සතුන්ගේ ආරක්ෂාව අපට ඉතාම වැදගත් වනවා. සංචාරක කටයුතු ක්‍රමානුකූලව කරන්නටත්, ඒ වාගේම සංචාරයේ යෙදෙන අයට අපේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මාර්ගෝපදේශකත්වය ලබා දෙන්නටත් මේ මඟින් කටයුතු කරන්නට අපි බලාපොරොත්තු වනවා. ඒ වාගේම සංචාරක කර්මාන්තය දියුණු කිරීමේ දී දුර්ලභ ගණයේ තල්මසුන්, ඩොල්ෆින් ඇතුළු සත්ව විශේෂයන්ගෙන් අපි උපරිම ප්‍රයෝජන ගන්නටත්, ඒ වාගේම මේ සතුන් අපේ මුහුදු සීමාවේ තව තවත් සංවර්ධනය කරන්නටත් මේ නියෝග ඉතාම වැදගත් වනවා. ඒ නිසා ගොවිජන සේවා හා වනජීවී නියෝජ්‍ය අමාත්‍යවරයා හැටියට, අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමා, අධ්‍යක්ෂකතුමන්ලා ඇතුළු සියලු දෙනාම එකතු වෙලා මේ නියෝග හදා ඉදිරිපත් කිරීම පිළිබඳව මා ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම අපි ඉතාම හොඳින් මේ කටයුතු ඉදිරියට ගෙන යාමට බලාපොරොත්තු වන බවත් මේ අවස්ථාවේ දී ප්‍රකාශ කරන්නට කැමැතියි.

**[අ.භා. 2.30]**

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ තල්මසුන් සහ ඩොල්ෆින් නැරඹීමේ සංචාරක කර්මාන්තය ගැනත්, ඒ වාගේම තල්මසුන් සහ ඩොල්ෆින් සංරක්ෂණය උදෙසාත් ඉදිරිපත් කර ඇති නියෝග පිළිබඳව කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන මා සතුටු වනවා. මේ පිළිබඳව ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාගේ අවධානය යොමු කරවන්නට මා කැමැතියි. ඔබතුමා තල්මසුන් සහ ඩොල්ෆින් නැරඹීමේ සංචාරක ව්‍යාපාරය සහ ඒ වාගේම එහි සංරක්ෂණ වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීමේ නාමයෙන් නියෝග රැසක් ඉදිරිපත් කර තිබෙනවා. මා ඔබතුමාගෙන් මේ කාරණය ගැනත් අහන්නට කැමතියි. මාස 14ක් මුළුල්ලේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අධ්‍යක්ෂක ජනරාල්වරයෙක් නැහැ. මාස 14ක් මුළුල්ලේ අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් පත් කර ගන්නට බැරි වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මේ නියෝග ක්‍රියාත්මක කරන්නට කටයුතු කරන්නේ කොහොමද? ඇත්ත වශයෙන්ම මා ඔබතුමාට ප්‍රකාශ කරන්නට කැමැතියි, මෙම දෙපාර්තමේන්තුවේ පරිපාලන ක්ෂේත්‍රයේ බරපතළ කඩා වැටීමක් තිබෙන බව. කෙටියෙන්ම කියනවා නම් මාස 14ක් මුළුල්ලේ අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් පත් කර ගන්නට බැරි වුණු තත්ත්වයක් තුළ මේ නියෝග ක්‍රමවත්ව, පිළිවෙළකට සැලසුම් සහගතව ක්‍රියාත්මක කරන්නට කටයුතු කරන්නේ කොහොමද කියලා මා ප්‍රථමයෙන්ම ඔබතුමාගෙන් අහන්නට කැමැතියි.

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් -පිරිස් බලය, මානව සම්පත- අද ඉතාමත් දුර්වල මානසිකත්වයකිනුයි කටයුතු කරන්නේ. විශේෂයෙන්ම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර නිලධාරින් ගැනයි මම මේ කථා කරන්නේ. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ බීට්වුවල සේවය කරන, ඒ වාගේම ක්ෂේත්‍රයේ සේවය කරන නිලධාරි මණ්ඩලය අද ඉතාමත් දුර්වල තත්ත්වයකට පත් වෙලායි සිටින්නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, විසිහතර පැයම වනජීවීන්ගේ සංරක්ෂණය උදෙසා කටයුතු කරන මේ නිලධාරි මණ්ඩලයට අද ලැබිය යුතු ශක්තිය ලැබිලා නැහැ. සියලුම සම්පත් ටික බෙදන්නේ කොළඹ කේන්ද්‍ර කර ගෙන. පිට ප්‍රදේශවලට සම්පත් බෙදී යෑමක් නැහැ. විදේශ ශිෂ්‍යත්ව ලබා දෙන කොට අගනුවර තිබෙන මහා කාර්යාලයේ උසස්ම නිලධාරි මණ්ඩලය තමයි තීන්දු කරන්නේ, මේ ශිෂ්‍යත්වවලට යන්නේ, නොයන්නේ කවුද කියලා. බොහෝ දෙනෙක් යන්නේ ක්ෂේත්‍රයෙන් නොවෙයි. ඈත එපිට ප්‍රදේශවල වනජීවීන්ගේ සුරක්ෂාව වෙනුවෙන් ඇප කැප වෙන නිලධාරි මණ්ඩලය අද සම්පූර්ණයෙන් අමතක කරලා, අගනුවර ප්‍රධාන කාර්යාලයේ නිලධාරින් මේ වාගේ වැඩ කටයුතුවලට යොමු කිරීම නිසා අතිදුර්වල මානසිකත්වයක් අද

වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව තුළ තිබෙනවායි කියන එක කනගාටුවෙන් හෝ ඔබතුමාට ප්‍රකාශ කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, තල්මසුන් සහ ඩොල්ෆින් යන ක්ෂීරපායීන් සංරක්ෂණය කිරීම සඳහා වෙනමම ඒකක පිහිටුවීම වැදගත් වනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මා ඔබතුමාගේ අවධානය යොමු කරවීමට කැමැතියි, නොවැම්බර් සහ අප්‍රේල් යන මාස අතරතුර තමයි සංචාරක කර්මාන්තය සාර්ථකව ක්‍රියාත්මක වන්නේ කියන කරුණ කෙරෙහි. ඒ වාගේම විශේෂයෙන්ම කල්පිටිය, මිරිස්ස, දෙව්නුවර, ත්‍රිකුණාමලය, අලුත්ගම, අම්බලන්ගොඩ, උණවටුන, හික්කඩුව යන ප්‍රදේශ කේන්ද්‍ර කර ගෙන තමයි මේ සංචාරක කර්මාන්තය ක්‍රියාත්මක වෙන්නේ. විශේෂයෙන්ම මේ වාගේ තත්ත්වයක් තුළ වෙනමම ඒකකයක් ස්ථාපනය කර ඒ ඒකකය හරහා මේ සංරක්ෂණ වැඩ කටයුතු ක්‍රියාත්මක කිරීම උචිතයි; යෝග්‍යයි කියලා මම යෝජනා කරනවා.

මේ නියෝග, රෙගුලාසි, නීතිරීති පනවන්නට පෙර මම මේ කරුණ කියන්න කැමැතියි. ඩොල්ෆින් සහ තල්මසුන් සංරක්ෂණය කිරීමේ ජාත්‍යන්තර ආදර්ශ ගණනාවක් තිබෙනවා. සොලමන් දූපත්, ඕස්ට්‍රේලියාව හා නවසීලන්තය ගත්තොත් තල්මසුන් නැරඹීමේ සංචාරක කටයුතු සඳහා වසරකට සංචාරකයන්12,000ක් පමණ එනවා. දකුණු අප්‍රිකාවේ ඒ වාගේම ටොංගා රාජධානියේ හොඳ උදාහරණ, හොඳ ආදර්ශ ඕනෑ තරම් තිබෙනවා. පරිසර සංරක්ෂණ සහ ප්‍රජා සහභාගිත්ව සංචාරක කර්මාන්තය හරහා මේ තල්මසුන් සහ ඩොල්ෆින් සංරක්ෂණය කර ඒ සංචාරක කර්මාන්තය හරහා අපේ රටට හොඳ විදේශ විනිමයක් උපයා ගන්නේ කොහොමද? ඒ සංරක්ෂණය හරහා කොහොමද, ප්‍රේර කලාපීය එහෙමත් නැත්නම් මේ කර්මාන්තය ක්‍රියාත්මක වන බලප්‍රදේශවල ජනතාවට ප්‍රතිලාභයක් ලැබෙන ආකාරයට වැඩ කටයුතු ක්‍රියාත්මක කරන්නේ? ඇත්ත වශයෙන්ම ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ නියෝග, රෙගුලාසි, නීතිරීති පනවන්නට පෙර සොලමන් දූපත්වල, ඕස්ට්‍රේලියාවේ, නවසීලන්තයේ, දකුණු අප්‍රිකාවේ, ටොංගා රාජධානියේ වාගේ සාර්ථක සංරක්ෂණ වැඩ කටයුතු, සංරක්ෂණය ආශ්‍රිත සංචාරක කර්මාන්තය ක්‍රියාත්මක වන ඒ උදාහරණ පිළිබඳව අධ්‍යයනයක් කළාද? මම හිතන්නේ නැහැ, ඒ වාගේ අධ්‍යයනයක් සිදු වුණායි කියලා.

මම ඔබතුමාගේ අවධානය යොමු කරන්නට කැමැතියි, - [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය ඇමතිතුමා, සමා වෙලා මගේ කථාව අවසානයේ උත්තර දෙන්න. තල්මසුන් සහ ඩොල්ෆින් සංරක්ෂණ ව්‍යාපෘතිය දියත් කිරීමේ ප්‍රධාන වගකීම තිබෙන්නේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවටයි. නමුත් අද වන විට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව කරන්නේ වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත ක්‍රියාත්මක කිරීම නොව එම ආඥාපනතේ තිබෙන මූලික වගන්ති අමු අමුවේ උල්ලංඝනය කිරීමේ ක්‍රියාවයි. එයයි වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව කරන්නේ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාට උදාහරණ කියන්නම්. ඔබතුමා දන්නවා, මෙම ආඥාපනතේ 2(c) වගන්තියත්, 3(a) වගන්තියත් උල්ලංඝනය කරමින් නීති විරෝධී ලෙස සංචාරක කඳවුරු වනෝද්‍යාන ඇතුළේ ක්‍රියාත්මක කර තිබෙනවා කියලා. මොකක්ද 2(c) වගන්තියේ කියන්නේ? ජාතික වනෝද්‍යානයකට පැමිණෙන සියලු සංචාරකයන්ට පහසුකම් සැපයීමේ වගකීම තිබෙන්නේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවටයි. එහෙම නම් මේ ආඥාපනතේ 2(c) වගන්තිය අද අමු අමුවේ උල්ලංඝනය කරලා තිබෙනවා. මොකක්ද 3(a) වගන්තියේ කියන්නේ? 3(a) වගන්තියේ කියනවා, වනෝද්‍යානයක සැතපුමක් ඇතුළත බල ප්‍රදේශයේ හෝටල් කර්මාන්තය හෝ හෝටල් පහසුකම් සැපයීමේ කටයුතු ක්‍රියාත්මක කරන්න බැහැ කියලා. නීති විරෝධී සංචාරක කඳවුරු ස්ථාපනය කිරීම තුළින් මේ ආඥාපනතේ 3(a) වගන්තියත් අද අමු අමුවේ උල්ලංඝනය කරලා තිබෙනවා. මම මේ අවස්ථාවේ විශේෂයෙන්ම ස්තුතිවන්ත වෙනවා ගරු ජනාධිපතිතුමාට. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මේ ආඥාපනත අමු අමුවේ උල්ලංඝනය කරන්නට කටයුතු කළත්, එම දෙපාර්තමේන්තුව යාල ජාතික වනෝද්‍යානයේ ක්‍රියාත්මක වූ නීති විරෝධී සංචාරක කඳවුරු වෙනුවෙන් පුන පුනා කථා කළත් විශේෂයෙන්ම ජනාධිපතිතුමාගේ මැදිහත් වීම යටතේ, ජනාධිපති නියමයෙන් ඒ නීති විරෝධී කඳවුරු ක්ෂණිකවම ඉවත් කරනු ලැබුවා. ඒ පිළිබඳව මම ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙනවා. නමුත් හොඳට මතක තියාගන්න, යාල ජාතික වනෝද්‍යානයේ පමණක් නොවෙයි, මේ වාගේ නීති විරෝධී සංචාරක කඳවුරු ක්‍රියාත්මක වන්නේ කියන එක.

මේ වාගේ නීති විරෝධී සංචාරක කඳවුරු උඩවලවේ ජාතික වනෝද්‍යානයේත් ක්‍රියාත්මක වෙනවා. ඒවා ඉවත් කරන්න නියෝගයක් ඇවිල්ලා නැහැ. විල්පත්තු ජාතික වනෝද්‍යානයේත් එවැනි කඳවුරු ක්‍රියාත්මක වෙනවා. ඒවා ඉවත් කරන්න නියෝග ඇවිල්ලා නැහැ. ඒ වාගේම, කුමන සහ හෝර්ටන්තැන්න වනෝද්‍යානවලත් ඒ වාගේ වැඩසටහන් ක්‍රියාත්මක කරන්නට සැලසුම් සකස් වෙමින් පවතිනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මා මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්නට ඕනෑ. ඔබතුමා මගේ මිත්‍රයෙක්. මේ පුද්ගලිකව කරන පහර ගැසීමක් නොවෙයි. කරුණු කාරණා, හේතු, දත්ත, සංඛ්‍යා ලේඛන සහිතවයි මා මේ විවේචනය ඉදිරිපත් කරන්නේ.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ගරු මන්ත්‍රීතුමනි, මට තත්පරයක් දෙන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ කථාවේදී පිළිතුරු සපයන්න. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, තල්මසුන් සංරක්ෂණය කරන්න, ඩොල්ෆින් සංරක්ෂණය කරන්න වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හරහා නියෝග නිකුත් කරන්නේ කොහොමද? ඔබතුමා යටතේ තිබෙන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත අමු අමුවේ උල්ලංඝනය කරනවා. මම ඔබතුමාට උදාහරණ ඉදිරිපත් කරන්නම්. දැන් බලන්න ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, විල්පත්තු ජාතික වනෝද්‍යානය හරහා 2010 ජනවාරි මාසයේ පාරක් කපලා තිබෙනවා. එහෙම පාරක් කපනවා කියන්නේ වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතේ 6වැනි වගන්තිය අමු අමුවේ උල්ලංඝනය කිරීමක්. ඇයි මේවා ඉදිරියේ ඔබතුමා නිහඬව ඉන්නේ කියන එක මම අහන්න කැමැතියි. අනවසරයෙන් සතුන් ඇති කිරීම වැළැක්වීම සඳහා කඩා පැනීමේ හමුදාවක් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ තිබුණා. අද ඒ හමුදාව විවිධ දේශපාලන බලපෑම් නිසා සම්පූර්ණයෙන්ම අකර්මණ්‍ය වෙලා, ක්ෂය වී ගොස් තිබෙනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මා තවත් පුංචි කාරණාවක් ඔබතුමාට කියන්නම්. වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 42වැනි වගන්තියේ VIII වන උපලේඛනයේ සඳහන් වෙලා තිබෙනවා, කොතල හිඹුටු ගස ආරක්ෂා කළ යුතු ගසක් බව, සුදු හඳුන් ගස ආරක්ෂා කළ යුතු ගස් වර්ගයක් බව. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාම දන්නවා ඒ ගැන. කොතල හිඹුටුවල විද්‍යාත්මක නාමය, *Salacia reticulata*. 2012 මාර්තු මාසයේ වැඩ බලන වනජීවී අධ්‍යක්ෂවරයා, අමාත්‍යාංශ ලේකම්වරයා නීත්‍යානුකූල නොවන ලිපියකින් අවසර ලබා දී තිබෙනවා කොතල හිඹුටු ඖෂධ පැළෑටිය ඕනෑ ඕනෑ විදියට කපලා අපනයනය කරන්නට. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා දන්නවාද ඒ ගැන? මොකක්ද ඒකට හේතුව? විෂය දන්නා, හැකියාව ඇති වනජීවී අධ්‍යක්ෂ ජනරාල්වරයෙකු නොමැති වීම නිසා තමයි මේ මහා හානිය වනජීවී ක්ෂේත්‍රයට සිද්ධ වෙන්නේ.

[ගරු සජිත් ප්‍රේමදාස මහතා]

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, තල්මසුන් ආරක්ෂා කරන්නට, ඩොල්ෆින් ආරක්ෂා කරන්නට ඔබතුමා රෙගුලාසි පනවනවා. උඩවලවේ ජාතික වනෝද්‍යානයට, රුහුණු ජාතික වනෝද්‍යානයට, ලුණුගම්වෙහෙර ජාතික වනෝද්‍යානයට, දහයියාගල අභයභූමියට ප්‍රේර කලාපයක්ව තිබෙන බෝගහපට්ටිය ප්‍රදේශය -විශේෂයෙන්ම අලි සම්පතට වැදගත් ප්‍රදේශයක්- ගොල්ෆ් පිටියක් හදන්නට වෙන් කරන කොට ඇයි ඔබතුමා නිහඬ? රිටිගල ප්‍රදේශයේ අලි අනාථාගාරයක් පිහිටුවා තිබෙනවා. නමුත් අද වන තුරු ජල සම්පත නැහැ. අද වන තුරු වැවක් නැහැ; වතුරත් නැහැ. ඔබතුමා දන්නවා උඩවලවේ අලි අනාථාගාරය බොහොම සාර්ථක ව්‍යාපෘතියක් බව. උඩවලවේ ජලාශය ආශ්‍රිතවයි ඒක තිබෙන්නේ. කාගේ අනුදැනුම මතද කිසිම ජල පහසුකමක් නැතුව රිටිගල අලි අනාථාගාරයක් ඉදි කළේ? අලි නාවන්න කිසිම පහසුකමක් නැහැ. අලින්ට අවශ්‍ය ජල සම්පත ලබා දෙන්නට කිසිම හැකියාවක් නොමැතිව කෝටි ගණන් වැය කරලා රිටිගල අලි අනාථාගාරයක් හැදුවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අද අලි මිනිස් ගැටුම අවම කරන්නට විදුලි වැටවල් ස්ථාපනය කරන්නේ කිසිම ක්‍රමවත් විධියකට නොවෙයි. කිසිම ක්‍රමවත් වැඩ පිළිවෙළක් නැහැ. දේශපාලනඥයන්ගේ හිතුවක්කාරකම්, සිතුවිලි මුදුන්පත් කර ගෙන අද අලි වැටවල් බිහි වෙනවා. එහෙම නොවෙයි ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අලි වැටවල් ස්ථාපනය කරන්න නම් සැලැස්මක් තිබෙන්නට ඕනෑ. අලි ගමන් කරන මාර්ග - elephant corridors - හඳුනා ගෙන විදුලි වැටවල් ස්ථාපනය කිරීමේ වැඩසටහනක් අද රටේ ක්‍රියාත්මක වෙන්නේ නැහැ. මොන යම් හෝ අර්බුදයක් වෙලා අලි මිනිස් ගැටුම ඉස්මතු වන කොට ඔබතුමා එතැනට ගිහිල්ලා, "අපි මෙතන විදුලි වැට හදමු; අතැන විදුලි වැට හදමු"යි කියනවා. ඒක ක්‍රමවත් වැඩසටහනක් නොවෙයි. ඒ වාගේම මා ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි, විදුලි වැටක් ක්‍රමවත් විධියට ක්‍රියා කරන්නට නම් පරිසර හිතකාමී අගලක් සහිතව ඒක ඉදි වෙන්නට ඕනෑය කියන කාරණයට. නැත්නම් ඒක ක්‍රියාත්මක වෙන්නේ නැහැ; ඇත්ත වශයෙන්ම ඒක කෙරෙන්නේ නැහැ. ඔබතුමා කරුණාකරලා ක්ෂේත්‍රයට ගිහිල්ලා බලන්න. අද විදුලි වැටවල් ස්ථාපනය කිරීම, විදුලි වැටවල් නඩත්තු කිරීම ලොකු ප්‍රශ්නයක් බවට පත් වී තිබෙනවා. අලි මංකඩ හඳුනා ගෙන, අලි ගමන් ගන්නා මාර්ග හඳුනා ගෙනයි ජාතික මට්ටමේ විදුලි වැටවල් ස්ථාපනය කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා සැබැවින්ම මේ රටේ වනජීවී ක්ෂේත්‍රය -වනජීවීන් ඇතුළු සතා සිවුපාවා- ආරක්ෂා කිරීමේ වගකීම ඉටු කරනවා නම්, කරුණාකරලා ජාතික වනජීවී සැලැස්මක් - national wildlife plan එකක් - කළමනාකරණ ක්‍රමයක් - management system එකක්- ස්ථාපනය කිරීමට කටයුතු කරන්න ඕනෑ. මම ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරවන්නට කැමැතියි. හිතු මතේට, තමන්ට හිතුණු අවස්ථාවක, තමන්ට හිටි හැටියේ හිතට අදහසක් ආපු විගසින් අලි වැටවල් ගහලා සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරලා කිසි සේත්ම වන සතුන් ආරක්ෂා කරන්නට බැහැ; අලි මිනිස් ගැටුම නතර කරන්නටත් බැහැ. ඒකෙන් එක දෙයයි සිද්ධ වෙන්නේ. මුදල් සම්භාරයක් වැය කරලා, ඒකෙන් ගසා කන්න පුළුවන්කම ලැබෙනවා. මා කියන්නේ නැහැ ඔබතුමා ගසා කනවා කියලා. නමුත් විවිධ පුද්ගලයන්ට ගසා කන්න පුළුවන්. අද පැහැදිලි ජාතික සැලැස්මක් නොමැති නිසා ගසා කෑමේ වනජීවී සංරක්ෂණ වැඩසටහනක් තමයි අපේ රටේ ක්‍රියාත්මක වෙන්නේ.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කිව්වා, වනජීවී දෙපාර්තමේන්තුව අද කෘතහස්ත සේවාවක් ක්‍රියාත්මක කර ගෙන යනවා කියලා. ක්ෂේත්‍රයේ සිටිනා බහුතරයක් වනජීවී සංරක්ෂණය වෙනුවෙන් ගැටුම්කාරී වාතාවරණයක් තුළ ජීවිතය පරදුවට තබා අති විශිෂ්ට වූ, අද්විතීය සේවාවක් කරනවා. මා ඒක පිළිගන්නවා. නමුත් මා මේ කථා කරන්නේ ප්‍රධාන කාර්යාලයේ පුටු රත් කරකර රට වෙනුවෙන් සංරක්ෂණ සැලසුම් හදන නිලධාරීන් ගැනයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මුඛ්‍ය අරමුණ වන්නේ වන ජීවීන් සුරක්ෂා කිරීම නම්, මා අහන්න කැමැතියි, ඔබතුමාගේ දිස්ත්‍රික්කයේ අනුරාධපුරය, නොච්චියාගම, මහවැලි "එච්" කලාපයට අයත් මහවැලි රක්ෂිතයේ අද මොකක්ද සිද්ධ වන්නේ කියලා. අක්කර 48ක් ආවරණය කරමින් රුපියල් කෝටි 30ක් වැය කරලා වනජීවී රක්ෂිතයක් තුළ "Forest Rock Garden" කියලා අද හෝටල් කර්මාන්තය ක්‍රියාත්මක වනවා. ඒ භූමි භාගය තුළ අක්කර 20ක මහා පරිමාණයේ කළු ගල් ක්වොරි එකක් ක්‍රියාත්මක වනවා. අන්දරවැව රක්ෂිතය පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. මෙම රක්ෂිතය පිළිබඳව ඔබතුමා හොඳට දන්නවා. විල්පත්තුව ජාතික වනෝද්‍යානයේ සිට තලාව මහමුකලානටත්, ගල්ගමුව ප්‍රදේශයටත් අලි සංක්‍රමණය වීම සිදු වන්නේ මෙම රක්ෂිතය හරහායි. අන්දරවැව, පහමුනේගම වැව, හැලඹ වැව, ඉලන්දක්කුලම වැව, සීරම්බාගමවැව යන වැව් රාශියක්ම පෝෂණය වන්නේ මෙම රක්ෂිතයෙන් බව මා ඔබතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි.

සෝමාවතිය ජාතික වනෝද්‍යානයේ අක්කර 6,110ක් කන්දකාඩු කෙසෙල් ව්‍යාපෘතිය සඳහා ඩෝල් නමැති බහු ජාතික සමාගමකට වෙන් කර දීලා තිබෙන්නේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව අහක බලා ගෙන ඉන්නකොටද කියන එක මා අහන්න කැමැතියි. ඒ වාගේම අද මඩු අභය භූමියේ ගස් කැපීම සිද්ධ වනවා. ඒ වාගේම මා ඔබතුමාට කියන්න කැමැතියි, මාදු ගඟ අභය භූමියේ නීති විරෝධී හෝටල් හැදෙනවාය; මන්නාරම යෝධ වැව අභය භූමියේ හෝටල් හැදීම සිදු වනවාය කියලා.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. යන්න, මාතලේ දිස්ත්‍රික්කයට. යන්න, සීගිරිය අභය භූමියට. සීගිරිය අභය භූමියේ ඉඩම් බිම් සවිය වැඩසටහන යටතේ එක් එක් පොහොසත් පුද්ගලයින්ට, ධනවතුන්ට, අගනුවර සිටින ධන කුවේරයන්ට බෙදා දෙන වැඩසටහනක් අද ක්‍රියාත්මක වනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කරුණාකරලා සීගිරිය අභය භූමියට ගිහින් ඒ අභය භූමිය තුළ සිදු වන මේ මහා ඉඩම් කොල්ලය, මේ මහා ඉඩම් ජාවාරම පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්නය කියලා මා මේ අවස්ථාවේදී යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මා ඔබතුමාගෙන් වැදගත් ප්‍රශ්නයක් අහන්න කැමැතියි. ඔබතුමා දන්නවා, මා උපදේශක කාරක සභාවට ඇවිල්ලා ඔබතුමාට බලවත් යෝජනාවක් කළ බව. ඒ තමයි ඉක්මනින්ම අලි සංරක්ෂණ සැලැස්මක් ක්‍රියාත්මක කිරීම සඳහා අලි සංගණනයක් ක්‍රියාත්මක කරන්නය කියන එක.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
අපි සංගණනයක් කළා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මා ඔබතුමාට ස්තුතිවන්ත වනවා, මගේ එම යෝජනාව පිළිගෙන අමාරුකම්, දුෂ්කරතාවන් රැසක් මැද්දේ අලි සංගණනය ක්‍රියාත්මක කිරීම ගැන. අගෝස්තු 11 දිනත්, 13 දිනත් අතර ඒ වැඩසටහන ක්‍රියාත්මක කළා. නිලධාරීන් 4,000ක් උපයෝගී කර ගෙන, රුපියල් මිලියන 25කට වැඩි මුදලක් වැය කරලා ස්ථාන 1,500ක ඒ සංගණනය ක්‍රියාත්මක කරලා, අන්තර්කාලීන වාර්තාව දෙසැම්බර් මාසයේත්, ජනවාරි මාසයේත් එළි දැක්වූවා. අවසන් වාර්තාව 2012 ජුනි මාසයේ එළි දැක්වූවා. මා ඔබතුමාගෙන් වැදගත් ප්‍රශ්නයක් අහන්න කැමැතියි. මා ඔබතුමාගෙන් පුනපුනා ඇහුවා, මේ සංගණන වාර්තාව ජනතාවගේ දැන ගැනීමට ඉදිරිපත් කරන්නේ නැත්තේ ඇයි කියලා. අදටත් මේ වාර්තාව රහසක්. අදටත් මේ වාර්තාව නිකුත් කරලා නැහැ. නමුත් මේ වාර්තාව මා සතුව තිබෙනවා. මා කෙසේ හෝ මේ වාර්තාව සොයා ගත්තා. මා උපදේශක කාරක සභාවට ගිහින් මේ වාර්තාව ඉල්ලනකොට

දුන්නේ නැහැ. මහ හැරියා; කල් මැරුවා. එසේ කළේ ඔබතුමා නොවෙයි; නිලධාරින්. මෙන්න වාර්තාව. මා එය ලබා ගෙන තිබෙනවා. නමුත් අද වන විටත් පොදු මහත් ජනතාවගේ දැන ගැනීමට මේ වාර්තාව නිකුත් කරලා නැහැ. මා ඔබතුමාගෙන් අහන්න කැමැතියි, මේ වාර්තාව හොර රහසේ තබා ගෙන ඉන්නේ ඇයි, මේ වාර්තාව නිකුත් කරන්නේ නැත්තේ ඇයි කියලා. [බාධා කිරීමක්] පන්නලා දෙන කථාවක් නොවෙයි. මා ඔබතුමාට කියන්න කැමැතියි, මේ වාර්තාව නිකුත් නොකරන්න හේතුව මොකක්ද කියලා. මේ වාර්තාවේ කතුවරුන් හැටියට එක් එක් නිලධාරින්ගේ නම් යොදා ගන්නට අවස්ථාව නොදුන්නු නිසා මේ වාර්තාව මාස ගණනාවක් මුළුල්ලේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව තුළ පුස් කකා තිබෙනවා. මේ වාර්තාව නිකුත් කරන්නේ නැත්තේ ඇයි? [බාධා කිරීමක්] පන්නලා දෙන කථාවක් නොවෙයි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාට කියන්න කැමැතියි මේ වාර්තාව නිකුත් නොකරන්න හේතුව මොකක්ද කියලා. එක් එක් නිලධාරින්ට මේ වාර්තාවේ කතුවරු හැටියට නම් යොදා ගන්නට අවස්ථාව නොදුන්න නිසා මේ වාර්තාව මාස ගණනාවක් මුළුල්ලේ වනජීවී දෙපාර්තමේන්තුව තුළ පුස් කකා තිබෙනවා. මේ වාර්තාව නිකුත් නොකරන්නේ ඇයි? මේ වාර්තාව හංගා ගෙන ඉන්නේ ඇයි? මේ වාර්තාව හංගා ගෙන ඉන්න හේතුව මොකක්ද? මේ වාර්තාවේ කතුවරුන් හැටියට වනජීවී දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ නම් වැටුණේ නැති නිසාද මේක එළි දක්වන්නේ නැත්තේ කියලා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ඩොල්ෆින් සංරක්ෂණය කරන්න, තල්මසුන් සංරක්ෂණය කරන්න කොපමණ උත්සාහ කළත්, ඒ මොනවා කරන්නටත් ඉස්සර වෙලා කළ යුතු කාර්යයක් තිබෙනවා. අඩුම ගණනේ වනජීවී දෙපාර්තමේන්තුවට මාස 14ක් මුළුල්ලේ පත් කරන්න බැරි වුණු අධ්‍යක්ෂ ජනරාල්වරයා පත් කරන්න.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Order, please! Hon. Member, please wind up now. Your time is over.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
How long do I have, Sir?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Your time is over. You had 17 minutes allotted to you. You have taken an additional five minutes from the time allotted to the Hon. Dayasiri Jayasekara.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, could you please give me one more minute because I want to wind up?

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Okay. Please wind up.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මගේ මිත්‍රයා. තරහින් නොවෙයි මම මේ අදහස් ඉදිරිපත් කළේ. මේවා සත්‍ය තොරතුරු. සැබැවින්ම වන සතුන්ට ආදරය කරන, මේ රටේ වනජීවී ක්ෂේත්‍රයට ආදරය කරන පුද්ගලයෙක් හැටියටයි මම මේ කරුණු කාරණා ඔබතුමාට ඉදිරිපත් කළේ. මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකරලා විෂයය ගැන දන්නා, දැනුමක් තිබෙන, හැකියාවක් තිබෙන, ක්ෂේත්‍රයට ආදරය කරන, ක්ෂේත්‍රයට සම්පත් බෙදා දෙන, මේ රටේ සැබැවින්ම ජාතික වනජීවී සැලැස්මක් නිර්මාණය කිරීමේ හැකියාවක් තිබෙන අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් මේ දෙපාර්තමේන්තුවට පත් කරන්න කියලා. මාස 14ක් තිස්සේ ඒ පත් කිරීම කරලා නැහැ. ඒකට හේතුව මොකක්ද? මාස ගණනාවකින් අලි සංගණන වාර්තාව ඉදිරිපත් කරලා නැහැ. ඒකට හේතුව මොකක්ද? ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාට කියන්න කැමැතියි ඩොල්ෆින් සහ තල්මසුන් සංරක්ෂණය කරන්නට පෙර වනජීවී දෙපාර්තමේන්තුවේ ඉහළ නිලධාරින්ගේ කාර්යක්ෂමතාව තහවුරු කරන්න කටයුතු කරන්න කියලා. ඔබතුමා ඒ අයට දෙන්න පුළුවන් උපරිම නියෝග, උපදෙස් ලබා දීලා මේ වනජීවී සංරක්ෂණ ක්ෂේත්‍රය වැඩිදියුණු කරන්නට, සුරක්ෂා කරන්නට කටයුතු කරන්න.

ජනාධිපතිතුමාගේ නියෝගය පරිදි යාල ජාතික වනෝද්‍යානයේ ඒ නීත්‍යානුකූල නොවන කඳවුරු ඉවත් කළා වාගේම කරුණාකරලා උඩවලවේ ජාතික වනෝද්‍යානයේත්, විල්පත්තු ජාතික වනෝද්‍යානයේත්, ඒ වාගේම කුමන සහ හෝර්ටන් තැන්නේත් යෝජිත නීත්‍යානුකූල නොවන සංචාරක කඳවුරු බිම් සම්පූර්ණයෙන් හකුළා ගන්නට ක්ෂණික නියෝගයක් ලබා දෙන්න කියලා මේ අවස්ථාවේදී මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට අදහස් දැක්වීමට අවස්ථාවට ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව නිම කරනවා.

**[අ.භා. 2.54]**

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා (වරාය හා මහාමාර්ග නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன - துறைமுகங்கள், நெடுஞ்சாலைகள் பிரதி அமைச்சர்)
(The Hon. Rohitha Abeygunawardana - Deputy Minister of Ports and Highways)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ සමුද්‍ර ක්ෂීරපායී සතුන් නැරඹීම සඳහා නියෝග නිකුත් කරන අවස්ථාවේදී විශේෂයෙන්ම සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා සද්භාවයෙන් මේ ගැන ලොකු විග්‍රහයක යෙදුණා. අපත් එතුමාට සද්භාවයෙන් පිළිතුරු දීමට බැඳී සිටිනවා. සාමාන්‍යයෙන් මේ වනජීවී -වන සත්ව- කියන කොට, සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාට ඒකට ලොකු සම්බන්ධකමක් තිබෙනවා. මා හිතන හැටියට එතුමා ඒ ගැන ලොකු අවධානයක් යොමු කරලා තිබෙනවා. පාසල් යන කාලයේ පටන් අපට අහන්න ලැබිලා තිබෙනවා එතුමා හුඟක් වෙලාවට යාල වනෝද්‍යානයට ගිහිල්ලා ඒ අලි සංරක්ෂණය කිරීම ගැන, අලි බලා ගැනීම ගැන ලොකු අධ්‍යයනයක යෙදුණා කියලා. හැබැයි එතුමාට අද වෙන කොට අලි ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ප්‍රශ්නය තමයි රටේ කැලෑවල ඉන්න අලියි, සිරිකොතේ ඉන්න අලියි ගැන තිබෙන ප්‍රශ්නය. [බාධා කිරීමක්] අන්න හරි. සිරිකොතේ අලි එකෙක්වත් කියන දේ අහන්නේ නැහැ. ඒ එකෙක්වත් සංරක්ෂණය කරන්න පුළුවන්කමක් ඇත්තෙත් නැහැ. හැබැයි දැන් ඒකේ හොඳ අලි

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

නැහැ, ඔය දයාසිරි මන්ත්‍රීතුමා වාගේ හොඳ අලියෙක් දෙන්නෙක් හිටියාට. ඉතුරු අලි ඔක්කොම හීලෑ වුණ, උඩවලවේ ඉන්නවා වාගේ හිඟන අලි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
විල් අලි.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ඔව්. විල් අලි. එහෙම අලි තමයි ඉන්නේ. හැබැයි දැන් එතුමාට - [බාධා කිරීමක්] වල් අලි නොවෙයි, විල් අලි. වල් අලි නැහැ. ඒ නිසා මේ අවස්ථාවේ අප එතුමාට මේ කාරණය පැහැදිලි කරන්න ඕනෑ. එතුමා කිව්වේ වනජීවී දෙපාර්තමේන්තුවෙන් මේ රටට කිසිම දෙයක් සිදු වන්නේ නැහැ කියලායි.

ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමනි, ඔබතුමා බොහොම පැහැදිලි ලෙස කිව්වා මේ කොතල හිඹුටු පැළෑටිය ඕනෑ ඕනෑ විධියට කපලා අපනයනය කරන්නට අමාත්‍යාංශයේ ලේකම්වරයා නීත්‍යනුකූල නොවන ලිපියකින් අවසර දීලා තිබෙනවාය කියලා. ගරු නියෝජ්‍ය ඇමතිතුමා මේ සභාවේ ඉන්නවා. ඒ වාගේම අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු ප්‍රධාන නිලධාරින් ඉන්නවා. මා වග කීමකින් කියනවා, මේ වන කොට කොතල හිඹුටු සම්බන්ධයෙන් එවැනි කිසිම අවසරයක් අමාත්‍යාංශය දීලා නැහැ කියලා. [බාධා කිරීමක්] අධ්‍යක්ෂ ජනරාල්තුමා එවැනි කිසිම අවසරයක් දීලා නැහැ. මා පාර්ලිමේන්තුවේදී මේක වග කීමකින් කියනවා. [බාධා කිරීමක්] වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල්වරයා එවැනි අවසරයක් දීලා නැහැ. ඔබතුමාට ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශයෙන් සහ වනජීවී දෙපාර්තමේන්තුවෙන් වැරදි තොරතුරු එන බව අද මේ සභාවට පැහැදිලි වුණා. තවම උපදේශක කාරක සභාවට ඉදිරිපත් නොකරපු පොතක් තමුන්නාන්සේගේ අතට ආවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අමාත්‍යාංශ ලේකම්තුමනි, මේවා ගැන වැඩි අවධානයක් යොමු කරන්න. තමුන්නාන්සේලා මේ පොත එළියට දුන්නේ නැත්තේ තමුන්නාන්සේලා තවම කරලා තියෙන සංගණනයේ නිවැරදි තොරතුරු ඒකේ නැති නිසායි. [බාධා කිරීමක්] ඔහොම ඉන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
එහෙම නම් මුද්‍රණය කළේ ඇයි?

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ඔහොම ඉන්න, ඔහොම ඉන්න. බලන්න කෝ. තාත්තාට ඉවසාගෙන ඉඳීමේ ගතියක් තිබුණා. [බාධා කිරීමක්] මම ඉතින් උත්තර දෙනවා නේ. මුද්‍රණය කරන්න පුළුවන්. සමහර නිලධාරින්ගෙන් අමාත්‍යාංශයට තොරතුරු ආවාම පොත මුද්‍රණය කරනවා. නමුත් මුද්‍රණය කළාට පස්සේ එහි තියෙන තොරතුරු සද්භාවයකින් දීලා නැත්නම්, එහි තිබෙන්නේ සත්‍ය තොරතුරු නොවෙයි නම් ඒක වෙනස් කරන්න අමාත්‍යාංශයට සිද්ධ වනවා. ඒ නිසා තමයි එතුමන්ලා තවම පොත අතිගරු ජනාධිපතිතුමාට ඉදිරිපත් කරන්නවත් එළියට දුන්නේ නැත්තේ.

ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ උපදේශක කාරක සභාවට සහභාගි වන්න. ඔය පොත හංගාගෙන හිටියාය කියලා මේ නියෝජ්‍ය ඇමතිතුමාට හම්බ වෙන තෑග්ග මොකක්ද? ඔය පොත හංගාගෙන හිටියාය කියලා මේ ඉන්න රාජ්‍ය නිලධාරින් ලබන වරප්‍රසාදය මොකක්ද? [බාධා කිරීමක්]

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඇයි, හංගාගෙන ඉන්නේ?

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
හංගාගෙන හිටියේ නැහැ. එහි යම් වරදක් තියෙන නිසා නේ එළියට දුන්නේ නැත්තේ. තමුන්නාන්සේ ඇයි හොරෙන් ගෙනාවේ? දැන් තමුන්නාන්සේට විරුද්ධව විනය පරීක්ෂණයක් පවත්වන්න ඕනෑ. මේ රටේ හිටපු ජනාධිපතිවරයකුගේ පුතෙක් හැටියට එක එක තැන්වලට හොරෙන් රිංගන එක හරිද කියලා බලන්න. ඒක එපමණ සුබවාදී නැහැ නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
හොරෙන් නොවෙයි.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
හොරෙන් නොවෙයි නම් ඔය පොත ආවේ කොහොමද? තමුන්නාන්සේට තැපෑලේ එව්වාද? [බාධා කිරීමක්] ඇත්ත කථාව නොවෙයි. තමුන්නාන්සේ අමාත්‍යාංශයේ කාව හරි අල්ලා ගන්නවා. අල්ලාගෙන ගෙන්වා ගන්නවා. [බාධා කිරීමක්] ඊකට කියන්නේ "සද්භාවයෙන් හොරකම් කිරීම" කියලායි. සද්භාවයෙන් නේ ඔක්කොම කරන්නේ. [බාධා කිරීමක්] මම තමුන්නාන්සේට බාධා කළේ නැහැ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සත්‍යය හෙළි කළේ.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
සද්භාවයෙන් මා සත්‍යය හෙළි කරන්නම්.
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙතුමා දැන් යාල වනෝද්‍යානය ගැන කථා කළා. දැන් අවුස්සා ගත්තා. යාල වනෝද්‍යානය ගැන කථා කරන කොට මේ කාරණයත් කියන්නට ඕනෑ. අතිගරු ජනාධිපතිතුමා පසු ගිය දවසේ හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ රැස්වීමේදී විෂය භාර ඇමතිවරයාට නියෝගයක් දුන්නා, යාල වනෝද්‍යානයේ තියෙන ඒ කඳවුරු මොන සමාගමකට අයිති වුණත් කමක් නැහැ, ඒ සියල්ලම ඉවත් කරන්න කියලා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ඒකට මම ස්තුති කළා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
අපට මතකයි, මෙතුමාගේ පියා ඉන්න කාලයේ යාල වනෝද්‍යානයට හෙළිකොප්ටර් යානාවල් බැස්සුව බව. තවම තිබෙනවා ඒ කාලවල කරපු දේවල්. දැන් මේ වීදුරු ගේ ඇතුළේ ඉඳගෙන තමයි ගල් ගහන්නේ. ඔබතුමා ඕනෑ නම් ඒකටත් කියාවි, "තාත්තා ඒක කරන කොට මම පුංචියි" කියලා. දැන් මොකුත් නොවුණු විධියට කථා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි බොහොම පැහැදිලි ලෙස අද ගෙනෙන නියෝග සම්බන්ධයෙන් මේ කාරණය කියනවා. අපි මේ රටේ සංචාරක ව්‍යාපාරයත් රැක ගන්න ඕනෑ. සංචාරක ව්‍යාපාරය කියලා කියන්නේ අපේ රටේ ආර්ථිකයට ලොකු පිටුවහලක් වෙන කර්මාන්තයක්. මෙතුමා කියනවා, සමහර තැන්වල හෝටල් ඉදි වෙනවා කියලා. අපි එහෙම කියන්නේ නැහැ. වනජීවී දෙපාර්තමේන්තුවේ තියෙන අණපනත් අනුව අපේ වන උද්‍යානයක් ඇතුළේ සංචාරක හෝටලයක්, නිවාඩු නිකේතනයක් තිබෙනවා නම් ඒක වැරැදියි. ඒක ඉවත් කළ යුතුයි කියලායි අපි කියන්නේ. හැබැයි වන උද්‍යානයකට අයිති නොවන, වනජීවී දෙපාර්තමේන්තුවට අයිති නොවන තැනක හෝටලයක් ඉදි කරනවා නම් ඒක දිහා වැරැදි විධියට බලන එක වැරැදියි. 2013 වර්ෂයට සංචාරකයෝ මිලියනයක් ලංකාවට ගෙන්වා ගන්න අපි ඉලක්ක කරලා තිබෙනවා. ඒ වෙනුවෙන් සංචාරක කර්මාන්තය ශක්තිමත් වෙන්න ඕනෑ. ඒ වෙනුවෙන් කාමර ඉදි වෙන්න ඕනෑ. සංචාරක නිවාඩු නිකේතන ඉදි වෙන්න ඕනෑ. ඒ නිවාඩු නිකේතන වනජීවී දෙපාර්තමේන්තුවට අයත් ප්‍රදේශවලට ළං වෙලා තියෙන්න ඕනෑ. හැබැයි මෙතුමන්ලා ඒවා දිහා බලන්නේත් වෛරයෙන් නම්, ඊර්ෂ්‍යාවෙන් නම් කවදාවත් මේකට පිළිතුරක් හම්බ වෙන්නේ නැහැ. ඊර්ෂ්‍යාව, වෛරය පෙරදැරි කර ගත් දෙයක් විතරයි එතුමන්ලා තුළ ක්‍රියාත්මක වන්නේ. ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා සභාවෙන් එළියට යන්න ඉස්සෙල්ලා එතුමාට අපි තව උත්තර දෙන්න ඕනෑ. ඇයි යන්නේ?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
පොඩ්ඩක් එළියට යන්නේ. මම ආපහු එනවා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ඕක තමයි ඉතින් හැම දාම වෙන්නේ. කට්ටිය අතරමං කර මාරු වෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
නැහැ, ආපහු එනවා.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
හැම දාම කළේ ඕක නේ. අපේ මිත්‍රයෝ කීප දෙනෙක් ඕකට අහු වුණා. ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා මොකද හොරට හිනා වෙන්නේ? ඒක ඇත්ත නේ. ඕක තමයි එතුමා හැම දාම කරන්නේ. ඒ අයට රනිල් වික්‍රමසිංහ මහත්තයාත් එක්ක ඉන්න දෙන්නේ නැතිව, මොකක් හරි කුත්තු කරලා මාරු වෙනවා. ඊට පස්සේ හිතේ සද්භාවයක් නැතිව ලොක්කාට පක්ෂව අත්සන් කරන්න වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය 1,500ක් පමණ තමන්ගේ රාජකාරිවල නියැලී සිටිනවා. ඒ කාටවත් මානසික ආතතිය නැහැ. එහෙම දෙයක් නැහැ. ඒ අය තමන්ගේ රාජකාරිය හරියාකාරව ඉටු කරනවා. ඒ වාගේම මේ වන විට උපාධිධාරීන් 40,000ක් අතිගරු ජනාධිපතිතුමාගේ සංකල්පයක් අනුව අපි රජයේ සේවයට බඳවා ගත්තා. ඒ උපාධිධාරීන්ගෙන් 50කට ආසන්න පිරිසක් මේ වන විට මේ අමාත්‍යාංශයට අනුයුක්ත කරලා තිබෙනවා. ඒ නිසා මේ අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු ටික ඉතා හොඳින් ක්‍රියාත්මක කෙරෙනවා. ඒ නිලධාරීන් ඔවුන්ගේ යුතුකම සහ වගකීම හරියට ඉටු කරන බව අපි මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම ඩොල්ෆින් සහ තල්මසුන් ගැන කථා කරද්දී, ගරු ධීවර නියෝජ්‍ය ඇමතිතුමා මෙතැන ඉන්න නිසා එතුමාටත්, අමාත්‍යාංශයේ ලේකම්තුමාටත් මේ කරුණු ඉදිරිපත් කරන්න ඕනෑ. විශේෂයෙන් ධීවර කර්මාන්තයට සම්බන්ධ ප්‍රදේශයක් නියෝජනය කරන මහජන නියෝජිතයකු හැටියට මම දැකලා තිබෙනවා, සංචාරක ව්‍යාපාරයත් එක්ක බද්ධ වෙච්ච අය මේ කර්මාන්තය හරියාකාරව ඉටු කරන ආකාරය. ඔවුන් කවදාවත් මේ සතුන්ට හිංසාවක් කරන්නේ නැහැ. ඒකට හේතුව ඔවුන්ගේ ආර්ථිකය ගැට ගැසිලා තිබෙන්නේ මේ සතුන් එක්ක නිසායි. ඩොල්ෆින් පෙන්වලා, ඒ වාගේම තල්මසුන් පෙන්වලා තමයි ඔවුන් මේ කර්මාන්තය කරන්නේ. ඔවුන්ගෙන් මේ සතුන්ට ප්‍රශ්නයක් වන්නේ නැහැ. නමුත් ඔවුන්ගෙන් සමහර අය වැරැදි කරනවා ඇති. ධීවර කර්මාන්තයේදී ඩොල්ෆින්ට "මුහුදු ඌරා" කියලා නමක් පට බැඳලා තිබෙනවා. සාමාන්‍යයෙන් පෞරාණික ධීවරයන් කියනවා, මේ මත්ස්‍යයාට අපේ මනුෂ්‍ය ජීවිතයත් එක්ක ලොකු ලෙන්ගතුකමක් තිබෙනවා කියලා. බෝට්ටුවක් ළඟට යන ඩොල්ෆින් මත්ස්‍යයාට මිනිසෙකුගේ ආශ්වාසය ප්‍රශ්වාසය දැනුනාම ඒ බෝට්ටුව ළඟ වැඩිපුර ගැවසෙනවා. මේ මත්ස්‍යයා පුරුදු වෙලා තිබෙන්නේ එහෙමයි. මේ මත්ස්‍යයා ඒ තරම් ලෙන්ගතුකමක් මනුෂ්‍යයාට දක්වනවා. නමුත් සමහර ධීවරයෝ තමන්ගේ බෝට්ටුවට මාළු නැති වුණ වෙලාවට මේ අහිංසක මත්ස්‍යයාව මරනවා. මරලා ඈත පිටිසර ප්‍රදේශවලට ගිහිල්ලා "මුහුදු ඌරා" කියලා විකුණනවා. මම ඇස් දෙකෙන් දැකලා තිබෙනවා, මේ මත්ස්‍යයා කැපුවාම තනිකරම ලේ පාටයි.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
Hon. Deputy Minister, please wind up now.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardena)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට විනාඩියක් දෙන්න.

මේ මත්ස්‍යයා මරලා විකුණන තත්ත්වයක් අපි දැකලා තිබෙනවා. ඒ නිසා ගරු ධීවර නියෝජ්‍ය ඇමතිතුමනි, ගරු ලේකම්තුමනි, මේ ගැන විශේෂ අවධානයක් යොමු කරන්න.

බහුදින ධීවර යාත්‍රාවලට වෙරළේ ඕනෑම තැනකට එන්න බැහැ. බහුදින ධීවර යාත්‍රාවක් තමුන්ගේ ඕනෑකමට එක එක තැන්වල නවත්වන්න බැහැ. ඒ සඳහා නියමිත වරායක් තිබෙනවා. අපි තංගල්ල ගත්තත්, කිරින්ද ගත්තත්, අම්බලන්ගොඩ ගත්තත්, බේරුවල ගත්තත්, ඒ වාගේම හලාවත, පුත්තලම, මීගමුව ගත්තත් මේ හැම තැනකම ධීවර වරායක් තිබෙනවා. හිටපු ධීවර ඇමතිතුමාත් මෙතැන ඉන්නවා. එතුමා ඒ ගැන දන්නවා. අවාසනාවන්ත විධියට මේ මත්ස්‍යයා මරණයට ගොදුරු කරන යම් ධීවර යාත්‍රාවක් තිබෙනවා නම්, ඒ යාත්‍රාවට දැඩි ලෙස නීතියක් පනවන්න. ඒ නීතිය පනවලා ඒ ධීවර යාත්‍රාවේ ගමන් කරන අයට නැවත එවැනි දෙයක් කරන්න ඉඩ දෙන්න එපා. ඒක අත්‍යවශ්‍යම දෙයක් කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

"ඩෝල්" සමාගමට කෙසෙල් ව්‍යාපෘතියක් සඳහා කන්දකාඩුවෙන් දීපු ඉඩම් ප්‍රමාණය නැවත භාර ගෙන තිබෙනවා. ඒ ඉඩම් ටික නැවත භාර ගෙන අවශ්‍ය කටයුතු කරන්න දැන් සූදානම් කරනවා. සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා කිව්වා, මේවා සම්බන්ධයෙන් දැඩි ප්‍රශ්නයක් තිබෙනවා කියලා. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය අපි දන්නවා. එහි සිටින නිලධාරීන් සහ ගරු ඇමතිතුමා ඔවුන්ගේ කාර්ය භාරය ඉටු කරන ගමන්, ඒ හා සම්බන්ධ අනෙක් ව්‍යාපාරය වන සංචාරක ව්‍යාපාරය මරලා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

පැවැත්මක් හදා ගන්න කවදාවත් බලන්නේ නැහැ. එහෙම තිබෙනවා නම් ඒක රටට අහිතකරයි. රටේ ආර්ථිකයට අහිතකරයි.

අන්න ඒ නිසා අපි පැහැදිලිවම ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාට කියනවා, මීට පස්සේ මේ සම්බන්ධයෙන් කථා කරන කොට ඒ ගැන සද්භාවයකින් කථා කරන එක හොඳයි කියන එක. එම කරුණ මතක් කරමින් අද මට කථා කරන්න වේලාව ලබා දීම සම්බන්ධයෙන් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමාට ස්තුතිවන්ත වනවා.

**[பி. ப. 3.07 ]**

**ගරු එස්. විනෝ මහතා**
(மாண்புமிகு எஸ். வினோ)
(The Hon. S. Vino)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, தாவர, விலங்கினப் பாதுகாப்புக் கட்டளைச் சட்டத்தின்கீழான ஒழுங்குவிதிகள் தொடர்பான இந்த விவாதத்திலே கலந்துகொள்வதற்குச் சந்தர்ப்பம் தந்தமைக்கு முதலில் நன்றி கூறுகிறேன். எங்களுடைய நாட்டிலே தாவர மற்றும் விலங்கினங்களுடைய பாதுகாப்புக்காக சட்டங்கள் இயற்றப்படுகின்றன. அந்தச் சட்டங்கள் நடைமுறைப்படுத்தப் படுகின்றனவா என்பதிலே எங்களுக்குச் சந்தேகம் எழுகின்றது. அதேபோல், வன விலங்குகளால் மக்களுக்கு ஏற்படுகின்ற பாதிப்புக்கள் சம்பந்தமாக பல்வேறு சந்தர்ப்பங்களில் நாங்கள் கேள்விகளை எழுப்பியிருக்கிறோம். இருந்தாலும், மக்களுடைய பாதுகாப்புக் கருதி இந்தச் சட்டங்களிலே கடுமையான போக்கைக் கடைப்பிடிக்க வேண்டுமென்று நான் இந்த நேரத்திலே கேட்டுக்கொள்கின்றேன்.

இங்கு இன்னுமொரு விடயத்தையும் கூறலாமென நினைக்கிறேன்.வன்னியில் நடைபெற்ற இறுதி யுத்தத்தில் பல்லாயிரக்கணக்கான மக்கள் உயிரிழந்ததும் பல கோடி ரூபா பெறுமதியான சொத்துக்கள் அழிவடைந்ததும் உங்களுக்குத் தெரியும். எஞ்சியுள்ள மக்கள் ஏதிலிகளாக மீண்டும் தங்களுடைய கிராமங்களில் இன்று மீள்குடியேற்றம் செய்யப்பட்டிருக்கிறார்கள். இந்த நிலையிலே 'மரத்தால் விழுந்தவனை மாடேறி மிதிப்பதுபோல', அந்த மக்கள் காட்டு யானைகளின் தொல்லைகளுக்கும் ஆளாகியிருக்கின்றார்கள். குறிப்பாக, துணுக்காய் பிரதேசத்திலிருக்கின்ற காடுகளை அண்டிய பல்வேறு கிராமங்கள் காட்டு யானைகளின் தொல்லைகளுக்குள்ளாகியிருக்கின்றன. தங்களுடைய வீடு களைச் சேதப்படுத்துகின்ற இந்த யானைகளிடமிருந்து உயிராபத்தையும் எதிர்நோக்கவேண்டிய ஒரு சூழ்நிலை அவர்களுக்கு இருக்கின்றது. கடந்த காலங்களிலும் காட்டு யானைகளால் அவர்கள் பல்வேறு அச்சுறுத்தல்களையும் சேதங்களையும் அனுபவித்தார்கள்.

முல்லைத்தீவு மாவட்டத்திலுள்ள ஒட்டுசுட்டான் பிரதேச செயலகப் பிரிவில் இருக்கின்ற முத்தையன்கட்டு என்ற கிராமத்திலும் அதனையண்டிய பிரதேசங்களிலும் காட்டு யானைகளின் தொல்லைகளைவிடவும் அங்கு கொண்டுவந்து விடப்பட்ட வளர்ப்பு யானைகளின் தொல்லை காணப்படுகிறது. அங்குள்ள மக்கள் அன்றாடம் பாதுகாப்பற்ற ஒரு நிலைமையிலேதான் வாழ்ந்துகொண்டிருக்கிறார்கள். ஏற்கெனவே இழந்த தங்களுடைய சொத்துக்களை மெல்ல மெல்ல மீண்டும் சேகரித்து வருகின்ற இந்த வேளையிலே, தங்களுடைய பொருளாதார மேம்பாட்டுக்காக அவர்களால் பயிர்ச்செய்கையைக்கூட மேற்கொள்ள முடியாத ஒரு நிலைமை காணப்படுகின்றது.குறிப்பாக வாழை, தென்னை, மரவள்ளி போன்ற பயிர்ச்செய்கைகளில் ஈடுபட்டவர்களுக்கு ஏற்கெனவே பல சேதங்கள் ஏற்படுத்தப்பட்டிருக்கின்றன. எதிர்வரும் காலபோக வேளாண்மையைச் செய்ய முடியாத ஒரு நிலையிலே அங்குள்ள மக்கள் ஏங்கிக்கொண்டிருக்கிறார்கள்.

அதேபோன்று, அங்கு கடைகளுக்குள் நுழையும் யானைகளால் வியாபாரிகளுக்கு ஆபத்து உருவாகிக் கொண்டிருக்கிறது. இந்த யானைகள் கடைகளின் சுவர்களை இடித்துச் சேதப்படுத்தி,அங்கிருக்கின்ற அரிசி, நெல் போன்ற உணவுப் பொருட்களை உண்டும் நாசமாக்கியும் வருகின்றன. இந்த வளர்ப்பு யானைகள் எப்படி அங்கு கொண்டுபோய் விடப்பட்டன? எந்த நோக்கத்துக்காக அங்கு அவை கொண்டுபோய்ச் சேர்க்கப்பட்டன? அதனால் அந்த மக்களுக்கு ஏற்படுகின்ற அசௌகரியங்களை, இழப்புக்களைப் பற்றி நாங்கள் சிந்தித்துப்பார்க்க வேண்டும். இந்த யானைகள் மதம் பிடித்தவை போன்று பாடசாலை அறைகளின் கதவுகளையும் சுவர்களையும் உடைத்து மாணவர்களின் மதிய உணவுக்காகச் சேகரித்து வைக்கப்பட்டிருக்கின்ற அரிசி, மா போன்ற உணவுப் பொருட்களுக்குச் சேதத்தை உண்டுபண்ணுகின்றன. இதனால் சில பாடசாலைகளின் நிர்வாகத்தினர் மாணவர்களுக்கு மதிய உணவு வழங்க முடியாத ஒரு நிலைமையிலே இருக்கின்றனர்.

அத்துடன், இந்த மக்கள் அங்கு சிறிய குடிசைகளிலும் தற்காலிகக் கொட்டில்களிலும் வாழ்கின்ற ஒரு நிலைமையே இருக்கின்றது. வன்னியிலிருந்து இடம்பெயர்ந்து மீளக் குடியேறிய அந்த மக்களுக்கு இன்னும் நிரந்தரமான வீடுகள் கட்டிக் கொடுக்கப்படாத ஒரு நிலையிலே பழைய, இடிந்துபோன வீடுகளுக்குள் அவர்கள் தற்காலிகமாக வாழ்கின்ற ஒரு சூழ்நிலையிலே, இந்த யானைகள் அந்த வீடுகளில் எஞ்சி இருக்கின்ற சுவர்களையும் இடித்துத் தள்ளி, அவற்றைச் சேதப்படுத்தி தொல்லைகள் கொடுப்பதன் காரணமாக அந்த மக்கள் மிகவும் கஷ்டப்படுகின்றார்கள்.

அதுமட்டுமல்ல, பெற்றோரினால் தமது சிறு குழந்தைகளை அங்கு பாதுகாப்பாகப் படுக்க வைக்க முடியாத ஒரு நிலைமை இருக்கின்றது. ஆகவே, இந்த யானைகள் என்ன நோக்கத்துக்காக அங்கே விடப்பட்டிருக்கின்றன என்பதை நாங்கள் கேட்டுக்கொள்ள விரும்புகின்றோம். அதாவது, காடுகளிலே விடப்பட வேண்டிய அந்த யானைகள் மக்களின் விருப்பத்துக்கு மாறாக மக்கள் செறிந்து வாழும் கிராமப் பகுதிகளிலே விடப்பட்டதன் நோக்கத்தை நாங்கள் உடனடியாக அறிந்துகொள்ள விரும்புகின்றோம். வன சீவராசிகள் இலாகாவினர் அந்த யானைகளைக் காடுகளுக்கோ அல்லது எந்தப் பிரதேசத்திலிருந்து அவை கொண்டுவரப்பட்டனவோ, அந்தப் பிரதேசத்துக்கோ உடனடியாகக் கொண்டு செல்ல வேண்டும் என்று அந்த மக்கள் கோருகின்றார்கள். இல்லையேல், அவர்கள் அங்கே நிம்மதியாகப் படுத்துறங்க முடியாத ஒரு சூழலுக்குள் தள்ளப்படுவார்கள். அவ்வாறு அவற்றினை முன்பிருந்த பழைய இடங்களுக்கு மீண்டும் கொண்டு செல்லாவிட்டால், அங்கே எதிர்வரும் காலங்களில் பயிர்ச்செய்கையிலும் காலபோக வேளாண்மையிலும் ஈடுபட முடியாத ஒரு நிலைமை ஏற்படும் என்பதையும் அவர்கள் மிகவும் கவலையுடன் தெரிவிக்கின்றார்கள்.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
உங்களுடைய உரையை முடித்துக் கொள்ளுங்கள்!

**ගරු එස්. විනෝ මහතා**
(மாண்புமிகு எஸ். வினோ)
(The Hon. S. Vino)
ஒரு நிமிடம்!

ஏற்கெனவே எங்களுடைய மண்ணின் மீட்புக்காக - எங்களுடைய நிலங்கள் ஆக்கிரமிக்கப்படுவதற்கு எதிராகப் பல்வேறு வகையான போராட்டங்களை அங்குள்ள எமது மக்கள் செய்துகொண்டிருக்கின்ற ஒரு நிலைமையிலே இன்று காடுகளுக்குள் விடப்பட வேண்டிய யானைகளைத் திட்டமிட்ட வகையில் மக்கள் வாழும் கிராமங்களுக்குள் கொண்டுவந்து விட்டிருப்பதன் காரணமாக அந்த மக்கள் யானைகளுக்கு எதிராக மீண்டும் வீதியில் இறங்கிப் போராட வேண்டிய ஒரு நிலைமைக்குள் தள்ளப்பட்டிருக்கின்றார்கள். காட்டு யானை களுடைய தொல்லை ஒரு பக்கம் இருந்தாலும் தென்னிலங்கையிலிருந்து கொண்டுவந்து விடப்பட்டிருக்கின்ற வளர்ப்பு யானைகளினால் குறிப்பாக ஒட்டுசுட்டான் பிரதேச மக்கள் பல்வேறு துயரங்களைச் சந்தித்துக் கொண்டிருக்கின்றார்கள். ஆகவே, உடனடியாக அங்கிருந்து அந்த யானைகளை அகற்ற வேண்டும். இல்லையேல், மக்கள் வீதியில் இறங்கிப் போராட வேண்டிய ஒரு நிலைமைக்குத் தள்ளப்படுவார்கள் என்று மீண்டும் கூறிக்கொண்டு விடைபெறுகின்றேன். நன்றி.

**නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(Mr. Deputy Chairman of Committees)
The next speaker is the Hon. Felix Perera. Before he starts, will an Hon. Member propose the Hon. Janaka Bandara to take the Chair?

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා (සමාජ සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா - சமூக சேவைகள் அமைச்சர்)
(The Hon. Felix Perera - Minister of Social Services)
I propose that the Hon. Janaka Bandara do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ජනක බණ්ඩාර මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* MR. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. JANAKA BANDARA *took the Chair.*

**[අ.භා. 3.16]**

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තල්මසුන් - whales - ගැන කථා කරද්දී, තල්මසුන් පෙන්වීමේ ව්‍යාපෘතිය පටන් ගත්තේ මම ධීවර හා ජලජ සම්පත් ඇමතිවරයා වශයෙන් සිටියදීයි කියලා මට මතක් වෙනවා. මම ඒ සඳහා වෝකස් කියන සංචාරක ව්‍යාපාරයත් එක්ක එකතු වෙලා Cinnamon Grand Hotel එකේ ලොකු උත්සවයක් පවත්වලා ඒ පිළිබඳ ව්‍යාපෘතිය launch කළා. සාමාන්‍යයෙන් ඩොලර් 60ක් ගත්තා. නමුත් අපි එක බෝට්ටුවකට ඩොලර් 600ක් විතර ගත්තා. ලොකුම තල්මස් ඝනත්වය -ලොකුම තල්මස් density එක- තිබෙන්නේ ලංකාවේ ප්‍රදේශයක් හරහායි; කිරින්ද ප්‍රදේශය හරහා තමයි එය පිහිටා තිබෙන්නේ.

තල්මසුන් වර්ග රැසක් ඉන්නවා. මේ තල්මසුන් පිළිබඳව අපි දරන සමහර මත ගොඩක් වැරදියි. ඇත්ත වශයෙන්ම මේක විදේශ විනිමය උපයන ව්‍යාපාරයක්. ඒ වාගේම තල්මසා ක්ෂීරපායී සතෙක්; කිරි බී වැඩෙන සතෙක්. මීටර් 22 දක්වා ලොකු තල්මසුනුත් සිටිනවා. ඒ වාගේම තල්මසුන් වර්ග ගොඩක් සිටිනවා. මේ අයව අපේ රටට ගේන්න ඕනෑ කොහොමද? ඒ අයගේ දිවි පැවැත්ම පිළිබඳව ගැඹුරු අධ්‍යයනයක් නොකර මේ පිළිබඳව නීතිරීති ගෙනා පමණින් එය ඉෂ්ට වෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මේ තල්මසුන්ට තිබෙන ලොකුම හානිය ශබ්ද දූෂණයයි. ශබ්ද දූෂණය නිසා විශාල තල්මසුන් ප්‍රමාණයක් මේ වන විට අඩු වෙලා තිබෙනවා. මුහුදු ඌරා, -sea cow කියන සතා- තල්මසා ලොකු මත්ස්‍යයන්. ටූනාගේ ඉඳලාම ප්‍රමාණය අඩු වෙලා තිබෙනවා. මොකද, මේ අය කථා කරන්නේ hertzවලින්. Hertz තිබෙනවා. 1 ඉඳලා 120 දක්වා hertzවලින් තමයි මේ අයගේ දැනීම් සිදු වන්නේ. සාමාන්‍යයෙන් තල්මසෙක් -මම ඒ දවස්වල මේ පිළිබඳව අධ්‍යයනය කළ නිසායි දන්නේ- දවස් 45ක් තුළ කිලෝමීටර් 1,700ක් ඔබ මොබ යනවා. එතකොට තරංග හරහා තමයි මේ අයගේ පැවැත්ම සහ breeding තිබෙන්නේ. සාමාන්‍යයෙන් පැටියෙක්ව අම්මාට visually දකින්න පුළුවන් වන්නේ උපරිම කිලෝමීටර් භාගයක් එහෙම නැත්නම් මීටර් විස්සක් එහා පැත්තට පමණයි. ඊට පස්සේ පැටියා සොයා ගන්න බැරි වෙනවා.

අපි දන්නවා, සාමාන්‍යයෙන් යාල වාගේ අභය භූමි පළමුවෙන්ම පටන් අරගෙන තිබෙන්නේ 1872 දී ඇමෙරිකාවේදීයි කියලා. නමුත් අවුරුදු 100කට පසුව මුහුදේ අභය භූමි පටන් ගෙන තිබෙනවා. අපේ මුහුදේ අභය භූමියක් නැහැ. අපට මුහුදට අභය භූමියක් අවශ්‍යයි. මුහුදේ අභය භූමියක් තිබුණොත් breeding කියන එක, මත්ස්‍ය සම්පත බෝ වන ස්වාභාවික පරිසරය එතැන ඇති කරන්න පුළුවන්. එම නිසා ඒ පිළිබඳව ගැඹුරු අධ්‍යයනයක් කරලා අවශ්‍ය කටයුතු කරන්නේ නැතිව, -අපි නීතිරීති ගේන එක හොඳයි- නීතිරීති ගෙනැත් වැඩක් නැහැ. නීතිරීතිවලට වඩා ශබ්ද දූෂණය නැති කළොත් හොඳයි. දැන් හුඟාක් නැව්වල propeller එකේ sound waves අඩු කරලා තිබෙනවා. එක්සත් ජාතීන්ගේ අලුත් නීතියකින් පැහැදිලිව කියලා තිබෙනවා, ඒ sound waves අඩු කරන්න කියලා. "Maersk" කියන සුප්‍රසිද්ධ නැව් සමාගමේ නැව්වල propeller එක දැන් වෙනස් කරලා. එම නැව් ලංකාවටත් එනවා. මේ "තල්මසුන්" අප ළඟට ගෙන්වා ගන්න ඕනෑ. ශබ්ද වැඩි යාත්‍රාවල ගියාම ඒ අයගේ සම්බන්ධතාව ගිලිහිලා ඒ අය පැත්තකට යනවා. ඉස්සර 1 සිට 150 දක්වා hertzවලට තමයි ඒ අය ශබ්දය හුවමාරු කර ගත්තේ. අපි කථා කරන්නේ hertzවලින්. අපි hertz 20,000 දක්වා කථා කරනවා. නමුත් දැන් මේ අය ඒ ශබ්දවලට හුරු වෙලා ඒක වැඩි කර ගෙන තිබෙනවා. තල්මසා කියන්නේ එපමණටම මොළය තිබෙන සතෙක්.

ඇත්ත වශයෙන්ම කියනවා නම්, අපි කනගාටු වෙනවා. මේ පිළිබඳව NARA ආයතනයත් එක්කත් කථා කරන්න ඕනෑ. මොකද, තල්මසා කියන්නේ මුහුදේ සිටින සත්වයෙක්. මේ වෙන කොට මේ සත්ව ගහනය සියයට 90කින් අඩු වෙලා තිබෙනවා. අඩු වීමට මූලික හේතුව ලෙස ඉස්සර නම් අපි කිව්වේ ඒ සතුන් දඩයම් කරලා මැරෙනවා කියලා. නමුත් දැන් තිබෙන ප්‍රශ්නය දඩයම නොවෙයි. දැන් තිබෙන ප්‍රශ්නය ශබ්ද දූෂණයයි. ශබ්ද දූෂණය නිසා තමයි තල්මසුන් මැරෙන්නේ.

[ගරු ෆීලික්ස් පෙරේරා මහතා]

ඇත්ත වශයෙන්ම අද අපේ රටට සංචාරයකයන් ගෙන්වා ගැනීමට යොදා ගත හැකි නොයෙකුත් පැති තිබෙනවා. මේ business promotion එක දැම්මේ කීල්ස් කොම්පැනියත් වෝකර්ස් කොම්පැනියත් හරහායි. ඒ business promotion එක දමද්දී ඒ ගොල්ලන් හරහා තමයි අපි සංචාරකයන් ආකර්ෂණය කර ගත්තේ. Website එකේ දමලා අපි සංචාරකයෝ ආකර්ෂණය කර ගත්තා. කඳු පෙන්වන්නේ නැතිව, ස්වාභාවික සම්පත් පෙන්වන්නේ නැතිව තල්මසුන් විතරක් පෙන්වලා, අවසානයේදී අපට ඒකෙන් යූඑස් ඩොලර් මිලියන 10ක 12ක විතර අමතර ආදායමක් ලැබුණා. ඒකට addict වුණ සංචාරකයෝ කොටසක් සිටිනවා. සමහරු ස්වාභාවික පරිසරය බලන්න එනවා; වෘක්ෂලතා බලන්න එනවා; කුරුල්ලෝ බලන්න එනවා. අපට මේකත් හොඳ ආයෝජනයක්. ඒ ගැන වඩාත් සැලකිලිමත් වෙන්න කියලා මම කියනවා.

සාමාන්‍යයෙන් hertz 1 සිට 200 දක්වා තරංග කලාය තුළ තමයි ඒ අය ශබ්දය හුවමාරු කර ගන්නේ. අධික යාත්‍රා ගමන නිසා හානි වෙලා තිබුණ ෆ්ලොරිඩා ප්‍රාන්තයේ සාරා-සෝටා කියන ප්‍රදේශය අද මේ පිළිබඳ සාගර අභයභූමියක් කරලා තිබෙනවා. සන්නිවේදනය හරියට තිබුණේ නැත්නම් අපි කොපමණ නීතිරීති ගෙනාවත් වැඩක් නැහැ. මේකට නීතිරීති පනවන්න ඕනෑ. ඒ නීතිරීති පනවද්දී මීටර් 50ක් ළඟට ගිහිල්ලා බලනවා කියන එක කොපමණ සාර්ථකද කියලා මම දන්නේ නැහැ. තල්මසුන් visually බලන්න පුළුවන් බොහොම ළඟට ගියොත් විතරයි. හුඟක් දෙනෙක් බලන්නේ දුරදක්නවලින්. කිසිම සංචාරක රසයක් ඒ තුළ ගැබ් වන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැනට තිබෙන කාලීන ප්‍රශ්නයක් ගැන ඔබතුමාට කියන්න ඕනෑ. දැන් අපේ මිනිස්සු වැඩි දෙනෙක් ඕස්ට්‍රේලියා යනවා. අපි දැන් මාළු සම්පත, වනජීවී සම්පත සුරක්ෂිත කරන්න කථා කරනවා; නිෂ්පාදනය වැඩි කර ගන්න කථා කරනවා. මේ වන විට බහුදින යාත්‍රා 200ක් විතර අපට අහිමි වී තිබෙනවා. ඒවා අර ගෙන ගිහිල්ලා දමලා එනවා. අපේ ධීවර සම්පත ගැන කථා කරද්දී දෙවැනි පරම්පරාවෙන් සියයට එකයි ධීවර කර්මාන්තයට එන්නේ. දෙවැනි පරම්පරාව ගිහිල්ලා, තුන්වැනි පරම්පරාවත් ගියාම මාළු ටික අල්ලන්නේ කවුද? මේ කර්මාන්තයට යොමු වන්නේ කවුද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අමාත්‍යතුමනි, දැන් අවසාන කරන්න.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
කරුණාකරලා මට තව විනාඩි දෙකක් දෙන්න.

මේ අය ගිහිල්ලා කරන්නේ මොනවාද? ඉස්සරවෙලාම මෙය පටන් ගත්තේ නැඟෙනහිරින්.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඇයි ඒ?

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
ඇයි ඒ කියන කථාව නොවෙයි මම අහන්නේ. නැඟෙනහිරින් තමයි ඉස්සරවෙලාම පටන් ගත්තේ. ඒ ගොල්ලන් ඉස්සරවෙලාම ඕස්ට්‍රේලියාවට ගියා. එහේ ගියාම සල්ලිත් දීලා, කන්නත් දීලා, ඉංග්‍රීසිත් උගන්වනවා. තවත් එකක් උගන්වනවා, මම ඒක කියන්නේ නැහැ. මොකද, ඒක ආගමික ප්‍රශ්නයක් වන නිසා. ඒ නිසා කරුණාකරලා මේ ගැන අවධානය යොමු කරන්න. මේ පිළිබඳව විශාල අවධානයක් යොමු කරන්න ඕනෑ. එහෙම නැති වුණොත් තව ටිකක් කල් යද්දී මාළු අල්ලන්න මිනිස්සුත් නැහැ, බෝට්ටුත් නැහැ. එතකොට මොකක්ද වෙන්නේ? අපේ ප්‍රෝටීන් ඌනතාවට අවශ්‍ය ලොකුම දේ මාළු කියලා අපි කියනවා. නමුත් මේ මාළු අල්ලන්න මිනිස්සු කෝ? ඕස්ට්‍රේලියාවට යන්නේ භය නැති ධීවරයෝ. ධීවර පරම්පරාවේ දෙවැනි කොටස උගත් අය. අනෙක පරම්පරාවෙන් ධීවර කර්මාන්තය කරපු අය. ඊයේ-පෙරේදා කිහිප දෙනෙක් මැරිලත් තිබුණා. ඇත්තටම ඒකත් දූෂණයක්. අපේ රටේ සාගර දූෂණයක්. ඉතින් මේ ගැන පොඩ්ඩක් බලන්න ඕනෑ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
හොඳයි, ගරු ඇමතිතුමනි කථාව අවසාන කරන්න.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
තව ටිකක් කියන්න තිබෙනවා. කමක් නැද්ද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
කාල වේලාව කළමනාකරණය කළ යුතුයි, ගරු ඇමතිතුමනි. තවත් කථිකයෝ කිහිප දෙනෙක් ඉන්නවා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
හොඳයි, එහෙම නම් කමක් නැහැ. ඔබතුමාට කීකරු වෙලා මම කථාව නවත්වන්නම්.

මේ ශබ්ද තරංග වැඩි වුණොත් තල්මසුන් නැතිව යාවි. එම නිසා ශබ්ද තරංග සම්බන්ධයෙන් නීතිරීති පනවන්නය කියලා මම ඉතාමත්ම කාරුණිකව ඉල්ලනවා. මම මේ විෂය භාර ඇමතිවරයා වශයෙන් - ආරම්භක නියමුවා වශයෙන්- කටයුතු කරපු නිසා ඒ පිළිබඳ දත්තයන්, තොරතුරු ගොඩාක් මා ළඟ තිබෙනවා. ඒ නිසා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට සම්බන්ධ අයට මම කියනවා, අවශ්‍ය නම් අපේ සහායත් දෙන්න කැමැතියි කියා. මොකද, රටට සුබ සෙතක් වන නිසා. ජාතික ආදායම වැඩි කර ගන්න, රටේ දායකත්වය ලබා ගන්න. ඒ සඳහා අපේ දායකත්වය ලබා දෙන්න කැමැතියි.

**[අ.භා. 3.25]**

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ අපේ එස්.එම්. චන්ද්‍රසේන මැතිතුමා ගෙනා වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියෝග සම්බන්ධව මම සන්තෝෂ වෙනවා.

එම නියෝගවලට අදාළ ගැසට් නිවේදනය මඟින් විශේෂයෙන් ලංකාවේ ඩොල්ෆින් මසුන්, තල්මසුන් ආරක්ෂා කර ගැනීම සඳහා වැඩ පිළිවෙළක්; යම්කිසි නීති මාලාවක් ක්‍රියාත්මක කරන්න කටයුතු යොදා තිබෙනවා. මෙහිදී මම කියන්න කැමැතියි, මේ ව්‍යාපාරය සම්බන්ධව අපට ප්‍රශ්න ගණනාවක් තිබෙන බව. ඉස්සර මේ සම්බන්ධව යම්කිසි ක්‍රියා මාර්ගයක් අරගෙන තිබුණා. අපි දන්නවා, තමුන්නාන්සේලා ලෝඩ්ස්ටාර් ආයතනය විසින් ක්‍රියාත්මක කරපු ෆින්ගර්ස් කියන යාත්‍රා දෙකක් විශාල වියදමක් දරා වැඩ ටික පටන් අරගෙන තිබුණ බව. එතැනින් පසු ඇත්ත වශයෙන් මෙයට - [බාධා කිරීමක්] ඒක ක්‍රමානුකූල විධියට ඔවුන් පවත්වාගෙන ගියා. හැබැයි, දැන් ක්‍රම ක්‍රමයෙන් වැඩි වැඩියෙන් මේ මත්ස්‍යයින් බලන්න එන්න පටන් ගත්තාට පසු අද ධීවර කර්මාන්තයේ යෙදෙන විශාල පිරිසකුත් මේ වැඩ පිළිවෙළට ඇවිල්ලා තිබෙනවා. මේ වන විට බෝට්ටු 60කට වැඩිය තිබෙනවා. ඇත්ත වශයෙන් අපේ නියෝජ්‍ය ඇමතිතුමාටත් මම කියන්න කැමැතියි, කරුණාකර, පොඩ්ඩක් ගිහින් ඒ පැත්තත් බලා මේ සම්බන්ධව යම්කිසි අවබෝධයක් ලබා ගෙන කැළෑව වාගේම මුහුදත් පොඩ්ඩක් අල්ලා ගත්තොත් හොඳයි කියා. දැන් ඇවිත් තිබෙන ක්‍රමවේදය අනුව ධීවර බෝට්ටු තමයි තල්මසුන් බලන්න මේ විධියට හදා ගෙන තිබෙන්නේ. ඒක convert කරලා තමයි හදා ගෙන තිබෙන්නේ. තල්මසුන් බලන්න, ඩොල්ෆින් මත්ස්‍යයෝ බලන්න ඇත්තටම ධීවර යාත්‍රා වෙනම හදා ගෙන ඒවාට අවශ්‍ය කරන සීට් හදා ගෙන ක්‍රියාත්මක කර ගෙන යනවා. මේකෙදි යම් යම් ප්‍රශ්න ගණනාවක් පවතින බව අපි දකිනවා.

ඔබතුමාගේ නියෝගයට පළමුවෙන්ම ලක් වෙන්න ඕනෑ නාවික හමුදාවේ Jetliner කියන නැව. ඒකෙන් තමයි විශාල පිරිසක් මේකට යන්නේ. ඒකේ තමයි ශබ්දය සම්පූර්ණයෙන්ම තිබෙන්නේ. මෙතුමා කියපු එක හරියට හරි. ඒ කියන්නේ මේ තරංගත් එක්ක තමයි මොවුන් එනවාද නැද්ද කියන එක තීරණය වන්නේ. දැන් මොකක්ද වෙන්නේ? මේ Jetliner කියන නැවේ දැවැන්ත අවර පෙති දෙකක් තිබෙනවා. මේවා විශාල ශබ්දයක් සහිතයි. ඇත්තටම ගුවන් යානයක් ගුවන් ගත කරනවා වාගේ ශබ්දයක් වතුර ඇතුළත එනවා. සාමාන්‍යයෙන් මහාචාර්යවරු කියලා තිබෙන විධියට ඉතාම ඈතින් ශබ්දය ඉතාම අඩු ප්‍රමාණයක් තමයි තිබෙන්න ඕනෑ. එහෙම නම් ඉස්සෙල්ලාම නතර කරන්න තිබෙන්නේ Jetliner නෞකාවයි. ඒක මේ සඳහා සුදුසු නැහැ. ඒක වෙන එකකට පාවිච්චි කරන්න. විශාල පිරිසක් අරගෙන යන්න මේ නෞකාව හොඳයි. එහි සුඛෝපභෝගී සියල්ල තිබෙනවා. නමුත් ප්‍රශ්නය ඒක නොවෙයි. අපි බලාපොරොත්තු වෙන මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න බැරි තත්ත්වයට පත් වෙනවා. මේ නෞකාවේ තිබෙන අවර පෙති දෙක නිසා ඇතුළතින් විශාල ශබ්දයක් එන නිසා මේ මත්ස්‍යයින් විශාල ප්‍රමාණයක් ඒ තැනින් ඉවත් වෙමින් යනවා. මේ ශබ්දය ඇහෙනකොට ඔවුන් එතැන ඉන්නේ නැහැ. [බාධා කිරීමක්] මට වෙලාව නැතුව යනවා.

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
මන්ත්‍රීතුමා, ඔබතුමා කියන කාරණය සියයට 100ක් ඇත්ත. මේ මත්ස්‍යයින් සියයට 90ක්ම නැතිව ගිහින් තිබෙන්නේ ශබ්දය නිසයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ නිසා මෙන්න මේ කාරණය ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. කරුණාකර, මේ නැව එතැනින් ඉවත් කර ඔවුන්ට වෙනත් මොකක් හෝ ක්‍රමවේදයක් හදලා දෙන්න. නාවික හමුදාව එන විධිය හොඳයි. ප්‍රශ්නයක් නැහැ. ඒකට ඔවුන්ට යම්කිසි වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. නමුත් මම විශේෂයෙන් ඔබතුමාට යෝජනා කරනවා, කරුණාකර මේ සම්බන්ධව හිතන්න කියා.

මේක හිතූ හිතූ ගණන් අය කරන තැනකට ගෙනැවිත් තිබුණා. ඔබතුමා ඒක යම්කිසි විධියට හදලා තිබෙනවා.හැබැයි ඒ වාගේම මම කියන්න කැමැතියි, මේ වනකොට බෝට්ටු 60ක විතර ඉන්න පුද්ගලයෝ insurance එක වෙනුවෙන් ලක්ෂ දෙකක් විතර ගෙවන බව. මාසයකට ඩොලර් 100ක් වරායට ගෙවන්න ඕනෑ. වනජීවී කාර්යාලයට තවත් ගණනක් ගෙවන්න වෙනවා. ඒ නිසා මම හිතන්නේ - [බාධා කිරීමක්]

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
රීති ප්‍රශ්නයක්. ගරු ඇමතිතුමනි, මොකක්ද රීති ප්‍රශ්නය?

**ගරු ෆීලික්ස් පෙරේරා මහතා**
(மாண்புமிகு பீலிக்ஸ் பெரேரா)
(The Hon. Felix Perera)
5440 කියන යාත්‍රාව විතරයි යන්නේ. Jetliner එක යන්නේ නැහැ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඒක රීති ප්‍රශ්නයක් නොවෙයි. ගරු මන්ත්‍රීතුමනි, කථාව කරගෙන යන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ වෙලාවෙන් අඩු කරන්න එපා. ඒ වාගේම සංචාරක මණ්ඩලයට රුපියල් 35,000ක් ගෙවන්නත් මොවුන්ට සිද්ධ වෙනවා. සහායට එන තැනැත්තාට දවසකට රුපියල් 4,000ක් ගෙවන්න වෙනවා. ඒ විධියට බලනකොට විශාල මුදලක් ගෙවන්න ඔවුන්ට සිද්ධ වෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ නිසයි මම කිව්වේ මේ ස්ථානයට ගිහින් ඩොල්ෆින් මත්ස්‍යයන් බලා, තල්මසුන් බලා ඒ අදාළ අයත් එක්කත් සාකච්ඡාවක් කළොත් මේක තවත් හොඳ තත්ත්වයට පත් වෙයි කියා. මම මේ කාරණා ටික කිව්වේ ඒ නිසයි.

ඊට අමතරව වෘක්ෂ ලතා ගැන කථා කරන කොට ඔබතුමාට මතක් කරන්න කාරණා කිහිපයක් තිබෙනවා. අද "මව්බිම" පුවත් පතේ මේ විධියට වාර්තාවක් පළ වෙලා තිබුණා:

> "වැදි නායකයා අනතුරු අඟවයි. ආණ්ඩුව නීති-රීති තද කරලා. වරිගේ ඇත්තන්ට කන්නත් නෑ. රුහේ ලක්ෂ පහක් විනාශයට යනවා."

පොරෝ කෙටි උස්සා ගෙන ඇවිල්ලා, ඔබතුමන්ලාගේ ආණ්ඩුවට පක්ෂව පෙළපාළි ගිය අය තමයි අද මේ පාරට බැහැලා තිබෙන්නේ. එම වාර්තාවට අනුව වැදි නායකයා තවදුරටත් මෙසේ කියා තිබෙනවා:

> "රටක නායකයෙක් වුණාම රට ගැන, ජාතිය ගැන, ආගම ගැන, සිරිත් - විරිත්, විවිධ ඇදහිලි පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ."

මම දන්නේ නැහැ, කාටද මේ කියා තිබෙන්නේ කියලා. මම දැක්කා තමුන්නාන්සේලාගේ කට්ටිය පහු ගිය සතියේ වන්නියලැත්තොත් එක්ක ක්‍රිකට් ගහනවා. අමුඩ කෙටි ඇඳ

[ගරු දයාසිරි ජයසේකර මහතා]

ගෙන ඉන්න වැදි ජනතාව ගෙන්වලා, ක්‍රීඩාංගනවලට දමලා ඔබතුමන්ලා ඒ අය සමඟ ක්‍රිකට් ගහලා ඒ ගොල්ලන්ව පරාජය කළා. අඩුම ගණනේ වැදි ජනතාවටවත් දිනන්න දුන්නේ නැහැ. ගරු ජීවන් කුමාරණතුංග ඇමතිතුමා ඉන්න නිසා මම කියන්න ඕනෑ, ඒක හරියට "ලගන්" චිත්‍රපටිය වාගෙයි කියා. ඒ චිත්‍රපටියේත් සුද්දෝ, ඉන්දියානු ජනතාවත් එක්ක ක්‍රිකට් ගහනවා. ඒකේ තිබෙන්නේත් ඔය වාගේම තමයි. සුද්දන්ගෙ කාලයේදී වාගේ තමයි. වනාන්තරේ ජීවත් වෙන අපේ ආදිවාසීන් එකතු කරගෙන තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ team එකක් ක්‍රිකට් ගහලා ඒ ගොල්ලන්වත් පැරැද්දුවා. දැන් ඉතින් කළු සුද්දන්ගෙ ගණනට වැටිලායි තිබෙන්නේ. කරුණාකරලා වන්නියලැත්තන්ගේ ප්‍රශ්නය විසඳන්න අවශ්‍ය කටයුතු කරන්නය කියා මා ගෞරවයෙන් ඉල්ලනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම තවත් කාරණයක් කියන්න තිබෙනවා. වනසතුන් අනවසරයෙන් තබා ගැනීම සම්බන්ධයෙන් වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 49 වන වගන්තිය යටතේ නීති පනවා තිබෙනවා. වී කුරුල්ලන්, රැන ගිරව්, මාල ගිරව් ආදී පක්ෂීන් ස්වාභාවික පරිසරයෙන් අල්ලලා මිනිස්සු ඒ සත්තු පාර දිගේ තියා ගෙන විකුණනවා. එහෙම විකුණන්න එපාය කියා තමුන්නාන්සේලා නීතියක් ගෙනාවා. 2012.10.01 වන දින ඔබතුමන්ලා වනජීවී අධ්‍යක්ෂ ජනරාල්ට නැවත ලිපියක් යවා තිබෙනවා. ඒ ලිපියේ මෙසේ පළ වී තිබෙනවා:

"පනතේ 49 වගන්තියෙන් සලසා ඇති ප්‍රතිපාදන යටතේ

i. වී කුරුල්ලන් (නිතඹ සුදු වී කුරුල්ලා)

ii. රැන ගිරවුන් සහ මාල ගිරවුන්

සම්බන්ධයෙන් වන යම් ව්‍යාපාරයක් හෝ වෙළඳාමක් මිලට ගැනීමක්, විකිණීමක් හෝ ප්‍රවාහනයක් කරගෙන යාම සඳහා පනතේ 71 වගන්තිය යටතේ වන නියෝගයක් මගින් බලපත්‍ර නිකුත් කිරීම සුදුසු හා ඒ සඳහා පියවර ගන්නා ලෙස ගරු ගොවිජන සේවා හා වනජීවී නියෝජ්‍ය ඇමතිතුමා විසින් මා වෙත දන්වා ඇත."

එතකොට ඉතින් නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා තමයි මෙහෙම දන්වා තිබෙන්නේ. මේ ඊයේ-පෙරේදා නේ ඔබතුමා ඇමති තනතුරෙන් අයින් වුණේ ඔබතුමාගේ මල්ලිට මහ ඇමතිකම දෙන්න. බර්ටි මහත්මයාට ගහන්න ඕනෑ නිසා ඔබතුමා ඇමතිකමෙනුත් අයින් වෙලා යන්තම් බේරුණා. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න, මම කියන්නම්. ගරු නියෝජ්‍ය ඇමතිතුමා තමයි මේ නියෝගය දීලා තිබෙන්නේ. මේ වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත අනුව මේ සත්තු පාර දිගේ විකුණන එක තහනම් කරලායි තිබුණේ. දැන් ඔබතුමා කියනවා විකුණන්න ඉඩ දෙන්නය කියලා.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
නැහැ, නැහැ. අපි කියන්නේ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
නැත්තෙ මොකද? මේ ලියුම තිබෙන්නේ. එහෙම නම් මේක අසත්‍යයක්ය කියලාද කියන්නේ? උදේනි වික්‍රමසිංහ කියන ඔබතුමාගේ ලේකම් තමයි මේක අත්සන් කරලා තිබෙන්නේ. 2012.10.11 තමයි අත්සන් කරලා තිබෙන්නේ. එතුමන්ලා අද ඇවිල්ලත් ඇති. වනජීවී අධ්‍යක්ෂ ජනරාල්ට තමයි ලියුම යවන්නේ, ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශයෙන්.

එම ලිපියෙහි තවදුරටත් මෙහෙම කියා තිබෙනවා:

"02. මේ සඳහා නිසි අවසරය ලබා ගැනීම පිණිස අමාත්‍ය මණ්ඩල සංදේශයක කෙටුම්පතක් සහ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා යෝජිත නියෝගයේ (බල පත්‍රයේ ආකෘතිය, ගාස්තු සහ කොන්දේසි) කෙටුම්පතක් සකස් කර අනුමැතිය සඳහා ඉක්මනින් මෙම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන මෙන් කාරුණිකව දන්වමි."

ඔබතුමන්ලාගේ ලේකම්තුමා තමයි මේ ලිපිය යවා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඒ ලිපියේ සඳහන් කර තිබෙනවා, මේ කුරුල්ලො පාර දිගේ විකුණන්න ඉඩ දෙන්නය කියා ඔබතුමා දන්වා තිබෙනවාය කියා. පාර දිගේ ගිරව් විකුණන්නේ මොකටද? නිදහස් කරන්නද? තමන්ගේ දසාව හොඳ නැති වුණාම නම් සමහරුන් එහෙම කරනවා. පාර අයිනේ කූඩු ඇතුළෙ දමා ඉන්න කුරුල්ලො අරගෙන නිදහස් කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ නිසා මම කියනවා, මේ වැඩ පිළිවෙළ උල්ලංඝනය වන තත්ත්වයක් මෙතුමා විසින්ම ඇති කර තිබෙනවාය කියා.

ඊට අමතරව ගිය සතියේ රූපවාහිනියේ ලොකු show එකක් දැම්මා. ජනාධිපතිතුමා ඇවිල්ලා කිව්වා, යාල වනෝද්‍යානයේ තිබෙන පෞද්ගලික ඉදි කිරීම් සියල්ල ගලවලා ඉවත් කරන්න කියලා. කවුද මේවා ඉදි කරන්න ඉඩ දුන්නේ? මේවා කරන්න ඉඩ දුන්නේ තමුන්නාන්සේලාගේම ආණ්ඩුවේ සංචාරක ඇමති. සංචාරක විෂය අයිති බැසිල් රාජපක්ෂ මහත්මයාටයි. ඒවා හැදුවේ චමල් රාජපක්ෂ මහත්මයාගේ ප්‍රදේශයේයි. එතකොට ඒවා අයින් කරන්නේ කවුද? අයින් කරන්න කියන්නේ නාමල් රාජපක්ෂ මහත්මයාගේ කීමට මහින්ද රාජපක්ෂ මැතිතුමායි. මේක පවුල ඇතුළේම කචල් එකක්. මේක අපේ ප්‍රශ්නයක් නොවෙයි. කඳවුරු ගලවලා ඉවත් කර ගන්න එක තමුන්නාන්සේලාට හොරෙන් කර ගන්න තිබුණා නේ. කවුද මේවා ගහන්න කිව්වේ? අපිද ගහන්න කිව්වේ? නැහැ. තමුන්නාන්සේලායි කියලා තිබෙන්නේ. එතකොට මේකට අවසර දෙන්නේ වෙන කවුරුවත් නොවෙයි, සංචාරක විෂය අයිති බැසිල් රාජපක්ෂ ඇමතිතුමායි. ඒවා ගලවලා ඉවත් කරපු එක හොඳයි. ඒ සම්බන්ධ photos ඔක්කෝම මා ළඟ තිබෙනවා. තමුන්නාන්සේලා අනුමැතිය දීලා හදලා තිබෙන ඒවායි මේ තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්ථිර වැසිකිළි හදපු ඒවා තිබෙනවා. ජනාධිපතිතුමා මේවා කඩන්න නියෝග කළ එක හොඳයි. හැබැයි කල්පනා කරන්න තිබුණේ, ජනාධිපතිතුමා නියෝග කරන්න කලින් එතුමාටත් උඩින් ඒවා කළේ කවුද කියන එකයි. ඒක නිකම් හරියට කකුල් දෙක අස්සේ toilet එකක් හදනවා වාගේ වැඩක්. ජනාධිපතිතුමාට හොරෙන් කවුරු හරි ගිහින් එතුමාගේ බල ප්‍රදේශයේ මේ වාගේ ඒවා හදනවා නම් ඒවාට විරුද්ධව ක්‍රියා කළ යුතුයි.

මා ළඟ ඒ ඉදි කිරීම් පිළිබඳ විස්තර තිබෙනවා. "Leopard Safaris" කියන බෝඩ් එකේ කොටියෙක් ඉන්නවා. වනෝද්‍යානය ඇතුළේ පන්දම් දල්වන්න එපාය කියලායි තිබෙන්නේ. නමුත් මේවා කරන්න තමුන්නාන්සේලා ඉඩ දීලා තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, අවසන් කරන්න.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ වේලාව ගත්ත නිසා මට එක විනාඩියක් දෙන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
කාල වේලාව සම්බන්ධ ගැටලුවක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගෙන් විනාඩියක කාලයක් මා ඉල්ලා සිටිනවා.

මීට අමතරව තවත් සමාගම් හතරකට යාල වනෝද්‍යානයේ ඉදි කිරීම් කරන්න දෙන්න ඔබතුමන්ලා ගිවිසුම් අත්සන් කරලා තිබෙනවා. කේ.එච්.ජේ. ඉසුරු මහත්මයාට අයත් Ruhunu Safari එකට, මිලින්ද ද සිල්වා මහත්මයාට අයත් Wild Trail ආයතනයට, ආර්.එස්. අරඹෙවෙල මහත්මයාට අයත් Master Camps ආයතනයට, Extreme Camping ආයතනයට, ඒ වාගේම පිළින්නාව කඳවුරු භූමිය ඩික්සන් දැල බණ්ඩාර මහත්මයාට දෙන්න දැන් ඔබතුමන්ලා ගිවිසුම් අත්සන් කරලායි තිබෙන්නේ. කරුණාකරලා මේවා සම්පූර්ණයෙන් අහෝසි කරන්න කියා මා කියන්න කැමැතියි. මේවා විතරක් නොවෙයි. සජිත් ප්‍රේමදාස මැතිතුමා කිව්වා වාගේ විල්පත්තුව වනෝද්‍යානයේ ඒ වාගේම උඩවලව ජාතික වනෝද්‍යානයේ ඉදි කිරීම් කරන්න Eco team ආයතනයටදෙන්න කටයුතු කර තිබෙනවා. හෝර්ටන් තැන්නේ ස්ථිර කඳවුරු පවත්වා ගෙන යන්න අවශ්‍ය කරන අනුමැතිය දීලා තිබෙනවා. කරුණාකරලා විල්පත්තුව, උඩවලව ඇතුළු සියලු වනෝද්‍යාන සම්බන්ධයෙනුත් ජනාධිපතිතුමා ගත්තා වාගේ තීන්දුවක් ගන්න කියලා ගෞරවයෙන් ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. මී ළඟට ගරු චන්ද්‍රසිරි ගජදීර ඇමතිතුමා.

**[අ.භා. 3.37]**

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා (පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர - புனர்வாழ்வளிப்பு, சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. Chandrasiri Gajadeera - Minister of Rehabilitation and Prison Reforms)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ වැදගත් නියෝග රාශියක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන අවස්ථාවේ මම විශේෂයෙන්ම නියෝජ්‍ය ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, අවිධිමත්ව පැවතුණු අපේ වටිනා සම්පත් ක්‍රමානුකූලව විධිමත්ව පාලනය කරන්න නියෝග මේ සභාවට ඉදිරිපත් කිරීම ගැන. අපේ මහ සමුද්‍රයේ තිබෙන විශේෂ සම්පත් ආරක්ෂා කර ගැනීම පදනම් කර ගෙන තමයි මේ නියෝග ඉදිරිපත් වන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්පත් අපට කවුරුවත් දීපු දේවල් නොවෙයි. මේවා අපට ස්වභාවයෙන්ම ලැබුණු දායාද. ස්වභාවයෙන් ලැබුණු දායාද සංරක්ෂණය කර ගැනීම, ඒවා හොඳින් කළමනාකරණය කර ගැනීම රජයක වග කීමක්.

ලෝකයේ විශේෂම අවධානය අපේ රටට යොමු වෙලා තිබෙන්නේ, සංචාරක ක්ෂේත්‍රය නිසා පමණක් නොවෙයි. ජෛව විවිධත්වය අගය කරන බොහෝ රටවල් ස්වභාව ධර්මයේ තිබෙන සෞන්දර්ය නිසා අපේ රට කෙරෙහි අවධානය යොමු කර තිබෙනවා. සොබා දහමින් අපට ලැබී තිබෙන වටිනා සම්පත් සංරක්ෂණය කිරීමට මේ නීතිරීති අපට අවශ්‍ය වෙලා තිබුණා. මම ඔබතුමාට මේ කාරණය කියන්න කැමැතියි. දැන් කොළඹ නගරය ඉතාම ලස්සන කරලා, ස්වාභාවික සම්පත් භුක්ති විඳින්න අවශ්‍ය පරිසරය නිර්මාණය කර තිබෙනවා. වැව් පද්ධතිය හදලා, අර තිබුණු ආවරණ ස්වරූපය වෙනස් කරලා යම් දර්ශනීයභාවයක් ඇති කරලා තිබෙනවා. අද අපේ රටේ පමණක් නොවෙයි, වෙනත් රටවලත් කොළඹ නගරයේ වෙනස ගැන කථා කරනවා.

මම කියන්න ඕනෑ, එහෙම වුණත් අද කොළඹ සිට මාතරට යන කොට මුහුද පෙනෙන තැන් හරි අඩුයි කියලා. ඉස්සර පාසල් යන දරුවෝ කොළඹින් දුම්රියට නැග්ගාම මහ මුහුද දිහා බලා ගෙන යන්න ඕනෑ නිසා මුහුද පැත්තේ seatවල වාඩි වෙන්න පොඩි සටනක් කරනවා. අද මහා විශාල පවුරුවලින් මුහුද ආවරණය වෙලා. ඒ නිසා අපට ස්වභාව සෞන්දර්ය භුක්ති විඳින්න තිබෙන අවකාශ ඒවා තුළින් අහිමි කරලා තිබෙනවා. විශේෂයෙන්ම ඒවා යම් පුද්ගලයන්ගේ වුවමනාකම් මත පරිහරණය කරන්න, ආර්ථික බලාගාර විධියට පත් කරන්න සමහර වේලාවට සමහර අය කරන ක්‍රියා මාර්ග අපට පාලනය කරන්න බැරි වෙලා තිබෙනවා. මේ හේතු මතම සාගරය අපවිත්‍ර වෙනවා. අවිධිමත්ව, විනයක් නැතුව කරන සමහර ඉදි කිරීම්වලින් මහා සාගරය දූෂණය වෙනවා. මේක අපේ ස්වාභාවික සම්පත්වලට බලපානවා.

මම කියන්න කැමැතියි, සංචාරක කර්මාන්තය සම්බන්ධව දකුණු වෙරළ තීරයේ ලොකු වර්ධනයක් තිබෙන බව. මේ වර්ධනයත් එක්ක අවිධිමත් ඉදි කිරීම් මේ විධියට ගොඩ නැඟුණොත් අපට මේ ස්වාභාවික සම්පත් නියම විධියට භුක්ති විඳින්න ලැබෙන්නේ නැහැ. විශේෂයෙන්ම දකුණු වෙරළ තීරයේ මිරිස්ස වාගේ ප්‍රදේශවලට ඩොල්ෆින් මත්ස්‍ය විශේෂ, විශේෂයෙන්ම ලෝකයේ දුර්ලභ ගණයේ තල්මසුන් බලන්න අද සංචාරකයෝ විශාල වශයෙන් ඇදී එනවා. මේක විශාල කර්මාන්තයක් විධියට අද ගොඩ නැඟෙමින් තිබෙනවා. ඒක එක පැත්තකින් ඒ ප්‍රදේශවල අයගේ ධනෝපායන මාර්ගයක් වී තිබෙනවා. නමුත් ඒ කර්මාන්තයේ විධිමත් බවක් තිබුණේ නැහැ.

අපි කවුරුත් දැන් කථා කළා වාගේ අක්‍රමවත් යාත්‍රාවලින් සමහර වේලාවට මත්ස්‍යයන් බලන්න යෑමක් නොවෙයි, තල්මසුන් පසු පස හඹා යෑමකුයි තිබුණේ. ඒ නිසා ඔවුන්ගේ සාගර නිවාස ඔවුන්ට අහිමි වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ප්‍රදේශවලට තල්මසුන් එන්නේ ඒ සාගරයේ තිබෙන සුවිශේෂ ලක්ෂණ නිසායි. නමුත් ඔවුන්ට නිදහසේ හැසිරෙන්න ඉඩකඩ නැත්නම් ඒවා ක්‍රමානුකූලව, විධිමත්ව නියාමනය කළේ නැත්නම් ඒ මත්ස්‍ය විශේෂ අපට ආපහු දකින්න ලැබෙන්නේ නැහැ. ඔවුන් අපව හැර යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මම මේ වේලාවේ මතක් කරන්න කැමැතියි, කල්පිටිය ප්‍රදේශයේ ඉන්න මුහුදු ඌරන් ගැන. ඔවුන් ලෝකයේ දුර්ලභම සම්පතක්. විශේෂයෙන්ම

[ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා මහතා]

මන්නාරම් ද්‍රෝණියේත් ඒ වාගේම පෝක් සමුද්‍ර සන්ධිය ආසන්න ප්‍රදේශවලත් මේ මුහුදු ඌරන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. මොවුන් සංරක්ෂණය කරන්න එක්සත් ජාතීන්ගේ සංවිධානයත් අද අවබෝධතා ගිවිසුම්වලට ඇවිල්ලා තිබෙනවා. නමුත් මේකට බාධා වන සමහර තත්ත්වයන් තිබෙනවා. අද මේ ප්‍රදේශවලට ඉතා බහුල වශයෙන් ට්‍රෝලර් යාත්‍රා ඇතුළු වීම නිසා ඒ මුහුදු ඌරන් ජීවත් වන පරිසරය, ඔවුන්ගේ ආහාර, ඔවුන්ට නවාතැන් ගන්න තිබෙන පහසුකම්, ඔවුන්ගේ සංචරණය ආදී මේ සියල්ල අහිමි වෙලා තිබෙනවා. එක පැත්තකින් අපි මේවා බුද්ධිමත්ව විසඳා ගන්න ඕනෑ. රාජ්‍ය තාන්ත්‍රික විධියට මේ ප්‍රශ්න ගැන අවධානය යොමු කරලා, ජාත්‍යන්තර සම්මුතීන්ට අනුකූලව මේ සුවිශේෂ මත්ස්‍ය සම්පත ආරක්ෂා කිරීම රජයක් හැටියට අපගේ වග කීමක්. එම නිසා මේ ස්වාභාවික සම්පත් නිසි ලෙස කළමනාකරණය කර ගැනීමෙන් අපේ ජෛව විවිධත්වය සුරක්ෂිත වෙනවා වාගේම අපේ රටට විශාල ආදායම් මාර්ගයක් ලැබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු අමාත්‍යතුමා කථාව අවසාන කරන්න.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලීන වශයෙන් වැදගත් වන කොරල් පර, කඩොලාන, මහා සාගරයේ තිබෙන වෙනත් ජෛව සම්පත් ආරක්ෂා කර ගැනීම අප රජයක් හැටියට ඊළඟ පරම්පරාව වෙනුවෙන් කළ යුතු භාරදූර වග කීමක්. ඒ කාර්ය භාරය ඉටු කිරීම සම්බන්ධයෙන් මෙම නියෝග ඉදිරිපත් කිරීමට ක්‍රියා කිරීම ගැන අමාත්‍යාංශයේ සියලුම නිලධාරින්ට මම ස්තුතිවන්ත වෙනවා. මොකද, මේ කාරණය පසු ගිය කාලයේ දීර්ඝ වශයෙන් සංවාදයට ලක් වුණා. මේ කාරණා ගැන පාර්ලිමේන්තුවේ කථා කළා. මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වුණු සියලුම නිලධාරින්ට මේ අවස්ථාවේදී අපේ ස්තුතිය පිරිනමනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
බොහොම ස්තුතියි. ඊළඟට ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා.

**[අ.භා. 3.43]**

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම රජයක් හැටියට සංචාරක කර්මාන්තය දියුණු කිරීම අභිප්‍රාය කර ගෙන ඒ මත ආදායම් උපයන ඉලක්කයක් සහිතව කටයුතු කරන වකවානුවක මේ ගන්නා ක්‍රියා මාර්ගය එක පැත්තකින් ලෝකයේ අනන්‍ය වුණ, අපේ රටට විතරක් විශේෂත්වයක් තිබෙන මුහුදු ජීවීන්, මුහුදු පැළෑටි ආරක්ෂා කිරීමේ පදනමින් ගන්නා වැදගත් ක්‍රියා මාර්ගයක්ය කියා අප විශ්වාස කරනවා. ඒ පැත්තෙන් අප ඒක අගය කරනවා. විශේෂයෙන් ලෝකයේ රටවල් අතරින් අපේ රට නිල් තල්මසුන් ඉන්න, මත්ස්‍ය විශේෂයන් ගණනාවක් ඉන්න රටක් බව අප දන්නවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දැන් ප්‍රශ්නය වෙලා තිබෙන්නේ මෙයයි. මේ ක්‍රියා මාර්ගය ප්‍රායෝගිකව ක්‍රියාවට නඟද්දී ඇති වන තත්ත්වයන් පිළිබඳවත් සැලකිල්ලට ලක් කරන්නට ඕනෑ. එක පැත්තකින්, ඔබතුමා ඉදිරිපත් කරන මේ නියෝගවල ඇත්තටම වැදගත්කමක් තිබෙනවා. පසු ගිය දවස්වල ජීවිත ආරක්ෂක උපකරණ නැතිව බෝට්ටුවක ගිහින් පස් දෙනෙක් එකවර මිය ගියාය කියා අප දැක්කා. [බාධා කිරීමක්] සංචාරයක් සඳහා ගිහින් තමයි. අවසානයේදී ඒ අය බේරා ගන්නටවත් කෙනෙක් සිටියේ නැහැ. මොකද, පළපුරුදු යාත්‍රා ධාවකයෙක් එය පදවන්නේ නැති වුණාම, එහි ජීවිත ආරක්ෂක උපකරණ නොතිබුණාම ඇති වන ගැටලු තිබෙනවා. නිල වශයෙන් පැහැදිලි ලියා පදිංචි වීමක් නොවෙද්දි, එවැනි තත්ත්වයන් නිර්මාණය වී තිබෙන බව යථාර්ථයේ තිබෙනවා.

දැන් ප්‍රශ්නය තිබෙන්නේ, සංචාරක කර්මාන්තයට ආපු, විවෘත ආර්ථිකයේ ප්‍රතිඵලයක් හැටියට මේ කර්මාන්තයට කැඳවපු, මේ කර්මාන්තයේ දැනටමත් ඉන්න, දකුණු පළාතේ - විශේෂයෙන් හික්කඩුවේ ඒ පළාත්වල ඉන්න- මුහුදු තීරයේ, හලාවත පැත්තේ මුහුදු තීරයේ විශාල වශයෙන් ඉන්න මේ අයව මේ ක්‍රියාවලියට ග්‍රහණය කර ගන්නේ කොහොමද කියන එකයි. ඒ සඳහා ඔබතුමන්ලාගේ තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද කියන එකත් වැදගත්. මෙතැනදී එක උදාහරණයක් තිබෙනවා. "බලපත්‍රයක් නොමැතිව එම යාත්‍රාව යාත්‍රා කරන සෑම දිනයක් සඳහාම දිනකට රුපියල් 100/- බැගින් වූ දඩයකට යටත් විය යුතුය" කියා තිබෙනවා. දවසට මේ දඩය රුපියල් 100යි නම් සමහර විට බලපත්‍රයක් නැතිවම යන්න කැමැති අයත් ඇති. මොකද, දෙන්න තිබෙන්නේ රුපියල් 100යිනේ. එහෙම හිතන අයත් ඉන්නවා. ඒක තමයි ඇත්ත දෙය. එම නිසා දැනටමත් මේ කර්මාන්තයේ යෙදී ඉන්න අයව රැක ගනිමින් විධිමත් ක්‍රියාවලියට මේ අයව ගන්නේ කොහොමද කියන එක පිළිබඳව ඇත්තටම වැඩ පිළිවෙළක් අවශ්‍යයි. එහෙම නැතිව මේක ආයෙත් වරක් දඩ ගහන, ලියා පදිංචි කරන එහෙම නැත්නම් වන ජීවී සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්වරයාට තව රුපියල් පන්දාහක් වාර්ෂික කුලිය හැටියට ගන්න ආදායම් මාර්ගයක් විතරක් වුණෝතින් ප්‍රතිඵලයක් ඇති වන්නේ නැහැ.

මේ පිළිබඳව නිවැරදි පසු විපරමක් නැත්නම් වැඩක් වෙන්නේ නැහැ. මේ පසු විපරම් ක්‍රියාවලිය වැදගත්. ඒක සිදු වුණොත් විතරයි, සංචාරකයාගේ ජීවිතයත් ආරක්ෂා වෙලා, මුහුදු ජීවියාගේ ජීවිතයත් ආරක්ෂා වෙලා මේ ගන්නා ක්‍රියා මාර්ගය යථාර්ථයක් බවට පත් වන්නේ. නැත්නම් මේක යථාර්ථයක් වන්නේ නැහැ. මේක පරීක්ෂා කරන්නය කියා තව නිලධාරින් කිහිප දෙනෙකුට රැකියා ඇති වෙයි. ඒ කට්ටියට යටින් අතමිට මොලවා බලපත්‍ර නැති, යෝග්‍යතාව නැති, සුදුසුකම් නැති බෝට්ටු පරණ විධියටම මුහුදේ යාවි. ඒකෙන් තෙල් ඉන්ධන එළියට යන ඒවා ඔක්කොමත් සිද්ධ වෙයි. පරිසරය ආරක්ෂා වන්නේත් නැහැ. සංචාරකයින්ගේ ජීවිත ආරක්ෂා වෙන්නේත් නැහැ. ඒක ප්‍රතිඵලයක් නැති වැඩක් බවට පත් වෙයි.

ඒ නිසා ඔබතුමා මේ ගන්නා ක්‍රියා මාර්ගය යහපත් ක්‍රියා මාර්ගයක් බවට පත් වෙන්න නම්, ඇත්තටම මේකට විධිමත් ක්‍රමවේදයක් අවශ්‍යයි. ඒ වාගේම ඔබතුමාගේ මේ ක්‍රියා මාර්ගය අගය කරන ගමන්ම තවත් කාරණයක් පෙන්වා දෙන්නත් කැමැතියි. දැන් බලන්න, මෙවැනි බලපත්‍රයක් සඳහා වන ඉල්ලුම් පත්‍රය පුරවන්නත් මාස එකහමාරක්, දෙකක් විතර යනවා. ප්‍රශ්නය තිබෙන්නේ දැන් ඉන්න අයට මේක පුරවා ගන්න පුළුවන් වේවිද කියන එකයි. ඒකට ඔබතුමාගේ පැත්තෙන් දෙන ආයතනගත වැඩ පිළිවෙළ මොකක්ද කියා මා අහන්න කැමැතියි. අන්න ඒ පිළිබඳවත් ඔබතුමාගේ කථාවේදී හෝ පැහැදිලි කිරීමක් වෙනවා නම් මේ ක්‍රියා මාර්ගය සාර්ථක ක්‍රියා මාර්ගයක් හැටියට හඳුන්වන්න පුළුවන්. එහෙම නැතිව සතුන් බෝ වෙනවා වාගේ බෝට්ටුවක් තිබෙන කෙනා මේකට එනවා; පිළිගැනීමක් නැහැ; සුදුසුකම් නැහැ; ජීවිත ආරක්ෂාවක් නැහැ; සතුන්ගේ ආරක්ෂාවකුත් නැහැ; මිනිස්සුන්ගේ ආරක්ෂාවකුත් නැහැ කියන තත්ත්වයට මෙය පත් නොවේවිය කියා මා විශ්වාස කරනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න.

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

හොඳයි. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, විශේෂයෙන්ම ඔබතුමාගේ විෂය පථයට අයිති ඒ වාගේම කාලීන වැදගත්කමක් තිබෙන කාරණාවක් මා ඔබතුමාගේ අවධානයට යොමු කරවන්න කැමැතියි. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ඇලහැර, 12 කනුව කියන ගම ඉවත් කරන්න ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් කටයුතු කරමින් ඉන්නවා කියා වාර්තා වෙනවා. ඊයේත් වනජීවී කාර්යාලයේ නිලධාරින් පිරිසක් එතැනට ගිහින් තිබෙනවා. අලි මංකඩක් එතැන හදන්න යනවා කියායි දැන ගන්න තිබෙන්නේ. අලි මංකඩක් හදන්න ගම ඉවත් කරනවා. ප්‍රශ්නය තිබෙන්නේ එතැනට අලි යන්නේ නැතිකමයි. අලි මංකඩක් වෙන්න නම් ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අලි යන එන තැනක් වෙන්න ඕනෑය කියන එක මා ඔබතුමාට කියන්න ඕනෑ නැහැ. මොරගහකන්ද පැත්තට අලි යන්නේ ඊට වඩා කිලෝ මීටර් ගණනක් ඈතිනුයි. කැලෑවදින අලියෙක් දෙදෙනෙක් අහම්බෙන් මේ ගමට ඇවිල්ලා තිබෙනවා මිසක මේක අලි මංකඩක් නොවෙයි. ඒ නිසා ගම්මුන්ගේ බරපතළ විරෝධතාවක් මේකට තිබෙනවා. ඔබතුමා මේ පිළිබඳ විශේෂ අවධානය යොමු කරන්නය කියා මා ඉල්ලා සිටිනවා. මම මේ කාරණාව කියන්නේ අද මේවා ගැන සාකච්ඡා වන නිසාමයි. ඒ ගමේ පන්සලේ ස්වාමීන් වහන්සේ, ගම්මු මේ පිළිබඳව අපට වාර්තා කළා ඔබතුමාව දැනුවත් කරන්නය කියා.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද ගමේ නම?

**ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා**
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඇලහැර, 12 යාය ගම කිව්වාම දන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

බොහොම ස්තුතියි. මීළඟට ගරු සුසන්ත පුංචිනිලමේ නියෝජ්‍ය ඇමතිතුමා.

**[අ.භා. 3.50]**

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே - கடற்றொழில், நீரக வளமூலங்கள் அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Susantha Punchinilame - Deputy Minister of Fisheries and Aquatic Resources Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කොපමණ වෙලාව තිබෙනවාද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
විනාඩි පහක කාලයක් තිබෙනවා.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු වනජීවී නියෝජ්‍ය ඇමතිතුමා ගෙනා නියෝග සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී විශේෂයෙන්ම එතුමාගේ අමාත්‍යාංශයත් අපේ ධීවර අමාත්‍යාංශයත් ඒකාබද්ධව කටයුතු කළ යුතු වනවා. අපේ ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කිව්වා වාගේ මෙය අපි කථා බහ කර ගෙන කරන්න ඕනෑ ව්‍යාපාරයක්. මොකද, හැම බෝට්ටුවක්ම මුහුදට දමන විට අනිවාර්යයෙන්ම අපි අංකයක් ලබා දෙනවා. ඒකට ධීවර දෙපාර්තමේන්තුවේ licence එකක් ගන්න ඕනෑ. එය එහි සටහන් විය යුතුයි. ඒ නිසා ඒ කටයුතු කරන කොට කථා කරගෙන, සාධාරණ විධියට ඒ මිනිසුන්ට අවශ්‍ය කරන පහසුකම්, ආරක්ෂක තත්ත්වයන් ලබා දීලා ක්‍රියා කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වනෝද්‍යානවල ඉදි කර තිබෙන කුඩාරම් සම්බන්ධව අපේ ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා කිව්වා. ඒ වාගේම ඒවා තුළින් සතුන්ට හානි වෙනවා කිව්වා. හැබැයි එතුමාගේ පියාගේ කාලයේ තමයි නවබුතුව බංගලාව අසළ කැලෑව ඇතුළේ helipad එකක් ගහලා helicopters බස්සලා සතුන්ට විශාලම damage එක ඇති කරන තත්ත්වයක් උදා කළේ කියන එක මා මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තව කාරණයක් මතක් කරන්න ඕනෑ. අපේ ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමා තමයි මේ කුඩාරම් ගහන්න දුන්නේ; ඊට පස්සේ අපේ ජනාධිපතිතුමා ඉවත් කළාය කියලා. ඒක සම්පූර්ණයෙන්ම අසත්‍යයක්. අසත්‍ය තොරතුරු එතුමාට දීලා තිබෙන්නේ. ඒකත් ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමාට අර පොත දුන්නා වාගෙයි. අපේ ගරු පාඨලී චම්පික රණවක ඇමතිතුමා වනජීවී ඇමතිවරයා වෙලා හිටපු කාලයේ තමයි කුඩාරම් ගහන්න දීලා තිබෙන්නේ කියලායි මට දැන ගන්න ලැබුණේ. ඒ නිසා මේකට කුමන ආකාරයකින්වත් ගරු බැසිල් රාජපක්ෂ ඇමතිතුමාගේවත්, දැනට ඉන්න ලේකම්තුමාගේවත්, අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේවත් සම්බන්ධයක් නැහැ. දැන් ඒක නිවැරදි කරලා තිබෙනවා, මුළු ලංකාවේම තිබෙන parksවල එවැනි ඉදි කිරීම් කටයුතු සිදු වෙන්නේ නැහැ කියලා. මාත් දවස් තුනකට පස්සේ ඊයේ උදේ තමයි පිලින්නාවේ ඉඳන් ආවේ, පාර්ලිමේන්තුවට සහභාගි වෙන්න ඕනෑ නිසා. මාත් ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමා වාගේ පොඩි කාලේ ඉඳන්ම කැලයේ සංචාරය කරන කෙනෙක්. එතුමාගේ පියා ඒ කාලයේ යන කොටත් අපි පොඩ්ඩක් side එකෙන් යනවා. මොකද, ඒ කාලයේ හැටියට අපට ඉස්සරහින් යන්න ටිකක් අමාරුයි. මේ කරුණු නිවැරදි විය යුතුයි. මේ රටට අපි ඇත්ත කියන්න ඕනෑ. අසත්‍ය කියන්න හොඳ නැහැ. එහෙම නැති වුණොත් ගරු බැසිල් ඇමතිතුමා මේ කටයුත්තට ඉඩ දුන්නාය, ජනාධිපතිතුමා අයින් කළාය කියලා අද හැන්දෑවට newsවලින් බොරු බෙගල් කියාවි. මේක නිවැරදි කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම විශේෂයෙන්ම අපි මතක් කරන්න ඕනෑ, මේ ක්ෂීරපායී සතුන්ගේ විනාශය ඇති වෙලා තිබෙන්නේ, ඩයිනමයිට් පාවිච්චිය විශාල වශයෙන් වැඩි නිසා බවයි. මම ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය නියෝජනය කරන නිසා ඒ බව දන්නවා. සමහර ධීවර ජනතාව කිලෝමීටර් 7ට එහායින් දාන්න ඕනෑ දැල් කිලෝමීටර් 7ට මෙහායින් දාලා ඩයිනමයිට්

[ගරු සුසන්ත පුංචිනිලමේ මහතා]

දැමීම නිසා, තල්මසුන් ඩොල්ෆින් වැනි ක්ෂීරපායී සතුන්ගේ විනාශය ඇති වෙලා තිබෙනවා. එතකොට ඒ වාගේ සතුන් මුහුදේ ඈතට යන තත්ත්වයක් තිබෙනවා. එහෙම නැතුව Navy එකෙන් දාපු නැව නිසා එක මත්ස්‍යයෙක්වත් අපේ මුහුදු සීමාවෙන් එහාට යන්නේ නැහැ. ලෝකයේ අනෙක් රටවල ඒ මත්ස්‍යයින් සමඟ අපට පීනන්න පුළුවන්. තල්මසුන් ළඟට ගිහිල්ලා ඔවුන් අත ගාන්න පුළුවන්. ඔවුන් ඉතාමත් අහිංසක සත්ව කොට්ඨාසයක්.

විශේෂයෙන්ම ත්‍රස්තවාදී යුද්ධය තිබුණු පසු ගිය වකවානුවේ පවා ත්‍රිකුණාමලය වරාය තුළ තල්මසුන් බෝ වුණා. සාමාන්‍යයෙන් ඒ කාලයේ තිබුණු වාතාවරණය යටතේ තල්මසුන් බෝ වෙන්නේ නැහැ. අලින්ට වාගේම තල්මසුන්ටත් විශාල දැනුමක් තිබෙනවා. කෙසේ වෙතත්, ඒ නාවුක යාත්‍රාව නිසා අයහපතක් වෙන්නේ නැහැ කියලා මම ඉතාම වග කීමෙන් යුතුව කියනවා. එම නිසා ඒ කරුණත් නිවැරදි විය යුතුයි. ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම නාවික හමුදාව දාලා තිබෙන යාත්‍රාව නිසා දේශීය සංචාරකයින් විශාල පිරිසකට තල්මසුන්, ඩොල්ෆින් වැනි මත්ස්‍යයින් බලා ගැනීමේ හැකියාව ලැබිලා තිබෙනවා. ඒ නැව නිසා ඒ සතුන්ට කිසිම හානියක් වෙන්නේ නැහැ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට විනාඩියක කාලයක් දෙන්න.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
මට කථා කරන්න තිබෙන්නේ විනාඩි පහයි.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒ ස්ථානයේ සිටින සතුන්ට විතරක් නොවෙයි ප්‍රශ්න ඇති වෙන්නේ. මට මහාචාර්යවරයෙක් කථා කරලා කිව්වා, එයින් පිටවන තරංග නිසා ලොකු ප්‍රශ්නයක් ඇති වෙනවා කියලා. ඒ යාත්‍රාවේ විශාල අවර පෙති තිබෙනවා.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
ගරු මන්ත්‍රීතුමා, මම කියන්නේ මහාචාර්යතුමාගේ තර්කයක් ගැන නොවෙයි. මම ඒ පළාතේ ජීවත් වන පුද්ගලයෙක් වශයෙන් මම ඒක දකිනවා. ඉස්සර කොටි ත්‍රස්තවාදීන් හිටපු කාලයේ සාම්පූර්වලට යන්න තිබුණේ ගොඩ බිමින් නොවෙයි, මුහුදින්. ඒ කාලයේ බෝට්ටුවට නැඟලා සාම්පූර්වලට යන කොට මුහුදේ තල්මසුන් හිටියා අපි දැක්කා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මම කිව්වේ ගාල්ලේ.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
මම මේ කියන්නේ ත්‍රිකුණාමලය ඇතුළු ඒ ප්‍රදේශයේ. එහේ තල්මසුන්ට නම් ඔය යාත්‍රාවල ශබ්දවලින් ප්‍රශ්නයක් නැහැ. මොකද, ඔවුන් බුද්ධිමත් සත්ව කොට්ඨාසයක්. ඔවුන් දන්නවා, ඔවුන්ට හිංසාවක් නැත්නම් ප්‍රශ්නයක් නැහැ කියලා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා. දැන් කථාව අවසන් කරන්න.

**ගරු සුසන්ත පුංචිනිලමේ මහතා**
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)
අද ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමා ගෙනාපු යෝජනාව ඉතා වැදගත්. ඒ කටයුත්ත සාර්ථක කර ගන්න ධීවර අමාත්‍යාංශය වෙනුවෙන් අපට දෙන්න පුළුවන් උපරිම සහයෝගය දෙන බව ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**[අ.භා. 3.55]**

**ගරු ආචාර්ය සරත් වීරසේකර මහතා**
(மாண்புமிகு கலாநிதி சரத் வீரசேகர)
(The Hon. (Dr.) Sarath Weerasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විනාඩි පහක් කියන්නේ ඉතාම කෙටි කාලයක්. මෙම නියෝග සම්බන්ධයෙන් විපක්ෂය වෙනුවෙන් ගරු සජිත් ප්‍රේමදාස මන්ත්‍රීතුමායි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමායි කරුණු දෙකක් මතු කළා. ඒ ගැන කියන්න ඕනෑ. එකක් තමයි අපි නවසීලන්තය සහ ටොංගෝ යන රටවල්වලින් ආදර්ශයක් අරගෙන ක්ෂීරපායී මත්ස්‍යයන් සංරක්ෂණය කිරීම පිළිබඳව අධ්‍යයනය කළ යුතුයි කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි මේක තමයි අපට වුණු විනාශය. මොකද, අපේ අභිමානය, අපේ දැක්ම, අපට තිබෙන උසස් තාක්ෂණය අපි හැම තිස්සේම අවතක්සේරු කළා. එදා මාදුරුඔය ජලාශ ව්‍යාපෘතිය කරන කොට කැනේඩියානු විද්‍යාඥයින් මාස හයක් පමණ පරිගණකවලින් ගණනය කරලා එතැන හාරන කොට අවුරුදු 1,800ක් පැරණි සොරොව්වක් මතු වුණා. අපට එවැනි තාක්ෂණයක් තිබුණා. ඒ වාගේම ටොංගෝ රාජ්‍යයත්, නවසීලන්ත රාජ්‍යයත් ඒ දවස්වල -1923 දී- තල්මසුන් මරා ගෙන කන කොට තමයි අපි මේ Fauna and Flora Protection Ordinance කියන පනත සම්මත කරලා සියලුම වන ජීවීන්, සියලුම මත්ස්‍යයින් ඇතුළු සියලුම ජීවීන් සංරක්ෂණය කරන්නට තීරණය කළේ.

මගේ මිත්‍ර ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කිව්වා, jetliner නෞකාවේ විශාල අවර පෙතිවලින් විශාල විනාශයක් සිද්ධ වෙනවා කියලා. මා නාවික හමුදාවේ හිටියා. ඒ නිසා මා එතුමාට මේ ටික කියන්න ඕනෑ. Jetliner නෞකාවට අවර පෙති නැහැ; propellers නැහැ. Jetliner නෞකාවට තිබෙන්නේ waterjets පමණයි. ඒ කියන්නේ වතුර පිටු පසට විදලා ඒ බලයෙන් තමයි ගමන් කරන්නේ. ඒකේ ශබ්ද තරංග ඉතාම අඩුයි. ඒ වාගේම jetliner නෞකාව කවදාවත් කොළඹින් පිටත ගැඹුරු මුහුදට යන්නේ නැහැ. කොළඹ අවට තමයි සැරිසරන්නේ. ඉඳලා හිටලා තමයි ගාල්ලට යන්නේ. ඒ නිසා ඒකෙන් කිසිම විනාශයක් වෙන්නේ නැහැ. එතුමාට ඒ උපදෙස් දුන් මහාචාර්යවරයාගෙන් මේ කරුණු ටික සනාථ කර ගන්න කියලා මා නැවත වරක් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යුද්ධයෙන් පසු අපේ සංචාරක ව්‍යාපාරය දියුණු වුණා. අපේ රටේ ජාතික වනෝද්‍යාන තිබෙනවා; වෙරළ තීර තිබෙනවා; පුරාවස්තු තිබෙනවා. ඒ වාගේම ආරුගම්බේ වාගේ තැන්වල දිය මත ලිස්සා යෑමේ ක්‍රීඩාව කරනවා. ඒ සඳහා ලෝකයෙන් තුන්වැනි නැත්නම් හතරවැනි තැනට පත් වන ප්‍රදේශයක් තමයි, ආරුගම්බේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි දැන් අපේ තල්මසුන්, මුහුදු ඌරන් සහ dolphins බලන්න විශාල වශයෙන් සංචාරකයන් පැමිණෙනවා කියන එක. තල්මසුන් සිටින්නේ නිම්නවලයි. ඒ නිම්න ත්‍රිකුණාමලයේ තිබෙනවා; මඩකළපුවේ තිබෙනවා; ඔලුවිල්වල තිබෙනවා; මිරිස්සේ තිබෙනවා. ඒ වාගේම මහා රාවණා කොටුවේ - great basses වල- තිබෙනවා. ඒ ගැඹුරු මුහුදත් සමඟ තිබෙන edgesවල තමයි තල්මසුන් ජීවත් වන්නේ. ඒ වාගේම, අපේ මහාද්වීප තටකය - continental shelf - ඉතාම නුදුරින් පිහිටා තිබෙන නිසා තමයි තල්මසුන් වැඩි වශයෙන් එන්නේ. විශේෂයෙන්ම මේ තල්මසුන් ගැවසෙන්නේ -

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු ආචාර්ය සරත් වීරසේකර මහතා**
மாண்புமிகு கலாநிதி சரத் வீரசேகர)
(The Hon. (Dr.) Sarath Weerasekara)
මට තව විනාඩියක් දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

විශේෂයෙන්ම මේ තල්මසුන් ගැවසෙන්නේ main shipping lanes වල නිසා, ඒ කියන්නේ ප්‍රධාන නෞකා ගමන් කරන මාර්ගයේ නිසා, අර කිව්වා වාගේ අවර පෙතිවලට හසුවෙලා පසු ගිය අවුරුද්දේ පමණක් තල්මසුන් තුන්දෙනෙක් මැරිලා තිබෙනවා. ඒ වාගේම තමයි ඔවුන් අන්දමන්ද වන ගතියක් තිබෙනවා. ඒ කියන්නේ disorientate වෙනවා. බොහෝ වෙලාවට මිනිස්සු බෝට්ටුවලින් ගිහිල්ලා වට කර ගෙන තල්මසුන් බලනකොට ඒ තල්මසා disorientate වෙලා coast එකට එනවා. එහෙම ආවාට පස්සේ, නැවත වතාවක් ගැඹුරු මුහුදට යන්න ශක්තිය නැති නිසා මිය යනවා. ඒ වාගේ දේවල් ගණනය කරලා තමයි, අධ්‍යයනය කරලා තමයි මේ වාගේ නියෝග හදලා තිබෙන්නේ. ඒ නියෝග පිළිපැදිය යුතුයි කියලා මා කියා සිටිනවා. මට තවදුරටත් කථා කරන්නට වෙලාව මදි වීම ගැන කනගාටු වෙමින් මගේ වචන ස්වල්පය සමාප්ත කරනවා. ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது*
*Question proposed.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කිරීමට පෙර කවුරු හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා**
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ජානක බණ්ඩාර මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு ஜானக பண்டார அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. JANAKA BANDARA *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

## තරඟ පාවා දීම
## ஆட்ட நிர்ணய சூதாட்டம்
## MATCH FIXING

**[අ.භා. 4.00]**

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ දී මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"මෑතක සිට ක්‍රීඩා ක්ෂේත්‍රයේ මහත් ආන්දෝලනයකට පත් වී ඇති ප්‍රශ්නයක් නම් තරඟ පාවා දීමයි; Match fixing. ලෝකය පුරා විශේෂයෙන් ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් තරඟ පාවා දීමේ චෝදනාව එම ක්‍රීඩාවේ ක්‍රීඩකයන්ට පමණක් නොව විනිසුරුවන් කෙරෙහි පවා එල්ල වී ඇත.

මෙම චෝදනාව ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාවට මහත් අපකීර්තියකි. ක්‍රිකට් ක්‍රීඩාවේ උද්ගත වී ඇති මෙම අවාසනාවන්ත තත්ත්වය පිළිබඳව සොයා බලා, ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට පෙර අත්ව තිබූ කීර්තිය නැවත වරක් ලබා දීම සඳහා මෙම චෝදනාව එල්ල වූවන් පිළිබඳව කරුණු විමර්ශනය කර බලා වරදකරුවන් වූවන් හට දැඩි දඬුවම් පමුණුවන ලෙස මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේටත් මතක ඇති, ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව ජාත්‍යන්තර මට්ටමට ගෙනෙන්න ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිතුමාගේ කාල සීමාව තුළ කටයුතු කළ බව. එවකට හිටපු ගාමිණී දිසානායක ඇමතිතුමා තමයි ඒ පිළිබඳව මූලිකත්වය අරගෙන කටයුතු කළේ. ඒක අපට අමතක කරන්න බැහැ. එම කාල පරිච්ඡේදය තුළ ඒ ක්‍රීඩාවේ නිරත වූ ක්‍රීඩකයන් බොහොම වුවමනාවෙන් ඒ ලබා ගත්ත ගරුත්වය රැක ගත්තා. අද ඒ සම්බන්ධයෙන් කනගාටුදායක තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. පසු ගියදා පැවැති විස්සයි විස්ස ලෝක කුසලාන ක්‍රිකට් තරඟය අවසන් වූ විගස මහා චෝදනාවක් ආවා, මුදලට මේ තරඟය පාවා දීමක් සිදු වුණා ද

[ගරු ජෝන් අමරතුංග මහතා]

කියලා. දහස් ගණන් ජනතාව මේ ක්‍රීඩාව නරඹන්න බොහොම වෙහෙස මහන්සි වුණා. රුපියල් පනහට, සියයට වික්ක ටිකට් පත රුපියල් හාර පන්දහසකට ගන්න පවා ජනතාව පොරකෑවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේත් දකින්න ඇති පසු ගිය දවස්වල ක්‍රිකට් පාලක මණ්ඩලයට විරුද්ධව, රජයට විරුද්ධව විවිධ චෝදනා ප්‍රවෘත්ති පත්‍රවල පළ වුණා, ඇයි මේ ප්‍රවේශ පත්‍ර කලින් වික්කේ කියලා. එක එක කොන්ත්‍රාත්කරුවෝ ප්‍රවේශ පත්‍ර සීය, දෙසීය බැගින් අරගෙන එළියට ඇවිල්ලා, ඒවා වැඩි මුදලට විකුණන්න පටන් ගත්තා. ඒ වාගේ අවාසනාවන්ත තත්ත්වයක් ඇති වුණා.

අපේ රටේ පුරවැසියන්ගේ විශාල බලාපොරොත්තුවක් තිබුණා, මේ තරගයෙන් ශ්‍රී ලංකාව ජය ගනී කියලා. මේ තරගය පරදින්න හේතු වුණේ, අරයා ආපු නිසාය, මෙයා ආපු නිසාය කියලා සමහරු විවිධ චෝදනා කළා. නමුත් මම ඒ ගැන කථා කරන්න යන්නේ නැහැ. කෙසේ වෙතත් ඒ බලාපොරොත්තුව තුළට යම් කිසි සැකයක් පහළ වුණා, මේ තරගයත් මුදලට පාවා දුන්නාද කියලා. එය තමයි මෙතැන තිබෙන තත්ත්වය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මම කැමැතියි, මුදලට ක්‍රීඩාව පාවා දීම - match fixing - පිළිබඳව ඉතිහාසය පොඩ්ඩක් මේ සභාවට ඉදිරිපත් කරන්න. තරග මුදලට පාවා දීම සඳහා පෙළඹවීම් ඇති කිරීමට හේතු වන තත්ත්වයන් කවරේද? එය කණ්ඩායමක බල අධිකාරිත්වය දරන පුද්ගලයකු විෂයයෙහි කණ්ඩායමේ සාමාජිකයන් අතර පවත්නා අන්‍යෝන්‍ය අකැමැත්තක ප්‍රතිඵලයක්ද? ග්‍රීසියේ ඔලිම්පික් කාල සීමාවේදීත් තුරඟ තරගවලදී මෙවැනි ඔට්ටු අල්ලා තිබෙනවා. ඉතිහාසයේ සඳහන් වනවා, 1919 දී බේස්බෝල් තරගයකදීත් මේ වාගේ සිද්ධියක් ඇති වුණා කියලා. සියලු තරග අතර මුදලට තරග පාවා දීමේ විෂයයේ ඉහළම අගයක් රඳවා ගෙන සිටින්නේ ක්‍රිකට් ක්‍රීඩාවයි. ක්‍රිකට් ක්‍රීඩාවට තමයි මේ චෝදනා සියල්ලක්ම එන්නේ. මුදලට තරග පාවා දීම මඟින් මහත්වරුන්ගේ ක්‍රීඩාවක් මුළුමනින්ම ලෝක අපවාදයක් තුළ ගිල්වා තිබෙනවා. අද ඒ තත්ත්වය තමයි පැන නැඟිලා තිබෙන්නේ. ලංකාවේ පමණක් නොවෙයි, ආසියාවේ අනෙකුත් රටවලත් ඒ චෝදනාව පවතිනවා. පසු ගිය දශකය පුරා මුදලට තරග පාවා දීම සම්බන්ධ අපකීර්තිමත් සිද්ධි මඟින් ඉන්දියානු ක්‍රිකට් ක්‍රීඩාව සසල කරනු ලැබ තිබෙනවා. ඒ තාක් දුරට බුකීකරුවන් හා පාතාලය විසින් ක්‍රිකට් තරග හසුරුවනු ලැබීමට උත්සාහ කරන්නේය යන්න මේ වන විට සාමාන්‍ය දැනීමක් බවට පත් වී තිබෙනවා. අද එය ලෝකය පුරාම ප්‍රචාරය වී තිබෙනවා.

ජාත්‍යන්තර ක්‍රිකට් තරග බිම සසල කරන ලද්දා වූ පළමු අපකීර්තිමත් සිදුවීම සිදු වුයේ 1998 දීයි. එහිදී කාලගුණික හා තණතිල්ල පිළිබඳ තොරතුරු හෙළිදරව් කිරීම වෙනුවෙන් ඉන්දියානු බුකීකරුවන් විසින් මුදල් ලබා ගැනීම හේතු කොට ගෙන ඕස්ට්‍රේලියානු ක්‍රිකට් පාලක මණ්ඩලය විසින් ඕස්ට්‍රේලියානු ක්‍රිකට් ක්‍රීඩකයන් වන ෂේන් වෝන් හා මාක් වෝ වෙත දඩුවම් පැමිණුවා. ඒ රටවල දඬුවම් කරලා තිබෙනවා.

කෙසේ වුවද, ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාවේ කීර්තියට යළි හිස එසවිය නොහැකි පරිදි හානි පමුණුවමින් සහ තවදුරටත් ක්‍රිකට් යනු මහත්වරුන්ගේ ක්‍රීඩාවක් නොවන බව ප්‍රකට කරමින් ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාව වඩාත්ම රළු කම්පනයකට ලක් කළ වර්ෂය වුයේ 2000 වර්ෂයයි. ඉන්දියානු බුකීකරුවෙකු හා දකුණු අප්‍රිකානු ක්‍රිකට් නායක හැන්සි ක්‍රොන්ජේ අතර සිදු වූ සංවාදයක් දිල්ලි පොලීසිය විසින් හසු කර ගන්නා ලද අවස්ථාවේ මේ සියල්ලෙහි ආරම්භය සනිටුහන් වුණා. මේ සංවාදය තුළ වසර 2000 ඉන්දියා-දකුණු අප්‍රිකා එක් දින තරග මාලාව තුළ තරග පරාජය වීම සඳහා හැන්සි ක්‍රොන්ජේ විසින් අල්ලස් ලබා ගෙන ඇති බව පැහැදිලි ලෙස හෙළි වුණා. මහත්වරුන්ගේ ක්‍රීඩාව වන ක්‍රිකට් ක්‍රීඩාවට මීළඟ බලවත් පහර වැදුණේ මුදලට තරග පාවා දීම පිළිබඳව පාකිස්තානු ක්‍රිකට් ක්‍රීඩකයින් තිදෙනෙකු වෙත චෝදනා එල්ල වූ අවස්ථාවේදීයි. එංගලන්තයට සහ ඕස්ට්‍රේලියාවට එරෙහිව පැවැති ටෙස්ට් තරගවලදී පාකිස්තානු ක්‍රිකට් කණ්ඩායමේ මොහොමඞ් අසීෆ්, කම්රන් අක්මාල් සහ සල්මන් බට් වෙත මුදලට තරග පාවා දීමේ චෝදනා එල්ල කරනු ලැබ, ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලය විසින් දීර්ඝ කාලීන තරග තහනමක්ද පනවනු ලැබුවා. මේ තමයි විවිධ අවස්ථාවන්වලදී ඇති වුණු සිද්ධීන්.

හිටපු ශ්‍රී ලංකා ක්‍රිකට් නායක හෂාන් තිලකරත්න විසින් දූෂණය ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව වනසමින් පවත්නා බවට චෝදනා එල්ල කිරීමත් සමඟම, 1982 වර්ෂයේදී ටෙස්ට් වරම් ලද අවස්ථාවේ සිට මත භේදයට ලක් නොවී නිරුපද්‍රිතව ඉදිරියට ආ ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව ද ලෝක ක්‍රිකට් භූමිය තුළ කම්පනයක් ඇති කිරීමට සමත් වුණා. තවදුරටත් අදහස් ප්‍රකාශ කරමින් ඔහු කියා සිටියේ, මෙම තත්ත්වය 1992 වර්ෂයේ සිට පැතිරී පැවති බවයි. 1996 ලෝක කුසලානය දිනා ගනිමින් ශ්‍රී ලංකාවට කීර්තියක් ලබා දුන් අර්ජුන රණතුංග ද තිලකරත්නගේ ප්‍රකාශය හා එකඟ වූ අතර, 2011 වර්ෂයේදී ඉන්දියාවට එරෙහිව පැවැති ලෝක කුසලාන අවසන් මහා තරගය සඳහා කණ්ඩායම තෝරා ගත් ආකාරය ප්‍රශ්න කර සිටියේය. ඉන්පසු 1996 දී ශ්‍රී ලංකාව විසින් ලෝක කුසලානය දිනා ගැනීමෙන් අනතුරුව ක්‍රිකට් ක්‍රීඩාව ඩොලර් දශ ලක්ෂ ගණනින් හුවමාරුවන ව්‍යාපාරයක් බවට පත්ව ඇති බව ප්‍රකාශ කරමින් කුමාර් සංගක්කාර විසින් පවත්වන ලද ව්‍යක්ත දේශනය ද මෙම තත්ත්වය තවදුරටත් සනාථ කරන්නක් වුණා.

තීරණාත්මක අවසන් තරගවලදී ශ්‍රී ලංකාවේ ජාතික කණ්ඩායම අන්ත පරාජයෙන් පරාජයට මුහුණ දුන් මෙවන් සිද්ධි සමුදායක් හා අදාළ පසුබිමකය අප හට ශ්‍රී ලංකා ක්‍රිකට් පිළිබඳව පරීක්ෂා කිරීමට සිදු වන්නේ. 2007 වර්ෂයේ බටහිර ඉන්දීය කොදෙව් දූපත්හි බාර්බඩෝස්හිදී පැවැති ලෝක කුසලාන අවසන් තරගයේදී අපි ඕස්ට්‍රේලියාවට පරාජය වුණා. ඉන් පසු නැවත වරක් 2011 වර්ෂයේ බොම්බායේදී ඉන්දියාවට එරෙහිව අපි ලෝක කුසලාන අවසන් තරගය පරාජය වුණා. අවසන් තරගයේ ජයග්‍රහණයට ඉතාමත්ම ආසන්නව සිටි අවස්ථාවක 20-20 තරග මාලාවේ අවසන් තරගයේදී සැබෑ ලෙසම දුර්වල කණ්ඩායමක් වූ හා තරග දිනනු ඇතැයි එතරම් අපේක්ෂා නොකළ කණ්ඩායමක් වූ බටහිර ඉන්දීය කණ්ඩායමට ද අපි පරාජය වුණා. මෙවැනි සිදුවීම් සිදු වනුයේ මුදලට තරග පාවා දීම නිසාද, නොඑසේ නම් ශ්‍රී ලංකාවේ ක්‍රිකට් කණ්ඩායම අශෝභන දේශපාලන සංස්කෘතියක් විසින් ගිලගනු ලැබ ඇති බැවින්ද? එය ප්‍රශ්නයක් වී තිබෙනවා. අපි පසු ගිය ලෝක කුසලාන අවසන් මහා තරග පරාජය වූයේ තැතිගැන්මක් නිසා නොවන බවට මම නොබියව ප්‍රකාශ කරනවා. අප විසින් 1996 ලෝක කුසලානය ජයග්‍රහණය කරන ලද්දේ නම් ඉන් පසු එළැඹි ලෝක කුසලාන තරගවලදී පරාජය වීමට කිසිදු හේතුවක් නැහැ. එයයි අපේ අදහස.

ශ්‍රී ලාංකික ක්‍රිකට් විනිසුරුවරුන් ද මුදලට තරග පාවා දීමට ඉදිරිපත්ව ඇති බවට මාධ්‍ය මඟින් හෙළිදරව් කරනු ලැබ ඇති තත්ත්වයක මෙම ගැටලුව වඩාත් නරක අතට හැරී තිබෙනවා. මෙකී මහත්වරුන්ගේ ක්‍රීඩාවට දෙවියනේ කවරක් නම් සිදුවී ඇද්ද? එය අද කවුරුත් ප්‍රශ්න කරන දෙයක්. ක්‍රිකට් විනිසුරුවරුන් ද මුදලට තරග පාවා දීමට එක්ව ඇත්නම් මෙම මහත්වරුන්ගේ ක්‍රීඩාව වෙනුවෙන්ද යැදීමට සිදු වන්නේ දෙවියන්ගේම පිහිට පමණක් නොවේදැයි මාද ප්‍රශ්න කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණය සම්බන්ධයෙන් අද කථා කර නිහඬව සිටීමට නොවෙයි අපට අවශ්‍ය වන්නේ. අප ලබා ගත්ත කීර්ති නාමය නැවත වරක් අප ආරක්ෂා කර ගත

යුතුයි. මෙතැන දේශපාලන ප්‍රශ්නයක් නැහැ. අපේ රටට යම් කිසි අභිමානයක් ලබා ගත්ත අවස්ථා තිබුණා. අද එය ගිලිහී ගිය එක ගැනයි අපේ කනගාටුව. දැන් මේ පිළිබඳව විසඳුමක් සොයා ගැනීම අවශ්‍යයි.

තරග පාවා දීම සම්බන්ධයෙන් උද්ගත වී ඇති මෙම තත්ත්වය සම්බන්ධව ගත යුතු පියවරයන් පිළිබඳව අදහස් දක්වන සමහර විශේෂඥයන් පවසන්නේ, තරග පාවා දීම තුරන් කිරීම සඳහා ඔට්ටු ඇල්ලීම නීතිගත කළ යුතු බවයි. සමහර රටවල අද ක්‍රිකට් තරග පිළිබඳව ඔට්ටු ඇල්ලීම නීතිගත කරලා තිබෙනවා. එය එංගලන්තයේ නීතිගත කරලා තිබෙනවා. ඕස්ට්‍රේලියාවේ නීතිගත කරලා තිබෙනවා. ඒ වාගේම සමහර අප්‍රිකානු රටවල්වල එය අද නීතිගත කරලා තිබෙනවා. එසේ නීතිගත කළොත් මේ විධියට තරග පරාජය කිරීමේ වැඩ පිළිවෙළවක නිරත වන්නේ නැහැ. ඒ නිසා අපි ගරු ඇමතිතුමාගෙන් අහන්නේ, පසු ගියදා පැවැති තරගයේදී එවැනි සිද්ධියක් සිදු වුණාද, මේ වන කොට ඒ පිළිබඳව වග විභාග කරලා තිබෙනවාද, ඒ ප්‍රවෘත්තිය පිළිබඳව සත්‍යතාවක් තිබෙනවාද, එහෙම නැත්නම් ඒක අසත්‍ය ප්‍රවෘත්තියක්ද, එසේ සිදු වුණා නම් එතුමා ගන්නා පියවර මොකක්ද, මින් ඉදිරියට එසේ සිදු නොවෙන්න කරන්න බලාපොරොත්තු වෙන්නේ මොකක්ද කියලායි.

අද මේ ගරු සභාවේදී ඒ පිළිබඳව පැහැදිලි ප්‍රකාශයක් අපි ඇමතිතුමාගෙන් බලාපොරොත්තු වෙනවා. මොකද, අපේ රටේ ජනතාව, විශේෂයෙන්ම තරුණ පිරිස මේ ක්‍රීඩාව පිළිබඳව විශාල උනන්දුවක් දක්වනවා. කොයි තරම් උනන්දුවක් තිබුණාද කිව්වොත් ඒ ක්‍රීඩාංගනයට ඇතුළු වන්න හැකියාවක් නැතුව කලකෝලාහල පවා කර ගත්තා. රුපියල් 100ට, රුපියල් 200ට තිබුණු ප්‍රවේශ පත්‍ර රුපියල් 4,000ට, රුපියල් 5,000ට පවා අරගෙන උත්සාහ කළේ ඒ ක්‍රීඩාංගනයට ඇතුළු වෙලා ක්‍රිකට් ක්‍රීඩාව නරඹන්නයි. ජයග්‍රහණය ලැබීමේ අවස්ථාව අපට නැති වීම ගැන ඇත්ත වශයෙන්ම අපි කනගාටු වනවා. අපේ තරුණ පරපුර විශාල බලාපොරොත්තුවකින් සිටියා, ශ්‍රී ලංකා කණ්ඩායම ජයග්‍රහණය කරයි කියලා. එදා මොනවා වුණා ද කියන එක තමයි තමුන්නාන්සේගෙන් වුණත් අහන්නේ. එදා අපේ ශ්‍රී ලංකා පිලට ජයග්‍රහණය කරන්න බැරි වුණේ ඇයි කියන ප්‍රශ්නය ඉදිරිපත් කරමින් මා නිහඬ වනවා. ස්තුතියි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ස්තුතියි.

ගරු අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා විසින් යෝජනාව ස්ථිර කිරීම.

**[අ.භා. 4.14]**

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළමුවෙන්ම ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද කාලීන වැදගත්කමකින් යුතු මෙම යෝජනාව ස්ථිර කරන්න මා කැමැතියි. අපේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව අපේ සංස්කෘතිය හා බැඳුණු, අපේ ජීවිත හා බැඳුණු අපේ ජීවිතයේ කොටසක්. තරුණ අප හැම දෙනාම අපේ ජීවිතවල යම් කාලයක යම් මට්ටමකින් හෝ ක්‍රිකට් ක්‍රීඩාව කර තිබෙනවා. කෙනෙක් තරගකාරී ලෙස ක්‍රිකට් ක්‍රීඩාව කරන්න ඉඩ තිබෙනවා. තවත් කෙනෙක් තමන්ගේ පාසලට ක්‍රීඩා කරන්න ඉඩ තිබෙනවා. තවත් කෙනෙක් තමන්ගේ ගමේ මිතුරන් සමඟ ක්‍රිකට් ක්‍රීඩාව කරනවා. ඒ වාගේම ගැහැනු, පිරිමි භේදයක් නැතුව තවත් පිරිසක් ක්‍රිකට් ක්‍රීඩාව රස විඳිමින්, තමන්ගේ ජීවිතයට තෘප්තියක් ලබන මාර්ගයක් බවට ක්‍රීඩාව පත් කර ගෙන තිබෙනවා.

මනුෂ්‍ය ශිෂ්ටාචාරයේ දියුණුවත් සමඟ ලෝකයේ සතුට, තෘප්තිය ලබා ගැනීමට තිබෙන වැදගත්ම මාර්ගයක් හැටියට ක්‍රීඩාව හඳුනා ගත්තා. ශ්‍රී ලංකාවේ අපට ජාත්‍යන්තර මට්ටමින් තරග කරන්නට, ලෝක ශූරයන් වන්නට, ලෝක කුසලාන තරගාවලියේ අවසාන තරගයට එන්නට, ලොව ඉදිරියටම යන්නට තරගකාරී මට්ටමින් කරන එකම ක්‍රීඩාව හැටියට මේ අවස්ථාව වන විට තිබෙන්නේ ක්‍රිකට් ක්‍රීඩාව පමණයි. මෙම ක්‍රීඩාව මේ තත්ත්වයට ගෙන එන්න මහන්සි වුණු ක්‍රීඩකයන්, පුහුණුකරුවන්, ඒ වාගේම විනිසුරුවරුන් සහ ක්‍රිකට් පරිපාලකයන් මේ රටේ සිටියා. ඒ ශ්‍රේෂ්ඨ ක්‍රීඩකයන්ට, පුහුණුකරුවන්ට සහ විනිසුරුවරුන්ට, ඒ වාගේම ඒ තත්ත්වය උදා කර ගන්න මහන්සි වුණු ශ්‍රේෂ්ඨ ක්‍රිකට් පරිපාලකයින්ට අපේ කෘතඥතාව පිරිනමන්න මෙය අවස්ථාවක් කර ගන්නවා. අප යුද්ධයෙන් බැට කන වෙලාවේත්, අප ඉතාම වේදනාවෙන් සිටින අවස්ථාවලත් අපේ රටේ ජනතාවට යම්තම් හෝ සතුටක් ගෙන දෙන්න සමත් වුණේ ක්‍රිකට් ක්‍රීඩාවයි. එම නිසා එම ක්‍රීඩකයන්ට, පුහුණුකරුවන්ට, පරිපාලකයන්ට අපි ස්තුතිවන්ත වන්න ඕනෑ. හැබැයි මේ ක්‍රීඩාව ව්‍යාපාරයක් ලෙස ලෝකයේ වර්ධනය වීමත් සමඟ බුකිකරුවන් සහ වෙනත් ජාවාරම්කරුවන් ක්‍රීඩාව තමන්ගේ ව්‍යාපාරයේ කොටසක් බවට පත් කර ගත්තාට පස්සේ ක්‍රීඩකයන් පරිපාලකයන් සහ විනිසුරුවරුන් ඒ ජාවාරමේ කොටසක් බවට, බුකිකරුවාගේ කොටසක් බවට, ගොදුරක් බවට පත් වන්න පටන් ගත්තා.

පසු ගිය මාසයේ ඉතාම සතුටුදායක පුවතක් අපට අසන්නට ලැබුණා. ඒ තමයි, ලෝකයේ සිටින ක්‍රිකට් විනිසුරුවරුන් අතරින් අපේ රට නියෝජනය කරමින් ප්‍රධාන සුපිරි විනිසුරුවරුන් අතර සිටින කුමාර් ධර්මසේන ලෝකයේ විශිෂ්ටතම විනිසුරුවරයා හැටියට විද්‍යාත්මක ආකාරයට තෝරා ගනු ලැබීම. එය ඉතාම ඉහළ ගෞරවයක්. අපේ රටට ඒ ලබා දීපු ගෞරවය පිළිබඳව අප ඔහුට ශුභ පතන්න අවශ්‍යයි. එක අතකින් ක්‍රීඩකයන් ලෝකය ඉදිරියේ තමන්ගේ දක්ෂතා පෙන්නුම් කරමින් අපව ආඩම්බරයට පත් කරන කොට කුමාර් ධර්මසේන විනිශ්චයකාරවරයකු විධියට අපේ රට ගෞරවයට පත් කරනවා; ලෝකයේ විශිෂ්ටතම ක්‍රිකට් විනිසුරුවරයා ලෙස සම්මාන ලබනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් ක්‍රිකට් ක්‍රීඩාව ගැන බොහොම උනන්දුවක් දක්වනවා. ඒ වාගේම මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාවේ දියුණුවට දායක වුණු තවත් පිරිසක් ඔබතුමා දකින විට මට මතක් වනවා. ඒ තමයි ක්‍රිකට් විස්තර ප්‍රචාරකයන්.

අපේ රටේ රූපවාහිනී නැති කාලයේ ඈත ගම්වල ඉන්න දරුවන්ට ක්‍රිකට් ක්‍රීඩාව මවලා පෙන්නුවේ, ඔවුන් තුළ ඒ ආශාව ඇති කළේ ක්‍රිකට් විස්තර ප්‍රචාරකයන් විසිනුයි. එදා ප්‍රේමසර ඈපාසිංහ, පාලිත පෙරේරා වැනි අය ආනන්ද-නාලන්ද විද්‍යාල අතර ක්‍රිකට් තරගය ගුවන් විදුලියෙන් ප්‍රචාරය කරන කොට, ඒ විස්තර අහගෙන ඉඳලා අපට ආශාවක් ඇති වෙනවා ආනන්ද විද්‍යාලයට යන්න, ක්‍රිකට් ගහන්න. ඒ ආශාව අප සිත් තුළ ඇති කළේ ප්‍රේමසර ඈපාසිංහ, පාලිත පෙරේරා වැනි මහත්වරුන්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
සිංහල භාෂාවෙන් ක්‍රිකට් විස්තර විචාරය ආරම්භ කළේ කරුණාරත්න අබේසේකර මහත්මයා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ඔව්. කරුණාරත්න අබේසේකර මැතිතුමා තමයි මුලින්ම ගුවන් විදුලියේ ක්‍රිකට් විස්තර ප්‍රචාරය ආරම්භ කළේ. නමුත් ඒක ඉහළම තලයට අරගෙන ගියේ මෙතුමන්ලා දෙදෙනායි. ඒ හරහා ක්‍රිකට් ක්‍රීඩාව ගමට ගියා. දක්ෂ ක්‍රීඩකයන් බිහි වුණා. ඒ වාගේම අපේ රටේ ක්‍රීඩා සංස්කෘතියේ වෙනසක් ඇති වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හැබැයි ඒ ඇති වුණ වෙනස්කම තුළ අප පසු කාලයක දැක්කා ක්‍රීඩකයන්ගේ ජයග්‍රහණ හරහා තමන්ගේ මුදල් මඩිය තර ගැනීමට වෙහෙසෙන පරිපාලකයන් පිරිසක් බිහි වුණු ආකාරය.

එදා ආචාර්ය එන්.එම්. පෙරේරා, ජේ.ආර්. ජයවර්ධන සහ ගාමිණී දිසානායක වාගේ ශ්‍රේෂ්ඨයෝ ඔවුන්ගේ දේශපාලන මති මතාන්තර පැත්තකට දමලා, ඔවුන්ගේ පරිපාලන දක්ෂතා සහ ක්‍රීඩාව පිළිබඳ තමන්ගේ තිබෙන දැනුම පාවිච්චි කර, රාජ්‍ය තාන්ත්‍රික දැනුම පාවිච්චි කර අපේ ක්‍රිකට් ක්‍රීඩාව ජාත්‍යන්තර තලයට අරගෙන ගියා. හැබැයි ජාත්‍යන්තර තලයට අරගෙන ගිය ඒ ක්‍රිකට් ක්‍රීඩාව තුළින් තමන්ගේ පෞද්ගලික නාමය වර්ධනය කර ගන්න, ඒ හරහා තමන්ගේ ව්‍යාපාර දියුණු කර ගන්න සමහරු උත්සාහ කළා. ඒ වාගේම කළු සල්ලිවලින් පොහොසත් වුණු පුද්ගලයන් සුදනන් බවට පත් වන්න ක්‍රිකට් ක්‍රීඩාව භාවිත කළා. මේක අප දැක්කා. ඒ නිසා එක අතකින් ක්‍රිකට් විනිසුරුවරු මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව වෙනුවෙන් කළ ශ්‍රේෂ්ඨ සේවය අගය කරන අතරේම මෙන්න මේ කාරණයත් අප කිව යුතුව තිබෙනවා. පසු ගිය වසරේ ලෝකයේ ශ්‍රේෂ්ඨතම ක්‍රිකට් විනිසුරුවරයා හැටියට කුමාර් ධර්මසේන ලැබූ සම්මානය අප අගය කරන අතරේ, බුකිකරුවන්ගේ ගොදුරක් බවට අපේ විනිසුරුවන් එක් කෙනෙක්, දෙන්නෙක් පත් වෙලා තිබෙනවා හෝ අඩුම ගණනේ එවැනි උත්සාහයකට දායක වෙන්න උත්සාහ කර තිබෙනවා කියා අපට ආරංචි වෙන කොට අපේ හිත්වලට යම් කිසි දුකකුත් දැනෙනවා. අප මේ ගැන හරියටම දන්නේ නැහැ.

ගරු ක්‍රීඩා ඇමතිතුමනි, මේ පිළිබඳ විධිමත් පරීක්ෂණයකින් තමයි අප නිගමනයකට එළඹෙන්න ඕනෑ. ඒ චෝදනාවට ලක් වුණ කිසිම කෙනෙක්ව අප නඩු විභාගයක් නැතිව පාර්ලිමේන්තුව තුළ වරදකරු කළ යුතු නැහැ. අප ඔවුන්ගේ ආත්ම ගරුත්වය ආරක්ෂා කළ යුතුයි. මොකද ඒ චෝදනාවට ලක් වුණ සමහරු කාලයක් ක්‍රීඩා කරපු අයයි. අපට ඒ බව මතකයි. ඒ වාගේම ඔවුන් විනිසුරුවරු වශයෙන් රටට වැදගත් සේවයක් කරපු අය. නමුත් හැන්සි ක්‍රොන්ජේ වාගේ ලෝකයේම හිටපු විශිෂ්ටතම ක්‍රිකට් ක්‍රීඩකයන් පවා, මොහොමඩ් අසාරුදීන් වාගේ ලෝකයේ හිටපු විශිෂ්ටතම ක්‍රිකට් ක්‍රීඩකයන් පවා, ෂේන් වෝන් වාගේ ලෝකයේ හිටපු විශිෂ්ටතම ක්‍රිකට් ක්‍රීඩකයන් පවා මාර්ක් වෝ වාගේ ලෝකයේ හිටපු විශිෂ්ටතම ක්‍රිකට් ක්‍රීඩකයන් පවා මුදලට යට වෙලා තිබෙන බව ඔප්පු වුණා; වරදකරුවන් වුණා; ඔවුන්ට දඬුවම් කළා. එවැනි පසුබිමක් තුළ චෝදනාවට ලක් වන මේ හැම පුද්ගලයෙක් ගැනම ගැඹුරින් පරීක්ෂණ පවත්වලා, විද්‍යාත්මක ලෙස පරීක්ෂණයක් පවත්වලා ඒ පිළිබඳ සොයා බලන්න ඕනෑ. ඔවුන් අහිංසක නම්, මේ චෝදනා අසත්‍ය නම්, මේ චෝදනා ප්‍රසිද්ධිය ලබා ගැනීම සඳහා යම් මාධ්‍ය විසින් ගොඩ නඟන කථා නම් ඒ බව පෙන්වා දිය යුතුයි. එහෙම නැත්නම් ඔවුන් තුළ අල්ප මාත්‍රයක හෝ වරදක්, මේ ක්‍රියාවලට දායක වීමක් තිබෙනවා නම් - අඩුම ගණනේ අල්ලසක් ලබා ගන්න, මේ තරග පාවා දීමට හෝ වෙනත් කාරණා පිළිබඳ යම් උත්සාහයක් තිබුණා නම්- ඒ සඳහා දෙන්න ඕනෑ බරපතළම දඬුවම ලබා දිය යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩාව තුළ තිබෙන නීති විරෝධී ක්‍රියා පිළිබඳව අපව බරපතළ විධියට කම්පනය කරවන ප්‍රවෘත්තිය අපට වාර්තා වුණේ ඊයේයි. ඒක තමයි ලෝකයේ හිටපු විශිෂ්ටතම ක්‍රීඩකයන් අතරින් කෙනෙක් කියලා අප අඳුනා ගත්ත, ප්‍රංශ සයිකල් ශුරතාව හත් වතාවක් දිනපු ඇමෙරිකානු ජාතික ලාන්ස් ආම්ස්ට්‍රෝන්ගේ ඒ ශුරතා හතම අන්තර් ජාතික පාපැදි සංගමය ඊයේ අහෝසි කිරීම. අපි ඔහුව දැක්කේ පිළිකා රෝගය ජය ගත්ත, ලෝකයටම ආදර්ශයක් වුණු, ඒ වාගේම පිළිකා මර්දනයට උපකාර කරන "LIVESTRONG" කියන පදනම මඟින් ඩොලර් මිලියන ගණනක් ජනතාවට ලබා දුන්න ශ්‍රේෂ්ඨ ක්‍රීඩකයෙක් විධියටයි. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ ශ්‍රේෂ්ඨයි කියලා හිතාගෙන හිටපු පුද්ගලයාට අද චෝදනාවක් එල්ල වෙලා තිබෙනවා; ඒ බව සාක්ෂි සහිතව ඔප්පු වෙලා තිබෙනවා. ක්‍රීඩාව විතරක් නොවෙයි, අප ඕනෑම කෙනෙකුගේ පෞද්ගලික ජීවිතයේ ආදර්ශයට ගන්න පුළුවන් කියලා හිතපු, ඒ ධෛර්යවන්තභාවය ආදර්ශයට ගන්න පුළුවන් කියපු ලාන්ස් ආම්ස්ට්‍රෝන් නමැති ක්‍රීඩකයාගේ ශුරතා සියල්ලම අද වෙන කොට අහෝසි කර ඔහුට ජීවිත කාලයටම ක්‍රීඩාව තහනම් කර තිබෙනවා.

ඒ නිසා පුද්ගලයකුගේ ඉතිහාසය වැදගත් කරුණක් වන්නේ නැහැ. ඔහු ජීවිතයේ යම් වරදක් කරලා තිබෙනවා නම්, වරදක් කර ගෙන ඇවිල්ලා තිබෙනවා නම් ඒ වරදට දඬුවම් දීම ක්‍රීඩාව පිරිසිදු කිරීමට අවශ්‍ය කරන මූලිකම කාර්යයක්. මේ ලෝකයේ ඉතිහාසය තුළ ඔවුන්ගේ කීර්තිය හෝ ඔවුන්ගේ ඇති සබඳතා නොවෙයි අත්‍යවශ්‍යවන්නේ, මතු වෙලා තිබෙන චෝදනා පිළිබඳව නිශ්චිතව, තීරණාත්මකව පරීක්ෂණයක් පවත්වා එක්කෝ ඔවුන්ගේ නම පිරිසිදු කරන එක, නැත්නම් දඬුවම් කරන එක තමයි අත්‍යවශ්‍ය වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අද මේ ක්‍රීඩාව පාවා දීම කියන කාරණය තරගයක ජය පරාජය කියන දෙයට වඩා ඔබ්බට ගිහිල්ලා තිබෙනවා. විශේෂයෙන්ම ක්‍රිකට් ක්‍රීඩාවේ අහවල් ඕවරයේ අහවල් පන්දුවේ කුමක්ද සිදු වන්නේ, no-ball එකක් දානවාද, ඒකට wicket එක යනවාද, එක ලකුණක් ගන්නවාද, දෙකක් ගන්නවාද, හයක් ගහනවාද කියන කාරණය පවා අද ඔට්ටු අල්ලන්නට පදනමක් කර ගෙන තිබෙනවා. ඒ කාරණා පිළිබඳව ඉතාම පරිස්සමට හොයලා බලලා, ඒ කාරණා පිළිබඳව කල්පනා කරලා අපි සියුම්ව මේ ගැන අධ්‍යයනය කළ යුතුයි. මොකද මේ ජාවාරම්කරුවන් ඉස්සර වාගේ ප්‍රසිද්ධියේ ක්‍රියා කරන්නේ නැහැ. ඒ ජාවාරම්කරුවන් ඉස්සර වාගේ කාටවත් අහු වෙන ආකාරයට මේ ජාවාරම්වල නිරත වන්නේ නැහැ. මෙවැනි වරදක් විශේෂයෙන්ම ජාත්‍යන්තරවයි සිද්ධ වෙන්නේ. ඉන්දියාව, ලංකාව විතරක් නොවෙයි, තවත් වෙනත් රටවල් හරහා මේ කාරණා සිද්ධ වෙන්න පුළුවන්. ඒ නිසා මෙවැනි චෝදනාවකට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් කරන පරීක්ෂණයක් ප්‍රමාණවත් වන්නේ නැහැ. එතැනින් එහාට ගිය ජාත්‍යන්තර පරීක්ෂණයක් අවශ්‍යයි. ඒ සඳහා දක්ෂතාව, කුසලතාව තිබෙන පුද්ගලයින් සමඟ සම්බන්ධතා ඇති කරගෙන ප්‍රමාණවත් පරීක්ෂණ කමිටුවක් පත් කළ යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මා විශේෂ කාරණයක් කියන්න කැමැතියි. ඒ තමයි වර්තමාන ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මේ පරීක්ෂණය පවත්වන්න සමත් ද නැද්ද කියන කාරණය. එදා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිලවරණය පවත්වන්නේ නැතිව දිගින් දිගට අන්තර් පාලන මණ්ඩලයක් මඟින් ක්‍රිකට් පරිපාලනය කර ගෙන යන කොට අප මේ සභාවේදී කිව්වා, ප්‍රජාතන්ත්‍රවාදීව නිලවරණයක් පවත්වන්න අවශ්‍යයි, මේ රටේ ක්‍රීඩා සමාජවලට තමන්ගේ නියෝජිතයන්ට මේ බලය ලබා දෙන්න අවශ්‍යයි කියලා. නිලවරණයක් පැවැත්වුවා. හැබැයි ඒ නිලවරණය හරියට මේ රටේ විධායකයේ බල පරාක්‍රමය පෙන්නුම් කරමින්, මේ රටේ ක්‍රීඩා සමාජවල සැබෑ නියෝජිතයන්ට ඒ නිලවරණය හරහා ජයග්‍රහණය කිරීමට තිබෙන අවකාශ අහුරමින් යම් බලපෑම් සහ පීඩා හරහා සිද්ධ වුණ නිලවරණයක්.

අද ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ බලයේ ඉන්නේ රාජපාක්ෂිකභාවය සහිත, ක්‍රිකට් ක්‍රීඩාවට යම් සබඳකමක් ඇති, මේ රටේ ක්‍රීඩාවට ඇත්තටම ආදරය කරනවා ද මේ රටේ ක්‍රීඩා

සමාජ සහ ක්‍රීඩකයෝ සැබෑවටම නියෝජනය කරනවාද කියලා පරීක්ෂාවට ලක් නොවෙච්ච පාලක පිරිසක්. කොටින්ම කිව්වොත් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය තුළ යහ පාලන - good governance- මූල ධර්ම ක්‍රියාත්මක වනවාද කියන කාරණය ගැන අපට බොහොම ගැටලු තිබෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
කාල වේලාව අවසානයි.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
මම අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එදා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය මේ රටේ තිබෙන දූෂිතම ආයතනවලින් එකක් කියලා කිව්වේ විෂය භාර අමාත්‍යවරයායි. හැබැයි එදා ඉඳලා අද වන තුරු ශ්‍රී ලංකාවේ ක්‍රිකට් පරිපාලනය සම්බන්ධ කිසි කෙනෙකුට කිසිම ආකාරයක දඬුවමක් කර නැතිවා විතරක් නොවෙයි, අතුරු පාලනය තිබීම හා සමාන තත්ත්වයකින් කිසිවෙකුට වග නොකියන, රාජපක්ෂලාට පමණක් වග කියන, රාජපාක්ෂිකභාවය පමණක් තිබෙන, රාජපාක්ෂිකභාවය වෙනුවෙන් කටයුතු කරන, රාජපක්ෂලාගේ වුවමනා වෙනුවෙන් කටයුතු කරන පිරිසක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා මෙය ඉතා වැදගත් ස්වාධීන පරීක්ෂණයක් කළ යුතු වෙලාවක්. ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාවේ හොඳ නම, ලංකාවේ ශ්‍රේෂ්ඨ ක්‍රිකට් විනිසුරුවරුන්ගේ හොඳ නම ආරක්ෂා කළ යුතු වෙලාවේ ස්වාධීන, වැදගත් ජාත්‍යන්තර පරීක්ෂකවරුන්ගෙන් යුතු මණ්ඩලයක් පත් කරලා තීරණයක් ගත යුතුයි කියලා මා යෝජනා කරනවා. බොහොම ස්තුතියි.

**[අ.භා. 4.28]**

**ගරු ඩිලාන් පෙරේරා මහතා (විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබ සාධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு டிலான் பெரேரா - வெளிநாட்டு வேலைவாய்ப்பு ஊக்குவிப்பு, நலனோம்புகை அமைச்சர்)
(The Hon. Dilan Perera - Minister of Foreign Employment Promotion and Welfare)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, චේතනාව කෙසේ වෙතත් විවාදය සඳහා වැදගත් විෂයයක් පිළිබඳව මේ යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන් අපි ජෝන් අමරතුංග මැතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මේ සම්බන්ධයෙන් එතුමාගේ චේතනාව මොකක්ද කියා මම දන්නේ නැහැ. නමුත් වැදගත් විෂයයක් ගැනයි කථා කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා ලංකාවේ මෙතෙක් තිබුණු හැම ක්‍රීඩාවකටම වඩා ලෝක මට්ටමේ, ලෝක ශූර මට්ටමේ පවතින ක්‍රීඩාව ක්‍රිකට් ක්‍රීඩාව බව. අපි වරක් ක්‍රිකට් ක්‍රීඩාවේ ලෝක ශූරයන් වුණා. අපි ඕවර් 50 තරගාවලි දෙකක අවසාන මහා තරගයට ආවා; 20-20 තරගාවලි දෙකක අවසාන මහා තරගයට ආවා. ක්‍රිකට් ක්‍රීඩාවට අමතරව බිලියඩ් සහ ස්නූකර් ක්‍රීඩාවෙන් අපේ ලාෆීර් මැතිතුමා ලෝක ශූරයෙක් වුණා. ඒ වාගේම අපි වරක් කැරම් ක්‍රීඩාවෙන් ලෝක ශූරයකු බිහි කළා. සුසන්තිකා පළමුවැනියා වුණේ නැහැ. සුසන්තිකා Silver Medal එක ගත්තා. අපි ඒක ඉතාම අගය කරනවා. ඩන්කන් වයිට් Silver Medal එකක් ගත්තා. Bronze Medal එක ගත්තු සුසන්තිකා Silver Medal එක ගත්තේ Gold Medal එක ගත්තු කෙනා තහනම් උත්තේජක පාවිච්චි කිරීමේ වරදට හසු වුණ නිසයි. අපේ ලංකාවේ අනෙක් ක්‍රීඩා හා සංසන්දනය කරන කොට ක්‍රිකට් ක්‍රීඩකයන් තමයි ලෝක ශූරයන් සහ අනුශූරයන් බවට පත් වුණේ. ශූරයන් සහ අනුශූරයන් වූ අවස්ථා එක්කාසු කළාම එවැනි අවස්ථා පහක් තිබෙනවා. වෙන කිසිම ක්‍රීඩාවක ඒ තරම් ප්‍රමාණයක - ශූරයන් සහ අනුශූරයන් වීමේ- දක්ෂතා පෙන්නලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩාව කියන එක දේශපාලනය වාගේ තමයි. හැම දාම දිනන්න බැහැ. තමන් ජයග්‍රහණය කළාම ජයග්‍රහණය නිහතමානීව භාර ගන්නවා වාගේම පරාජයටත් මුහුණ දෙන්න ක්‍රීඩාවෙන් ඉගෙන ගන්න ඕනෑ කියා තමයි අප ක්‍රීඩා කළ කාලයේ අපට කියා දුන්නේ. දේශපාලන තලයේත් පරාජය වුණාම, පරාජයට විවිධ හේතු කියමින්, පරාජය වුණේ නැහැ කියමින් කාරණා කියන යුගයක් අද තිබෙන්නේ. ඒ නිසා ලංකාව 20-20 ලෝක කුසලාන තරගාවලිය පරාජය වුණාම ක්‍රීඩකයන් තරග පාවා දුන්නාද කියා එක්සත් ජාතික පක්ෂය සැක මතු කරන එක ගැන මම පුදුම වන්නේ නැහැ.

හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අමතක නොකළ යුතු කාරණයක් තිබෙනවා. අද අජිත් පී. පෙරේරා මැතිතුමා, ජෝන් අමරතුංග මැතිතුමා මොනවා කිව්වත් බටහිර ඉන්දීය කොදෙව් කණ්ඩායම අවසාන මහා තරගයට එන්නේ ඕස්ට්‍රේලියාවත් පරාජය කරලායි. ඕස්ට්‍රේලියාව බටහිර ඉන්දීය කොදෙව් කණ්ඩායමට පරාජය වුණාම ඕස්ට්‍රේලියාවේ කවුරුවත් ඕස්ට්‍රේලියානු ක්‍රීඩකයන්ට චෝදනා කළේ නැහැ ඒ අය තරග පාවා දුන්නා කියා. අවසාන මහා තරගයේදී ක්‍රිස් ගේල් කියන ක්‍රීඩකයා අසාර්ථක වුණා. වැරැදිලාවත් ශ්‍රී ලංකාව අවසාන මහා තරගය ජයග්‍රහණය කළා නම් මම ඔට්ටු දාලා කියනවා බටහිර ඉන්දීය කොදෙව්වල කිසිම කෙනෙකු ක්‍රිස් ගේල් ඕනෑකමින් තරග පාවා දුන්නා කියා ක්‍රිස් ගේල්ට චෝදනා කරන්නේ නැහැ කියා. මොකද, ක්‍රීඩකයන් සාර්ථක වෙනවා; අසාර්ථක වෙනවා. අපි ඒක දන්නවා. මෙතැන ඉන්නවා ගරු රුවන් රණතුංග පාර්ලිමේන්තු මන්ත්‍රීතුමා. එතුමාගේ සහෝදරයා වන අපේ මිත්‍ර අර්ජුන රණතුංග මහතාගේ නායකත්වයෙන් අපි 1996 ක්‍රිකට් ලෝක කුසලානය දිනුවා. ලෝක කුසලානය දිනලා ඊට පස්සේ අපි සිංගප්පූරුවට ගිහින් practice match එකක් ගැහුවා පාකිස්තානයත් එක්ක. ඒ practice match එකේදී සනත් ජයසූරිය මහත්මයා බෝල 17කින් ගහපු අර්ධ ශතකය තමයි තවමත් fastest fifty එකේ ලෝක වාර්තාව වෙලා තිබෙන්නේ. නමුත් අපි ඒ match එක පැරදුණා. ලෝක ශූරයන් වෙලා ගහපු පළමුවැනි match එක සිංගප්පූරුවේදී පැරදුණා. ඒක පාවා දීමක් නොවෙයි. අර්ජුන රණතුංග මහත්මයාගේ නායකත්වයෙන් 1996 දී ලෝක ශූරයන් වෙලා ඊළඟ ලෝක ශූර තරගාවලියේදී අපට semi-finalවත් එන්න බැරි වුණා. ඒක පාවා දීමක් නොවෙයි. 1996 දී හොඳට සෙල්ලම් කළා, ඊළඟ තරගාවලියේදී හොඳට සෙල්ලම් කරන්න බැරි වුණා. Match එකක් පැරදුණාම ඒක තරග පාවා දීමක් හැටියට සැක සිතීම පවා මා හිතන්නේ අසාධාරණයක් කියලායි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
ඒක ප්‍රවෘත්ති පත්‍රවල පළ වෙලා තිබුණා.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ගරු අජිත් පෙරේරා මන්ත්‍රීතුමා කිව්වා හැන්සි ක්‍රොන්ජේ ගැන. ස්ටීව් වෝ ගේ සහෝදරයා වන මාක් වෝ ගැන කිව්වා; අසාරුදීන් ගැන කිව්වා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මතක තියා ගන්න, ලෝකයේ කොපමණ විශිෂ්ට ගණයේ ක්‍රීඩකයන් හිටියත් ලංකාවේ කිසිම ක්‍රීඩකයෙකුට -බස්නාහිර පළාත් සභා මන්ත්‍රී හෂාන් තිලකරත්න මහතාට තරග පාවා දුන්නා කියලා චෝදනාවක් එල්ල කළා.

[ගරු ඩිලාන් පෙරේරා මහතා]

නමුත් ඒක ඔප්පු කර ගන්න බැරි වෙලා තිබෙනවා. ඒ කථාව කියනකම්, ඉතිහාසය වේවා වර්තමානය වේවා ලංකාවේ අපේ කිසිම ක්‍රීඩකයෙකුට- තරග පාවා දුන්නා කියලා ඇඟිල්ල දිගු වුණේ නැහැ. ලෝකයේ විශිෂ්ට ගණයේ ක්‍රීඩකයන්ට එහෙම චෝදනා එල්ල වුණාට, ශ්‍රී ලංකාවේ ක්‍රීඩකයන්ට කවදාවත් එහෙම වුණේ නැහැ. ශ්‍රී ලංකාවේ ක්‍රීඩකයන් තමන්ගේ රට වෙනුවෙන් ඉෂ්ට කරන රාජකාරිය නිවැරැදිව ඉෂ්ට කළා කියලා මම කල්පනා කරනවා.

අවසාන විස්සයි විස්ස ලෝක කුසලාන තරගාවලිය බලන්න අපි ඔක්කොම ගියා. ඒ තරගාවලිය ජයග්‍රහණය කරන්න අපට හැකියාව තිබුණා. නමුත් ඒ දිනයේදී අපේ සමහර ක්‍රීඩකයන් හොඳට සෙල්ලම් කළේ නැහැ. හැබැයි ක්‍රීඩකයෙක් වුණාම හැම දාම හොඳට සෙල්ලම් කරන්න බැහැ. සමහර පිතිකරුවන් හොඳට සෙල්ලම් කරන අවස්ථා තිබෙනවා; fail වන අවස්ථාවන් තිබෙනවා. පන්දු යවන්නන් හොඳට පන්දු යවන අවස්ථා තිබෙනවා; fail වන අවස්ථාවන් තිබෙනවා. ඒක තමයි ක්‍රීඩාව කියන්නේ.

රාජකීය විද්‍යාලයේ ක්‍රිකට් කණ්ඩායමේ ඒ කාලයේ හිටපු opening batsman ඉරාන් වික්‍රමරත්න මහත්මයා මේ සභාවේ ඉන්නවා. එතුමා බොහොම හොඳට තාක්ෂණිකව පන්දුවට පහර දෙන ක්‍රීඩකයෙක්. හැබැයි සීමිත ඕවර තරගවලදී එතුමාට සමහර opening batsmenලා වාගේ හයියෙන් පහර දෙන්න බැහැ; ඉතා ඉක්මනින් පහර දෙන්න බැහැ. හැබැයි එතුමාගේ ක්‍රිකට් තාක්ෂණය ඉතාම හොඳයි. මා හිතන්නේ රාජකීය විද්‍යාලයෙන් මෑත ඉතිහාසයේ බිහි වුණු හොඳම ආරම්භක පිතිකරු එතුමා කියලායි. එතුමාගේ දේශපාලනය සම්බන්ධයෙන් මට එහෙම කිසිම ඇගැයීමක් නැහැ. නමුත් එතුමා රාජකීය විද්‍යාලයේ ක්‍රිකට් කණ්ඩායමේ opening batsman ලෙස සෙල්ලම් කළා. එතුමාගේ සහෝදරයා වන මිෂෙල් මගේ classmate.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
සහෝදරිය?

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
නැහැ. මල්ලි, මිෂෙල්. [බාධා කිරීමක්] අපි කියන්නේ මිෂෙල් කියලා. එතුමා pastor කෙනෙක් නේ. ඒක මම දන්නවා.

අපේ ක්‍රීඩකයන් හොඳට සෙල්ලම් කළාම ඒ අය හොඳයි කියන එකත්, කොහේදි හරි අසාර්ථක වුණාම ඒ අය තරග පාවා දුන්නාද කියලා සැක මතු කරන එකත් අසාධාරණයි. අපේ ක්‍රීඩකයන්ට කවුරුත් එහෙම කරලා නැහැ. [බාධා කිරීමක්]

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මම ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමාට බාධා කළේ නැහැ නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! He is not giving way.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මම ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමාට බාධා කළේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අර්ජුන රණතුංග ක්‍රීඩකයාගේ නායකත්වයෙන් යුත් අපේ ක්‍රිකට් කණ්ඩායම World Cup එක දිනුවාට පස්සේ හතර වතාවක් World Cup finals දක්වා ආපු කණ්ඩායමක්. ඕස්ට්‍රේලියාව හැරුණු කොට ලෝකයේ වෙන කිසිම කණ්ඩායමක් එහෙම ක්‍රිකට් ලෝක කුසලාන අවසාන මහා තරග හතරකට පැමිණ නැහැ. ඕස්ට්‍රේලියාව World Cup finals දක්වා පැමිණියා විතරක් නොවෙයි, ඒගොල්ලන් ලෝක කුසලානය දිනූ අවස්ථාත් වැඩියි. ඕස්ට්‍රේලියාව හැරුණු කොට World Cup finals දක්වා ඒ විධියට ආපු කණ්ඩායමක් ලෝකයේ වෙන නැහැ. විවිධ අවස්ථාවල, විවිධ ක්‍රීඩා අමාත්‍යවරුන් යටතේ, විවිධ ක්‍රිකට් පාලක මණ්ඩල යටතේ අපේ ක්‍රිකට් කණ්ඩායම අවසාන මහා තරගය දක්වා ආවා. ඒක ජයග්‍රහණයක් නොවෙයිද? අනෙක් සියලුම කණ්ඩායම් අභිභවා අවසාන මහා තරගයට ඒම ජයග්‍රහණයක් නොවෙයිද? ජයග්‍රහණයක්ම තමයි.

අවසාන මහා තරගය එක කණ්ඩායමක් දිනනවා; එක කණ්ඩායමක් පරදිනවා. හැබැයි තිබෙන වෙනස අපි පාකිස්තානයේදී ඕස්ට්‍රේලියාව පැරැද්දුවාම කවුරුත් ඕස්ට්‍රේලියාවට ඇඟිල්ල දිගු කළේ නැහැ, ඕස්ට්‍රේලියාව තරග පාවා දුන්නා කියලා. එහෙම කරන්න බැහැ. එහෙම කළ යුතුත් නැහැ. මේ විස්සයි විස්ස තරගාවලියේදී අපි අවසාන මහා තරගයට ආවාට පස්සේ ඕස්ට්‍රේලියානු නායකයා වන බේලි කිව්වා, ක්‍රිස් ගේල් out කර ගත්තොත් ලංකාව දිනුම් කියලා. ඕස්ට්‍රේලියානු කණ්ඩායම ක්‍රිස් ගේල්ව දැක්කේ ඒගොල්ලන්ගේ තරගයේ ජයග්‍රහණයට සිටි බාධාව හැටියටයි. අවසාන මහා තරගයේදී ක්‍රිස් ගේල් ඉක්මනට out වුණා. ක්‍රිස් ගේල් ඉක්මනට out වෙලා ලංකාව දිනුවා නම්, එහෙම නම් ඉතින් බටහිර ඉන්දීය කොදෙව් දූපත්වල කට්ටිය ඒගොල්ලන්ගේ පාර්ලිමේන්තුවල කියන්න ඕනෑ, ක්‍රිස් ගේල් තරග පාවා දුන්නා කියලා. එක රටක් නොවෙයි, රටවල් කීපයක් එකතු වෙලායි ඒගොල්ලන්ගේ කණ්ඩායම හැදෙන්නේ. ඒ රටවල අය එහෙම කියන්නේ නැහැ. මොකද ක්‍රිස් ගේලුත් සාර්ථක වන අවස්ථා තිබෙනවා; අසාර්ථක වන අවස්ථා තිබෙනවා.

ලසිත් මාලිංග කියන්නේ ලංකාවෙන් බිහි වුණු ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩකයෙක්. ඔහු තමයි විස්සයි විස්ස තරගාවලි තුළ තවම ලෝකයේ ඉන්න හොඳම පන්දු යවන්නා. ඔහුට එක දවසක් වැරැදුණා. එතකොට ඔහු තරග පාවා දුන්නා වනවාද?

කුමාර ධර්මසේන විනිශ්චයකාරතුමා දැන් ලෝකයේ සිටින හොඳම විනිශ්චයකාරතුමා වුණා. හැබැයි මේ දැන් සෙල්ලම් කරන Champions League තරගාවලිය තුළ එතුමා දෙන සමහර තීන්දු වැරැදියි.

Replay දැම්මාම පෙනෙනවා වැරදියි කියලා. නමුත් වැරදියි කියලා කුමාර ධර්මසේන හොර කරනවාද? නැහැ. මහේල ජයවර්ධන කියන්නේ වරක්, -මීට අවුරුදු ගණනාවකට පෙර- ලෝකයේ හොඳම ක්‍රිකට් නායකයා හැටියට සම්මාන ලබපු නායකයායි. එක match එකක් පැරදුණාම ඒ නායකයා පසු බසිනවාද? දැන් සෙල්ලම් කරන Champions League T20 තරගාවලියේ Delhi Daredevils කණ්ඩායමට නායකත්වය දෙන්නේ ඔහුයි. බොහෝ විට ඒ Delhi Daredevils කණ්ඩායම ජයග්‍රාහී කණ්ඩායම වෙන්න පුළුවන්. ඒ කණ්ඩායමේ නායකයා මහේල ජයවර්ධනයි. ඒක ලංකාවට ආඩම්බරයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මම මේ කාරණය දකින්නේ, විරුද්ධ පක්ෂයේ සමහර උදවිය ඡන්ද පැරදුණාම මේක නිසා පැරදුණා, මේක නිසා පැරදුණා කියලා හේතු හොයනවා වාගේ වැඩක් කියලායි. කම්පියුටර් ජිල්මාට් කියයි, අර ජිල්මාට් කියයි, මේ ජිල්මාට් කියයි. පක්ෂ අතර මැතිවරණ නොවෙයි, එක පක්ෂයේ නායක නායිකාවෝ තෝරන්න ගියාමත් පැරදුණාම ගල් ගහනවා නේ. සමහර උදවිය පරාජය භාර ගන්න බැරිව ගල් ගහනවා. ඒ නිසා මෙවැනි තත්ත්වයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා අපේ රටේ කීර්තිනාමය වෙනුවෙන් සහ අපේ රටේ ක්‍රීඩාව වෙනුවෙන්, -රටේ කීර්තිනාමයත් ආරක්ෂා කර ගනිමින්- රටට ජයග්‍රහණ ගෙනාපු මේ ක්‍රිකට් ක්‍රීඩකයින් සම්බන්ධයෙන් අපි සැක හිතන්න හොඳ නැහැ. සැකයක් මතු කිරීමම ඒ දක්ෂ ක්‍රීඩකයින්ට කරන්නා වූ අපහාසයක්; අපරාධයක්. එහෙම සැක මතු කිරීම අසාධාරණයි. මොකද, ලෝකයේ ක්‍රිකට් සෙල්ලම් කරන්නා වූ අනෙක් රටවල් හා සංසන්දනය කරන විට ඒ ක්‍රීඩකයින් මේ රට වෙනුවෙන් සෙල්ලම් කර අවසාන මහා තරග පහකට ආවා. එකක් දිනුම්. හතරකින් අනුශූරයෝ වුණා. අද ශ්‍රී ලංකාව තමයි ඕවර් පණහේ ලෝක අනුශූරයෝ. ඒ වාගේම 20-20 ලෝක අනුශූරයෝ. ඉන්දියාව ඕවර් පණහේ ශූරයෝ; 20-20 මොකුත් නැහැ. බටහිර ඉන්දීය කොදෙව් ක්‍රීඩකයන් 20-20 ශූරයෝ; ඕවර් පණහ මොකුත් නැහැ. හැබැයි, ශ්‍රී ලංකාව 20-20ත් අනුශූරයෝ; ඕවර් පණහෙත් අනුශූරයෝ. අපි ඒ දෙකේම world runners-upලා. ඒ කියන්නේ අපි තමයි consistent. ඕවර් පණහ වේවා, 20-20 වේවා අපි තමයි consistency තියා ගෙන තිබෙන්නේ. එහෙම කණ්ඩායමකට මේ චෝදනාව එල්ල කිරීම වැරදියි.

සමහර අය ගරු අර්ජුන රණතුංග මන්ත්‍රීතුමාට කැමැතියි. එතුමාගේ සහෝදරයා වන නිශාන්ත රණතුංග මහත්මයා තමයි අපේ ක්‍රිකට් පාලක මණ්ඩලයේ ලේකම්. ගරු අර්ජුන රණතුංග මන්ත්‍රීතුමා වේවා, නිශාන්ත රණතුංග වේවා, රුවන් රණතුංග වේවා, -මට සංජය රණතුංග මහත්මයා ගැන ඒ කථාව කියන්නට බැහැ- මේ රණතුංග පවුලම අපි දන්නා විධියට ලංකාවේ ක්‍රිකට් වෙනුවෙන් මහා විශාල මෙහෙයක් කළ අයයි. ක්‍රිකට් සෙල්ලම් කරලා, පාලක මණ්ඩලවලට ඇවිල්ලා විවිධ ආකාරයට විශාල මෙහෙයක් කළ අයයි. හැබැයි ගරු අර්ජුන රණතුංග මන්ත්‍රීතුමා සන්ධාන ආණ්ඩුව පැත්තේ ඉන්න විට ක්‍රිකට් පාලක මණ්ඩලයේ සභාපති වන විට, එතුමා හොඳ නැහැ. අපේ පැත්තේ ඉන්න කාලයේ එතුමා ක්‍රිකට් පාලක මණ්ඩලයේ සභාපති වුණා. එතකොට මේ පාර්ලිමේන්තුවේ විවාදවලදී එතුමා හොඳ නැහැ කිව්වා. එතුමා සභාපති කාලයේ ඒ කටයුතු හරියට කරන්නේ නැහැ කියන අදහසින් පාර්ලිමේන්තුවේ විතරක් නොවෙයි පාර්ලිමේන්තුවෙන් පිටදීත්, මාධ්‍ය සාකච්ඡාවලදීත්, ක්‍රීඩා සාකච්ඡාවලදීත් විවිධ අවස්ථාවලදී එතුමාට විවිධ චෝදනා එල්ල කළා. එතුමා විරුද්ධ පක්ෂයට ගියාට පස්සේ එතුමා හොඳ වුණා. එතුමාගේ සහෝදරයා වන නිශාන්ත රණතුංග මහත්මයා -පාලක මණ්ඩලයේ ලේකම්තුමා- එතුමා හොඳ නැහැ. ඇයි මේ? ඒ විධියට පාට කණ්ණාඩි දාලා ක්‍රීඩාව දිහා බලන්න එපා. ඒ නිසා මම විශේෂයෙන්ම මේ වෙලාවේ කියන්නේ -[බාධා කිරීමක්]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Minister, please conclude your speech.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
හොඳයි, මම අවසන් කරනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු ජෝන් අමරතුංග මැතිතුමා කියන්නේ මම ඉතාම ආදරය කරන, බොහොම හොඳ ක්‍රීඩකයෙක්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මොන ක්‍රීඩාවටද?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා ( ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - விளையாட்டுத் துறை அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Sports )
හැම ක්‍රීඩාවකටම.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මම දන්නා විධියට එතුමා මෙපමණ වයස්ගත වෙලාත් සමහර ක්‍රීඩාවලට අපිටත් වඩා දක්ෂයි. එතුමා බොහොම දක්ෂ ක්‍රීඩකයෙක්. එක්සත් ජාතික පක්ෂයේ ඉන්න අයගෙන් මම ඉතාම ආදරය කරන ක්‍රීඩාශීලී මන්ත්‍රීවරයෙක්. මම එතුමාට කියන්නේ, ඔබතුමා වෙන වෙන අය දෙන ලණු කන්න එපා කියලායි.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මම කිව්වේ රටේ තිබෙන ආන්දෝලනය ගැනයි.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ඔබතුමා ලණු කන්න එපා. මොකද, අපේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් කවදාවත් හීනෙන්වත් තරග පාවා දෙන්න හිතනවා කියලා මම හිතන්නේ නැහැ, ඒ අයගේ performances දිහා බැලුවාම.

ගරු අජිත් පෙරේරා මන්ත්‍රීතුමා මේ වාගේ විවාදවල කථා කරන්න ඕනෑ. මොකද, එතුමා ළඟදී පාර්ලිමේන්තුවට ඇවිල්ලා, අනෙක් අලුත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සියලු දෙනා අභිභවලා දැන් විපක්ෂයේ නියෝජ්‍ය සංවිධායකතුමා වෙලා සිටින නිසා. එතුමා අනෙක් අයට ඉහළින් තනතුරු ලබා ගෙන ඉන්නවා. එතුමා තනතුරු ලබා ගැනීමේ ඒ ක්‍රීඩාවේ ඉතාම හොඳින් නියැලෙනවා. ඒ නිසා එතුමා හැම එකකටම කථා කළාට කමක් නැහැ. එතුමා කථා කරන්න ඕනෑ. සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා, හරින් ප්‍රනාන්දු මන්ත්‍රීතුමා වැනි දක්ෂ, අලුත් මන්ත්‍රීතුමන්ලාට වඩා ඉතා හොඳින් අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා ලකුණු රැස් කරමින්, හයේ ඒවා, හතරේ ඒවා ගහමින් විපක්ෂයේ නියෝජ්‍ය සංවිධායක වුණා. ඒ අනුව එතුමාගේ ලකුණු ලබා ගැනීමේ වේගය ඉතාම හොඳයි. ඒ නිසා එතුමාගේ ක්‍රීඩාව එතුමා කර ගෙන ගියාවේ. එතුමා ඒ ක්‍රීඩාව හොඳට කර ගෙන යනවා. එහෙම නැතිව ඔය වැඩේ කර ගන්නත් බැහැ නේ. එහෙම නේද, සුජීව සේනසිංහ මන්ත්‍රීතුමනි? හැබැයි ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමනි, දැනටමත් සමහර ක්‍රීඩාවල අපට වඩා දක්ෂකම් පෙන්වන, ඔබතුමා වාගේ බොහොම ක්‍රීඩාශීලී, ඔබතුමා වාගේ ප්‍රවීණ මන්ත්‍රීවරයෙක් මේ වෙලාවේ අපේ ක්‍රිකට් ක්‍රීඩකයන් දෙස සැකයෙන් බැලීම ඒ තරම් හොඳ වන්නේ නැහැ.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
මා ක්‍රීඩකයන් ගැන කිව්වේ නැහැ. ඒක වැරදි මතයක්.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දන්නවා-

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
දැන් ඔබතුමාගේ ඉනිම අවසන් කළ යුතුයි.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
වර්තමාන ක්‍රීඩා ඇමතිතුමා ගැන මම දන්නවා. මංජු වන්නිආරච්චි කියන බොක්සිං ක්‍රීඩකයාට Gold Medal එක ලැබුණා. හැබැයි, තහනම් උත්තේජක ගත්තාය කියන චෝදනාවට ඒ ක්‍රීඩකයා වැරදිකාරයා වුණු ගමන් ඇමතිතුමා පැය 24න් ඒ ක්‍රීඩකයා තහනම් කළා. වර්තමාන ක්‍රීඩා ඇමතිතුමාත් දක්ෂ ක්‍රීඩකයෙක්. අපේ ආණ්ඩු පක්ෂයේ ඉන්න, ඕනෑම ක්‍රීඩාවක් සඳහා දක්ෂකම් පෙන්වූ ක්‍රීඩකයෙක්. රාජකීය විද්‍යාලයේ හිටපු මගේ යහළුවෙක්. [බාධා කිරීම්]මම දන්නවා, එතුමා සෑම ක්‍රීඩාවකදීම බොහොම ක්‍රීඩාශීලීයි.

යම්කිසි කෙනෙක් තහනම් උත්තේජක අරගෙන, විවිධාකාරයේ වැරදි වැඩ හරහා ක්‍රීඩා කරනවා නම් අනිවාර්යයෙන්ම එතුමා ඒ පිළිබඳව කටයුතු කරනවාය කියන විශ්වාසය අපට තිබෙනවා. ඒ ආත්ම විශ්වාසය තිබෙනවා. හැබැයි, අපේ ක්‍රිකට් ක්‍රීඩකයන්ට අගෞරව වන විධියට, ඒ අයගේ ක්‍රීඩාශීලීභාවයට අගෞරවයක් වන විධියට ඒ අය තරග පාවා දුන්නාය - match fixing කළාය - කියන චෝදනාව කොයිම අවස්ථාවකවත් මොන බලාපොරොත්තු තියා ගෙන හෝ හීනයකින්වත් කළ යුතු නැහැයි කියන එක මා මෙහිදී කියන්න කැමැතියි.

**[අ.භා. 4.45]**

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විස්සයි-විස්ස ක්‍රිකට් ලෝක කුසලාන අවසාන තරගය පරාජය වීම ගැන ක්‍රීඩාවට ආදරය කරන හැම කෙනෙක්ම ඉතාම කනගාටු වුණා. මම ඩිලාන් පෙරේරා ඇමතිතුමා කිව්ව සමහර කරුණු එක්ක එකඟ වෙනවා. එතුමා කිව්වා වාගේ අවසාන මහා තරගවලට අපි හතර වතාවක් තේරිලා තිබෙනවා. ඒ නිසා අපේ ක්‍රීඩකයන්ගේ දක්ෂතාව ගැන සැකයක් හෝ ප්‍රශ්නයක් නැහැ. ඒ අයට හැකියාව, දක්ෂතාව තිබෙනවා. නමුත් අපි බලන්න ඕනෑ, අපි අවසාන තරග හතරකට ඇවිල්ලා පැරදෙන්නේ ඇයි කියලා. මම අපේ ගරු ඇමතිතුමාට පෞද්ගලිකවත් මේ ගැන කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට Test වරම් ලැබුණු කාලයේ අපේ කණ්ඩායමට පුහුණුව ලබා දෙන්න ගැරී සෝබර්ස් මහත්මයා ගෙන්වුවා. එතුමා ලෝකයේ ඉන්න හොඳම තුන් ඉරියව් ක්‍රීඩකයෙක්. ඔහු ගෙන්වුවා.

ඊ ළඟට, අපේ ක්‍රීඩකයන්ගේ මනස හදන්න ඕනෑ, we should strengthen them mentally. ඒක හුඟ දෙනකුට අමතක වෙලා තිබෙනවා. මම ගරු ඇමතිතුමාට පෞද්ගලිකවත් මේ ගැන කිව්වා. ක්‍රීඩකයන්ගේ මනස හදන්න එක්දහස් නවසිය අසූ ගණන්වල ක්‍රිකට් පාලක මණ්ඩලයට ගෙනාවා රුඩි වෙබ්ස්ටර් කියලා ජාත්‍යන්තර වෛද්‍යවරයෙක්. ඔහු අපේ කණ්ඩායමත් එක්ක අවුරුදු කිහිපයක් වැඩ කළා. When we obtained Test status, to strengthen our cricketers mentally, the then Cricket Board brought down Dr. Rudi Webster.

දැන් බලන්න, මේ රුඩි වෙබ්ස්ටර් ගැන තිබෙන විස්තර. ඔහු අවුරුදු ගණනාවක් අපේ කණ්ඩායමත් එක්ක වැඩ කළා. නමුත් අපේ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනට අද එහෙම කෙනෙක් නැහැ. අපේ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය ක්‍රීඩා පිටි හදනවා. ඒක හොඳයි, නරකයි කියන්නේ නැහැ. නමුත් මට පෙනෙන විධියට අපි මේ අවසාන තරග හතර පැරදුණේ අපේ ක්‍රීඩකයන්ගේ මනස හදලා නැති නිසායි. ඒ නිසා අපේ ක්‍රීඩකයන්ගේ මනස හදන්න ඕනෑ. ඒ අවශ්‍ය විශේෂඥ වෛද්‍ය උපදෙස් තිබුණේ නැහැ. මම මේ කියන රුඩි වෙබ්ස්ටර් කියන පුද්ගලයා අවුරුදු ගණනාවක් අපේ ක්‍රිකට් කණ්ඩායමත් එක්ක වැඩ කළා. මේ මෑතකදී නැවත ඔහුගේ සේවය ලබා ගෙන තිබෙනවා. ඒ සම්බන්ධ වාර්තාවක් තිබෙනවා.

I quote:

"Rudy Webster to help Kolkata Knight Riders. Seventy-two-year-old sports psychologist..

- He is a sports psychologist.

..Dr. Rudi Webster, who worked with World Cup winning West Indies captain Clive Lloyd in the 1970s, would help Kolkata Knight Riders in the upcoming IPL season 5 beginning on April 4.

Announcing the appointment, KKR in a statement on Monday said Dr. Webster would be the mental skills coach and would play an important role in the team's scheme of things.

'We are delighted welcome Dr. Webster. I am sure he will add to the strength and play an important role in taking KKR to the next level of performance,…."

පසු ගිය IPL තරගාවලියේදී මේ රුඩි වෙබ්ස්ටර් කියන මනෝ වෛද්‍යවරයා පාවිච්චි කරලා Kolkata Knight Ridersලා IPL තරගාවලිය දිනුවා. මට පෙනෙන විධියට අපේ ක්‍රිකට් ක්‍රීඩකයන්ගේ දක්ෂතාව ගැන ප්‍රශ්නයක් නැහැ. නමුත් තීරණාත්මක තරගවලදී ඒ ක්‍රීඩකයන්ගේ මනස හැදීමට, ඒ අවශ්‍ය වෛද්‍ය උපදෙස් ලබා දීමට අපේ ක්‍රිකට් ආයතනය වැඩි උනන්දුවක් දක්වා නැහැ. ඉතින් ඒක කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

පසු ගිය ඒවා අපි අමතක කරමු. අනාගතය උදෙසා හෝ මේ විෂය ගැන අවබෝධයක් තිබෙන උදවිය ගෙනැවිත් අපේ ක්‍රීඩකයන්ගේ මනස හදන්න අවශ්‍ය සහයෝගය ලබා දෙමු.

දැන් ක්‍රිකට් ආයතනයේ Interim Committee එකක් තමයි තිබෙන්නේ ගරු ඇමතිතුමනි. Interim Committee එක පත් කරන්න තරගයක් තිබුණා. නමුත් එතැන මොකක්ද වුණේ කියා තමුන්නාන්සේලා දන්නේ නැහැ. මම තමුන්නාන්සේගෙන් අහන්නේ, ඇයි ඇමතිවරයා ඒ වගකීම භාර ගන්නේ? නිලවරණයක් තියලා ක්‍රිකට් ආයතනයට ඕනෑ විධියට සභාපතිවරයෙක් ඇතුළු නිලධාරි මණ්ඩලයක් පත් කර ගන්නේ ඉඩ හැරියොත් ඔබතුමා නිදහස්. දැන් Interim Committees පත් කරනවා. එතැන වරදක් වුණොත් ඔබතුමාට තමයි ඒ දෝෂාරෝපණය එන්නේ. ගිය වතාවේ නිලවරණයක් තිබුණාට ඒක නිලවරණයක් වුණේ නැහැ. ඔබතුමා දන්නවා, කණ්ඩායමක් බලහත්කාරයෙන් වාගේ ඉවත් කළ බව. ඇයි, ඒ වගකීම ඇමතිවරයා භාර ගන්නේ? එම නිසා මම ඔබතුමාට කියන්නේ නිලවරණයක් තියන්න කියලායි. නිලවරණයක් තියලා ක්‍රීඩා සමාජවලට අවශ්‍ය,- [බාධා කිරීමක්] ලබන අවුරුද්දේ තිබ්බාට ගිය වතාවේ කරපු වැඩේ කරන්න එපා. [බාධා කිරීමක්] ගිය වතාවේ නිලවරණයක් තිබ්බාට, බලපෑම් කරලා කණ්ඩායමක් ඉවත් කළා නේ. [බාධා කිරීමක්] පසු ගිය ඒවා අමතක කරන්න. මා ඔබතුමාට කියන්නේ, conduct an election and let the Clubs elect whom they want. Why must you take the responsibility? Interim Committee එක පත් කරනකොටත්

ඔබතුමා තමයි ඒක පත් කරන්නේ. නිලවරණයක් තියනකොට බලපෑම් කරලා අනෙක් කණ්ඩායම් ඉවත් කළාම ඒකේ දෝෂාරෝපණය එන්නේත් ඇමතිවරයාට. අන්න එම නිසා මම ඉල්ලීමක් කරනවා නිලවරණයක් තියන්න, ක්‍රීඩා සමාජවලට අවශ්‍ය අය පත් කරන්න ඉඩ හරින්න කියලා.

අපි ඕවර් 50 සහ 20 තරගවලට හොඳ දක්ෂතාවක් දැක්වූවාට අපට මුළු ලංකාවම වෙලා ගන්නා ක්‍රීඩා තරගයක් නැහැ. If you take Australia, there is the Sheffield Shield which covers the whole of Australia. ඉන්දියාව ගත්තොත්, you get the Ranji Trophy and the Duleep Trophy which covers the whole of India. ඒ වාගේ මුළු රටම වෙලා ගන්නා ක්‍රීඩා තරග අපට නැහැ. ඔබතුමා දන්නවා, අපේ ක්‍රිකට් ක්‍රීඩාව කොළඹට පමණයි සීමා වෙලා තිබෙන්නේ. අපි Test වරම් ලබලා දැන් අවුරුදු විසි ගණනක් වෙනවා. නමුත් අපේ Test Cricket ක්‍රීඩාව ඒ තරම් හොඳ තත්ත්වයක නැති බව ඔබතුමා පිළිගන්නවා. අපි ඕස්ට්‍රේලියාවට ගිහින් තවම Test Match එකක්වත් දිනලා නැහැ. එම නිසා මා ඔබතුමාට කියන්නේ මුළු රටම වෙලා ගන්නා ක්‍රීඩා තරග ඇති කරන්න කියන එකයි. ප්‍රාදේශීය වශයෙන් මධ්‍යම පළාත ගත්තොත් මධ්‍යම පළාතට Cricket Team එකක් ඉන්න ඕනෑ.

දකුණු පළාතට ඉන්න ඕනෑ. කුරුණෑගලට ඉන්න ඕනෑ. එතකොට ඒ කණ්ඩායම්වලට ප්‍රාදේශීය සහයෝගය ලැබෙනවා. ඉන්දියාව ගැන බැලුවොත් Bombay Team එක ඉන්නවා; Delhi Team එක ඉන්නවා; Tamil Nadu Team එක ඉන්නවා; කර්ණාටක Team එකක් වෙනම ඉන්නවා. ඉතින් එතකොට ප්‍රාදේශීය සහයෝගය ඒ කණ්ඩායම්වලට ලැබෙනවා. මධ්‍යම පළාතට වෙනම කණ්ඩායමක් ඉන්නවා නම් මුළු මධ්‍යම පළාතම ඒ කණ්ඩායම පිටුපස ඉන්නවා. එපමණක් නොවෙයි ක්‍රීඩා තරග නරඹන්නන් ගැන බැලුවොත්, අද ක්‍රිකට් ක්‍රීඩාව කොළඹට පමණක් සීමා වෙලා තිබෙන නිසා විශේෂයෙන්ම පිට පළාත්වල අය මේ තරග නැරඹීමට එනවා අඩුයි. There must be a regional competition covering the whole island if we are to improve cricket in Sri Lanka. එම නිසා මේ කාරණා ටික ඉදිරිපත් කරමින් මා නැවත වරක් කියනවා, දැන් වෙච්ච දේවල් වුණා; අපට ඒක ආපසු හරවන්න බැහැ කියලා. මා කලින් කිව්වා වාගේ අනාගතයේදී ඒ අවශ්‍ය විශේෂඥ සහයෝගය අපේ ක්‍රිකට් කණ්ඩායමට ලබා දෙන්නය කියා මා ඉල්ලනවා.

**[අ.භා. 4.54]**

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම අද දින ඉදිරිපත් කර තිබෙන සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව සම්බන්ධයෙන් වචන කිහිපයක් කථා කරන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව මා ස්තුතිවන්ත වෙනවා. ඇත්තෙන්ම අද ක්‍රිකට් ක්‍රීඩාව තුළින් අපේ රටට විශාල කීර්තියක් අත් වෙලා තිබෙනවාය කියන එක අපි කවුරුත් පිළිගන්නා කාරණයක්. අපි අහලා තිබෙන විධියට, අපි දැන ගත්තු විධියට 1948 ඩන්කන් වයිට් කියන ක්‍රීඩකයා අපේ රට වෙනුවෙන් ප්‍රථම ඔලිම්පික් පදක්කම ගෙනාවායින් පසුව ක්‍රිකට් ක්‍රීඩාව ආරම්භ වෙලා, පියවරෙන් පියවර ඉදිරියට ගිහින් ඒ ඒ රාජ්‍ය පාලන කාලයන් තුළදී ක්‍රිකට් ක්‍රීඩාව වර්ධනය කරන්න විශාල සහයෝගයක් ලබා දී තිබෙනවා.

විශේෂයෙන්ම 1996 දී අපට හැකියාව ලැබුණා ලෝක කුසලානය දිනා ගන්න. ඒ සම්බන්ධයෙන් කථා කරනකොට අපේ හිටපු ක්‍රිකට් නායක ගරු අර්ජුන රණතුංග මන්ත්‍රීතුමා ගැන මතක් කරන්න ඕනෑ. එතුමාගේ නායකත්වයෙන් යුතු ඒ කණ්ඩායම අපේ රටට ලෝක කුසලානය දිනා ගන්න සමත් වුණා. මම හිතන හැටියට අපේ මේ පුංචි ශ්‍රී ලංකාව ගැන සමහර රටවල්වලට ගිහින් කථා කළාම ලෝක සිතියම බලලා තමයි ශ්‍රී ලංකාව කොතැනද තිබෙන්නේ කියා හඳුන්වා දෙන්න පුළුවන් වුණේ. ඒ මට්ටමේ තිබුණු ශ්‍රී ලංකාව පිළිබඳව ජාත්‍යන්තර වශයෙන් කථාබහට ලක් වෙන්න තරම් අපේ ක්‍රිකට් ක්‍රීඩාව ප්‍රධාන හේතුවක් වුණාය කියන කාරණය අපි කවුරුත් දන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම නැවතත් අපේ රටේ නාමය ජාත්‍යන්තරයට ගෙනි යන්න සුසන්තිකා ජයසිංහ ක්‍රීඩිකාව ඉමහත් වූ කාර්ය භාරයක් ඉටු කළා. ආසියානු මට්ටමෙන්, දකුණු ආසියානු මට්ටමෙන්, පොදු රාජ්‍ය මණ්ඩලීය මට්ටමෙන් අපි ජයග්‍රහණ අත් පත් කර ගත්තත් මුළු ලෝකයම පිළිගන්නා ඔලිම්පික් තරගයෙන් ජයග්‍රහණය කරලා රිදී පදක්කමක් අපේ රටට ලබා දෙන්නට සුසන්තිකා ජයසිංහ ක්‍රීඩිකාව සමත් වුණා. ඒ වාගේම මුලින් මේ සභාවේ කථා කළා වාගේම කණ්ඩායම් ක්‍රීඩා වේවා, මලල ක්‍රීඩා වේවා ඒ සියල්ලතුළින් අපට ලෝක මට්ටමේ අභියෝගාත්මක කණ්ඩායමක් බවට පත් වෙන්න, එහෙම නැත්නම් හොඳ තරගයක් දීලා අනු ශූරයන් බවට, ශූරයන් බවට පත් වෙන්න, ශ්‍රී ලංකාව අනිකුත් රටවල්වලට අභියෝගයක් බවට පත් වෙන්න තරම් වර්තමානයේ තිබෙන එකම ක්‍රීඩාව තමයි ක්‍රිකට් ක්‍රීඩාව. ඒ නිසා තමයි අපේ රටේ ජාතික ක්‍රීඩාව වොලිබෝල් වුණත්, අද ජනප්‍රියම ක්‍රීඩාව හැටියට අපි සියලු දෙනාම ක්‍රිකට් ක්‍රීඩාවට ආදරය කරන්නේ. ඒ නිසාම තමයි විපක්ෂයේ ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා විසින් අද මේ යෝජනාව පාර්ලිමේන්තුවට ගෙනල්ලා, මේ යෝජනාව කථාබහට ලක් කරන්න අවස්ථාවක් කර ගන්න ඇත්තේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම විශේෂයෙන් අපි මේ කාරණයත් මතක් කරන්න ඕනෑ. සුපුරුදු පරිදි අපේ අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා බෝලය ගහගෙන, ගහගෙන ඇවිල්ලා අන්තිමට රාජපක්ෂ පවුල ළඟ තමයි ඒක නැවැත්වුයේ. එතැනට තමයි ගෙනාවේ. අපි දැක්කා පසු ගිය කාලයේදී මේ රටේ ත්‍රස්තවාදය නිමා කරන්නට යන ගමනේදීත් ඇත්තෙන්ම සමහර දේශපාලනඥයන් ඒකට කැමැති වුණේ නැහැ කියලා.

ත්‍රස්තවාදය නිමාවට පත් කළාට පස්සේ කීර්තිමත් රජයක්, -ආණ්ඩුවක්- දේශපාලන පක්ෂයක් බවට අපේ රජය පරිවර්තනය වෙයි කියලා ගොඩාක් අය බයෙන් හිටියා. ඒ වාගේම තමයි සමහර අවස්ථාවල ක්‍රිකට් ජයග්‍රහණය තුළිනුත් මේ ආණ්ඩුවට, දේශපාලන නායකත්වයට යම් කිසි ප්‍රසාදයක් ඇති වෙයි කියලා හිත යටින් ඒ ජයග්‍රහණය නොලැබුණොත් හොඳයි කියලා හිතන කණ්ඩායම් ඉන්නවා. එවැනි අවස්ථාවකට උදාහරණයක් තමයි මේ ළඟදී අවසන් වුණු විස්සයි විස්ස ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලිය පරාජය වීම. අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා මේ පරාජයට හේතුව, රාජපක්ෂ පවුලේ වැරැද්දක්, රාජපක්ෂ පවුල තමයි මේක යට ඉන්නේ කියන චෝදනාවක් එල්ල කළා. ඇත්තෙන්ම ක්‍රීඩාව නාමයෙන් අපි ඒවා හෙළා දකින්න ඕනෑ. විශේෂයෙන්ම අපි මතක් කරන්නේ, අපේ ජාතික ක්‍රිකට් කණ්ඩායම අපට ලොකු අභිමානයක්ය කියන එකයි. ඔවුන්ට අපේ ගෞරවය දෙන්න ඕනෑ. ක්‍රීඩාව කියන්නේ හැම වේලාවේම ජයග්‍රහණ උරුම කර ගන්න පුළුවන් දෙයක් නොවෙයි. පරාජයට පත් වෙනවා. ඒ වාගේම ජයග්‍රහණ අත් පත් කර ගන්නවා. ඒක සාමාන්‍ය දෙයක්.

ක්‍රිකට් ක්‍රීඩාව ගත්තාම අපි කියන්නේ එය අවිනිශ්චිත ක්‍රීඩාවක්ය කියලායි. අපේ ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා මතක් කළා වාගේ අපි ඉහළම ජයග්‍රහණය ලබා ඊ ළඟ තරගාවලියට ගියාම අන්ත පරාජයට පත් වුණු අවස්ථා තිබෙනවා. ඒක තමයි ක්‍රිකට් ක්‍රීඩාවේ හැටි. ක්‍රිස් ගේල් කියන්නේ අපි කවුරුත් දන්නා ක්‍රීඩකයෙක්. එදා අවසාන තරගය නරඹන වේලාවේ ශ්‍රී ලාංකිකයන් හැටියට අපි හැමෝම ප්‍රාර්ථනා කළේ ක්‍රිස් ගේල්ව ඉක්මනට out වෙන්න කියලා. ක්‍රිස් ගේල් ලකුණු තුනට out වෙන

[ගරු ශාන්ත බණ්ඩාර මහතා]

කොට අපට පුදුම සතුටක් දැනුණා. හැබැයි ක්‍රිකට් ක්‍රීඩාව අවිනිශ්චිත ක්‍රීඩාවක්ය කියන එක ඔප්පු කරමින් වෙනත් ක්‍රීඩකයෙක් ඉදිරියට ඇවිල්ලා ඔවුන්ගේ රට වෙනුවෙන්, කණ්ඩායම වෙනුවෙන් තරග කර විශාල ජයග්‍රහණයක් ලබන්න පුළුවන් ලකුණු ප්‍රමාණයක් ලබා ගන්න කටයුතු කළා.

ඉතින් මෙය තමයි ක්‍රිකට් ක්‍රීඩාවේ ස්වභාවය. ජයග්‍රහණ ලබන කොට අපි මල් මාලා දමා අපේ රටේ ක්‍රිකට් කණ්ඩායම, ක්‍රිකට් ක්‍රීඩකයින් පිළිගන්නවා වාගේම පරාජයට පත් වුණාට පස්සේ ඔවුන්ට චෝදනා එල්ල කිරීම කළ යුතු කාර්යයක් නොවේය කියන එක අපි මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ. අපේ ක්‍රිකට් කණ්ඩායම පරාජිතයන් නොවෙයි. ඒ අය 20-20 ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියේ අනුශූරයන් වෙලා තිබෙනවා. ඒ වාගේම සීමිත ඕවර් තරගවලදීත් -ඕවර් 50 තරගවලදීත්- අපි අනුශූරයන් බවට පත් වෙලා තිබෙනවා. ඒ කියන්නේ ලෝකයේ විශාල තරගයක් දෙන්න පුළුවන් ක්‍රිකට් කණ්ඩායමක් බවට අපේ ශ්‍රී ලාංකික ක්‍රිකට් කණ්ඩායම පත් වෙලා තිබෙනවා. ඒ නිසා හැම වෙලාවේම ඔවුන්ට අපේ ගෞරවය, ප්‍රණාමය, සුබ පැතුම් එකතු කළ යුතුව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ ජාතික ක්‍රිකට් කණ්ඩායමේ ඉන්න රංගන හේරත් ක්‍රීඩකයා මා නියෝජනය කරන දඹදෙණිය මැතිවරණ කොට්ඨාසයේ ක්‍රීඩකයෙක්. දඹදෙණිය ජනතාව හැටියට, සත් කෝරළයේ ජනතාව හැටියට අපට ඔහු විශාල ගෞරවයක්.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
එතුමා Moors' Club එකට නායකත්වය දුන්නා.

**ගරු ශාන්ත බණ්ඩාර මහතා**
(மாண்புமிகு சாந்த பண்டார)
(The Hon. Shantha Bandara)
ඔව්. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ක්‍රිකට් කණ්ඩායම පසු ගිය 20-20 ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියෙන් පරාජයට පත් වන කොට අපටත් ඇත්තටම ලොකු කනගාටුවක් දැනුණා; අපට ලොකු දුකක් දැනුණා. ඒ විතරක් නොවෙයි. සමහර අය ඒ වේදනාව උහුලා ගන්න බැරිව ජීවිතය නැති කර ගත්තා. සමහර අවස්ථාවල අපේ ක්‍රිකට් කණ්ඩායම පැරදෙන කොට ඇතැම් පුද්ගලයින් හෘදයාබාධ හැදිලා ජීවිතක්ෂයට පත් වුණා අපි දැකලා තිබෙනවා. ජනතාව තුළ ඒ තරම් ලෙංගතුකමක්, බැඳීමක්, ආදරයක් ක්‍රිකට් ක්‍රීඩාවට සහ අපේ ක්‍රීඩකයන් වෙත තිබෙනවා. ඒ නිසා යම් කිසි අවස්ථාවක ඒ අය පරාජයට පත් වුණාට පස්සේ ඔවුන් තරග පාවා දුන්නාය කියා යම් චෝදනාවක් එල්ල කරන්න සූදානම් වෙනවා නම් දෙපාරක් හිතලා ඒ චෝදනාව එල්ල කරන්න ඕනෑය කියන එක මේ වෙලාවේ අපි මතක් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රිකට් ක්‍රීඩාවේ පරිපාලනයේ යම් යම් දුර්වලතාවන් තිබෙන්න පුළුවන්. අපි ඉතාමත් ආදරය කරන ඒ වාගේම දක්ෂ ඇමතිවරයකු තමයි අද අපේ රටේ ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයා හැටියට කටයුතු කරන්නේ. ඒ තමයි ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා. එතුමාට භාර දෙන ඕනෑම විෂයක් එතුමාගේ දක්ෂතාව, හැකියාව මත ඉතාම සාර්ථකව ඉදිරියට ගෙන යනවා. අද ක්‍රීඩාවේ ලොකු වෙනසක් දකින්න තිබෙනවා. අද වන විට ගම්බද ක්‍රීඩාව දියුණු කරන්න කටයුතු කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතෙක් වයඹ පළාතේ අපට ක්‍රීඩා සංකීර්ණයක් තිබුණේ නැහැ. මෙතෙක් ක්‍රීඩා ඇමතිවරුන් හැටියට කවුරුන් හිටියත්, කවුරුන් ක්‍රීඩාවට උදව් කළා කිව්වත් වයඹ පළාතට ක්‍රීඩා සංකීර්ණයක් නැහැ. හරිහමන් පිහිනුම් තටාකයක් නැහැ. මේ වන කොට අතිගරු ජනාධිපතිතුමාගේ උපදෙස් පරිදි, අපේ මුළු රටේම සියලුම පළාත්වලට අංග සම්පූර්ණ ක්‍රීඩා සංකීර්ණ ලබා දෙන්නත්, සෑම දිස්ත්‍රික්කයටම අංග සම්පූර්ණ ක්‍රීඩාගාර ලබා දෙන්නත් කටයුතු කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි. හැම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම එක් අංග සම්පූර්ණ ක්‍රීඩා පිටියක් ලබා දෙන්නත් අද වැඩ පිළිවෙළ සකස් කර, මුදල් ප්‍රතිපාදන වෙන් කර දැන් පළාත් කිහිපයක ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වෙමින් පවතිනවා. ඒ වාගේ වැඩසටහන් රාශියක් එක්ක ගරු ඇමතිතුමා කටයුතු කරද්දී, අපි ඔබතුමාගෙන් තව එක කාරණයක් ඉල්ලනවා. ක්‍රිකට් පාලක මණ්ඩලයේ යම් යම් පරිපාලන දුර්වලතා තිබෙන්න පුළුවන්. ඒවා පිළිබඳව විශේෂයෙන් සොයා බලන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම ඇතැම් අය කියන ආකාරයට තරග පාවා දීමක් සිදු වෙලා තිබෙනවාද යන්නත් ගරු ඇමතිතුමා ඉතාම සුපරීක්ෂාකාරීව සොයා බලා කටයුතු කරාවි කියන විශ්වාසය අප තුළ තිබෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ වන විට නිර්භීත තීන්දු තීරණ කිහිපයක් ගෙන තිබෙනවා. විශේෂයෙන්ම තහනම් උත්තේජක භාවිත කිරීම සම්බන්ධයෙන් අපේ රටේ සමහර ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට එරෙහිව නිසි ආකාරයෙන් විනය ක්‍රියාත්මක කරන්න ඔබතුමා කටයුතු කර තිබෙනවා. ඒ නිසා මේ පිළිබඳව විපක්ෂය එල්ල කරන චෝදනාව, එහෙම නැත්නම් අපේ ක්‍රීඩකයින් ක්‍රීඩාව මුදලට පාවා දුන්නාය කියන කාරණය පිළිබඳව යම් සත්‍යයක් තිබෙනවාද කියා සොයා බැලීමත් කාලීන අවශ්‍යතාවක් වෙනවා. අපි විශ්වාස කරන්නේ නැහැ, අපේ රටේ ක්‍රීඩකයන් ඒ තත්ත්වයට පත් වුණාය කියා. නමුත් එහෙම ප්‍රශ්නයක් නඟනවා නම් ඒ පිළිබඳව ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරාවි කියා අපි විශ්වාස කරනවා.

අද අප කනගාටු වෙනවා, මෙම ක්‍රීඩාව මුදලට හසු වෙන්න යන තත්ත්වය ගැන. පසු ගිය 20-20 ක්‍රිකට් තරගාවලියේදී විශාල වශයෙන් ඔට්ටු අල්ලනවා අප දැක්කා. විශාල මුදල් ප්‍රමාණයන්, වාහන, ඒ වාගේම නොයෙකුත් ආකාරයේ ඔට්ටු අල්ලා මෙම ක්‍රීඩාව සූදුවක් බවට පරිවර්තනය කරන්නත් සමහර අවස්ථාවල සමහර අය සූදානම් වෙනවා අප දැක්කා. මේ ක්‍රිකට් ක්‍රීඩාව හෝ වෙනත් ක්‍රීඩාවක් මුදල් උපයන ව්‍යාපාරයක් බවට පත් වෙනවා නම්, සූදුවක් බවට පත් වෙනවා නම්, ඔට්ටු අල්ලා මේ තුළින් මුදල් සොයා ගැනීමේ ව්‍යාපාරයක් බවට මේක පත් වෙනවා නම් තරුණ මන්ත්‍රීවරුන් හැටියට අප ඒකට විරුද්ධ වෙනවා. ඒ විතරක් නොවෙයි ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි, මේ රට නියෝජනය කළ ක්‍රීඩකයෙක් හැටියට මා එය සම්පූර්ණයෙන්ම හෙළා දකිනවා. සමහර රටවල මෙය නීතිගත කර තිබෙන්නට පුළුවන්. නමුත් අපේ රටේ ඒක නීතිගත කර නැහැ. එසේ නීතිගත කිරීමත් සුදුසු නැහැ. ඒ නිසා ඒ ආකාරයට කටයුතු කිරීම සුදුසු තත්ත්වයක් නොවේය කියන එක මේ වෙලාවේ අප මතක් කරන්නට කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා දීර්ඝ වශයෙන් කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. මේ යෝජනාවත් එක්ක මේ කාරණය මා විශේෂයෙන් කියා සිටින්නට කැමැතියි. ජාත්‍යන්තර වශයෙන් ඉදිරියට යන්නට පුළුවන් ක්‍රීඩාවක් හැටියට ඒ වාගේම අප ගැන ලෝකයේ කථාබහට ලක් වන, ලෝකයේ අනෙකුත් රටවලට අභියෝගයක් එල්ල කරන්න පුළුවන් ක්‍රීඩාවක් හැටියට ක්‍රිකට් ක්‍රීඩාව ඉදිරියට ගෙන යාම සඳහා අප සියලු දෙනාගේම සහයෝගය ලබා දිය යුතුව තිබෙනවා. මගේ පෞද්ගලික දැනීමේ හැටියට, විශේෂයෙන් ක්‍රීඩා පුහුණු කරුවෙක් හැටියට මට කියන්න තිබෙන්නේ එදා අපේ ක්‍රීඩා කණ්ඩායමට මුහුණ දෙන්න තිබුණු විධියට - ක්‍රීඩා කණ්ඩායමට අවශ්‍ය සුදුසු ආකාරයට- ඒ කණ්ඩායමේ කළමනාකරණ කටයුතු ටික සිදු කර ගන්නට අපහසුතාවක් ඇති වුණු බවයි.

මේ තැන්වලදී ක්‍රීඩා ඇමතිතුමාට විෂය භාර ඇමතිවරයා හැටියට මැදිහත් වන්නට පුළුවන් සීමාව මොකක් ද කියා අප දන්නේ නැහැ. එම නිසා ගරු ඇමතිතුමාට මැදිහත් වන්නට පුළුවන් සීමාව තුළ සිට මෙවැනි තැන්වලදී සහයෝගය ලබා දෙන්නට පුළුවන් වුණොත් මේ තත්ත්වයන් අවම කර ගන්නට පුළුවන්කම ලැබේවි. ඔබතුමා දක්ෂ ඇමතිවරයෙක් හැටියට මේ පැන නැඟී තිබෙන කරුණුත් එක්ක අපේ ක්‍රිකට් ක්‍රීඩාව තව දුරටත් ශක්තිමත් කර, අප දැන් ලබා ගෙන තිබෙන ජාත්‍යන්තර ජයග්‍රහණ තවදුරටත් ශක්තිමක් කරමින් ඉදිරියට ගෙන යන්නත්, ඒ තුළින් අපේ රටට කීර්තියක් ඇති කර දෙන්නත් නායකත්වය ගන්නය කියන ගෞරවණීය ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඊළඟට ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා.

**[අ.භා. 5.07]**

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මෙම විවාදයට එක් වීමට අවස්ථාවක් ලැබීම ගැන මම ප්‍රථමයෙන්ම සතුටු වෙනවා. ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කර තිබෙන මෙම සභාව කල්තබන අවස්ථාවේ යෝජනාව විශාල වශයෙන් ආන්දෝලනයකට ලක් වෙනවාය කියා තමයි මා සිතන්නේ. ඒකට මූලික හේතුව මෙයයි. එතුමා මෙම යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ මේ ආකාරයෙනුයි. "මෑතක සිට ක්‍රීඩා ක්ෂේත්‍රයේ මහත් ආන්දෝලනයකට ලක් වී ඇති ප්‍රශ්නයක් නම් තරග පාවා දීමයි. ලෝකය පුරා විශේෂයෙන් ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් තරග පාවා දීමේ චෝදනාව එම ක්‍රීඩාවේ ක්‍රීඩකයන්ට පමණක් නොව විනිසුරුවන් කෙරෙහි පවා එල්ල වී ඇත. මෙම චෝදනාව ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව කෙරෙහි මහත් අපකීර්තියකි. ක්‍රිකට් ක්‍රීඩාවේ උද්ගත වී ඇති මෙම අවාසනවන්ත තත්ත්වය...." යනාදි වශයෙන් එතුමා යෝජනාවෙන් කියනවා. මේ ආකාරයේ යෝජනාවක් ඉදිරිපත් කරමින් මෙම කතිකාව මේ සභාවේ ආරම්භ කිරීමෙන් මේ උත්තරීතර සභාවේ මන්ත්‍රීවරයකු හැටියට එතුමා කර තිබෙන්නේ අපේ ක්‍රිකට් ක්‍රීඩකයින්ටත්, ක්‍රීඩාවටත් අපහාසයක්, එහෙම නැත්නම් ඔවුන්ට යම් කිසි අපකීර්තික් ගෙන ඒමක්ය කියන එකයි මගේ පෞද්ගලික මතය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහරවිට මේ යෝජනාව ඉතාම හොඳ චේතනාවෙන් එතුමා ගෙන එන්නට ඇති. එතුමා මේ ක්‍රීඩාව නරඹන්නෙකු හැටියට, මේ ක්‍රීඩාවට ආදරය කරන කෙනෙකු හැටියට අවංකව මේ යෝජනාව ගෙන එන්නට ඇති. නමුත් මෙම ස්ථානයට මෙම යෝජනාව ගෙන ඒම තුළ මෙම උත්තරීතර සභාවේ සාමාජිකයන් හැටියට - මන්ත්‍රීවරුන් හැටියට- රට තුළ සංවාදයක් ඇති වෙනවා, අපේ ක්‍රීඩකයක් ක්‍රීඩා කරන්නේ මුදලට, අපේ ක්‍රීඩාව පාවා දීමටය කියා. එම නිසා අපි පුළුල්ව කල්පනා කර බැලුවොත්, අපේ ජාතික කණ්ඩායම, ඒ ක්‍රීඩකයින් විශාල කැපවීමක් කර, මහන්සි වෙලා තමන්ගේ රට නියෝජනය කරනවා.

මට කලින් කථා කළ ගරු ඩිලාන් පෙරේරා ඇමතිතුමා පැවසූ ආකාරයට, ඒ වාගේම ගරු ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා කථා කළ ආකාරයට දීර්ඝ වශයෙන් පැය ගණන් මේ ගැන කථා කරන්නට පුළුවන්, අපේ රටේ ක්‍රීඩාවට විශේෂයෙන් ක්‍රිකට් ක්‍රීඩාවට අපේ ක්‍රීඩකයින් කර තිබෙන සේවය ගැන. නමුත් ඔවුන්ව සැකයට භාජනය කරමින්මේ කතිකාව ඇති කිරීමේ තිබෙන හානිය ගැන අපි බලන්නට ඕනෑ.

ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියක අවසාන වටයට එන එක කොපමණ අමාරුද කියලා අපි දන්නවා. අවසාන වටයට ආවාට පසුව පළමු තැනට හෝ දෙවැනි තැනට පත් වනවා. සාමාන්‍යයෙන් යම් කිසි රටක් අවසාන වටයට පැමිණියාම ඒ රටේ ජනතාව තුළ ලොකු උනන්දුවක්, ඒ වාගේම බලාපොරොත්තුවක් ඇති වෙනවා, අපේ රට කප් එක ගන්නවා කියලා; ජයග්‍රහණය කරනවා කියලා. ඒක අපි අවුරුදු ගණනාවක අත් දැකීමෙන් දන්නවා. අපේ රට quarter-final එකට තේරෙන කොට ඇති වන උනන්දුවට වඩා, ඒක දිනලා semi-final එකට එන කොට මිනිසුන් තුළ කොපමණ උනන්දුවක් ඇති වෙනවාද කියලා අපි දන්නවා. ඊට පස්සේ අවසාන මහා තරගයට - final match එකට - ආවට පස්සේ, අවසාන මහා තරගය දිනලා රටට විශාල ගෞරවයක්, අභිමානයක් ගෙනෙන්න ඒ කණ්ඩායමත් එක්ක මුළු රටම පෙළ ගැහෙනවා. ඒක අපේ රටේ විතරක් නොවෙයි ලෝකයේ ඕනෑම රටක රටට ආදරය කරන ජනතාව කරන දෙයක්. අවසාන මහා තරගයට ඇවිල්ලා ජයග්‍රහණය කරන්න බැරි වුණාම බොහොම කනගාටුවට පත් වෙනවා. අප තුළ ඒ වගේ ප්‍රතික්‍රියාවක් - reaction එකක් - ඇති වෙනවා.

මට මතකයි, ආර්. ප්‍රේමදාස ක්‍රීඩාංගනයේ පැවැති ටෙස්ට් තරගයකදී සනත් ජයසූරිය මහත්මයා ලකුණු 290ක් ගහලා නොදැවී හිටපු අවස්ථාව. පළමුවැනි දවසේ තරගය නරඹන්න ප්‍රේක්ෂකයෝ 300ක්වත් හිටියේ නැහැ. අපි ටිකට් පත් මුද්‍රණය කරලා තිබුණේත් නැහැ. නමුත් පසුවදා අපට ක්‍රීඩාංගනයේ සියලුම ගේට්ටු විවෘත කරන්න සිද්ධ වුණා, බ්‍රයන් ලාරාගේ ලෝක වාර්තාව සනත් ජයසූරිය මහත්මයා කඩයි කියලා; ඒ වාර්තාව බිඳ දාලා තරගය දිනයි කියලා පහුවදා උදේ ප්‍රේක්ෂකයෝ 30,000කට අධික ප්‍රමාණයක් ආර්. ප්‍රේමදාස ක්‍රීඩාංගනයට ඇවිල්ලා හිටියා. ඒ මිනිස්සු රස්සාවට යන්නේ නැතිව නිවාඩු දමා ගෙන ඇවිල්ලා, රස්සාවට ගිය අය උදෙන්ම මාරු වෙලා ඇවිල්ලා මුළු ක්‍රීඩාංගනයම අතුරු සිදුරු නැතිව පිරුණා. ඒක තමයි තමන්ගේ රට පිළිබඳව තිබෙන හැඟීම; ඒක තමයි තමන්ගේකම, අපේකම.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම පසු ගිය 20-20 තරගාවලියටත් අපි ආවේ දිනයි කියලා. කවුද පරදින්න යන්නේ? ඒක පිටුපස යම් කිසි වරදක් වෙනවා නම්, යම් කිසි උපක්‍රමශීලි වැඩසටහනකින් කූඨ ව්‍යාපාරයක් වෙනවා නම්, එහෙම නැත්නම් යම් කිසි කෙනෙක් තරග පාවා දීමට මැදිහත් වෙලා තිබෙනවා නම් මේ කථිකාව දෙස බලන කොට ඒක අපට පැහැදිලිව අවබෝධ කර ගන්න බැරි වෙනවා.

මම කැමැතියි, ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන්න, 1998 දී හැන්සි ක්‍රොන්ජේ මහත්මයාගේ ප්‍රශ්නය දෙසට. එතකොට මම ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලයේ සභාපති; ආසියානු ක්‍රිකට් සම්මේලනයේත් සභාපති. හැන්සි ක්‍රොන්ජේ කියන්නේ ලෝක පූජිත ක්‍රීඩකයෙක්. නෙල්සන් මැන්ඩෙලා මහත්මයා දකුණු අප්‍රිකාවට නිදහස ලබා ගත්තාට පස්සේ South Africaවල බිහි වුණු යුග පුරුෂයෙක්. ඔවුන් හිතුවේ නෙල්සන් මැන්ඩෙලාට පස්සේ හැන්සි ක්‍රොන්ජේ මහතා ඒ රටේ නායකයා වෙයි කියලායි. මුළු රටම පෙළ ගස්වපු, ජනතාව බොහොම ආදරය කරපු, විශාල වශයෙන් ගෞරවයට පාත්‍ර වුණ ක්‍රීඩකයෙක් එතුමා. එතුමාට තරග පාවා දීමක් ගැන චෝදනාවක් ආවා. පළමුවැනි වතාවට ඔහුගෙන් ඇහුවාම කිව්වා, ඒ තරග පාවා දීමට තමන් සම්බන්ධ නැහැ කියලා. ඔහු ගෙදර ගිහින් හොඳටම හැඬුවා. පස්සේ කිව්වා, ඔහුට පාපොච්චාරණයක් කරන්න ඕනෑ කියලා. ඔහු ඇවිල්ලා කිව්වා, තරගය පාවා දීපු හැටි. ක්‍රිකට් ක්‍රීඩාවට ආදරය කරන මුළු ලෝකයාම කනස්සල්ලට පත් වුණා.

හැබැයි, එදා ඒ රටේවත් ලෝකයේවත් මේ සඳහා ක්‍රියාත්මක වෙන්න නීතියක් තිබුණේ නැහැ; ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලයේ - ICC එකේ - නීතියක් තිබුණේත් නැහැ. ඊට පස්සේ 2000 වර්ෂයේදී අලුත් නීතියක් ගෙනැල්ලා, ICC එකේ Anti-

[ගරු තිලංග සුමතිපාල මහතා]

Corruption Unit කියලා වෙනමම අංශයක් පිහිටුවලා, එංගලන්තයේ Interpol එකේ හිටපු දක්ෂම පුද්ගලයා වන Sir Paul Condon මහත්මයාව එහි අධ්‍යක්ෂවරයා හැටියට පත් කරලා ඒක භාර දුන්නා. මුළු ලෝකය පුරාම පරීක්ෂණ පැවැත්වුවා. හැම රටකටම ආරාධනා කළා, උදවු කරන්න කියලා. ඒ වෙලාවේ නොයෙකුත් වාර්තා ආවා. ඒ වාර්තාවලින් ඔප්පු වුණා, ක්‍රීඩකයින් විශාල ප්‍රමාණයක් ඒකට සම්බන්ධයි කියලා. ඒ ඒ රටවල්වලින් ඉල්ලීමක් කළා, නීතිය ක්‍රියාත්මක කරලා අදාළ ක්‍රීඩකයින්ට දඬුවම් කරන ලෙස. ඒකේ ප්‍රතිඵලයක් හැටියට පාකිස්තානයේ සලීම් මලික් මහත්මයාට, ඒ වාගේම ඇලෙක් ස්ටුවට් මහත්මයාට ප්‍රශ්න ඇති වුණා. ඒ වාගේම තරග පාවා දීම නිසා මොහොමඩ් අසරුඩීන් මහත්මයාව ඉන්දීය කණ්ඩායමෙන් ඉවත් කළා. ඒ යනාදී වශයෙන් විශාල පිරිසක් එක්ක 2000 ඉඳලා 2004, 2005 වෙන කොට නීතිය ක්‍රියාත්මක කරලා ලෝක ක්‍රිකට් ක්‍රීඩාවට වෙන්න යන අගතිය වැළැක්වීමට අවශ්‍ය පසු බිම හැදුවා.

ඊට පසුව ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සලයෙන් Anti-Corruption Unit එක Anti-Corruption and Security Unit කියලා වෙනස් කළා. ඒකට හේතුව පරීක්ෂණ කරන්න රටකට ගියාම, ඒ පරීක්ෂණවල පළමු වැනි වටයේ තොරතුරු ලබා ගැනීම සඳහා පොලිසියත්, ඒ වාගේම රහසිගත වාර්තා ගැනීම සඳහා ආරක්ෂක අංශයකුත් අවශ්‍ය වීමයි.

අද තරගාවලියකට කලිනුත්, තරගාවලිය තුළදීත් නිල ලත්, නිල නොලත් වශයෙන් නිලධාරින් විශාල ප්‍රමාණයක් තරගය සඳහා යොමු කරනවා. ඒ අය ක්‍රීඩකයන්ට උපදෙස් දෙනවා. ඒ ක්‍රීඩකයන්ට උපදෙස් දීලා පෙළ ගස්වනවා. මෙවැනි දෙයක් කළොත් තමන්ට සිදු වන දේ, තමන්ගේ රටට සිදු වන දේ, තමන්ගේ පවුලට සිදු වන දේ ගැන දැනුවත් කිරීමේ වැඩසටහන් තිබෙනවා. මා හිතනවා විශේෂයෙන්ම 2003, 2004 වර්ෂ වනකොට ලංකාවේ ක්‍රීඩකයින්ට ඒ ගැන හොඳ දැනුමක් තිබුණා කියලා. මේ වාගේ දෙයකට තමන් සහභාගි වුණොත්, තමන් තරග පාවා දීමකට එකඟ වුණොත් තමන්ට සිදු වන වින්නැහිය මොකක්ද කියන එක ගැන ඔවුන් දැන ගෙන සිටියා. ඒ වාගේම ක්‍රිකට් පාලක මණ්ඩලයේත් මේ වෙනුවෙන් වෙනම අංශයක් හදලා ඒ අයට තොරතුරු ලබා දුන්නා.

මට මතකයි දැනට සති ගණනාවකට ඉස්සර වෙලා ලෝක කුසලාන තරගය ලංකාවේ පවත්වන්නට ඉස්සර ඒ ගැන නොයෙකුත් වාර්තා ආවා.

අපේ ගරු මහින්දානන්ද අලුත්ගමගේ ඇමතිතුමා අපත් එක්ක ඒ සම්බන්ධව කථා කළා. අපට කිව්වා, අපේ ඉතිහාසයේ අත් දැකීම් එක්ක වාර්තාවක් දෙන්න කියලා. එතුමා කිව්වා, සෑම ක්‍රීඩාවකම ක්‍රීඩකයින්ට වෙනමම Anti-Corruption Unit එකක් පත් කරන්නට ඕනෑය කියලා. ඒ පිළිබඳව මා එතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ වනකොටත් ඒ පිළිබඳව එතුමාගේ අවධානය යොමු කරලා වෙනමම උපදෙස් ලබා ගෙන එතුමා බොහොම රහසිගතව එම උපදෙස් අනුව ක්‍රියා කර තිබෙනවා. යම් ක්‍රීඩාවක් සම්බන්ධයෙන් මොකක් හරි අගතියක්, අසාධාරණයක් සිදු වනවා නම්, ඒ සඳහා Anti-Corruption Unit එකක්, එහෙම නැත්නම් ඒ පිළිබඳව සොයා බැලීම සඳහා වෙනම වරලත් කණ්ඩායමක් යොදවා ක්‍රීඩා නීතියේ යම් රෙගුලාසි තුළින් කටයුතු කර ඒ සියලුම ක්‍රීඩාවන් ශක්තිමත් කරන්නට එතුමා තීන්දු කර තිබෙනවා. ඒ ගැන ගරු ඇමතිතුමාට ස්තුති කරන්නට මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

මේ යුගය පුරා ක්‍රීඩකයින්ගේ තරග පාවා දීම පිළිබඳව ආපු වාර්තා ICC එකේ දැන් තිබෙනවා. තමුන්නාන්සේලාට ඒවා බලන්න පුළුවන්. මා ළඟ තිබෙනවා Bertrand de Speville ගේ වාර්තාව. මේ අවුරුද්දේ මුල් කාලයේ දී - ජනවාරි මාසයේ දී - තමයි මේ වාර්තාව පිට වුණේ. මා එය **සභාගත*** කරනවා.

"A Review of the Anti-corruption Arrangements of the International Cricket Council" යන මාතෘකාව යටතේ වර්තමාන ලෝකයේ තරග පාවාදීම්, තරගයට පිවිසීම්, තරගය සඳහා යෙදී සිටින පරිපාලන ක්ෂේත්‍රයේ සියලු දෙනා ක්‍රියාත්මක විය යුත්තේ කොහොමද කියන කරුණු ගැන මෙහි සම්පූර්ණයෙන් සඳහන් වනවා. තරග පාවා දීම ගැන පමණක්, ඔට්ටු ඇල්ලීම ගැන පමණක් නොවෙයි මේ වාර්තාවේ තිබෙන්නේ. තව පැතිකඩක් තිබෙනවා. තරගය පුළුල් වනකොට ඒකට අනුග්‍රාහකයන් එනවා. ඒ අනුග්‍රාහකයින් කැමැතියි තමන්ගේ ක්‍රීඩකයා හොඳ ප්‍රසිද්ධියක් ලබනවාට; තමන්ගේ ක්‍රීඩකයා හොඳම පන්දු යවන්නා වනවාට; තමන්ගේ ක්‍රීඩකයා තරගාවලියේ වීරයා වනවාට. මොකද, ඒ හා සමානව බැඳිච්ච රුපියල් කෝටි ගණනක් වටිනා ඔවුන්ට අවශ්‍ය ඒ marketing එක, එහෙම නැත්නම් තමන්ගේ ව්‍යාපාරයේ ප්‍රවර්ධනය සඳහා එයින් අවස්ථාවක් ලැබෙනවා. ඔට්ටු ඇල්ලීම වාගේම, යම් යම් විධියේ manipulations උපයෝගි කරගෙන ක්‍රීඩාවට පැමිණෙන අනුග්‍රාහකයන් දිරිමත් කරන්නටත් ක්‍රීඩාව නිසා යම් කිසි පැතිකඩක් විවෘත වනවා කියලා මේ වාර්තාවේ කියනවා.

ලෝකයේ බහුතරයක් -සියයට 98ක්- තරග පාවාදීම් ගැන මේ වාර්තාවේ සඳහන් වන්නේ illegal bookmaking කියලායි. ඒ වාගේම එම වාර්තාවේ තිබෙනවා, එංගලන්තය, ඕස්ට්‍රේලියාව, South Africa යන රටවලින් ඒ පිළිබඳ කිසිම වාර්තාවක් ඇවිල්ලා නැහැයි කියලා. ඒ රටවල තිබෙන්නේ නීත්‍යානුකූලව තරගවලට ඔට්ටු ඇල්ලීමේ ව්‍යාපාරයි. දැන් මෙහිදී සඳහන් කරන්නේ ඒ නීත්‍යානුකූල නොවන අය, නීත්‍යානුකූල අයත් එක්ක යම් කිසි මුදල් හුවමාරුවක් කරලා, නැත්නම් ඔට්ටු අල්ලලා වක්‍ර ක්‍රමයකින් ඒ ක්‍රීඩකයින් හෝ ක්‍රීඩාවේ යෙදී සිටින නිලධාරින් අල්ලා ගෙන ඒ අයට යම් කිසි මුදලක් ලබා දීලා කරන පාවා දීම් ගැනයි. ඒ නිසා මෙහිදී illegal betting හා legal betting කියන කොටස පැහැදිලිව වෙන් වෙන් වශයෙන් හඳුනා ගෙන තිබෙනවා. මම කියන්න ඕනෑ, ලංකාව මේ වන කොට තරගාවලි රාශියක් පවත්වා තිබෙන රටක්; විශේෂයෙන්ම අවසාන තරග පවත්වපු රටක්; ලෝක කුසලාන තරග පවත්වපු රටක්; ඒ වාගේම triangular එහෙම නැත්නම් quadrangular තරග පවත්වපු රටක් බව. ICC එකේවත් Asian Cricket Council එකේවත් වාර්තාවලට අනුව කිසිම අවස්ථාවක ලංකාවේ ක්‍රීඩකයකු හෝ නිලධාරියකු ලංකාව තුළ තරගයක් පාවා දීමක් සම්බන්ධයෙන් වාර්තා වෙලා නැහැ. යම් කිසි වාර්තාවක් තිබුණා නම් තිබෙන්නේ ලංකාවෙන් පිට උත්සාහයක් දරා තිබෙන බවටයි. නැත්නම් මුදලට තරග පාවා දීමක් වුණා නම් ඒ ගැන සඳහන් වන්නේ ලංකාවෙන් පිටයි. අවුරුදු තිහක් තිස්සේ මේ ක්ෂේත්‍රයේ මෙවැනි ප්‍රශ්න ඇති වුණාය, ඒ ඇති වුණ ප්‍රශ්න විසඳා ගන්න ICC එකට යාන්ත්‍රණයක් තිබුණේ නැහැ කියලා මේ ICC වාර්තාවේ පැහැදිලිව කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම සඳහන් කළ යුතුම දේ තමයි, පසු ගිය අවුරුදු පහළොව විස්ස තිස්සේ එක් දින තරග සිය ගණනක් වැඩි වෙලා තිබෙන බව. අවම වශයෙන් ටෙස්ට් තරග 8ක් විතර හැම රටක්ම ක්‍රීඩා කරනවා. එතකොට රටවල් 10ක් කියන්නේ තරග 100ක් විතර. එක් දින තරග විශාල සංඛ්‍යාවක් තිබෙනවා. මා හිතන හැටියට හැම රටක්ම ඒ සඳහා ක්‍රීඩා කරනවා. ඒ සංඛ්‍යාව 300කට 400කට වැඩි ඇති. T20 කියලා අලුතෙන් ආපු තරගත් එක්ක බැලුවාම පසු ගිය අවුරුදු 8 තුළ තරග ප්‍රමාණය සියයට 500කින් වැඩි වෙලා තිබෙනවා.

---

***** **පුස්තකාලයේ තබා ඇත.**

* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

* *Placed in the Library.*

නමුත් තරගවලට තිබුණු මේ අභියෝගය, තරග පාවා දීම පිළිබඳව තිබුණු චෝදනා බැලුවොත් ඒවා විශාල වශයෙන් අඩු වීමක් වෙලා තිබෙනවා.

වාර්තාවලට අනුව හැන්සි ක්‍රොන්ජේ මහත්මයාට පස්සේ, ළඟදී දැනට අවුරුදු දෙකකට විතර කලින් පාකිස්තාන ක්‍රීඩකයෙක් වැරදිකරු බවට ඔප්පු වුණාට පස්සේ ක්‍රීඩකයන් සෘජුව මේ පාවාදීම්වලට සම්බන්ධ වුණු බවක් හෝ දඬුවම් කළ බවක් වර්තමාන යුගයේ අපට දැන ගන්නට ලැබිලා නැහැ. අන්තිම තරගාවලියේදී විනිශ්චයකරුවන් හය දෙනෙක් ගැන ඉන්දියාවෙන් වාර්තාවක් ඇවිල්ලා තිබෙනවා. අපට ඒ ගැන සොයා බලන්න සිද්ධ වෙනවා. ඒක නිසා අපි හිතනවා, මෙවැනි කරුණක් ගැන ගරු ඇමතිතුමා ක්‍රීඩා අමාත්‍යාංශයේ අදාළ නිලධාරින් හා ක්‍රිකට් පාලක මණ්ඩලයත් එක්ක සාකච්ඡා කරලා යම් කිසි අඩු පාඩුවක් තිබෙනවා නම් ඒ ගැන සොයා බලා ක්‍රියා කරයි කියලා. ඒ වාගේම ක්‍රිකට් පාලක මණ්ඩලය මේ වන කොටත් දැනුම් දීලා තිබෙනවා, ඔවුන් දැනුවත්ව මේ ගැන කිසිම වාර්තාවක් ලැබිලා නැහැ; කිසිම චෝදනාවක් නැහැයි කියලා. හැබැයි, යම් කිසි පුද්ගලයකුගේ නමක් සඳහන් වෙලා තිබෙනවා නම් ඒ පුද්ගලයා සම්පූර්ණයෙන්ම නිදොස් කර නිදහස් කරන තෙක් පුළුවන් නම් ජාත්‍යන්තර තරගවලින් ඒ අයව ඈත් කරන්න පාලක මණ්ඩලය මේ වන කොටත් තීරණය කරලා තිබෙනවා. ඒක තමයි අපේ වාර්තා අනුව සඳහන්ව තිබෙන්නේ. වග කීමක් ඇති රජයක් හැටියට, වග කීමක් ඇති ඇමති කෙනෙක් හැටියට, ඒ වාගේම පාලක මණ්ඩලය හැටියට කිසිම හේතුවක් නැහැ, කිසිම බලාපොරොත්තුවකුත් නැහැ, යම් කිසි පුද්ගලයෙක් වරදක් කළා නම්, වරදකට සැකකරුවෙක් නම්, ඔවුන් සැක සහිතව හැසිරිලා තිබෙනවා නම් ඒ වෙනුවෙන් ක්‍රියාත්මක කරන්න ඕනෑ ක්‍රියා මාර්ගය නොගන්න. මොකද, මේ වන තෙක් ආ සියලුම තොරතුරුවලින් අවසාන වශයෙන් පිළිබිඹු වන්නේ එක්කෝ පාකිස්තානයේ, ඉන්දියාවේ නැත්නම් මැද පෙරදිග බුකිකරුවෙක් නැත්නම් තරග පාවා දීමට සම්බන්ධ කණ්ඩායමක් තුළින් යම් කිසි දෙයක් වුණා කියලායි. නැවතත් මා අවධානය යොමු කරවන්නට කැමැතියි, මේ ක්‍රීඩකයන්ගේ පැත්ත ගැන.

මට මතකයි, 1996 දී අපි ලෝක කුසලානය දිනුව කාලය. 1995 දී මම ක්‍රිකට් පාලක මණ්ඩලයේ උප සභාපති. අපි බැලුවා, අපට ලෝක කුසලානයට යන්න පුළුවන් කොහොමද කියලා. ඒ දවස්වල අපි ගෙවීම් කරන කොට ක්‍රීඩකයන්ට ගෙවුවේ අපට - ක්‍රිකට් පාලක මණ්ඩලයට- ලැබෙන මුළු මුදලින් කොටසක් පමණයි ගරු ඇමතිතුමනි. නමුත් අද ඒ ක්‍රීඩකයන්ට විශාල මුදලක් සෘජුව ගෙවනවා. ඒ ක්‍රීඩකයන්ට ගෙවනවා වාගේම ඔවුන්ට මේ රුපියල් කෝටි ගණනක ආදායම පාලනය කර ගැනීමේ හැකියාව අවශ්‍ය වෙනවා. මම හිතනවා, අපේ රටේ ආර්ථික තත්ත්වයත් එක්ක අපේ රටේ ආදායම් තත්ත්වයත් එක්ක බැලුවාම මුළු ලංකාවේම ක්‍රීඩාවට ගෙවන ප්‍රමාණයෙත් අපේ ජාතික මට්ටමේ ඉන්න ක්‍රීඩකයන්ට ගෙවන ප්‍රමාණයෙත් යම් කිසි සංශෝධනයක් විය යුතුයි කියලා.

ගරු ඇමතිතුමනි, ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා. ක්‍රීඩකයන් තරග වදින කොට සංසන්දනාත්මකව ඒ අයට සාධාරණ මුදලක් ගෙවනවා. ඒ තමයි win bonus එක හෙවත් තරගයක් ජයග්‍රහණය කළාම ඔවුන්ට ගෙවන මුදල. තරගාවලියෙන් තරගාවලියට විග්‍රහ කරලා, විගණනය කරලා යම් මුදලක් අයින් කරලා ඒක ගෙවනවා.

දැනට අවුරුදු හත අටකට ඉස්සර වෙලා ක්‍රීඩකයන්ගේ සංගමයක් ඇවිල්ලා ඒ පරිපාලනය අතට අරගෙන විශාල පීඩනයක් ඇති කළා. එහිදී ක්‍රීඩකයන් නියෝජනය කරපු අය වෙනුවෙන් පාලක මණ්ඩලය එකඟතාවකට ආවා ඒ ගෙවීම් කරන්න ඕනෑ කියලා. ක්‍රීඩකයන්ට ගෙවන එකට අපි කැමැතියි. ඒක ගැන අපට ප්‍රශ්නයක් නැහැ. නමුත් මේ රටේ අවුරුද්දකට තිබෙන ක්‍රීඩකයන්ගේ ආදායමත්, කලාපයේම තරගාවලියෙන් තිබෙන ආදායමත් එක්ක බැලුවාම ඒ ක්‍රීඩකයා එදා ක්‍රීඩකයා තමන්ගේ මුළු ශ්‍රමයම දාලා ලංකාවට ක්‍රීඩා කරනවා වෙනුවට අද සියයට කීයක්ද ඔහු මුළු ශ්‍රමයම යොදවලා ලංකාවට ක්‍රීඩා කරන්නේ කියලා බැලුවාම -ඔහුට ජාත්‍යන්තරයෙන් ලැබෙන තරගාවලිවලින් එන ආදායම ගැන අපට ප්‍රශ්නයක් නැහැ. නමුත් දේශීය වශයෙන් අපේ ක්‍රීඩාව පවත්වාගෙන යන්න නම් ක්‍රීඩකයන්ගේ අපේ පළමුවෙනි පෙළ අපේ ක්‍රීඩා සමාජවල ක්‍රීඩා කරන Premier ක්‍රිකට් ක්‍රීඩාව දේශීය ක්‍රිකට් සංචාර මේ සියල්ල බැලුවාම- අපට "A" කණ්ඩායම් තිබෙනවා; වයස 19න් පහළ කණ්ඩායම් තිබෙනවා; වයස 23න් පහළ කණ්ඩායම් තිබෙනවා. ඒවා නඩත්තු කරන්න ඕනෑ. ඒවා බලා ගන්න ඕනෑ. ඒවාට පුහුණුකරුවන් අවශ්‍යයි; යටිතල පහසුකම් අවශ්‍යයි. ඒ අයට පරිපාලනය සඳහා මුදල් අවශ්‍යයි. මේ සියලු දේවල් සංසන්දනය කරලා බලන කොට, ජාතික කණ්ඩායමේ අන්තිම 25 දෙනාට ගෙවන මුදලත් එක්ක බැලුවාම දේශීය වශයෙන් සංශෝධනයක් විය යුතුයි කියලා අපි විශ්වාස කරනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒ ගැන අදහසක් දක්වන්න කියලා මා ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා psychologistsලා ගැන කිව්වා. එතුමා අවංකවම ක්‍රිකට් ක්‍රීඩාවට ළැදියි කියලා මම දන්නවා. බොහොම කාලයක් තිස්සේ ක්‍රිකට් ක්‍රීඩාවත් එක්ක වැඩ කරන කෙනෙකු හැටියට ඔහුගේ අදහස ඇත්ත. මේ වෙන කොටත් අපේ ඇමතිතුමා කිව්වා මනෝ විද්‍යාඥයන් සඳහා කොහොමද ඔහු පෙළ ගැසෙන්න ඕනෑ කියලා. ඒ අදහස් හුවමාරු කරගෙන යනවා. ඒ අදහසට අපි ගරු කරනවා. හැබැයි මෙහිදී අපට පවසන්න මූලික කරුණක් තිබෙනවා. අපේ ක්‍රීඩකයන්ගේ යම් කිසි අඩු පාඩුවක් තිබෙනවාය, ඔවුන්ගෙන් යම් කිසි වරදක් වෙනවාය කියලා සැකයක් තිබෙනවා නම් ඒ සම්බන්ධයෙන් ප්‍රසිද්ධියේ මෙවැනි සාකච්ඡාවක් ඇති කර ගැනීම ඔවුන්ගේ කීර්ති නාමයට බලපානවා. ඔවුන් සැකයට භාජනය වීම නිසා අපේ ක්‍රීඩාවට හානියක් සිද්ධ වෙනවා. ක්‍රීඩාවේ ප්‍රචලිතභාවයට හානියක් වෙනවා. ක්‍රීඩාවට තම දරුවන් යොදවන්න බලාපොරොත්තු වන, ගම්වල ඉන්න දෙමව්පියන්ට ක්‍රීඩාවට දරුවන් යොමු කිරීම සම්බන්ධයෙන් බාධාවක් ඇති වෙනවා. ඒ වාගේම ක්‍රීඩකයන් පෞද්ගලික අංශයේ රැකී රක්ෂා සොයා ගෙන යන කොට ඔවුන්ට තිබෙන කීර්ති නාමය බලපානවා. යම් යම් තැන්වල සැක සහිත දෙයක් තිබෙනවා නම්, අඩු පාඩුවක් තිබෙනවා නම් එය විමසා බැලිය යුතුයි; විමසා බැලිය හැකියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පෞද්ගලිකව හොඳින් දන්නා කාරණයක් තිබෙනවා. වර්තමාන නායක මහේල ජයවර්ධන මහතාට, කුමාර සංගක්කාර මහතාට වචනයේ පරිසමාප්ත අර්ථයෙන් "මහත්වරු" කියලා කියන්න පුළුවන්. ඒ අයගේ යුගයේ, ඒ අය නායකත්වය දරපු කාලයේ තරග කරන කොට තරගයක් පාවලා දෙන්නේ ඇයි, ඒ කොහොමද කියලා හිතාගන්න හරි අමාරුයි. එහෙම කරන්න බැහැ. හැබැයි ඔවුන් තරගයට ගිය විධිය මත, තරග කරපු විධිය මත, තරගය ජයග්‍රහණය කළාද නැද්ද කියන එක මත ප්‍රශ්නයක් ඇති වෙන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපි කල්පනා කරන්න ඕනෑ අපි කාටද පැරදුණේ කියලා. අවසන් තරගය පැරදුණේ බටහිර ඉන්දීය කොදෙව්වන්ට. ඒ අය ඉතාම පැහැදිලි වැඩ සටහනකට ඇවිල්ලා එදා wicket එක අනුව, එදා දවස අනුව ඒ වැඩසටහන ක්‍රියාත්මක කළා. එදා ඔවුන්ගේ දවස. ඔවුන් ජයග්‍රහණය කළා. නමුත් අප සන්තෝෂ වෙන්න ඕනෑ, එක් දින තරගාවලියේ අනුශූරතාව රැක ගෙන ඉන්න, T20 එකේ -ඕවර් 20 - 20 තරගාවලියේ- අනුශූරතාවට දෙවතාවක් එන්න පුළුවන් වූ, ලෝකයේ එකම රට වීම ගැන. මේ වාගේ තත්ත්වයකයි අපි

[ගරු තිලංග සුමතිපාල මහතා]

ඉන්නේ. ඒ කියන්නේ, පළමුවැනි දෙවැනි තුන්වැනි හතරවැනි ස්ථාන අතර -1 සිට 4 අතර- අපි රැඳිලා ඉන්නවා; ජාත්‍යන්තර ක්‍රීඩාවේ රැඳිලා ඉන්නවා; යුද්ධයක් තිබුණු කාලයේ එවැනි තත්ත්වයක රැඳී සිටින්න හැකි වෙලා තිබෙනවා. ඒ නිසා අනෙක් රටවල් එක්ක සාපේක්ෂ විධියට බැලුවාම අපේ යන්ත්‍රණය ගැන, අපේ ක්‍රමවේදය ගැන අප සෑහීමකට පත් වෙන්න ඕනෑ.

අපි දන්නවා එක යුගයක එංගලන්තය මේ තරගාවලිය සම්පූර්ණයෙන් ග්‍රහණය කරගෙන හිටපු බව. ඊට පස්සේ බටහිර ඉන්දීය කොදෙව්වන් - West Indiesලා - අවුරුදු 15ක් විතර ක්‍රිකට් ක්‍රීඩාවෙන් මුළු ලෝකයම හොල්ලා ගෙන හිටියා. ඊටත් පස්සේ ඕස්ට්‍රේලියාව. ඕස්ට්‍රේලියාව එක දිගට තරගාවලි තමන්ගේ අතට ග්‍රහණය කර ගෙන හිටියා. කිසි කෙනකුට එන්න දුන්නේ නැහැ. නමුත් අපට පුළුවන් වුණා 1994-1996 වන කොට ඒ තරගාවලියට අවතීර්ණය වෙලා, ජාත්‍යන්තර කණ්ඩායම්වලටත් පීඩනයක් දෙන්න පුළුවන් මට්ටමේ ජාත්‍යන්තර කණ්ඩායමක් බවට පත් වෙන්න. ඒ වෙනුවෙන් කැප වෙච්ච ඒ දරුවන්ගේ දෙමව්පියන්, ගුරුවරුන්, ඒ පාසල්වල විදුහල්පතිවරුන්, හිතවතුන්, ඥාතීන්, මිත්‍රයන්, පුහුණුකරුවන් සහ ඔවුන් ක්‍රීඩා කරපු ක්‍රීඩා සමාජ යන ඒ සියලු දේවලින් සකස් වුණු විශාල පිරමීඩයක ප්‍රතිඵලය හැටියට තමයි අපේ ලංකාවේ කණ්ඩායම ක්‍රීඩාංගණයේ boundary line එකෙන් ඇතුළට සිංහ කොඩිය අරගෙන ඇවිදගෙන යන්නේ. ඒ යන එකොළොස් දෙනා අපේ රටට විශාල ආඩම්බරයක්. ඒ එකොළොස් දෙනා ගැන අපි බොහොම කල්පනාවෙන් කථා කරන්න, හැසිරෙන්න ඕනෑය කියලා මා විශ්වාස කරනවා.

තරග පාවා දුන්නාද යන සැකයකින් අද දවසේ අප මෙහෙම කථා කළත්, හෙට දවසේ යම් කිසි කූට ක්‍රමවේදයකට ඇවිල්ලා තරගය විකුණන්න, පාවා දෙන්න අවස්ථාවක් නැහැ කියලා අප හිතන්න නරකයි. එවැනි අවස්ථාවක් ඇති නොවෙන්න ක්‍රියා කිරීම පාලකයන්ගේත්, අමාත්‍යාංශයේත් වාගේම අපි හැමෝගේම වගකීම කියන එක මා කියනවා. ඒ කතිකාව ආරම්භ කිරීමට සද්භාවයෙන් මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කළාය යන අදහසින් මා කියන්නේ, මෙම සියලු දේවල් පිටු පස රජය සිටිනවාය සිතා රජයට ඇඟිල්ල දිගු කරන්නේ නැතුව, ක්‍රීඩාවේ උන්නතිය සඳහාම මේ කතිකාව ඉදිරියට ගෙන යන්න කියලායි. එසේ කියමින් මේ අවස්ථාව ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

**[අ.භා. 5.32]**

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුදලට තරග පාවා දීම යන කාලෝචිත මාතෘකාව අපේ ප්‍රධාන සංවිධායකතුමා මේ අවස්ථාවේදී ඉදිරිපත් කරලා තිබෙනවා. මගේ මිත්‍ර තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා කිව්වා, ඒ ඉදිරිපත් කිරීම සහ ඒ ගැන සාකච්ඡා කිරීම සුදුසු නැහැ කියලා. හැබැයි, ගරු මන්ත්‍රීතුමනි මේවා කථා කරන්න ඕනෑ දේවල්. මේවා හංගන්න ඕනෑ දේවල් නොවෙයි. මට මතකයි මීට මාස කීපයකට පෙර මේ ගරු සභාවේදීම ඔබතුමා ලොකු චෝදනාවක් කළා අර්ජුන රණතුංග මැතිතුමාටත්, අරවින්ද ද සිල්වා මැතිතුමාටත්. ඇත්තටම මා ඒ ගැන කනගාටුවට පත් වුණා. තරග පාවා දීමක් ගැන අපේ ලංකාවේ ක්‍රීඩකයන් සම්බන්ධයෙන් පළමුවැනි වතාවටයි එදා සාකච්ඡාවට බඳුන් වුණේ.

කෙසේ වෙතත් මේ වන තෙක් අපේ ලංකාවේ කිසිම ක්‍රීඩකයෙකු තරග පාවා දීම සම්බන්ධයෙන් වරදකරුවෙකු බවට පත් වෙලා නැහැ. ඔබතුමා කියපු කාරණයට මා එකඟ වෙනවා. හැබැයි ඔබතුමා කියපු යම් දෙයක් සම්බන්ධයෙන් මා එකඟ වෙන්නේ නැහැ. එංගලන්තයේ තිබුණු පරීක්ෂණවලින්,හැන්සි ක්‍රොන්ජෙ මහතාට පස්සේ පාකිස්තානයේ ක්‍රීඩකයන් තුන් දෙනෙකු තරග තහනමට ලක් වුණා. වේග පන්දු යවන දෙදෙනෙකුත්, සල්මන් බට් නමැති පුද්ගලයාත් ඒ අතර හිටියා. මා හිතන විධියට අන්තිම වතාවට මේ තිදෙනා තරග පාවා දීමේ චෝදනාවට වරදකරුවන් බවට පත් වුණා. විශේෂයෙන්ම පාකිස්තානයට මේක විශාල ප්‍රශ්නයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තරග පාවා දීම සහ තහනම් උත්තේජක භාවිතය ක්‍රීඩාවට විශාල පිළිකා දෙකක්. අපේ ක්‍රීඩා ඇමතිතුමා ඒ ගැන දන්නවා. ඒ කරුණු දෙක ගැන අනිවාර්යයෙන්ම කථා කරන්න ඕනෑ. අද ලෝකයේ ඇති වෙලා තිබෙන තත්ත්වය බැලුවොත්, විශේෂයෙන්ම ලාන්ස් ආම්ස්ට්‍රෝන් කියන්නේ, "ටුවර් ඩි ෆ්‍රාන්ස් තරගාවලිය" හත් පාරක් දිනපු තැනැත්තා. තහනම් උත්තේජක සම්බන්ධයෙන් කිසිම පරීක්ෂණයකදී ඔහු වරදකරුවකු බවට පත් වෙලා නැහැ. හැබැයි, ඔහුට විරුද්ධව තිබෙන සාක්ෂි අනුව අද වන විට ඔහු වැරදිකරුවකු බවට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාපැදි ක්‍රීඩාවේ තිබෙන සංකීර්ණභාවය නිසා විශාල කණ්ඩායමක් ඔහුගේ ජයග්‍රහණය සඳහා මැදිහත් වෙනවා. සියයක්, එකසිය පනහක් විතර තරගකරුවන් ඒ කණ්ඩායමේ ඉන්නවා. ඒ කණ්ඩායමේ තරගකරුවන්ගේ පාපොච්චාරණය අනුව තමයි ඔහු වරදකරු බවට පත් වුණේ. එතකොට ඔබතුමා හිතලා බලන්න. මේ ලෝකයේ තනියෙන් තරග කරන ක්‍රීඩකයෝ කී දෙනෙකු තහනම් උත්තේජක අරගෙන ඇද්ද? ඒ අතර දුවන කට්ටිය, ක්‍රිකට් ගහන කට්ටිය, රගර් ගහන කට්ටිය ඉන්නවා. හැබැයි ලාන්ස් ආම්ස්ට්‍රෝන් කියන ක්‍රීඩකයා තහනම් උත්තේජක පාවිච්චි කළාය කියලා කිසිම පරීක්ෂණයකදී වරදකරුවකු බවට පත් වෙලා නැහැ. හැම දාම පරීක්ෂණ කරනවා. රෑට කරනවා; උදේට කරනවා. ඒ කිසිම අවස්ථාවකදී ඔහු තහනම් උත්තේජක භාවිත කළාය කියලා වරදකරු වෙලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම තමයි තරග පාවා දීමත්. තරග පාවා දීම සම්බන්ධයෙනුත් සලීම් මලික්, හැන්සි ක්‍රොන්ජෙ, මොහොමඩ් අසරුඩීන් වාගේ පුද්ගලයන් කීප දෙනෙකු වරදකරුවෝ බවට පත් වුණා. මෙයට සම්බන්ධ වන පුද්ගලයෝ මීට වඩා විශාල ප්‍රමාණයක් මේ ක්‍රීඩාවේ ඇති. හැබැයි අපේ වාසනාවට ලංකාවේ ක්‍රීඩකයන් මේවාට සම්බන්ධ නැහැ කියන එක තමයි අපට ලැබිලා තිබෙන තොරතුරු. එය අපට වාසනාවක්. ඒ ක්‍රීඩකයෝ අපට විශාල සම්පතක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් කථා කරන කොට, අතීතයේ අපේ ක්‍රිකට් ක්‍රීඩාවට අත දුන්නු අය බොහෝ විට මතක් කරන්නේ නැහැ. විශාල මුදලක් ලැබෙන වෙළෙඳාමක් බවට අද මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාව පත් වෙලා තිබෙනවා. මෑත වකවානුවේ මේ රටේ විශාල පිරිසක් මුදල් කැදරකමට, තමන්ගේ මුදල් පසුම්බිය වැඩි කර ගැනීමට ක්‍රිකට් ක්‍රීඩාව වටේ එල්ලිලා ඉන්නවා. පා පන්දු ක්‍රීඩාවේ මෙවැනි තත්ත්වයක් නැහැ. රගර් ක්‍රීඩාවේ මේ තත්ත්වය එච්චරම දකින්න නැහැ. දැන් රගර් ක්‍රීඩාවටත් මේ තත්ත්වය ටිකෙන් ටික එනවා.

විශේෂයෙන් මයිකල් තිසේරා මැතිතුමා, අනුර තෙන්නකෝන් මැතිතුමා, දයා සහබන්දු මැතිතුමා, පොලොන්නෝවිට මැතිතුමා හා සරවනමුත්තු මැතිතුමා, ඒ වාගේම දුලීප් මෙන්ඩිස්, බන්දුල වර්ණපුර, රොෂාන් මහානාම, අර්ජුන රණතුංග හා අරවින්ද ද සිල්වා මැතිතුමන්ලා, තවත් පැත්තකින් තිලංග සුමතිපාල මැතිතුමා වැනි විශාල පිරිසක් ක්‍රිකට් ක්‍රීඩාව වෙනුවෙන් විශාල කාර්ය භාරයක් ඉටු කළා. විශේෂයෙන්ම ගාමිණී දිසානායක

මැතිතුමා හා රාජාමහේන්ද්‍රන් මැතිතුමා ක්‍රිකට් ක්‍රීඩාවට Test status ලබා දීම සඳහා විශාල දායකත්වයක් ලබා දුන්නා. ඒ වාගේම රොබට් සේනානායක මැතිතුමාත් ක්‍රිකට් ක්‍රීඩාව වෙනුවෙන් කටයුතු කළා. ඒ වාගේ විශාල පිරිසක් ලබා දුන්නු ශක්තියෙන් තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අර්ධ වටයට එනවා ද, අවසාන තරගය ජයග්‍රහණය කරනවාද කියන පදනම හෝ ඇති වුණේ. ඒ ලබා දුන්නු ශක්තියෙන් ජයග්‍රහණය කරලා ශ්‍රී ලංකාව ලෝක ශූරයන් බවට පත් වෙලා තිබෙනවා. ඒ තත්ත්වය අනුව, තරගයක් පැරදුණාම ඒ ක්‍රීඩකයා තරගය පාවා දුන්නාය කියලා කිසිම ආකාරයකින් ක්‍රීඩකයකු වෙත ඇඟිල්ලක් දික් කරන්න බැහැ.

ලංකාවේ පුරවැසියකු වශයෙන් මා ඇත්තටම ආඩම්බර වනවා, අපේ කණ්ඩායමට අවසන් තරග හතරකට සහභාගි වීමට අවස්ථාව ලැබීම ගැන. මේ වාගේ පොඩි රටකට ඒකම ඇති. ක්‍රිකට් ලෝක කුසලානය ජයග්‍රහණය කළාට පස්සේ අපි හතර වතාවක් අවසාන තරගයට සුදුසුකම් ලැබුවේ එයට සම්බන්ධ පුද්ගලයන් හැම දෙනකුම ක්‍රිකට් ක්‍රීඩාවට යම් දෙයක් කර තිබෙන නිසායි. අපට විරුද්ධවයි ආණ්ඩුව ඉන්නේ. අවසන් තරගයට සහභාගි වීම සඳහා සුදුසුකම් ලබන්න ආණ්ඩුවේ අයත් යම් දෙයක් කරලා ඇති. අපි එය නැහැයි කියන්නේ නැහැ. අපි කිසිම ක්‍රීඩකයකුගේ දක්ෂතාව අවමානයට ලක් කරන්නේ නැහැ. අපි කිසිම ක්‍රීඩකයකුගේ දක්ෂතාව අවතක්සේරු කරන්නේ නැහැ. ඉතාම දක්ෂ, තමන්ගේ හැකියාව උපරිමයෙන් කණ්ඩායමට ලබා දෙන ක්‍රීඩකයෝ තමයි ලංකාවේ ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා කිව්ව දෙයක් සම්බන්ධයෙන් මා එකඟ වනවා. තරගාවලියට ක්‍රීඩකයන් 11දෙනෙක් සහභාගි වනවා. මේ 11දෙනා මේ තත්ත්වයට ගෙනෙන්න පොඩි කාලයේ සිට සම්බන්ධ වුණු විශාල පිරිසක් ඉන්නවා. තවත් ක්‍රීඩකයෝ පස්දෙනෙක්, හයදෙනෙක් reserves වශයෙන් ඉන්නවා. ජයග්‍රහණය කිරීමේදී රුපියල් කෝටි ගණනක් ලැබෙන නිසා, ක්‍රිකට් ක්‍රීඩාව ඉදිරියට ගෙන යා හැකි ආකාරයෙන් ඒ මුදල බෙදා හැරෙන්න ඕනෑ.

අපේ ශාන්ත බණ්ඩාර මන්ත්‍රීතුමා කිව්වා, තරගයක් පැරදුණා නම් අන්තිමට වරද එන්නේ රාජපක්ෂ පවුලටයි කියලා. අපි කියන්නේ නැහැ රාජපක්ෂ පවුල නිසා තරගයක් පැරදුණා කියලා. හැබැයි අපේ වාසනාවට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජපක්ෂ දරුවෙක් ක්‍රිකට් ගහලා නැහැ. මා හිතන හැටියට ඒක රටේ වාසනාවක්. රාජපක්ෂ දරුවෙක් ක්‍රිකට් ගහන්නේ නැතුවත් මෙහෙම නම්, ක්‍රිකට් ගැහුවා නම් ඉවරයි. ක්‍රීඩාවට කරන මේ බලපෑම -

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே )
(The Hon. Mahindananda Aluthgamage)
වික්‍රමසිංහලාට ළමයි නැහැ කියලා අපි මොනවා කරන්නද?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාටවත් ළමයි ඉන්නවාද, නැද්ද කියන එක නොවෙයි ප්‍රශ්නය.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

පවුලේ දරුවකු ක්‍රිකට් ගැහුවා නම් ක්‍රිකට් ක්‍රීඩාවත් ඉවරයි. මේ කරන බලපෑම බලන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඒ වචනය ඉල්ලා අස් කර ගන්න. මා ඒ වචනය expunge කරනවා. ඒ ගොල්ලන් ක්‍රිකට් නොගැහුවාට රගර් ගහනවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඒක තමයි. මා කියපු කොටස අයින් කරලා ඔබතුමා කියපු ඒ කොටස දමා ගන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඒක සත්‍ය ප්‍රකාශයක් නේ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔබතුමාට බොහොම ස්තුතියි. ඒක තමයි මා කිව්වේ. සමහර විට ඒ කණ්ඩායමේ නායකයා එහෙම පුද්ගලයකු බවට පත් වෙයි. කෙසේ වෙතත් අපේ වාසනාවට එහෙම වුණේ නැහැ.

ක්‍රීඩා ඇමතිතුමා මෙම ගරු සභාවේ සිටින නිසා විශේෂයෙන්ම මේ කාරණය කියන්න ඕනෑ. අන්තිම වකවානුව තුළ යම් කිසි ආකාරයකට පැලැස්තර දමලා ක්‍රිකට් ක්‍රීඩාව නැවත යම් මට්ටමකට, යම් තැනකට පැමිණිලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම පසු ගිය ක්‍රිකට් ලෝක කුසලානය සම්බන්ධයෙන් මේ ආණ්ඩුව අනුගමනය කරපු ඒ ක්‍රියා පටිපාටිය ගැන අපට සෑහීමකට පත් වන්න බැහැ. ඇමතිතුමනි, එහිදී විශාල මුදල් කොල්ලයක් සිදු වුණා. අවශ්‍ය නොවන අවස්ථාවක රුපියල් බිලියන 5.8ක ක්‍රීඩාංගණයක් හැදුවා.

ඊළඟට, දන්දෙණිය මහත්මයා, විශේෂයෙන්ම නිශාන්ත රණතුංග මැතිතුමා ගැන මා කියන්න ඕනෑ. ක්‍රිකට් ක්‍රීඩාවට එතුමාගේ තිබෙන සම්බන්ධය ගැන COPE වාර්තාවේ සඳහන් කර තිබෙනවා. අප අනුමත කරන්නේ නැහැ. එතුමා ක්‍රිකට් පාලක මණ්ඩලයේ ලේකම් වශයෙන් ඉඳ ගෙන CSN නාලිකාවේ ඒ තනතුරුදැරීම සුදුසු නැහැ කියලා COPE වාර්තාවේ සඳහන් කර තිබෙනවා. ඒ කථාව හරි. අප දන්නේ නැහැ, මුදල් සම්බන්ධයෙන් -ගනුදෙනු සම්බන්ධයෙන්- මොන සම්බන්ධයක් තිබෙනවාද කියලා. ඒ ගැන අපට කියන්න බැහැ. මට ඒ සම්බන්ධයෙන් දත්ත නැහැ. හැබැයි එතුමා ඒ සුදුසුකම ලබලා නැහැ; conflict of interest. ක්‍රිකට් පාලක මණ්ඩලයේ ලේකම් ධුරය දරන කොට-

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அளுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
නිශාන්ත රණතුංග මහත්මයා ඉඳලා නැහැ. එතුමා ඒකට කිසිම සම්බන්ධයක් නැහැ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු ඇමතිතුමනි, ඒක නොවෙයි මම කියන්නේ. Conflict of interest කියලා කියන්නේ මේකයි. යම් තනතුරක් දරන කොට වෙන තනතුරු දරන්න බැරි අවස්ථා තිබෙනවා. ඒ තනතුරු දැරීම සුදුසු නැහැ. ඒ අවස්ථාව ලබලා දෙන්න එපා. ඒ අවස්ථාව ඇති කරන්න එපා. ඒ වාගේ කාරණයක් සාකච්ඡාවට බඳුන් වෙන්න අවශ්‍ය නැහැ. මොකද මේ රටේ මිලියන විසි ගණනක ජනතාවක් ඉන්නවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
CSN නාලිකාවට ඒ තරගාවලිය ලබා දීම නිසා ක්‍රිකට් පාලක මණ්ඩලයට කිසිම පාඩුවක් වෙලා නැහැ. අප වෙනදා ජාතික නාලිකාවට දුන්නාට වැඩිය මුදලක් අපට ලැබිලා තිබෙනවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු ඇමතිතුමනි, මට බාධා කරන්න එපා. ඔබතුමාට අවස්ථාව දුන්නොත් මට කථා කරන්න බැරි වෙනවා. බොහොම ස්තුතියි.

ඔය කාරණය ගැන; ලාභය ලැබිලා තිබෙනවාද, නැද්ද කියන කාරණය ගැන අපට වෙනම විවාදයක් ගන්න පුළුවන්. මම ඒක අනුමත කරන්නේ නැහැ. මොකද හරියට දැනුම් දීලා සියලුම නාලිකාවලට එහි විකාශන අයිතිය -ඒ අවස්ථාව- ලබා දෙන්න ඕනෑ. එක නාලිකාවකට විතරක් නොවෙයි-

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඒ සම්බන්ධයෙන් පුවත් පතේ දැන්වීමක් පළ කළා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
පුවත් පතේ ඒ පළ කිරීම සම්බන්ධයෙනුත් විශාල ප්‍රශ්න තිබෙනවා. විශේෂයෙන්ම ඒ පළ කළ දැනුම් දීම සම්බන්ධයෙන් අධිකරණයට පවා කරුණු ඉදිරිපත් කරන්න ඔවුන් ලෑස්ති වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ ගැන පොඩ්ඩක් පරීක්ෂා කර බලන්න. ඔබතුමාගේ පරිපාලනය යටතේ තිබෙන නිසා අප කියන්නේ. ලොකු ප්‍රසිද්ධියක් ලබා දෙන්න, මේකේ විනිවිදභාවයක් ඇති කරන්න. අප කියන්නේ එච්චරයි.

අනික් ප්‍රශ්නය තමයි ක්‍රිකට් පාලක මණ්ඩලයේ සභාපති ධුරය. අප මේ ගැන හොරෙන් කථා කරන්න ඕනෑ නැහැ. ඔය තරගය තිබ්බා නම් තිලංග සුමතිපාල මහත්මයා දිනනවා. හැබැයි තිලංග සුමතිපාල මහත්මයා දිනන්නේ කොහොමද? ඒකට එතුමා මුදල් පාවිච්චි කරනවාද? නැත්නම් ඒ ක්‍රමවේදය මොකක්ද? මොන වාගේද මේ තනතුරට තෝරා ගන්නේ? ක්‍රිකට් ක්‍රීඩකයන් මේකට සම්බන්ධයිද? ඇමතිතුමාගේ ඡන්දයක් මේකට තිබෙනවාද? ඔබතුමන්ලා ඒ සඳහා ක්‍රමවේදයක් හදන්න. හරියට ක්‍රිකට් පාලක මණ්ඩලයක් ඇති කරන්න. කවුරු හරි කථා කරලා තිලංග සුමතිපාල මහත්මයාට අයින් වෙන්න කියන්න හරි තවත් ඉදිරිපත් වෙන පුද්ගලයෙකුට අයින් වෙන්න කියන්න හරි නොවෙයි කරන්න තිබෙන්නේ. විනිවිදභාවය කියන්නේ මේකයි ගරු ඇමතිතුමනි. ඔබතුමන්ලා ක්‍රමයක් හදන්න. ක්‍රිකට් සමිති පමණක් මේකට ඡන්දය දෙන්න ඕනෑ කියලා ඔබතුමන්ලා හිතනවා නම් - ඒකේ යම් කිසි බලපෑමක් කරලා ඒ ඡන්දය ලබා ගන්න පුළුවන් කියලා- එය ලබා දෙන්න වෙන තනතුරුවලට. අපේ ක්‍රිකට් කණ්ඩායමේ ඉන්න පුද්ගලයන්ට ඡන්දයක් දෙන්න පුළුවන්ද බලන්න. ඒ පුහුණුකරුවාට ඡන්දයක් දෙන්න පුළුවන්ද බලන්න. ක්‍රීඩා ඇමතිවරයා වශයෙන් ඔබතුමාට ඡන්ද කීයක් හිමිද බලන්න. මේ වාගේ ක්‍රමවේදයක් හදන්න. නැත්නම් අපේ ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් විනිවිදභාවයක් මේ රටේ කවදාවත් ඇති කරන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝක කුසලාන තරගාවලිය අවස්ථාවේදී කෝටි ගණනක මුදල් වංචා සිදු වුණා. මම නම් වශයෙන් සඳහන් කරන්න කැමැති නැහැ. මම නිශාන්ත රණතුංග මහත්මයාගේ නම පමණක් සඳහන් කළේ එතුමා ගැන COPE වාර්තාවේ තිබෙන නිසායි. මම එතුමාට කියා සිටිනවා එතුමාට තිබෙන තනතුරු දෙකින් එකකින් ඉල්ලා අස් වෙන්න කියලා. රණතුංග පවුල ගැන අප දන්නවා. අර්ජුන රණතුංග මැතිතුමාට අපේ විශාල ගෞරවයක් තිබෙනවා. එතුමා මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාවට විශාල සේවයක් කළා. [බාධා කිරීමක්] මෙතුමා එච්චර ක්‍රිකට් ගැහුවේ නැහැ. ඇඟ පත තිබෙනවා. ක්‍රිකට් සෙල්ලම් කළා නම් හොඳට කරන්න තිබුණා. හැබැයි එතුමාට කලින් අපේ සංජීව රණතුංග මහත්මයා ක්‍රිකට් ක්‍රීඩාවට විශාල සේවයක් කළා. සංජීව රණතුංග මහත්මයා අපේ ක්‍රිකට් ක්‍රීඩාවට ඉතාම අගනා සේවයක් කළ පුද්ගලයෙක්. එතුමා ක්‍රිකට් ක්‍රීඩාවට ඉතා ආදරය කරන පුද්ගලයෙක්. [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව නවත්වන්නද ඔබතුමා හදන්නේ?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
ඔබතුමාට තව විනාඩියක් පමණ තිබෙනවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මම තවම පටන් ගත්තා විතරයි නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
තමුන්නාන්සේට පස් වරු 5.30 ඉඳලා මිනිත්තු 15ක කාලයක් දුන්නා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මට තව විනාඩි 5ක් දෙන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Okay, you carry on.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු ඇමතිතුමනි, ලෝක කුසලාන තරගාවලිය අවස්ථාවේදී හම්බන්තොට ක්‍රීඩාංගණයට රුපියල් බිලියන 5.8ක් වියදම් කළා. නමුත් මෙවර 20-20 තරගාවලියේ තරග දෙකක් විතරයි එම ක්‍රීඩාංගණයේ පැවැත්වුයේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. [බාධා කිරීමක්] ඌරෝ වාගේ අය රගර් ගැහුවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. තල්ලු කරන්න පුළුවන් මිනිස්සු අපේ හිටියා, මී හරක් වාගේ දෙතුන් දෙනෙක්. මෙතැන ඉන්නවා. හැබැයි ගහපු රගර් එකක් නම් නැහැ. ඒ වුණාට මෙතැනට ඇවිල්ලා කථා කරනවා. [බාධා කිරීමක්] ගොනා වාගේ තල්ලු කළ එක විතරයි කළේ. ඔළුව තිබුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෙසේ වෙතත් ක්‍රීඩාවට ඊට වැඩිය බුද්ධියක් අවශ්‍යයි. හොඳ යහ පාලනයක් අවශ්‍යයි. විශේෂයෙන්ම ක්‍රීඩා ඇමතිතුමා වශයෙන්, නන්ද මැතිව් මැතිතුමා වාගේම ඊට පස්සේ එස්.බී. දිසානායක ඇමතිතුමා විශාල සේවයක් කළා. මම බොහෝ වෙලාවලට ක්‍රීඩා අමාත්‍යාංශයට එනවා. ඒ අවස්ථාවේදී ඔවුන්ගෙන් මම මේ ගැන විමසලා බැලුවා. ඔබතුමා යම් වැඩක් කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, හැබැයි ඔබතුමාටත් මේ සඳහා දියුණු කරන්න මුදල් අවශ්‍යයි. අය වැයෙන් මේ පාර ලබා දීලා තිබෙන මුදල මම දැක්කා. ක්‍රීඩාව දියුණු

කරන්න ඉතා සුළු ප්‍රමාණයක් තමයි ඔබතුමාගේ අමාත්‍යාංශයට වෙන් කරලා තිබෙන්නේ. මා හිතන්නේ නැහැ, ඔබතුමා බලාපොරොත්තු වන ඒ දියුණුව -

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ක්‍රීඩා අමාත්‍යාංශයට වැඩිම ප්‍රතිපාදන ලැබිලා තිබෙනවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
නැහැ, නැහැ. මට වෙලාව නැහැ. ඔබතුමාට වෙලාව දීලා මට ඉස්සෙල්ලා කෙළ වුණා. [බාධා කිරීමක්] අනිවාර්යයෙන්ම අපි ඉල්ලා හිටින්නේ ඔබතුමා ආණ්ඩුවට සුදු හුණු ගාන්න එපා කියලායි. අවුරුද්ද අවසානයේදී ඔබතුමා අමාත්‍යාංශයෙන් අයින් වෙන කොට ඔබතුමාට කියන්න බැහැ, මට මුදලක් ලබා දුන්නේ නැහැ කියලා. අපි ඔබතුමාගේ සහයෝගයටයි කියන්නේ. තව මුදලක් ලබා ගන්න. මම දැක්කා, ඉතා සුළු මුදලක් තමයි අය වැයෙන් වෙන් කරලා තිබෙන්නේ. මේ මුදල වෙන් කරලා තිබෙන්නේ ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් නොවෙයි. ක්‍රිකට් ක්‍රීඩාවට විශාල මුදලක් එනවා. ඒ මුදල යන විධිය, ඒ විනිවිදභාවය ඇති කරන්න කියලා තමයි අපි ඇමතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ. හරියට ක්‍රිකට් පාලක මණ්ඩලය පිහිටුවන්න. ඒ වාගේම ක්‍රිකට් පාලක මණ්ඩලයේ තනතුරු තිබෙනවා නම්, "conflict of interest" කියලා එහි සඳහන් වෙනවා නම්, ඒ නිලතල දරන පුද්ගලයෝ ඒවාට ඉදිරිපත් වෙන්න විශේෂයෙන්ම කෝප් කමිටුවෙන් ඉල්ලා අස් වෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අන්තිමට මූ හොරා, අරූ හොරා, අරූ හොරා කියලා ඇඟිල්ල දිග් කරන්න ඉඩ තියන්න එපා. විශේෂයෙන්ම පල්ලේකැලේ සහ -[බාධා කිරීමක්]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමා, කෝප් වාර්තාවේ එහෙම එකක් නැහැ. අසත්‍ය ප්‍රකාශ කරන්න එපා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මට අවස්ථාව ලබා දෙන්න. මගේ වෙලාව දෙන්න ඕනෑ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
What is your point of Order?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෝප් වාර්තාවේ කිසිම තැනක නිශාන්ත රණතුංග මහත්තයාට විරුද්ධව චෝදනාවක් ඇවිල්ලා නැහැ. කරුණාකරලා ගරු මන්ත්‍රීතුමාට ඒක ඉල්ලා අස් කර ගන්න කියන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! මම එදාත් තමුන්නාන්සේට කිව්වා, කෝප් එකේ කරන සාකච්ඡාවල් Report එක එන තුරු සභාවේ කථා කරන්න බැහැ කියලා. දැන් Interim Report එක පමණයි ඇවිල්ලා තිබෙන්නේ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මම දන්නේ නැහැ, ඔබතුමාත් මොනවා කථා කරනවාද කියලා. මේ කථා කරන්නේ ගිය සැරේ COPE Report එක සම්බන්ධයෙන්.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
සභාගත කරන්න. දන්නේ නැත්නම් කියන්න එපා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
සභාගත කරලා තිබෙන්නේ. සභාගත කරන්න ඕනෑ නැහැ. ගිය සැරේ සභාගත කළා. අහන්න, ඒ කමිටුවේ සභාපතිතුමා දන්නවා. ඔබතුමා මොනවාද කියන්නේ?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
බොරුවට මිනිස්සුන්ට චෝදනා කරන්න එපා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔබතුමා මාත් එක්ක මේ ගැන කථා කළා නේ. ඔබතුමා මගෙන් මේ ගැන ඇහුවා නේ.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
වෙලාව හරි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමා, කෝප් එකේ වාර්තාවක් නැහැ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔබතුමා බොරුවට මෙතැන ඉන්න නිසා එක දා ගන්න එන්න එපා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමා, කෝප් වාර්තාවේ එහෙම දෙයක් නැහැ. බොරු කියන්න එපා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔබතුමා දන්නවා, කොහේද තියෙන්නේ කියලා. කෝප් කමිටුවේ සඳහන් කළා, "conflict of interest" ; එතුමා ඒ තනතුර දරන එක වැරදියි කියන එක. මා වැරදි නම් මා මේ කියන දේ ඉල්ලා අස් කර ගන්නවා.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please!

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු ඇමතිතුමා, ඔබතුමා මේක පිළිගන්න. ඔබතුමා දන්නවා, කෝප් කමිටුව සම්බන්ධයෙන්. ඔබතුමා මෙතැන ඉන්න අය බේරා ගන්න එන්න එපා. ඒක තමයි ඔබතුමාගේ වරද.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! The deliberations of the COPE cannot be discussed here. You can have a debate on the Interim Report. Order, please! Hon. Member, now you have to wind up your speech. Your time is over.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ගරු ඇමතිතුමා, ඔබතුමාට කවදා හරි වරදින්නේ ඔන්න ඔතැනයි. ඔබතුමාට අපි කියා සිටියා, හොරු ආරක්ෂා කරන්න එපා, ඒ වෙනුවෙන් පෙනී හිටින්න එපා කියලා. ඔබතුමාගේ වගකීම තමයි හොරු ආරක්ෂා නොකර ඔබතුමා අන්තිමට මේ ධුරය අවසන් කරන වෙලාවේදී නමක් තියලා යන එක.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
What is your point of Order?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sometime ago, when this matter came up, actually it was I who raised it at the COPE. The Hon. Arjuna - [*Interruption*.]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
නැහැ, ඔබතුමාට උදවුවක් කරන්න යන්නේ. කෝප් එකේ එහෙම Ruling එකක්, එහෙම Order එකක් දීලා තිබෙනවාද?

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Whatever it is, let us debate the COPE Report on a separate date.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
[බාධා කිරීමක්] නැහැ, නැහැ. ගරු මන්ත්‍රීතුමා, පොඩ්ඩක් ඉන්න.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Is this a clarification?

**ගගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, when this matter came up, I raised it in the COPE and I said that Mr. Nishantha Ranatunga is the Secretary to the Cricket Board and that he cannot be the CEO of CSN. I raised this matter and even the Hon. Arjuna Ranatunga was there. He also agreed with me. There was a lengthy discussion on that and it was generally agreed that he cannot hold both positions: the Secretary of the Cricket Board and the CEO of CSN. So, this was discussed. - [*Interruption.*]

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, Please! Hon. Member, it is very clear in the Standing Orders that the deliberations of the COPE cannot be discussed in the House until the Interim Report is tabled in the House.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
This is just for clarification.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, can I make - [*Interruption.*]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
මී ළඟට ගරු නෙරංජන් වික්‍රමසිංහ මන්ත්‍රීතුමා. ඊට ප්‍රථම, ගරු හුනෛයිස් ෆාරුක් මහතාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන මෙන් මා ඉල්ලා සිටිනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු හුනෛයිස් ෆාරුක් මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු හුනෛයිස් ෆාරුක් මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஹுனைஸ் பாறூக் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. ALHAJ A.H.M. AZWER *left the Chair, and* THE HON. HUNAIS FAROOK *took the Chair.*

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Neranjan Wickramasinghe, you may start your speech.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Sir, I rise to a point of Order.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Order, please! There is a point of Order being raised.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු ඇමතිතුමා, මම කියන්නේ ක්‍රීඩා සාරධර්මවලට විරුද්ධයි කියලායි. මොකද අපි ක්‍රීඩාව කරන්නේ සාරධර්ම ආරක්ෂා කරන්න, විනය ආරක්ෂා කරන්න. එකම පුද්ගලයා ක්‍රිකට් පාලක මණ්ඩලයේ ලේකම්, Carlton Sports Network එකේ ප්‍රධාන විධායක නිලධාරි.

මම ඔබතුමාට මේ කරුණත් කියන්න ඕනෑ. මම නිශාන්ත රණතුංග මහතාගෙන් ඇහුවා, ඔබතුමා Carlton Sports Network එකේ CEO හැටියට වැඩ කරනවා නේ, මේකේ අධ්‍යක්ෂවරු කවුද කියලා. I asked him who the directors were but he did not know. You ask the Hon. Arjuna Ranatunga, he was there. It is morally wrong.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Okay, thank you. Hon. Neranjan Wickramasinghe, you may speak now.

**ගරු නෙරන්ජන් වික්‍රමසිංහ මහතා**
(மாண்புமிகு நெரன்ஜன் விக்கிரமசிங்க)
(The Hon. Neranjan Wickramasinghe)
මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා විසින් කල් තබන අවස්ථාවේදී මේ යෝජනාව ගෙනැවිත් තිබෙනවා. මා විශ්වාස කරනවා, එතුමා බොහොම සද්භාවයෙන් මේ යෝජනාව මේ ගරු සභාවට ඉදිරිපත් කරන්න ඇති කියලා. තරග පාවා දීම් පිළිබඳවයි මේ කල් තබන යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ.

විශේෂයෙන්ම විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලා බොහෝ අවස්ථාවල මෙම මාතෘකාවෙන් පිට පැනලා වෙනත් දේවල් තමයි අද කථා කළේ. ඒක අපි දැක්කා. මම හිතන්නේ මේ මාතෘකාවට අදාළ දේවල්වලට පරිබාහිරව බොහෝ දේවල් මේ ගරු සභාවට ඔවුන් ඉදිරිපත් කළා.

විශේෂයෙන්ම ක්‍රිකට් ක්‍රීඩාව පිළිබඳව කථා කරන විට, ක්‍රීඩා සමාජ මට්ටමට යන්න කලින් ක්‍රිකට් ක්‍රීඩාව ආරම්භ කරන්නේ පාසලෙන්. ක්‍රිකට් ක්‍රීඩාව පමණක් නොවෙයි, බොහෝ ක්‍රීඩා පාසලෙන් තමයි අපි ආරම්භ කරන්නේ. සෑම ක්‍රීඩාවකටම විනයක් තිබෙනවා. ක්‍රිකට් ක්‍රීඩාවටත් එවැනි විනයක් තිබෙනවා. විශේෂයෙන්ම විපක්ෂයේ අපේ ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා මෙවැනි යෝජනාවක් අද මේ ගරු සභාවට ගෙන ඒම පිළිබඳව මම කනගාටු වනවා. මොකද මෙතෙක් කිසිම තහවුරුවක් ලැබිලා නැහැ, මේ වාගේ තරග පාවා දීමක් මේ රටේ සිදු වෙලා කියලා. කිසිම තැනක එවැන්නක් සඳහන් වෙලා නැහැ. ඒක කථාවලදීත් සඳහන් වුණා නේ. අනෙක් රටවල ක්‍රීඩකයින් විසින් එවැනි කටයුතු සිදු කරලා තිබෙනවා. නමුත් අපේ රටේ කිසිම ක්‍රීඩකයෙක් විසින් එවැන්නක් සිදු කරලා නැහැ.

විශේෂයෙන්ම අපි 1996 දී ක්‍රිකට් ලෝක කුසලානය ජයග්‍රහණය කිරීම ගැන කථා කළා. හතර වතාවක් අනුශූරයෝ වුණා කියලා අපි කථා කළා. ඉතින් මෙවැනි උත්තරීතර සභාවක, මෙවැනි ශක්තිමත් ක්‍රීඩා කණ්ඩායමක් ගැන, මෙවැනි යෝජනාවක් ගෙනැල්ලා කථා කිරීම ඒ තරම් සුදුසු නැහැයි කියන එකයි මගේ හැඟීම. මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම මම මේ අවස්ථාවේදී ඒක ප්‍රකාශ කරන්න අවශ්‍ය වනවා.

අද අපි දන්නවා, අපේ රටේ ජනතාව තුළ මේ ක්‍රීඩාව පිළිබඳව ලොකු උනන්දුවක් තිබෙනවා කියලා. අපි දන්නවා, මෙම තරගවලට විශාල පිරිසක් සම්බන්ධ වෙලා අපේ ජයග්‍රහණය උදෙසා විශාල සහයෝගයක් ලබා දෙනවා කියලා. පසු ගිය 20/20 ලෝක කුසලාන තරගවලදී කොච්චර ජනතාවක් මේ ක්‍රීඩා තරග නැරඹීමට සම්බන්ධ වුණා ද කියලා අපි දැක්කා. අපේ රටට තිබෙන කීර්තිනාමය, විශේෂයෙන් අපේ ක්‍රීඩකයින්ගේ තිබෙන අභිමානය, මානසික මට්ටම පහත හෙළීමට ගන්නා වූ ක්‍රියාමාර්ගයක් හැටියට තමයි මම නම් මෙවැනි යෝජනා ගෙන ඒම දකින්නේ. දෙවරක්, තුන්වරක් කල්පනා කරලා මෙවැනි යෝජනා මෙම ගරු සභාවට ඉදිරිපත් කළොත් හොඳයි කියලායි විශේෂයෙන් මේ අවස්ථාවේදී මම කල්පනා කරන්නේ. අපේ ගරු මන්ත්‍රීතුමන්ලා බොහෝ දෙනා මේ එක එක ක්‍රීඩකයින් පිළිබඳව කථා කළා. අපි දන්නවා, අපේ ක්‍රීඩා කණ්ඩායමේ නායක මහේල ජයවර්ධන මහතා විශේෂයෙන් 20/20 අවසාන මහා තරගයේදී අපේ පරාජයත්, අනුශූරයින් බවට පත්වීමත් සම්බන්ධව පුවත් පත් සාකච්ඡාවක් තැබුවා. එතුමා ප්‍රකාශ කළේ මොකක්ද? එතුමා කිව්වා, "අපට ලොකු පීඩනයක් ආවා. ලොකු පීඩනයක් තිබුණු නිසා තමයි අපට මේ තරගාවලිය ජයග්‍රහණය කරන්න බැරි වුණේ." කියලා. මේ අවසාන මහා තරගය බටහිර ඉන්දීය කොදෙව් කණ්ඩායම ජයග්‍රහණය කළා.

[ගරු නෙරන්ජන් වික්‍රමසිංහ මහතා]

මීට අවුරුදු විස්සකට, විසිපහකට කලින් බටහිර ඉන්දීය කොදෙව් කණ්ඩායම මොන තත්ත්වයක ද තිබුණේ කියලා අපි දන්නවා. ක්ලයිව් ලොයිඩ්ගේ නායකත්වය යටතේ අවුරුදු ගණනාවක් අපරාජිත කණ්ඩායමක් හැටියටයි ඔවුන් සිටියේ. අපේ තිලංග සුමතිපාල ගරු මන්ත්‍රීතුමාත් එතුමාගේ කථාවේදී එය සඳහන් කළා. ක්‍රිකට් ක්‍රීඩාව සම්පූර්ණයෙන් ඔවුන් ආක්‍රමණය කරලායි තිබුණේ. නමුත් මම හිතන්නේ ඉන් පසුව බටහිර ඉන්දීය කොදෙව් කණ්ඩායමට පසු ගිය තරගය ජයග්‍රහණය කරන තුරු අවුරුදු ගණනාවක් කිසිම ජයග්‍රහණයක් හිමි වුණේ නැහැ. ඒ අතින් ගත් කල අපේ ශ්‍රී ලංකා කණ්ඩායම බොහෝ තරගාවලි ජයග්‍රහණය කළා. අනුශූරයින් බවට පත් වුණා. නමුත් අපි දන්නවා, ක්‍රිකට් ක්‍රීඩාවේදී වාසනාවත් ටිකක් බලපානවා කියලා.

පාසල් ජීවිතයේදීත් අපි මහා තරගවලට මුහුණ දී තිබෙනවා. අපි ශිෂ්‍යයෝ හැටියට ගිහින් ඒවාට සම්බන්ධ වුණා. ඒවා ජයග්‍රහණයේදී අපි උදම් ඇනුවා. නමුත් පරාජය වූ විට අපි ටිකක් කනගාටු වුණා. එවැනි තත්ත්වයක් තමයි අපට පසු ගිය 20-20 කුසලානයේදී හිමි වුණේ. නමුත් අපි අධෛර්යවත් නොවී අපේ කණ්ඩායම ශක්තිමත් කරන්න ඕනෑ. මේ අවස්ථාවේදී අපේ කණ්ඩායම ශක්තිමත් කරන්න ඕනෑ. මේක අවසන් තරගය නොවෙයි. තව තරග රාශියක් අපට තිබෙනවා. මේ ක්‍රිකට් ක්‍රීඩාව ඉදිරියට යන්න ඕනෑ. විශේෂයෙන්ම අපේ ගරු අමාත්‍යතුමා මේ අවස්ථාවේදී දෙන නායකත්වය ඉතාමත් වැදගත්. අපේ සංගම් සම්බන්ධයෙන් නොයෙක් නොයෙක් චෝදනා කළා.

අපි සතුටු වෙනවා, එතුමා අද බොහෝ සංගම් පිළිබඳව තිබුණ ව්‍යාකූල තත්ත්වය මඟ හරවලා ඒවා නිසි කළමනාකාරිත්වයක් ඇතිව කටයුතු කරන්නට එතුමා අද වග බලා ගෙන තිබීම ගැන. මම දැක්කා ඊයේ පෙරේදා පත්තරයකට එතුමා ප්‍රකාශ කරලා තිබුණා. ඉදිරියේදී මීට වැඩිය අපේ සංගම් තුළට ප්‍රජාතන්ත්‍රවාදය ගෙනැල්ලා, -විපක්ෂය සඳහන් කළා වාගේ- ඒවායේ හොඳ පාලනයක් ගෙන යාමට, විනිවිද භාවයක් ඇතුව මෙම සංගම් හොඳ පාලනයක් යටතට පත් කරන්නට කටයුතු කරනවා කියන එක එතුමා පුවත් පත්වලට ප්‍රකාශ කරලා තිබුණා. එතුමාට යම් කිසි දැක්මක් තිබෙනවා. එතුමා යටතේ තිබෙන එකම ක්‍රීඩාව ක්‍රිකට් ක්‍රීඩාව නොවෙයි. එතුමාගේ විෂය පථයට අයත් තවත් ක්‍රීඩා රාශියක් තිබෙනවා. මෙම සෑම ක්‍රීඩාවක් කෙරෙහිම එතුමාගේ අවධානය යොමු කරන්නට ඕනෑ. ක්‍රිකට් ක්‍රීඩාව පමණක් නොවෙයි. නමුත් අපි දන්නවා අද අපේ රටේ ජනප්‍රියම ක්‍රීඩාව බවට පත් වෙලා තිබෙන්නේ ක්‍රිකට් ක්‍රීඩාව. ලෝකයේත් එවැනි මතයක් තිබෙනවා. ජනප්‍රියතාවට මෙම ක්‍රිකට් ක්‍රීඩාව පත් වෙලා තිබෙනවා. නමුත් අපේ ක්‍රිකට් ක්‍රීඩකයෝ තරග පාවාදීම්වලට කවදාවත් යොමු නොවෙයි කියන එකයි මගේ විශ්වාසය. මොකද, එවැනි පරිසරයක් තුළ තමයි පොඩි කාලයේ ඉඳන් අපේ ක්‍රීඩකයෝ හැදිලා තිබෙන්නේ. මුදලට යොමු නොවී, ක්‍රිකට් ක්‍රීඩාවට තමන්ගේ මනස යොමු කරලා, රට වෙනුවෙන් ක්‍රීඩා කරලා ජයග්‍රහණය කරන්න තමයි අපේ ක්‍රීඩකයින්ගේ එකම අරමුණ කියන එකයි විශේෂයෙන් මේ අවස්ථාවේදී කියන්න තිබෙන්නේ.

විශේෂයෙන්ම අද ජාත්‍යන්තර තරග පාවාදීම් ගැන කථා කරනවා. අද ක්‍රිකට් ක්‍රීඩකයෝ පමණක් නොවෙයි, ඊයේ පෙරේදා අපි දැක්කා ක්‍රිකට් විනිසුරුවරුන්වත් මේකට ඇතුළත් කරලා තිබෙනවා කියලා. ක්‍රිකට් විනිසුරුවරුන්වත් මේකට ඇතුළත් කරලා තිබෙනවා. ක්‍රිකට් ක්‍රීඩකයෝ පමණක් නොවෙයි. අපේ රටේ යම් යම් පුද්ගලයෝ ගැන සඳහන් කළාට, ක්‍රිකට් විනිසුරුවන් ගැන සඳහන් කළාට මේක ඔප්පු කරලා නැහැ. කෙනෙකුට චෝදනාවක් කළොත් ඒක ඔප්පු කරන්න ඕනෑ. එතෙක් අපට එයා වරදකරුවෙක් කියලා නම් කරන්න බැහැ. එම නිසා විශේෂයෙන්ම මේ අවස්ථාවේදී අපට කියන්නට තිබෙන්නේ අද අපේ ක්‍රිකට් ක්‍රීඩාව ඉහළම තලයක තිබෙනවා. අපේ බොහෝ මන්ත්‍රීවරුන් ප්‍රකාශ කළ පරිදි අපේ අනෙකුත් ක්‍රීඩාවලින් අපට ඉදිරියට යන්න අමාරුයි. මලල ක්‍රීඩා ගත්තාම, පාපන්දු ක්‍රීඩාව ගත්තාම ඒ වාගේම අනෙකුත් ක්‍රීඩාවන්ගෙන් ජාත්‍යන්තර ලෝකයට ගිහින් ජයග්‍රහණය කරන්න අමාරුයි. නමුත් ක්‍රිකට් ක්‍රීඩාවෙන් අපි ඉදිරියටම ගිහින් තිබෙනවා. ඒ නිසා ඉදිරියටත් අපිට කරන්න තිබෙන්නේ, රටක් හැටියට, විශේෂයෙන්ම දේශපාලන අධිකාරිය හැටියට ක්‍රිකට් ක්‍රීඩාවේ දියුණුව උදෙසා අපේ ක්‍රිකට් කණ්ඩායමට දෙන්න පුළුවන් උපරිම සහයෝගය, ශක්තිය සහ ධෛර්ය ලබා දීමයි. මෙවැනි යෝජනා ගෙනැල්ලා අපේ ක්‍රිකට් ක්‍රීඩකයින්ගේ ඉදිරි ගමන වැළැක්වීම, අපේ තිබෙන අභිමානය කෙලෙසා ගැනීම නොවෙයි කළ යුතු වන්නේ.

විශේෂයෙන්ම අපේ තිබෙන අභිමානයත් එක්ක මේ ක්‍රිකට් ක්‍රීඩකයින්ගේ අධිෂ්ඨානය ඉහළ තලයකට ගෙන ඒම තමයි විශේෂයෙන්ම අපි රජයක් හැටියට බලාපොරොත්තු වන්නේ. අපේ ගරු අමාත්‍යතුමා ඒ ස්ථාවරයේ ඉන්නවා. විශේෂයෙන්ම අපේ ගරු මන්ත්‍රීතුමන්ලා සියලුම දෙනා ඒ ස්ථාවරයේ සිටිනවා කියා මා විශ්වාස කරනවා. ඒ නිසාම අද බොහෝ දෙනා ඒ පිළිබඳව කථා කළා. ඒ නිසා අපි විශේෂයෙන්ම අපේ ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා. එතුමා මේ සියලුම ක්‍රීඩාවන්වලට එතුමාගේ දැඩි අවධානය යොමු කරලා තිබෙනවා. ඒවා ඉතාමත්ම ක්‍රමවත් කරන්නට, විධිමත් කරන්නට අවශ්‍ය සියලු පහසුකම් එතුමා අපේ ක්‍රීඩකයින්ට ලබා දෙනවා. ඒක අපි පැහැදිලිව කියන්නට ඕනෑ. එදා මෙදා නොතිබූ සියලුම පහසුකම් අපේ ක්‍රීඩකයින්ට ලබා දෙන්නට අපි අද කටයුතු කරලා තිබෙනවා.

පසු ගිය කාලයේ අපි දැක්කා ජයග්‍රාහකයින්ට රුපියල් ලක්ෂ 40, 50 වාගේ විශාල මුදල් ප්‍රමාණයන් ප්‍රදානය කළා. මම හිතන්නේ ඉතිහාසයේ මෙතෙක් එවැනි ප්‍රදානයන් කරලා නැහැ. මානසික මට්ටම ඉතාම ඉහළ මට්ටමකට ගෙන ඒමට එතුමා ඒ මඟින් බලාපොරොත්තු වෙනවා. එම නිසා අපට බලාපොරොත්තු තබා ගන්න පුළුවන්. ඉදිරියේදී ක්‍රිකට් ක්‍රීඩාවට පමණක් සීමා නොවී අනෙකුත් ක්‍රීඩාවනුත් ජාත්‍යන්තර මට්ටමට ගෙනැල්ලා ජාත්‍යන්තර මට්ටමේ ජයග්‍රාහකයින් බිහි කිරීම තමයි විශේෂයෙන් අපේ ගරු අමාත්‍යතුමා බලාපොරොත්තු වන්නේ. ඒ නිසා අද විශේෂයෙන්ම මේ ක්‍රිකට් ක්‍රීඩාව පිළිබඳව විශාල උනන්දුවක්, උද්‍යෝගයක් තිබෙනවා.

අද ගම් මට්ටමේ කුඩා පාසල් ක්‍රිකට් ක්‍රීඩාවට යොමු වීම පිළිබඳව අපි සතුටු වෙනවා. අපේ ජාතික ක්‍රිකට් කණ්ඩායම - නගරයට පමණක් සීමා වුණු ක්‍රිකට් කණ්ඩායම- අද ගම්බද ප්‍රදේශවල ක්‍රිකට් ක්‍රීඩකයන් බහුලව නියෝජනය කරනවා. ඒ ගැන අද අපි සතුටු වෙනවා. මම මහනුවර ත්‍රිත්ව විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙක්. කුමාර් සංගක්කාර වැනි බොහොම සුපිරි ක්‍රීඩකයෝ අපේ විද්‍යාලයෙන් බිහි කරලා තිබෙනවා. එතුමා බොහොම ඉහළ තලයක ක්‍රීඩා කිරීම ගැන අපි සතුටු වෙනවා. අනෙක් පාසල් ගත්තත් එහෙමයි. අනෙක් පාසල්වලිනුත් ජාතික මට්ටමින් බොහෝ ක්‍රීඩකයන් බිහි කරලා තිබෙනවා. ඒ පාසල්වල ඉගෙන ගත් ගරු මන්ත්‍රීතුමන්ලාත් මේ සම්භාවනීය උත්තරීතර සභාව නියෝජනය කරනවා. එතුමන්ලාගේ පාසල්වලිනුත් එවැනි ක්‍රීඩකයන් බිහි වීම ගැන එතුමන්ලාත් සතුටු වෙනවා ඇති.

සමස්තයක් හැටියට කථා කරන විට අපට ලොකු විශ්වාසයක් ඇතිව කියන්න පුළුවන් අපේ ක්‍රිකට් ක්‍රීඩකයෝ එදත්, අදත්, හෙටත් අපේ විශ්වාසය තහවුරු කරමින්, තරග පාවාදීම්වලින් බැහැර වෙලා, අවංකව, ක්‍රිකට් ක්‍රීඩාවට ලැදි කණ්ඩායමක් හැටියට අපේ රට නියෝජනය කරලා ඉදිරි කාලයේ අවශ්‍ය ජයග්‍රහණයන් අප වෙත ලබා දෙයි කියලා. ඒ දැඩි විශ්වාසය අප තුළ තිබෙනවාය කියන එක මේ අවස්ථාවේ විශේෂයෙන් සඳහන් කරනවා. මට මේ අවස්ථාව ලබා දීම ගැන බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

**[6.01 p.m.]**

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

*Bismillahir Rahmanir Raheem.*

Mr. Presiding Member, I think it augurs well that cricket is on the correct path. I must thank the Hon. John Amaratunga, a steady cricketer who, in politics, has moved this Adjournment Motion, for that gives us an opportunity to discuss the progress of the game we have made in Sri Lanka and all over the world. That also gives a very good opportunity for our young and able Sports Minister, the Hon. Mahindananda Aluthgamage to spell out the present and future programmes initiated by him for good of cricket and also to meet all the arguments, the misconceptions that you carry in your inner mind.

Sir, it is a duty cast on us as cricket enthusiasts and I am sure the whole Parliament will join me in wishing Tony Greig speedy recovery, good health and back to the mike once again, as early as possible. Sir, the "DailyFT", of 22nd October, 2012, reports it vividly. Tony Greig has been a great promoter of cricket and also a lover of the scenic beauty of Sri Lanka. I had occasion to pay tribute to him on an earlier occasion in this House, and I handed over to him a Hansard containing my speech. He said that he had travelled all over the world, but nowhere had any Parliament paid such a tribute to him. I once again pay tribute to him because he is our goodwill ambassador. He promoted not only cricket, but also tourism. One has to only listen to him on the Galle esplanade how beautifully he describes this venue - the Dutch Fort. The Barmy Army who came to Sri Lanka on several occasions said that they came to Sri Lanka because they were attracted by the beautiful descriptions that Tony Greig gave live on international transmissions.

Tony Greig is suffering from lung cancer. It gives us a lot of pain to hear that. The former England Captain and Commentator, Tony Greig, has revealed that he is suffering from lung cancer. Only last month he was giving scintillating commentaries about our performances and of the other teams that took part in the Twenty20 World Cup in Sri Lanka.

Sir, the "DailyFT" of 22nd October states, I quote:

> Greig was initially diagnosed with bronchitis in May this year and then gathered further knowledge during the Australian-Pakistan Series. Greig was quoted as saying to Australia's Sunday Telegraph that he would undergo surgery to ascertain the extent of the illness.

He further states, I quote:

> "I have had a few scrapes in my life and this is another one"

The South African-born Greig is 66 years old. We cannot believe that. He looks a 16 year-old lad when he is marvelling before the mike at the Sooriyawewa, Keththarama, Pallekele and other stadia. The "DailyFT" further states, I quote:

> "Vivian (his wife) and I are going to put the boxing gloves on………."

He is speaking in cricket parlance. It is very beautiful even here. I quote:

> "'and fight this like we've never fought anything before."
>
> "At the moment it is totally up in the air. My priority, 100 percent, is my family. They will come first".

We wish him quick recovery and we also offer our solace to his wife and children.

Today, Sri Lanka is dazzling in the international arena as a result of the great game we are playing - the gentlemen's game. That is cricket. As somebody said, we are in the brink of obtaining championship after championship. In 1996, our good Friend, who is an now an MP, the Hon. Arjuna Ranatunga brought laurels to this country by winning the first 50-50 World Cup. That was a great moment for our country. I still remember going round Galle Face Green in the mid of night in an open vehicle with a lot of other boys waving flags and hailing Sri Lanka's historic victory in Lahore against that formidable team, Australia.

Now, Sir, what is this accusation that has been made? At the outset, it is very clear to the entire Members of this House and also those who will be reading the newspapers that not a single cricketer has been accused of any misbehaviour or corruption unlike others such as Hansie Cronje, Mohammed Azarudeen, Salim Malik and even Qasim Omar. I remember Qasim Omar well. That shows the high moral standards set by our cricketers from the time beginning from Bandula Warnapura, our first Test Captain. We cannot forget him for the great glory he brought by winning the First Test Match for Sri Lanka. Sir, I can rattle through the names of those people who brought us international glory by playing for our country and captaining our team. After Bandula Warnapura, there was Duleep Mendis, Arjuna Ranatunga and the present Captain, Mahela Jayewardene, who brought us two Silver Medals if we are to put it in the Olympic parlance. That is Silver in 50-50 and Silver in Twenty20. I should say today *Insha Allah*, next time it will be gold that he will reap in cricket.

Then, Sir, there have been people like Roy Dias and Michael Tissera before we were given Test status. We must also commend our commentators at CSN and SLBC, who did a splendid job.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member you have got only one minute more.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

Ranjan Madugalle has been chosen as one of the best referees in the world and also Kumar Dharmasena had been named as the best umpire. That speaks volumes of the cleverness and talent displayed by our cricketers the world over. Then, Anura Tennakoon was a classic player and D.S. de Silva, who later headed the Board. After that, Mr. Thilanga Sumathipala also was the President of the Board. Ravindra Pushapakumara was a fast bowler. He has done something marvellous. He has been asked to go to the North. So, he had visited Jaffna, Mullaitivu, Kilinochchi, Vavuniya and Mannar, promoting cricket in schools over there. So much so, that it is the first time after 30 years of war that Tamil students or cricketers came from Jaffna and played cricket at Ananda College in Colombo. For the first time after 30 years, Jaffna Tamil Boys from the North are playing with Sinhala Boys in the South. To that extent, cricket has helped to bring communities together.

I pay great tribute to the Government, headed by His Excellency Mahinda Rajapaksa, for the immeasurable help and assistance given to us to promote cricket in the country.

Not only that, cricket has also brought us international glory now. As I said, the tourists are coming, they are pouring into our shores in large numbers. We were at the Katunayake International Airport, when the Twenty20 Cricket World Cup match was on. You should have seen, Sir, the English people, the Australians, the New Zealanders, the Pakistanis, the Indians and the West Indies were pouring in. Even the staff at the immigration counters found it difficult to clear them soon.

Mr. Ravindra Pushpakumara has done another laudable work. He has discovered a Girls' Cricket Team in Mannar - which area you represent, Mr. Presiding Member - in Fatima College. You have perhaps failed to see those girls. But, he has spotted that talent in Mannar and he is now turning his attention to the Eastern Province.

Then, of course, there were Champaka Ramanayake, Neil Chanmugam and Abu Fuard. Mr. Abu Fuard incidentally passed away recently; he has done much for cricket. He also stood behind the late Hon. Gamini Dissanayake like a sentinel during the Cricket World Cup - I should say a word of prayer for Abu: *Inna lillahi wa inna ilaihi rajioon!*

He has done yeomen service for the promotion of cricket. He was a Wesleyite. Not only cricket but he also helped to bring up cricketers of the calibre of Arjuna Ranatunga, Kumar Dharmasena and the like.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, please, wind up now.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)

I will wind up, Sir. Then, we have Sanath Jayasuriya who is still playing good cricket. He is now playing T20 matches in South Africa. There is also Roshan Mahanama, Kumar Sangakkara, Muttiah Muralitharan, Rangana Herath, Tillakaratne Dilshan, Hashan Tillakaratne, Rumesh Ratnayake and Daya Sahabandu, playing. Anuruddha Polonowita, the National Curator, made it possible for the English team to come and play the first match at the Maligawatte-Keththarama R. Premadasa Stadium within a short period of three months. He also helped to develop the International Cricket Stadium at Sooriyawewa in Hambantota.

Now, what is happening? There are more and more grounds coming up. That brings not only credit to Sri Lanka but also boosts tourist inflow and we can earn more foreign exchange. There is also the new Pallekele International Cricket Stadium in picturesque Kandy. Who is decrying these developments? All these are happening briskly under the guidance of President Mahinda Rajapaksa and our able Minister, the Hon. Mahindananda Aluthgamage. I think the whole nation must pay tribute to His Excellency the President, Upali Dharmadasa, the Chairman of Sri Lanka Cricket, Nishantha Ranatunga the Secretary and the other officials.

When a ball is sent down, the Opposition Members think that the wicket is made for Rajapaksa. Whatever goal is scored, they think the goal is made for Rajapaksa. Rajapaksa, Rajapaksa, Rajapaksa! It is very good, Sir. They are chanting the name, Rajapaksa like a *mantra* morning, evening and night. I am very happy about it. You go on reciting those *mantras*, you will be doing a great meritorious act by that. I want to tell them this.

මෙය පින් කරපු පවුලක්. යමක් කරද්දි හොඳ දෙයක් කරන්න, පින් ඇති වැඩක් කරන්න. පින් ටිකක් මේ ආත්මයේදී වපුරා ගන්න. මේ ලෝකයේ හොඳට පින් රැස් කර ගත්තොත් තමුන්නාන්සේලාට අනෙක් ආත්මයේදී මේ පින්වත් රාජපක්ෂ පවුලේ කෙනෙක් වෙලා ඉපදීමේ වාසනාව ලබා ගන්නට පුළුවන් කියා මම කියනවා. ඒ සඳහා ඔබ සියලු දෙනාට මා ආරාධනා කරනවා.

I must also mention about the media reporters and cricket commentators. They spend much of their time in the Cricket Stadium. There is Elmo Rodrigopulle of the

"Daily News". He has served under 26 editors. He is a veteran cricket writer. There is also Sa'adi Thawfeeq, Davis Callister, Ranjan Paranavitana and A.C. de Silva.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)
Hon. Member, please wind up now.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
I will conclude, Sir. Give me two minutes, please.

Then, all the cricket reviewers of Sinhalese newspapers such as "Lakbima", "Divaina", "Mawbima", "Lankadeepa" and also of the "Ceylon Today" newspaper give a lot of prominence to that.

Sir, I am very happy to say that after billiard, cricket has taken the centre stage. It was left to Marhoom M.J.M. Lafir to bring us the first world championship in any sport. That was in billiard. He belongs to the MICH, the Moors' Islamic Cultural Home. Once, I mistakenly said that he was from the Moor's Sports Club. No, Mr. M.J.M. Lafir belongs to Sri Lanka and he was a proud product of the Moors' Islamic Cultural Home and I wish the Hon. Minister good luck!

Race එකක් දිව්වත් "රාජපක්ෂ" කියා කියනවා නම්, බෝලයක් දැම්මත්, "රාජපක්ෂ" කියා කියනවා නම්, රග්බි බෝලයක් ඇල්ලුවත් "රාජපක්ෂ" කියා කියනවා නම්, එහෙම නම් රාජපක්ෂ පවුල ඉතාමත්ම පින් කරපු පවුලක් කියන එක තමුන්නාන්සේලාගේ අවධානයට ගෙන එමින්, මෙම යෝජනාව ගෙන ආ ජෝන් අමරතුංග මහත්මයාට නැවතත් ස්තුතිවන්ත වෙමින් මම නවතිනවා.

**ගරු ජෝන් අමරතුංග මහතා**
(மாண்புமிகு ஜோன் அமரதுங்க)
(The Hon. John Amaratunga)
කියන්න දෙයක් නැහැ නේ.

**ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා**
(மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர்)
(The Hon. Alhaj A.H.M. Azwer)
ඒක හරි. ඒක තමයි. පින් කර ගන්න. එතකොට රාජපක්ෂ පවුලේ කෙනෙකු වෙලා තමුන්නාන්සේලාට ඉපදෙන්න පුළුවන්.

**[பி. ப. 6.15]**

**ගරු ජේ. ශ්‍රී රංගා මහතා**
(மாண்புமிகு ஜெ. ஸ்ரீ றங்கா)
(The Hon. J. Sri Ranga)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இச்சபையில் நீண்டதொரு உரைக்குப் பின்பு எனக்குப் பேசுவதற்குச் சந்தர்ப்பம் வழங்கியமைக்கு நன்றி. கௌரவ அமைச்சர் அவர்களுக்கு நன்றாகத் தமிழ் தெரியுமென்றாலும் அவர் சிங்கள உரைபெயர்ப்பினைக் கேட்பதற்காக ஒலிவழங்கியைக் காதிலே இணைக்க முயற்சிக்கின்றார். அவர் தேர்தல் காலங்களில் நாவலப்பிட்டிப் பிரதேசத்தில் நடைபெறுகின்ற பிரசாரக் கூட்டங்களிலே தமிழில் பேசி, தமிழ் பேசும் மக்களுடைய வாக்குகளைப் பெற்றதை நாங்கள் பார்த்திருக்கின்றோம். அதனைவிட, கிளிநொச்சி, யாழ்ப்பாணம் போன்ற பிரதேசங்களில்கூட அவர் சுத்தத் தமிழில் பேசுவதைக் கேட்டுக்கொண்டிருந்த சிலர், "தமிழர் ஒருவர்தான் இதற்கு அமைச்சராக இருக்கின்றாரா" என்று கேட்டார்கள்.

இன்று இச்சபை cricket விளையாட்டு பற்றி விவாதம் நடத்தப்படுகின்ற ஒரு முக்கிய மேடையாகக் காணப் படுகின்றது. அதாவது, உலகக் கிண்ண Twenty20 கிரிக்கெட் போட்டியில் ஏன் இலங்கை அணி தோல்வியடைந்தது என்பது பற்றி விவாதிக்கப்படுகிறது. இதைவிட முக்கிய விடயமாகக் காணப்படுகின்ற, ஐக்கிய தேசியக் கட்சியானது தேர்தலில் தொடர்ச்சியாக பலமுறை - 29 தடவைகளுக்கு மேல் - ஏன் தோற்றிருக்கின்றது; அதன் தலைமை தோற்றிருக்கின்றது" என்பது பற்றி ஒரு விவாதத்தை இச்சபையில் கொண்டு வருவோமேயானால் அது மிகவும் பொருத்தமாகவும் அக்கட்சிக்கு வாக்களித்த மக்களுக்குப் பிரயோசனமாகவும் இருக்கும். அத்துடன், இந்த நாட்டில் ஜனநாயகத்தை நிலைநாட்டுவதற்கும் அது உதவியாக இருக்குமென்று நான் நினைக்கின்றேன். ஆனால், துரதிஷ்டவசமாக இன்று நாங்கள் ஒத்திவைப்புப் பிரேரணை கொண்டுவந்திருப்பது ஒரேயொரு Twenty20 match தோற்றதற்காகவே. Twenty20 World Cup match இனுடைய இறுதிச் சுற்றில் இலங்கை அணியினர் வெற்றி இலக்கைத் தொடும்வகையில் இருந்தபொழுது, கௌரவ அமைச்சர் மஹிந்தானந்த அலுத்கமகே அவர்கள் எதிர்க்கட்சித் தலைவர் அவர்களை Minister's box இலிருந்து President's boxக்கு அழைத்துக்கொண்டு வந்தார். அப்பொழுதிருந்தே எங்களுடைய அணி கொஞ்சம் கொஞ்சமாக தோற்றுக் கொண்டிருந்ததை நாங்கள் பார்த்துக் கொண்டிருந்தோம்.

இன்று இச்சபையிலே இந்த நாட்டில் எந்தளவுக்கு ஜனநாயகம் நிலைநாட்டப்படுகின்றது; எந்தளவுக்கு நீதி நிலைநாட்டப்படுகின்றது என்பது பற்றிய விடயங்களையே நாங்கள் பேசவேண்டும். இந்த விவாதத்தில் துரதிஷ்டவசமாக நானும் பேசவேண்டிய நிலைமை ஏற்பட்டிருக்கின்றது. இன்று நாங்கள் கிரிக்கெட் விளையாட்டை எடுத்துக்கொண்டால்,- மாண்புமிகு ருவன் ரணதுங்க அவர்கள் எதிர்ப்பக்கத்தில் இருந்துகொண்டு நான் பேசுவதை நன்றாகக் கேட்டுக் கொண்டிருக்கின்றார். உண்மையிலே அவருடைய குடும்பத்தை ஒரு கிரிக்கெட் குடும்பம் என்று கூறலாம்- மாண்புமிகு அர்ஜுன ரணதுங்க அவர்களின் தலைமையிலான இலங்கை அணி 1996ஆம் ஆண்டு World Cupஐ வென்றெடுத்தது. அன்று இலங்கையில் இருந்த கிரிக்கெட் ஆதரவாளர்களுக்கோ அல்லது கிரிக்கெட் ரசிகர்களுக்கோ அல்லது cricket playerகளுக்கோ வெற்றிபெற வேண்டுமென்ற ஓர் ஆவேசம் இருந்தது. அதாவது, "இலங்கை அணி World Cupஐத் தூக்க வேண்டும்; இலங்கையணியினரால் இந்த cricketஐ விளையாடமுடியும் என்பதை நிரூபிக்கவேண்டும்" என்று. ஆனால், இன்று அந்த நிலைமை இல்லை என்றுதான் நான் நினைக்கின்றேன். இதற்காக கௌரவ அமைச்சர் அவர்கள் மைதானத்துக்குப்போய் கிரிக்கெட் விளையாட முடியாது. மாறாக, நாங்கள் எமது நாட்டுக்காகக் கிண்ணத்தை வெல்லவேண்டும் என்ற எண்ணம் எமது கிரிக்கெட் வீரர்கள் மத்தியில் வரவேண்டும். ஆனால், துரதிஷ்டவசமாக இன்று வீரர்கள் மத்தியிலே அப்படியான எண்ணம் இருக்கின்றதா? என்றதொரு கேள்வி எழுகின்றது.

[ගරු ජේ. ශ්‍රී රංගා මහතා]

அன்று உலகக் கிண்ணத்தை இலங்கை வென்றபொழுது, உலகுக்கு கிரிக்கெட் விளையாட்டை அறிமுகப் படுத்தியவர்களும் ஏனைய உலக கிரிக்கெட் ரசிகர்களும் இலங்கை அணியினால் உலகக் கிண்ணத்தை வெல்லமுடியுமா? இலங்கை அணி test match விளையாடுமா? One-day international match விளையாடுமா? என்று வியப்புடன் பார்த்தார்கள். ஆனால், இன்று 3 - 4 தடவைகளுக்குமேல் இலங்கை அணியானது finalக்கு தெரிவாகியபொழுதும்கூட, இலங்கை வீரர்கள் மத்தியில் விவேகம் என்பதற்கு அப்பால், நாங்கள் எமது நாட்டுக்காக நமது மண்ணில் இந்தக் கிண்ணத்தைக் கைப்பற்ற வேண்டும் என்றதொரு ஆர்வம் அல்லது ஆவேசம் இருந்ததாகத் தெரியவில்லை. நிச்சயமாக வீரர்களுக்கு மத்தியிலே இவ்வாறான ஆர்வம் இருக்க வேண்டும். நான் கிரிக்கெட் சம்பந்தமான சில கட்டுரைகளைப் படித்ததிலிருந்து, அன்று அர்ஜுன ரணதுங்க போன்றவர்கள் கிரிக்கெட் வீரர்களாக இருந்தபோது அவர்களுக்கு வழங்கப்பட்ட சம்பளமானது, இன்று கிரிக்கெட் விளையாடுபவர்களுக்குத் தண்ணீர்ப் போத்தலை எடுத்துக்கொடுக்கின்றவர்களுக்கு கிடைக்கின்ற சம்பளத்துக்கு அண்மித்ததாக இருந்திருக்குமென அறிய முடிகிறது. இவ்வாறான கஷ்டங்களுக்கு மத்தியிலும் அவர்களிடத்தில் தாங்கள் கிண்ணத்தைக் கைப்பற்றவேண்டும் என்றதொரு ஆவேசம் அன்றிருந்தது. ஆனால், இன்று அதனை எமது வீரர்களிடத்தில் காணமுடிவதில்லை. இன்று கிரிக்கெட் விளையாட்டானது ஓர் ஆடம்பர விளையாட்டாகவே அவர்களால் பார்க்கப்படுகின்ற ஒரு நிலைமை காணப்படுகின்றது. பிரேசில் போன்ற நாடுகளை எடுத்துக் கொண்டால், அங்குள்ளவர்கள் உலகக் கிண்ண உதை பந்தாட்டத்தை வென்றபின்பும்கூட ஏனைய விளையாட்டுக் களுக்கும் முக்கியத்துவம் கொடுத்து வருகின்றார்கள். ஆனால், இலங்கையில் கிரிக்கெட்டுக்கு மாத்திரம் முக்கியத்துவம் கொடுப்பதோடு, அதனை மையமாக வைத்துத்தான் பல போட்டிகளையும் நடத்துகின்றார்கள்.

குறிப்பாக squash, tennis போன்ற விளையாட்டுக்களுக்கு ஏனைய நாடுகளில் முக்கியத்துவம் அளிப்பதைப்போன்று எமது நாட்டில் முக்கியத்துவம் கொடுக்கப்படுவதில்லை. இலங்கையில் நாங்கள் cricket ஐ மட்டும் நம்பியிருக்கின்றோம். எமது நாடு கிரிக்கெட் விளையாட்டில் தோல்வியடைந்தால், தேர்தல் வரும்வரை அதுபற்றி எந்த விதமான கருத்தும் வெளியிடாது தேர்தல் முடிவுகளை எதிர்பார்த்திருப்பதும் தேர்தலில் தோல்வியடைந்த பின்னர் எதிர்க்கட்சியில் இருந்து கொண்டு அதுபற்றி விவாதிப்பதையுமே இங்கு காணக் கூடியதாக இருக்கின்றது. எனவே, நாங்கள் cricketக்கு போலவே ஏனைய விளையாட்டுக்களுக்கும் முக்கியத்துவம் கொடுக்கவேண்டும்.

கௌரவ விளையாட்டுத்துறை அமைச்சர் அவர்களுடைய தலைமையில் நானும் முல்லைத்தீவு மாவட்டத்துக்குச் சென்றிருந்தேன். அப்பொழுது அப்பிரதேசத்திலுள்ள விளையாட்டு வீரர்களைத் தெரிவுசெய்யவேண்டிய நிலைமை ஏற்பட்டது. இதேபோன்று இலங்கையிலுள்ள அனைத்துக் கிராமங்களிலிருந்தும் விளையாட்டு வீரர்கள் தெரிவு செய்யப்படவேண்டும். எனக்கு முன்னர் உரையாற்றிய மாண்புமிகு உறுப்பினர் ஏ.எச்.எம். அஸ்வர் அவர்களும் பிரபல cricket commentator ஆக இருக்கின்றார். அன்று மக்கள் மத்தியிலே cricket வீரர்களுக்கு இருந்த மதிப்பும் முக்கியத்துவமும் இன்றில்லை. இன்று cricket match இல் தோல்வியடைந்தவுடன், " ඒ අය සල්ලි ගත්තා" என்னும் opinion வருவதற்கான காரணம் என்ன?அன்று அர்ஜுன ரணதுங்க அவர்கள் cricket விளையாடிய காலகட்டத்தில் இத்தகைய அபிப்பிராயங்கள் எதுவும் வெளிவரவில்லை. முத்தையா முரளிதரன் அவுஸ்திரேலியாவில் cricket விளையாடியபொழுது ஏற்பட்ட பிரச்சனைக்கு captainship என்றால் என்ன என்பதனை அர்ஜுன ரணதுங்க அவர்கள் எடுத்துக் காட்டியமை எனக்கு நல்ல ஞாபகமிருக்கிறது. அது மிகவும் பாராட்டக்கூடிய விடயமாகும்.அதாவது, தனது குழுவிலுள்ள ஒருவருக்குப் பாதிப்பு ஏற்பட்டவேளையில் தலைமை தாங்கியவரான அவர் அந்தப் பாதிப்பானது ground இலிருந்து வெளிச்செல்வதற்கு முன்னர் அதற்குள்ளேயே இருந்து கொண்டு போராடி வெற்றியும் கண்டார். அதன் பின்னர் முத்தையா முரளிதரனை 'எறிபந்தாளர்' எனக் கூறிக் கொண்டிருந்த அவுஸ்திரேலியா போன்ற நாடுகள், அதே முரளிதரனை திறமையான சுழல்பந்து வீச்சாளர் எனக் கூறும் அளவுக்கு நிலைமை மாறியிருந்தது. ஆனால், இன்று நாங்கள் இவ்வாறான வீரர்களை உருவாக்குகின்றோமா? அல்லது உருவாக்கப்போகின்றோமா? என்பதுதான் இன்று எழுந்துள்ள கேள்வி. நாங்கள் cricket போன்ற விளையாட்டுக்களில் அக்கறையுள்ளவர்களை மீண்டும் உருவாக்க முடியுமான எனச் சிந்திக்க வேண்டும்.

சுசந்திகா ஒலிம்பிக் போட்டியில் வெற்றியீட்டியபொழுது அவருக்கு ஏற்பட்ட பிரச்சனைகளையும் அவருக்கு எவ் வகையான உதவி வழங்கப்பட்டது என்பதனையும் இந்தச் சபை அறியும்.ஆனால், இந்த முறை 400 மீற்றர் Para Olympic இல் எமது நாட்டு வீரர் இரண்டாவதாக வந்திருக்கின்றார். Cricket மூலம் கிடைக்கின்ற நிதியில் நாங்கள் ஏனைய விளையாட்டுத்துறைகளுக்கும் முக்கியத்துவம் அளித்து ஊக்குவிக்க வேண்டும். நாம் ஏனைய துறைகளுக்கு முக்கியத்துவம் அளிக்காவிட்டால் நிச்சயமாக எமது விளையாட்டுத்துறை மீண்டும் பின்தங்கிய நிலைக்குச் செல்லும். கௌரவ விளையாட்டுத்துறை அமைச்சர் அவர்கள் ஒவ்வொரு மாகாண சபைக்கும் stadium அமைக்கும் வேலைத்திட்டத்தை ஆரம்பிக்கவிருப்பதாகக் கூறியிருந்தார். கண்டியில் பிறந்த முரளிதரன் கிரிக்கெட் துறையில் புகழ் ஈட்டினார். அதேபோன்று நுவரெலியா மாவட்டத்தையும் அமைச்சர் அவர்கள் கவனத்திலெடுத்து அங்கிருக்கின்ற பல திறமைவாய்ந்த இளம்வீரர்களையும் விளையாட்டுத்துறையில் இணைத்துக்கொள்ளவேண்டும் எனக் கேட்டுக் கொள்கின்றேன்.

இச்சபையில் பல்வேறுபட்ட கருத்துக்கள் முன்வைக்கப்பட்டன. அண்மைக்காலங்களில் இலங்கை cricket team இல் இருப்பவர்கள் காசு வாங்கினார்களா? அல்லது contract செய்தார்களா என்ற சந்தேகம் எழுகின்றது. இத்தகைய சந்தேகம் ஏன் எழுகின்றது? West Indies team வெற்றியீட்டிய பின்னர் அந்த மைதானத்துக்குள் மகிழ்ச்சியுடன் சுற்றி வந்தது. ஆனால், இலங்கையிலுள்ள ஒரு பார்வையாளர்கூட அவர்கள்மீது தண்ணீர் போத்தலையோ, கல்லையோ, கொடியையோ எறியவில்லை. ஆனால், இதே நிகழ்வு இன்னொரு நாட்டில் நிகழ்ந்திருந்தால் அந்த West Indies team மீது எவ்வளவோ கற்களும் தண்ணீர்ப் போத்தல்களும் விழுந்திருக்கும். ஆனால், பார்வையாளர்கள் நிதானமாக எழுந்து நின்று அவர்களுக்கு ஆதரவாகக் கரகோஷம் செய்தார்கள். எனினும், அதே பார்வையாளர்கள் மத்தியில் இலங்கை cricket team காசு வாங்கித்தான் தோற்றது என்ற எண்ணம் வருவதற்கான காரணம் என்ன? என்பதை நாங்கள் நிச்சயமாக ஆராயவேண்டும் எனக் கூறி, விடைபெறுகின்றேன். நன்றி.

**මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Presiding Member)

The next speaker is the Hon. Mahindananda Aluthgamage. Before he starts, will an Hon. Member propose the Hon. Alhaj A.H.M. Azwer to take the Chair?

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

I propose that the Hon. Alhaj A.H.M. Azwer do now take the Chair.

**ගරු ජේ. ශ්‍රී රංගා මහතා**
(மாண்புமிகு ஜெ. ஸ்ரீ றங்கா)
(The Hon. J. Sri Ranga)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***අනතුරුව ගරු හුනෙයිස් ෆාරුක් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු අල්හාජ් ඒ.එච්.එම්. අස්වර් මහතා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு ஹுனைஸ் பாறூக் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு அல்ஹாஜ் ஏ.எச்.எம். அஸ்வர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. HUNAIS FAROOK *left the Chair, and* THE HON. ALHAJ A.H.M. AZWER *took the Chair.*

**[අ.භා. 6.25]**

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා ( ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - விளையாட்டுத் துறை அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - Minister of Sports )

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ක්‍රිකට් ක්‍රීඩාවේ පැන නැඟී තිබෙන ගැටලු පිළිබඳව අද දින සභාව කල් තබන අවස්ථාවේ විපක්ෂය විසින් ඉදිරිපත් කළ මේ යෝජනාව සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කරපු විපක්ෂයේ සහ ආණ්ඩු පක්ෂයේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාට මුලින්ම මගේ ස්තුතිය පුද කරන්න කැමැතියි. ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් ඒ සියලු දෙනාගේම අදහස් සැලකිල්ලට ගන්නා බව අමාත්‍යවරයා හැටියට මා සඳහන් කරන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමාගේ කථාව හැර විපක්ෂයේ අනික් කථිකයන්ගේ කථා සාරාංශයක් හැටියට ගත්තාම, ඒවායින් විශේෂ අවධානය යොමු වුණේ පසු ගිය දා පැවැති තරගය පාවා දීමක් සිද්ධ වුණා ද කියන කාරණය ගැනයි. ක්‍රිකට් ක්‍රීඩාවේ බරපතළ උවදුරක් හැටියට අද ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සලය හඳුනා ගත් කාරණයක් තමයි තරග පාවා දීම. තරග පාවා දීම බරපතළ වෛරසයක් හැටියටත් මේ වනකොට ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සලය විසින් හඳුනා ගෙන තිබෙනවා.

ඒ නිසා 2000 වර්ෂයේ Anti-Corruption Security Unit නමින් ආයතනයක් හදලා, ඒක ඒ ඒ රටවල ස්ථාපිත කරලා, තරග පාවා දුන් අයට විරුද්ධව අවශ්‍ය කටයුතු කරන්න මේ වනකොට පියවර අරගෙන තිබෙනවා. තරග පාවා දුන්නු හතර-පස්දෙනකුගේ නාම ලේඛනයක් ගරු මන්ත්‍රීතුමන්ලා කියෙව්වා මා අහගෙන සිටියා. 2000 වර්ෂයේ මා කලින් කියපු ආයතනය ස්ථාපිත කළාට පස්සේ, පාකිස්තානය, ඉන්දියාව ආදී තවත් රටවල් නියෝජනය කරන ක්‍රීඩකයන් විසි දෙදෙනෙකු තරග පාවා දීම නිසා තරග තහනමට ලක් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය විස්සයි-විස්ස ක්‍රිකට් තරගාවලියත් එක්ක පිට පිට හතර වතාවක් අවසාන තරගයට මුහුණ දෙන්න ශ්‍රී ලංකාවට එන්න පුළුවන් වුණා. මා දන්නවා, ජෝන් අමරතුංග මන්ත්‍රීතුමා ක්‍රීඩාවට බොහොම ආදරය කරන, බොහොම හොඳ ප්‍රේක්ෂකයෙක් බව. ඔබතුමන්ලාත්, අපි සියලු දෙනාමත් එහෙමයි. එම නිසා පිට පිට තරගාවලි හතරකදීම අවසාන මහා තරගයට ඇවිල්ලා පරදිනකොට ප්‍රේක්ෂකයන් හැටියට තමුන්නාන්සේලාට යම් සැකයක් හිතෙන්න පුළුවන්, එවැනි තරග පාවා දීමක් සිද්ධ වුණා ද කියලා. ඒක සාධාරණයි. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ශ්‍රී රංගා මන්ත්‍රීතුමා කිව්ව ආකාරයට ඊට කලින් වාරවලදී අපි තරග පරදින කොට රටේ ජනතාව තුළ මතයක් ඇති වුණේ නැහැ, තරග පාවා දීමක් සිදුවුණාද කියලා. හැබැයි අවාසනාවට රටේ ජනතාව අතරේ අද එවැනි මතයක් ඇති වෙලා තිබෙනවා. ඒක එච්චර හොඳ දෙයක් නොවෙයි. එවැනි මතයක් ඇති වෙලා තිබෙනවා නම් ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් රජයක් හැටියට ඒ මතය නිවැරදි කරන්න ඕනෑ. ඒ නිසා මා හිතන හැටියට අද මේ කරන මේ සංවාදය හොඳයි. මේ සංවාදය වටිනවා. මේ පිළිබඳව පැහැදිලි කරන්න මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ මෙවැනි සංවාදයක් පැවැත්වෙන එක හොඳයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, match fixing කියන එක මහා බරපතළ ප්‍රශ්නයක්. දැන් මේ බුකීකරුවන්, umpire තුන්වන ඕවරයේදී තොප්පිය ගලවනවා කියලා ඔට්ටු දමනවා. ඒ කියන විධියටම ඇත්තටම umpire තොප්පිය ගලවනවා. සමහර වෙලාවට ඔට්ටු දමනවා, අසවල් ඕවරයේදී umpire cooling glasses ගලවනවා කියලා. අනේ, ඇත්තටම umpire ඒක ගලවනවා. ඒ වාගේම බුකීකරුවන් ඔට්ටු දමනවා, 44 වන පන්දු ඕවරයේ තුන්වන බෝලය no ball එකක් කියලා. ඇත්තටම ඒ විධියටම no-ball එකක් යනවා. ඉතින් මේක මහා බරපතළ තත්ත්වයක්. මෙවැනි සිද්ධීන් වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එවැනි සිද්ධි ඇති වෙච්ච නිසා තමයි තරග තහනමට ලක් වෙච්ච ක්‍රීඩකයන් විසි දෙදෙනාගෙන් වැඩි පිරිසක් ජීවිතාන්තය දක්වා තරග තහනමට ලක් වෙලා තිබෙන්නේ. එම නිසා මේක බරපතළ තත්ත්වයක්.

අපේ රටේ යම් යම් ක්‍රීඩකයන්ට විරුද්ධවත් match fixing පිළිබඳව පැමිණිලි ලැබිලා තිබෙන බව ක්‍රීඩා අමාත්‍යවරයා හැටියට මම ඔබතුමන්ලාට කියන්න ඕනෑ. අපි ඒක නැහැයි කියන්නේ නැහැ. හැබැයි, තරග පාවා දීමක් සම්බන්ධයෙන් ලංකාවේ කිසිම ක්‍රීඩකයකු මෙතෙක් වැරදිකරුවකු වෙලා නැහැ කියන එක වග කීමෙන් යුතුව මේ පාර්ලිමේන්තුවේදී මා කියන්න කැමැතියි. ක්‍රීඩකයන් විසි දෙදෙදෙනකු, තරග පාවා දීම පිළිබඳ වරදකරුවන් වන කොට ශ්‍රී ලංකාවේ එක ක්‍රීඩකයකුවත් එවැනි අවස්ථාවකට ලක් වෙලා නැති එක ගැන අපි ආඩම්බර වෙනවා. ඒ නිසා මා විශ්වාස කරන්නේ නැහැ, එවැනි දෙයක් සිද්ධ වුණා කියලා. එවැනි තරග පාවා දීමක් සිද්ධ වුණා නම් සාමාන්‍ය ක්‍රමවේදය අනුව ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සලය විසින්, Anti-Corruption Security Unit එකෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලයට දැනුම් දෙනවා. පසු ගිය දිනවල පැවැති 20-20 ලෝක කුසලාන තරගාවලිය අවසන් වෙලා දැනට සැහෙන කාලයක් ගත වෙලා තිබෙනවා. නමුත් මෙතෙක් එවැනි කිසිදු පැමිණිල්ලක් ලැබිලා නැහැ. එම නිසා ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය දිනවල පැවැති අවසාන තරගාවලියේදී කිසිදු තරග පාවා දීමක් සිද්ධ වුණේ නැහැයි කියන එක ඔබතුමාට කියන්න ඕනෑ.

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

මගේ මිත්‍ර ශ්‍රී රංගා මන්ත්‍රීතුමා හොඳ කථාවක් කිව්වා. ලංකාව හතර වතාවක් අවසාන මහා තරගයට ඇවිල්ලා පැරදුණාය කියමින් තරග පාවා දීමකට ලක් වුණාය කියලා විපක්ෂය කියනවා නම්, මැතිවරණ 29කින් පැරදුණ එක්සත් ජාතික පක්ෂයත් මැතිවරණ පාවා දීමකට ගියාද කියන එක සොයා බලන්න Anti-Corruption Security Unit එකට භාර දෙන්න ඕනෑ කියලා ශ්‍රී රංගා මන්ත්‍රීතුමා කිව්වා. ඒ පිළිබඳව මම මෙතැන කථා කරන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තරග පාවා දීම පිළිබඳව ඔබතුමාට කියන්න ඕනෑ. මේ වෙන කොට ලෝකයේ රටවල් කිහිපයක් ඒ සම්බන්ධයෙන් අවශ්‍ය නීති රීති සම්පාදනය කරලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. ඉන්දියාව Prevention of Corruption Act එක පාර්ලිමේන්තුවේ සම්මත කරලා, ඒ අවශ්‍ය නීති රීති ගෙනැල්ලා අවශ්‍ය කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම එංගලන්තයත් Criminal Law Act එක යටතේ Prevention of Corruption Act 1906 කියන එක සංශෝධනය කරලා අවශ්‍ය විධිවිධාන ගෙනැවිත් තිබෙනවා. ඒ වාගේම දකුණු අප්‍රිකාවත් Prevention of Corruption Bill කියලා එවැනිම පනතක් ගෙනැල්ලා අවශ්‍ය නීති, අණ පනත් සකස් කරලා තිබෙනවා. ඒ වාගේම ඕස්ට්‍රේලියාවත් anti-corruption unit එකක් හදලා ඒ අවශ්‍ය නීති සම්පාදනය කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "Sri Lanka Cricket : Anti-Corruption Code for Players and Player Support Personnel" කියන document එක මම මේ අවස්ථාවේදී **සභගත*** කරන්න කැමැතියි.

මේ වන විට අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කරලා තිබෙනවා. ඒ කමිටුවේ වාර්තාව සකස් කර අවසන් වුණු වහාම අපි ඉතා කඩිනමින් එය නීතිපතිතුමාට යොමු කරලා, කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලා, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, තරග පාවා දීම පිළිබඳව අදාළ නීතිමය කටයුතු ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ අනුව ශ්‍රී ලංකාවේ යම් ක්‍රීඩකයෙක් එවැනි තරග පාවා දීමකට ලක් වුණොත් ඔහුට විරුද්ධව උපරිම දඬුවම් ලබා දීම සඳහා අවශ්‍ය අණපනත් පාර්ලිමේන්තුවට ගෙන ඒම සඳහා මේ වන විටත් කටයුතු කර ඇති බව ඉතාම සතුටින් කියන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඊළඟට අපි කියන්න ඕනෑ, අපේ රටේ මේ වැරදි අවම කරන්න ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට කරන්න පුළුවන් උපරිම උත්සාහය දරලා තිබෙන බව. වැඩි වශයෙන් කිව්වොත්, පසු ගිය දිනවල පැවැති ප්‍රිමියර් ලීග් තරගාවලියේදීත් අයිසීසී එක සම්බන්ධ කරගෙන anti-corruption සඳහා අවශ්‍ය කටයුතු කළා. ඒ කියන්නේ අපේ අන්තර් පළාත් තරගාවලිවලට පවා අදාළ නිලධාරින් ගෙන්වලා anti-corruption පිළිබඳව අපේ අවධානය යොමු කර තිබෙනවා. අපි ඒ සියලු කටයුතු වළක්වන්න ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය හැටියට කටයුතු කර තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ජෝන් අමරතුංග මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ තරග හතරේ පරාජය පිළිබඳව ක්‍රීඩා අමාත්‍යවරයා හැටියට මමත් අපේ මිත්‍ර ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමාත් -එකම දිස්ත්‍රික්කයේම ඉන්න නිසාද දන්නේ නැහැ, අප දෙදෙනාම- දරන්නේ එකම මතය. අපි පිට පිට අවසාන මහා තරගාවලිවලට හතර පාරක් ආවා. හැබැයි, අපි අවසාන තරගාවලියෙන් පරාජය වුණා. අපේ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා කියපු හැටියට ලෝක කුසලානය ජයග්‍රහණය කර ගන්න බැරි රටක් නොවෙයි අපි. මම දන්නා හැටියට අපේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට කරන්න බැරි දෙයක් නැහැ. මේ තරගාවලි අපට ජයග්‍රහණය කර ගන්න පුළුවන්.

ගරු මන්ත්‍රීතුමනි, මම සියයට සියයක් එකඟ වෙනවා, මේ ක්‍රීඩා කණ්ඩායමට මනෝ විද්‍යාව පිළිබඳ psychologistලා ගෙනෙන්න. මේක අපේ අවධානය යොමු නොවුණු කාරණයක්. මේ පිළිබඳව අපි ක්‍රිකට් පාලක මණ්ඩලයට උපදෙස් දීලා තිබෙනවා. ලෝකයේ ඉතාම හොඳ මනෝ විද්‍යාඥයෝ - psychologistලා- ගෙනැවිත් අපේ කණ්ඩායමත් එක්ක ඉඳලා මේ අයත් එක්ක කටයුතු කරලා මේක හදන්න ඕනෑ. ඔබතුමා දන්නවා, ක්‍රිකට් තරගාවලි ගහනකොට විශාල මුදලක් ක්‍රීඩකයන්ට ලැබෙන බව. ඉස්සර වාගේ නොවෙයි. මේ ක්‍රීඩකයන්ගේ මානසික තත්ත්වය මේ සියල්ල කෙරෙහි අවධානය යොමු කරන්න ඕනෑ. මගේ අත් දැකීම හැටියට නම් මේ ක්‍රීඩකයන්ට අපෙන් වුණු ලොකුම අඩුව ඒකයි. ඔවුන්ට ඉතාම හොඳට තරග කරන්න පුළුවන්. ඔවුන්ට තරගාවලිවලට මුහුණ දෙන්න පුළුවන්. ජයග්‍රහණය කරන්න පුළුවන්. මේ වෙලාවේ මේ අයගේ psychological පැත්ත, මේ ගොල්ලන්ගේ තිබෙන stress එක, ඒ වාගේම අවසාන තරගාවලියකට ආවට පසු ඔවුන් මුහුණ දෙන අභියෝගය මෙන්න මේ කාරණා කෙරෙහි අපේ අවධානය යොමු වෙලා නැහැ.

මම ක්‍රීඩා අමාත්‍යවරයා හැටියට, ලෝක කුසලාන දෙකක් සඳහා අපේ ක්‍රීඩකයින් යොමු කරන්න මට වාසනාව ලැබුණා. පසු ගිය දා පැවැති ඕවර් 50-50 ලෝක කුසලානය හා ඕවර් 20-20 ලෝක කුසලානය. ක්‍රීඩා අමාත්‍යවරයා හැටියට මම ආඩම්බර වෙනවා, ඒ තරගාවලි දෙකේම අපට අවසාන මහා තරගාවලියට එන්න පුළුවන් වුණා. මේ ලෝකයේම ක්‍රීඩාවට ආදරය කරන එංගලන්තයට බැරි වෙලා තිබෙනවා, තවම ලෝක කුසලානයක් ජයග්‍රහණය කරන්න. හැබැයි, අපට පුළුවන් වුණා, මේ අවසානයේ පැවැති තරගාවලි දෙකේම අවසාන මහා තරගාවලියට එන්න. ඒ නිසා මම කැමැති නැහැ, ඉදිරියේදී එන ක්‍රීඩා අමාත්‍යවරයෙකුගේ කාලයේ හෝ ලෝක කුසලානය හෝ 20-20 තරගාවලියක් අවසාන මහා තරගාවලියෙන් පරාජයට පත් කරන්න. ඒ නිසා ක්‍රිකට් පාලක මණ්ඩලය හැටියට, අපේ අමාත්‍යාංශය හැටියට, ක්‍රිකට් පාලක මණ්ඩලයත් එක්ක එක්කාසු වෙලා පැහැදිලිව ඒ අඩුපාඩුකම් සියල්ල සැලකිල්ලට අරගෙන කටයුතු කරනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, ඔබතුමාට කියන්න ඕනෑ ක්‍රිකට් structure එකේ ප්‍රශ්නයක් තිබෙන බව. අද ක්‍රීඩාව ගමට ගිහින් නැහැ. ඔබතුමා කිව්වා වාගේම මේක පළාත් මට්ටමට යන්න ඕනෑ. මේ Premier League එක පටන් ගත්තේ ඒකයි. අපි මේක පළාත් මට්ටමට ගෙන යන්න ඕනෑ. අද අපේ ක්‍රීඩාවෙන් අපට ලැබෙන ආදායමෙන් සියයට 60ක් වියදම් කරන්නේ ක්‍රීඩකයන්ට. ඊළඟට අපි clubsවලට තව ගණනක් වියදම් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්‍රීඩාවේ සංවර්ධනයට සියයට10ක්වත් අපි වියදම් කරන්නේ නැහැ. මම පසු ගිය කාලයේ උතුර නැඟෙනහිර මඩකළපු දිස්ත්‍රික්කයටත් ගියා. එහි ක්‍රීඩකයන් 600ක් ක්‍රීඩා කරනවා. හැබැයි, මඩකලපු දිස්ත්‍රික්කයේ side wicket එකක් නැහැ. අපි කිළිනොච්චියට ගියා. ක්‍රීඩකයන් විශාල පිරිසක් ක්‍රීඩා කරනවා. හැබැයි, ඔවුන්ට අවශ්‍ය පහසුකම් නැහැ. අපිට හම්බ වෙන සියලු මුදල් අපි වියදම් කරන්නේ ක්‍රීඩකයන්ට. ඔබතුමා දන්නවා, ඕස්ට්‍රේලියාවේ ක්‍රීඩකයන්ට ගෙවන්නේ සියයට 25ක් බව. අපි සියයට 60ක් ගෙවනවා. ඒ නිසා අපි අධික මුදලක්

---

***** පුස්තකාලයේ තබා ඇත.**
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගෙවන බව කියන්න ඕනෑ. ඒ නිසා අපි හරුන් ලෝර්ගාට් මහත්මයා ගෙනැවිත් අපේ cricket structure එක change කරන එක පිළිබඳ කමිටුවක් පත් කරලා අපි ඒ කටයුත්ත කර ගෙන යනවා. අපේ මූලා පරිහරණය පිළිබඳව ලබන මාසය වන විට කියන්න පුළුවන්. මම ලෝක කුසලානයට ඉස්සෙල්ලා කිව්වා, ක්‍රිකට් ක්‍රීඩාවේ විශාල පරිවර්තනයකට යන බව.

ගරු මන්ත්‍රීතුමනි, ඉදිරි කාලයේ ක්‍රිකට් පාලක මණ්ඩලය මේ කටයුත්තට අත ගහනවා. මෙතෙක් කාලයක් ක්‍රිකට් පාලක මණ්ඩල මේවාට අත ගැහුවේ නැති හේතුවක් තිබෙනවා. ඔබතුමන්ලා දන්නවා ඇති, අවුරුද්දෙන් අවුරුද්ද නිල වරණයකට යන බව. ඔබතුමන්ලා ඡන්ද ගැන කිව්වා. ගරු මන්ත්‍රීතුමනි, නිල වරණයකට ගියාම අවුරුද්දකින් නිල වරණයක් තිබෙනවා. මාස හයක් ක්‍රිකට් පාලක මණ්ඩලයට එනවා. එහාට මෙහාට හැරෙනවා. ඊළඟ මාස හයේ ආපහු ඡන්දයට දුවනවා. ඒ නිසා මම දන්නා තරමට පවතින ක්‍රමවේදය තුළ ක්‍රිකට් පාලක මණ්ඩලය ක්‍රිකට් දියුණු කරනවාට වැඩිය තමන්ට ඡන්දය දුන්නු ක්‍රීඩා සමාජ දියුණු කරන්න තමයි කටයුතු කරන්නේ. ඒ නිසා ක්‍රීඩා සමාජවලට සල්ලි දෙන්න, ක්‍රීඩා සමාජවලට බෝල දෙන්න, ක්‍රීඩා සමාජවලට බැට් දෙන්න, ක්‍රීඩකයන්ට ගෙවන්න වාගේ ඒ අයව තෘප්තිමත් කරන වැඩ කරනවා මිස ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් ක්‍රිකට් පාලක මණ්ඩලය තුළ දැනට සිදු වන කටයුතු පිළිබඳව මා සෑහීමකට පත්වන්නේ නැහැ. මේක ක්‍රිකට් පාලක මණ්ඩලයත් පිළිගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මම ක්‍රීඩා පනතේ රෙගුලාසි සංශෝධනය කරලා ලබන වර්ෂයේ ඉඳලා මැතිවරණයකින් තොරව වසර හතරක් අපි ඔවුන්ට ඉදිරියට යන්න දෙනවා. මොකද ජාත්‍යන්තර තරගාවලියක් අවුරුදු හතරෙන්, හතරට තිබෙනවා. එතකොට එන ඕනෑම පාලකයෙකුට ක්‍රීඩාව දියුණු කර ඕනෑම තරගාවලියකට යන්න කාලයක් තිබෙනවා. මම ඒ guarantee එක දුන්නු හින්දා තමයි අද ක්‍රිකට් පාලක මණ්ඩලය ඒ සියලු වෙනස්කම්වලට යන්න සූදානම්. එහෙම කළේ නැත්නම් -ලබන අවුරුද්දේ ඡන්දයක් තිබුණා නම්- අනිවාර්යයෙන් මේ තීරණය ගන්නේ නැහැ. මොකද ඔවුන්ට ඡන්දය දෙන ක්‍රීඩා සමාජ ටික ඡන්දය දෙන්නේ නැහැ. ඒ නිසා අපි ක්‍රීඩා සමාජ සතුටු කරන්න ගියොත් අපට මේක ගෙන යන්න බැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමනි, මේ ක්‍රීඩාව පළාත් මට්ටමට ගෙන යන්න කියන කාරණයට මා එකඟයි. ගරු මන්ත්‍රීතුමනි, පළාත් මට්ටමට නොවෙයි, අපි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමට යන්න ඕනෑ. අපි ගමට යන්න ඕනෑ. දක්ෂ ක්‍රීඩකයෝ ගමේ ඉන්නවා. අද බලන්න උතුරු, නැඟෙනහිරින් එකම ක්‍රීඩකයෙක්වත් අපට එන්නේ නැහැ. ඒ නිසා අපි උතුරු, නැඟෙනහිරට මේ ක්‍රීඩාව තවම ව්‍යාප්ත කරලා නැහැ. උතුරු, නැඟෙනහිර ඉතාම දක්ෂ ක්‍රීඩකයෝ ඉන්නවා. අපි තවම ක්‍රීඩාව ඒ පළාත්වලට ව්‍යාප්ත කරලා නැහැ. අපි මේ වන විට උතුරු, නැඟෙනහිර දැවැන්ත වැඩ පිළිවෙළක් ගෙන යනවා. ඒ නිසා ක්‍රිකට් structural change එකකට අපට යන්න වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපි ක්‍රිකට් ක්‍රීඩාවේ අඩු පාඩුකම් සියල්ල හඳුනා ගෙන තිබෙනවා. ඒ නිසා නැවත වතාවක්, ශ්‍රී ලංකාව අවසාන මහා තරගාවලියකට ඇවිල්ලා ලෝක කුසලානය ලබා නොගන්න කටයුතු සිදු නොවෙන්න -පරාජය නොවෙන්න- ක්‍රීඩා අමාත්‍යවරයා හැටියට මා ක්‍රිකට් පාලක මණ්ඩලයත් එක්ක දැඩි පියවර ගනිමින් සිටිනවා. ඒ නිසා ඉදිරි කාලයේ අපි ගන්නා වූ යම් තීරණත් එක්ක අපට යම් ගැටුම් ඇති වෙයි. අපි ගන්නා යම් තීරණත් එක්ක අපිත් එක්ක අමනාප වෙයි. ක්‍රීඩා සමාජ අමනාප වෙයි. අපට චෝදනා එයි. ඒ මොන අභියෝග ආවත් ක්‍රීඩාවේ උන්නතිය වෙනුවෙන් අපි ඒ තීරණ ගන්නවාය කියන කාරණය විශේෂයෙන් මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතැනදී කථා කරපු කිහිප දෙනෙක් සඳහන් කළ කාරණාවලට උත්තර කීපයක් දෙන්න මා බලාපොරොත්තු වෙනවා. විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා කිහිප දෙනෙක් කිව්වා, ක්‍රිකට් පාලක මණ්ඩලයේ නිල වරණය පිළිබඳව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ක්‍රිකට් පාලක මණ්ඩලයේ නිල වරණයක් පැවැත්වූවා. ඕනෑම කෙනෙකුට, ක්‍රීඩා සමාජයකට නාම යෝජනා දීමේ හැකියාවක් තිබුණා. පාර්ශ්වයන් දෙකක් අපට නාම යෝජනා ලබා දුන්නා. නමුත් නාම යෝජනා දීපු එක් පාර්ශ්වයක් මැතිවරණය තිබෙන දවසේ උදේ -අවසාන මොහොතේ- මේ තරගාවලියෙන් ඉවත් වුණා. මේ තරගාවලියෙන් ඉවත් කෙරෙව්වා කියලා තමුන්නාන්සේලා අපට චෝදනා එල්ල කළා. අපි කවුරුවත් ඉවත් කරන්න කටයුතු කළේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, මේකට හේතුව වන්නේ, සියලුම ක්‍රීඩා සමාජ තමන්ගේ mandate එක ඡන්දයට දවසකට කලින් ගන්නවා. මොකද ක්‍රීඩා සමාජ තමන්ගේ ඡන්දදායකයාට කියනවා, "ඔබ ඡන්දය දෙන්න ඕනෑ මේ පාර්ශ්වයටයි." කියලා. එතකොට ඡන්දයට දවසකට කලින් දන්නවා, දිනන්නේ කවුද, පරදින්නේ කවුද කියලා. එතකොට ඒ club එකේ mandate එක අරගෙන තමයි ඒගොල්ලන් ඡන්දය දෙන්න යන්නේ. එක් පාර්ශ්වයකට වාසියි කියලා අනෙක් පාර්ශ්වය දැන ගත්තා. ඔවුන් ඉල්ලා අස් වුණා. අමාත්‍යවරයා හැටියට මගේ කාලයේ මට කරන්න පුළුවන් එකම දේ තමයි, interim committee සංස්කෘතිය අහෝසි කරන එක.

අපි interim committee ක්‍රමය අහෝසි කළාට පස්සේ අතිගරු ජනාධිපතිතුමා මගෙන් දැඩිව ඉල්ලපු දෙයක් තමයි වහාම ක්‍රිකට් පාලක මණ්ඩලයේ නිල වරණයකට යන්නය කියන එක. ක්‍රීඩාවට ආදරය කරන නායකයෙකු හැටියට එතුමා කිව්වේ මේ තේරීම් කමිටු සංස්කෘතිය අපට හරි යන්නේ නැහැයි කියලායි. ඒ නිසා අපි නිල වරණයකට ගියා. ක්‍රීඩා සමාජයි ඡන්දය දුන්නේ. අපට කවුරුත් කියලා නැහැ, අපි හොර ඡන්ද දැම්මා කියලා. කිසිම කෙනෙක් කියලා නැහැ, අපි ඡන්දදායකයෝ බිය ගැන්වූවා කියලා. සියයට 95කට ආසන්න ප්‍රමාණයක් ඡන්දය දෙන්න ඇවිල්ලා තිබෙනවා. කිසිම ඡන්ද දායකයෙකුගෙන් චෝදනාවක් නැහැ. එහෙම නම් අපි කොහොමද මේ නිලවරණය අසාධාරණයි කියලා කියන්නේ. මෙතුමන්ලා කියනවා රාජපක්ෂ පාලනය ක්‍රිකට් පාලක මණ්ඩලයට ඇවිල්ලාය කියලා. ඉතින් නරක නැහැ නේ. රාජපක්ෂ පාලනයක් ක්‍රිකට් පාලක මණ්ඩලයට ඇවිල්ලා ඒ පාලනය විසින් අපේ ක්‍රිකට් කණ්ඩායම ලෝක මහා කුසලාන අවසාන තරගයට ගෙනැල්ලා තිබෙනවා. ඉතින් ඒක නරක නැහැ නේ, හොඳයි නේ. එංගලන්තයට බැරි වෙච්ච දෙයක්, ඕස්ට්‍රේලියාවට බැරි වෙච්ච දෙයක් රාජපක්ෂ පාලනය කරලා තිබෙනවා නම් ඒක හොඳයි නේ. ඒක නිසා එක, එක අයට ඇඟිල්ල දිගු කරන්න එපා. ඒක අසාධාරණයි.

ඒ නිසා යම් කිසි පාර්ශ්වයක් පත් වුණාම ඒක අසවලාගේ පාර්ශ්වය කියලා කියන්න එපා. ඒක අසාධාරණයි. තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා මේකට පත් වුණා නම් ඔය චෝදනාවම අනෙක් පාර්ශ්වය විසින් එල්ල කරනවා. එහෙම නැත්නම් අර්ජුන රණතුංග මන්ත්‍රීතුමා පත් වුණා නම් තවත් පාර්ශ්වයක් විසින් ඔය චෝදනාව එල්ල කරනවා. නමුත් අපි නිල වරණයකට ගියා. ක්‍රීඩා අමාත්‍යවරයා හැටියට මම සාධාරණ නිල වරණයක් පැවැත්වූවා. නිල වරණයෙන් පත් වෙච්ච කමිටුව අද කටයුතු කරනවා. ඒ නිසා කරුණාකරලා චෝදනා එල්ල කරන්න එපා. අපි ඒ කටයුත්ත කළා.

ඒ වාගේම ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා කිව්වා, නිශාන්ත රණතුංග මහත්මයා CSN නාලිකාවේ විධායක නිලධාරි විධියටත්, අපේ ක්‍රිකට් පාලක මණ්ඩලයේ ලේකම් හැටියටත් කටයුතු කරන කාරණය පිළිබඳව. ගරු කිරිඇල්ල මන්ත්‍රීතුමනි, මා ඔබතුමාට කිව්වේ, අප කටයුතු කරන්නේ ක්‍රීඩා පනතත් එක්ක

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

කියලායි. ක්‍රීඩා පනතට අනුව, එවැනි ක්‍රීඩා සංගමයක කටයුතු කරන පුද්ගලයෙකුට තවත් ආයතනයක - ඔබතුමා කියන්නා වාගේ මාධ්‍ය ආයතනයක - එහෙම ඉන්න බැහැ කියා පනතේ සඳහනක් නැහැ. එම නිසා පත් නොවී ඉන්නට අපට ඉඩ දෙන්නට බැහැ. ඔබතුමා කියන කාරණය පිළිබඳව යම් ප්‍රශ්නයක් තිබෙනවා. එම නිසා නැවත රෙගුලාසි සංශෝධනය කිරීමේදී ක්‍රීඩා පනතට ඒ සම්බන්ධ රෙගුලාසි ඇතුළත් කරන්නට බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මා ඔබතුමාට මේ කාරණයත් කියන්නට ඕනෑ. CSN නාලිකාවේ කටයුතු පිළිබඳව අප පරීක්ෂණයක් පැවැත්වූවා. ගරු අර්ජුන රණතුංග මන්ත්‍රීතුමා පැමිණිල්ලක් කළා. මේ පිළිබඳව පාර්ලිමේන්තුවේ හිටපු මහ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කර, මේ වනවිට ඒ කමිටුවේ පරීක්ෂණ කරමින් යනවා. ඒ පරීක්ෂණ වාර්තාව හෙට අනිද්දා වනකොට ලැබේවි. මොකද, ගරු අර්ජුන රණතුංග මන්ත්‍රීතුමා මේ පැමිණිල්ල කළේ අතිගරු ජනාධිපතිතුමාට. ගරු ජනාධිපතිතුමා ඒ වෙලාවේම මට වහාම මේ ගැන පරීක්ෂණයක් පවත්වන්නය කියා කිව්වා. පාර්ලිමේන්තුවේ හිටපු මහ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් ඒ සඳහා කමිටුවක් පත් කළා. ගරු අර්ජුන රණතුංග මන්ත්‍රීතුමා මේ වන කොට මේ පිළිබඳව සාක්ෂි දෙනවා. එම නිසා CSN ගනුදෙනුව පිළිබඳව හෙට අනිද්දා වන කොට අප පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ටිකට් පත් සම්බන්ධයෙන් දූෂණයක් සිද්ධ වුණාය කියා චෝදනාවක් එල්ල වුණා. මේ සියලුම ටිකට් පත් විකිණීම් කටයුතු කළේ ICC එක මඟින්. අප නොවෙයි, මේකට සම්බන්ධ වුණේ. ඔවුන් තමයි සියලුම කටයුතු කළේ. හැබැයි අප පිළිගන්නවා. තිස්පන්දාහක් නරඹන්නන් දමන්න පුළුවන් ක්‍රීඩාංගනයක ක්‍රිකට් තරගය බලන්න තුන් ලක්ෂ පණස්දාහක් ආවාම ඒ අයට අපට ටිකට් දෙන්නට බැහැ. එම නිසා අප පිළිගන්නවා. යම් යම් පාර්ශ්වයන් විසින් ටිකට් අර ගෙන වැඩි මිලට වික්කා. එම නිසා අපට ඒක නවත්වන්නට බැහැ. අප ඉතාමත් විවෘතව පුවත්පත්වල දැන්වීම් දාලා, රේඩියෝවේ දාලා, website වල දාලා, දිස්ත්‍රික්ක තුනේ වෙනම counters හදා ටිකට් වික්කා. අප කිසිම පාර්ශ්වයකට ඒවා ලබා දුන්නේ නැහැ. අපට යම් චෝදනාවක් ආවා, ක්‍රිකට් පාලක මණ්ඩලයේ අපේ නිලධාරියෙක් ක්‍රිකට් පාලක මණ්ඩලයේ පවුලේ අයට දුන් ටිකට් විකුණා අහු වුණාය කියා. අප මේ වනවිටත් ඔහුගේ සේවය අත හිටුවා තිබෙනවා. බොහොම සුළු ටිකට් ප්‍රමාණයක්. නමුත් මෙවැනි ප්‍රධාන තරගාවලි තියද්දී අපට බොහොම අපහසුයි, මේවා පාලනය කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. ඔබතුමන්ලා කිව්ව සියලුම කාරණාවලට මම උත්තර දුන්නාය කියා මම විශ්වාස කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මම නැවතත් කියන්නේ, මොන හේතුවකටවත් අපේ ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම මොනම අවස්ථාවකවත් තරග පාවා දීමකට සම්බන්ධ වුණාය කියා ක්‍රීඩා අමාත්‍යවරයා විධියට මම විශ්වාස කරන්නේ නැහැ. ක්‍රිකට් පාලක මණ්ඩලය හැටියට, අපේ අමාත්‍යාංශය හැටියට අප නිහතමානීව පිළිගන්නවා, අපේ අවධානය යොමු නොවුණු කාරණයක් සම්බන්ධව. මේ වන විටත් ගරු කිරිඇල්ල මන්ත්‍රීතුමනි, - ඔබතුමා කියනකොටත් - අප මේක ගැන අවධානය යොමු කර තිබුණා. පසුගිය ලෝක කුසලාන තරගාවලියේ පරාජයත් එක්කම අප ක්‍රිකට් පාලක මණ්ඩලයට උපදෙස් දුන්නා, වහාම මේ පිළිබඳව අවධානය යොමු කරන්නය කියා. ලෝකයේ ඉතාම හොඳ psychologistලා බොහොම දක්ෂ පිරිසක් ඉන්නවා. ඔබතුමා කියන එකට මම සියයට සියයක් එකඟයි. එතුමා එක කාලයක ඇවිත් කණ්ඩායමත් එක්ක වැඩ කළා. මා හිතන විධියට අපේ අයට තිබෙන stress එක -පීඩනය- යනාදී මේ සියල්ල කෙරෙහි අපේ අවධානය යොමු කරන්නට ඕනෑ.

ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ශ්‍රී රංගා මන්ත්‍රීතුමාගේ කථාවේදී කිව්වා, අධික ලෙස මුදල් වැය වන නිසා ක්‍රීඩකයෝ රට වෙනුවෙන් ක්‍රීඩා කිරීම ගැන මීට වඩා අවධානය යොමු කරනවා නම් හොඳයි කියා. ඒ සියල්ල අපේ අවධානයට යොමු කරනවා. සමහර ජාත්‍යන්තර තරගාවලීන් පවත්වද්දී සමහර ක්‍රීඩකයන් යම් යම් විධියට රට වෙනුවෙන් ක්‍රීඩා කරන්නේ නැතිව වෙනත් ජාත්‍යන්තර තරගාවලිවලට සම්බන්ධ වන්න උත්සාහ කරනවා. නමුත් ලෝකයේ අනෙක් රටවල ක්‍රීඩකයෝ එහෙම කරන්නේ නැහැ. එම නිසා ඒ පිළිබඳවත් අවශ්‍ය අනපනත් අප ඉදිරි කාලය තුළදී ගෙන එන්නට බලාපොරොත්තු වෙනවා. මම නැවතත් ඔබතුමන්ලාට කියන්නේ, මෙවැනි තරගාවලියක් පවත්වන වේලාවක අපට රටක් හැටියට අවසාන මහා තරගාවලියෙන් නවතින්නේ නැතිව ලෝක කුසලාන ජයග්‍රහණ කරන්න අපේ ක්‍රීඩකයන්ට අවශ්‍ය ඒ පහසුකම් ලබා දෙන්න, පසුබිම සකස් කරන්න ක්‍රීඩා අමාත්‍යාංශයත්, ක්‍රිකට් පාලක මණ්ඩලයත් කටයුතු කරනවාය කියන එකයි. එසේම මේ යෝජනාව සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කළ විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාටත්, විශේෂයෙන් ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාටත්, මේ සියලු දෙනාටමත් අපේ ගෞරවය ස්තුතිය පුද කරමින් මම නවතිනවා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.47 ට, 2012 ඔක්තෝබර් 24 වන බදාදා අ.භා. 1.00 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 6.47 மணிக்கு பாராளுமன்றம், 2012 ஒக்ரோபர் 24, புதன்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Adjourned accordingly at 6.47 p.m. until 1.00 p.m. on Wednesday, 24th October, 2012.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to be Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**දායක මුදල් : පාර්ලිමේන්තු විවාද වාර්තාවල වාර්ෂික දායක මිල රු. 2178කි. පිටපතක් ගෙන්වා ගැනීම අවශ්‍ය නම් ගාස්තුව රු. 18.15කි. තැපැල් ගාස්තුව රු. 2.50කි. කොළඹ 6, කිරුළපන, පාමංකඩ පාර, අංක 102, පියසිරි ගොඩනැගිල්ලේ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම නොවැම්බර් 30 දාට ප්‍රථම දායක මුදල් ගෙවා ඉදිරි වර්ෂයේ දායකත්වය ලබා ගෙන විවාද වාර්තා ලබාගත හැකිය. නියමිත දිනෙන් පසුව එවනු ලබන දායක ඉල්ලුම් පත් භාර ගනු නොලැබේ.**

**சந்தா ;** ஹன்சாட் அதிகார அறிக்கையின் வருடாந்த சந்தா ரூபா 2,178. ஹன்சாட் தனிப்பிரதி ரூபா 18.15. தபாற் செலவு ரூபா 2.50. வருடாந்த சந்தா முற்பணமாக **அத்தியட்சகர், அரசாங்க வெளியீட்டலுவலகம், இல. 102, பியசிறி கட்டிடம், பாமன்கடை வீதி, கிருளப்பனை, கொழும்பு 6** என்ற விலாசத்திற்கு அனுப்பி பிரதிகளைப் பெற்றுக்கொள்ளலாம். ஒவ்வோராண்டும் நவம்பர் 30 ஆந் தேதிக்கு முன் சந்தாப்பணம் அனுப்பப்பட வேண்டும். பிந்திக் கிடைக்கும் சந்தா விண்ணப்பங்கள் ஏற்றுக்கொள்ளப்படமாட்டா.

**Subscriptions :** The annual subscription for Official Report of Hansard is Rs. 2,178. A single copy of Hansard is available for Rs. 18.15. (Postage Rs. 2.50) Copies can be obtained by remitting in advance an annual subscription fee to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, No. 102, Piyasiri Building, Pamankada Road, Kirulapone, Colombo 6. The fee should reach him on or before November 30 each year.
Late applications for subscriptions will not be accepted.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.